ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Pages 52 MARCH 2018 Issue : 100 මාසික සංග්‍රහය 2018 මාර්තු, 100 කලාපය 50 ¢

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative

The Diamond Realty Inc.
Tel: 416 822 2789
www.gaminiabeysinghe.com



**ප්‍රවීණ චිත්‍ර සහ මූර්ති කලා ශිල්පී තිලක අබේසිංහයනි,**

**සියුම් රේඛාවට, සිමෙන්ති පිඩට ජීවය ලබා දුන් ඔබ අසීමිත මිනිසෙකි. අද්විතීය කලාකරුවෙකි. ඔබට නිදුක් නිරෝගී චිර ජීවනය සැලසේවා...!!**

# නිවාස වෙළඳපොළ තවදුරටත් පහතට !

ටොරොන්ටෝව ප්‍රධාන GTA කලාපයෙහි නිවාස වෙළඳපොළ තත්ත්වය තවදුරටත් පහත වැටෙමින් පවතින බව ඒ පිළිබඳව දැක්වෙන වාර්තාවල සඳහන් වේ. ඒ අනුව පසුගිය පෙබරවාරි මාසයේදී මෙම කලාපයෙහි නිවාස වෙළඳපොළ සියයට 35 ක පමණ පසුබෑමකට ලක්ව ඇතැයි වාර්තා වේ.

GTA කලාපයෙහි නිවාස මිල ගණන් ඓතිහාසික ඉහළ මට්ටමකට පත් 2017 වසර සමග සංසන්දනය කිරීමේදී මේ වන විට මෙහි නිවාස මිල සියයට 12 කින් පමණ පහත වැටී ඇතැයි ටොරොන්ටෝ දේපළ වෙළඳාම් සංගමය (TREB) සඳහන් කරයි. කෙසේ වුවත් පසුගිය වසරට සාපේක්ෂව යම් මිල අඩුවීමක් ටොරොන්ටෝ හා ආසන්න නගරවල නිවාස මිල ගණන්හි දක්නට ලැබුණත් තවමත් කැනඩාවේ මිල වැඩිම සාමාන්‍ය නිවාස සහිත නගරය වන්නේ ටොරොන්ටෝව බව TREB පවසයි.

නිවාස වෙළඳපොළ පිළිබඳව සංඛ්‍යාලේඛන දත්ත වාර්තාවලට අනුව 2017 වසරේ පෙබරවාරි මාසයේදී ටොරොන්ටෝවේ නිවාස 7,955 ක් විකිණී ඇති අතර මේ වසරේදී එය 5,175 දක්වා පහත වැටී ඇත.

8 වන පිටුව බලන්න

# කැනඩා මහ බැංකු පොලී අනුපාතය

කැනඩා මහ බැංකුවේ පුරෝකථන සැලකිල්ලට ගෙන මෙවර වෙළඳපොළ පොලී අනුපාතිකවල ඉහළ යෑමක් සිදු නොකරන බව කැනඩා මහ බැංකුව නිවේදනය කර ඇත. ඒ අනුව පෙර පැවති සියයට 1.25 ක් වූ ප්‍රතිශතාත්මක අගයෙන්ම එය තවදුරටත් පවත්වාගෙන යනු ඇත.

කැනඩාව තුළත් ගෝලීය වශයෙනුත් වෙළඳ ප්‍රතිපත්ති සංවර්ධනය සම්බන්ධයෙන් මෑත කාලයේ මතු වී ඇති අවිනිශ්චිතභාවය ප්‍රධාන මූලාශ්‍ර කර ගනිමින් මෙවර පොලී අනුපාත වැඩි නොකිරීමට කැනඩා මහ බැංකුව කටයුතු කර ඇත.

මෙහිදී ප්‍රධාන වශයෙන් සැලකිල්ල යොමු කොට ඇත්තේ, ඇමරිකාව සමග පවතින වෙළඳ ගණුදෙනුවලදී කැනඩාවට මුහුණ පා ඇති ගැටලු සම්බන්ධවයි. ආනයනික වානේ සහ ඇලුමිනියම් සඳහා ඇමරිකාව විසින් පැනවීමට නියමිත විශේෂිත බද්දත්, උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම (NAFTA) සම්බන්ධයෙන් යළි යළිත් සිදුකෙරෙන අස්ථාවර මට්ටමක පවතින සාකච්ඡාත් කැනඩාවේ ආර්ථිකයට සෘජුවම බලපෑම් එල්ල කරන තත්ත්වයන් ලෙස සැලකේ.

එසේම සිව්වන කාර්තුවේ ආර්ථික වර්ධන වේගය අපේක්ෂිත ඉලක්කයට වඩා දුර්වල වීමත්, අපේක්ෂිත මට්ටමට වඩා විශාල ලෙස ආනයනයන් ඉහළ යෑමත්, නව ප්‍රතිපත්තිමය සහ උගස් ණය වෙනස්වීම් මත නිවාස වෙළඳපොළ තුළ සිදුවෙමින් පවතින අස්ථාවරත්වයත් යන සියලු කරුණු මෙම පියවර ගැනීමේදී සලකා බලා ඇත.

ආර්ථිකයේ පවතින අස්ථාවර තත්ත්වයන් මගහරවා ගනිමින් ආර්ථික කටයුතුවලට සහන සැලසීමේ අරමුණින්

8 වන පිටුව බලන්න

ඔබ දෙවියන් කෙරෙහි මෙන්ම CCTV කැමරා පද්ධති කෙරෙහිත් විශ්වාසය තබන්න.
අපරාධ අවම කරගැනීමට එය උපකාරී වේ.

CAMSONICS
SECURITY SYSTEMS

FULL HD
www.camsonics.com
Rajeev 647 302 5748
අපගේ සේවාව මගින් ඔබගේ නිවසත් ආරක්ෂා කරගන්න

බ්‍රින්දාවන් සුපර්මාර්කට්
BRINTHAVAN SUPERMARKET
SRI LANKAN FRESH FRUIT, VEGETABLE AND GROCERIES


An excellent news to our beloved customers! We are excited to announce that your favourite
BRINTHAVAN SUPERMARKET ! NOW OPEN AT NEW LOCATION
New establishment with a brand new look and brand new facilities
13 Fisherman Dr, Unit 11 & 12, Brampton, ON L7A 2X9 TEL : 905 495 3755


VESAK 2018
BUDDHA'S BIRTHDAY CELEBRATION
"Blessings on the City, the Nation, and the World."
The Largest Annual Canadian Buddhist Festival
MAY 27
SUNDAY
MISSISSAUGA CELEBRATION SQUARE
300 City Centre Drive, Mississauga
Ontario L5B 3C1
Parade: 2:00pm
Program: 3:00pm
For more information visit www.vesakcelebration.com
Co-organized by
正覺寺
Halton Peel Buddhist Cultural Society
West End Buddhist Temple
And Meditation Centre
Fo Guang Shan
Temple of Toronto
加拿大佛教会湛山精舍

# බිලි බිෂොප් සහ ඔටාවා උ. ඇමරිකාවේ හොඳම ගුවන් තොටුපොළ අතරට

අන්තර්ජාතික ගුවන් තොටුපොළ සේවා කවුන්සිලය - Airports Council International's (ACI) මගින් වාර්ෂිකව පවත්වනු ලබන ගුවන් තොටුපොළ සේවා තත්ත්ව සම්මාන උළෙලේදී (Airport Service Quality Awards) උතුරු ඇමරිකානු කලාපයේ හොඳම ගුවන් තොටුපොළවල් අතර දෙවන ස්ථානය සමව හිමිකර ගැනීමට ටොරොන්ටෝවේ බිලි බිෂොප් ගුවන් තොටුපොළත් - Toronto Billy Bishop (YTZ) ඔටාවා ගුවන් තොටුපොළත් - Ottawa (YOW) සමත් වී ඇත.

වාර්ෂිකව මිලියන 2 කට අධික මගීන් සංඛ්‍යාවක් ගුවන් ගමන් සඳහා බිලි බිෂොප් ගුවන් තොටුපොළ භාවිත කරන අතර මෙම ගුවන් තොටුපොළ මේ ආකාරයට ඉහළ ඇගයුමට ලක් වූ තෙවැනි අවස්ථාව මෙය වේ.

2017 ACI සම්මානය පදනම් කර ගනිමින් අන්තර්ජාතික ගුවන් තොටුපොළ සේවා කවුන්සිලය මගින් ලොව පුරා රටවල් 85 ක ගුවන් තොටුපොළවල් 300 ක සේවා තත්ත්ව සමීක්ෂණයට ලක් කොට ඇත. එහිදී මගීන් 600,000 කට වැඩි සංඛ්‍යාවකගේ අදහස්ද මෙම සමීක්ෂණය සඳහා ලබාගෙන තිබුණි.

ගුවන් තොටුපොළ සේවා සමීක්ෂණය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක ගණනාවක් ප්‍රයෝජනයට ගෙන ඇති අතර මගී තෘප්තිය පිළිබඳව මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කොට ඇත. එහිදී ගුවන් තොටුපොළ ප්‍රවේශය, ආරක්ෂක පිරික්සුම්, කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාව, පහසුකම් සැපයීම හා අදාළ පහසුකම් සහිත බව ආදි කරුණු ගණනාවක් නිරීක්ෂණයට ලක් කරනු ලැබේ.

මෙහිදී උතුරු ඇමරිකා කලාපයේ හොඳම ගුවන් තොටුපොළ ලෙස Indianapolis (IND) සහ Jacksonville (JAX) යන ගුවන් තොටුපොළ දෙක සම මට්ටමෙන් තේරී තිබුණි.

මෙම තත්ත්ව සමීක්ෂණ සම්මාන ඇගයුමේ ආසියා පැසිෆික් අංශයෙන් පළමු ස්ථානය ඉන්දියාවේ දිල්ලි ගුවන් තොටුපොළත්, මුම්බායි ගුවන් තොටුපොළත් සමව හිමිකරගනු ලැබුණි.

# අතුරුදන් වූ කාන්තාවන්ගේ පරීක්ෂණ කල් යන ලකුණු

අතුරුදහන් වූ සහ ඝාතනයට ලක් වූ ස්වදේශීය කාන්තාවන් සහ ගැහැනු ළමුන් පිළිබඳව තොරතුරු සොයා බැලීමට පත්කරනු ලැබූ කොමිෂම විසින් සිදුකරමින් පවතින පරීක්ෂණ කටයුතු අවසන් කිරීම සඳහා තවත් වසර දෙකක කාලයක් අවශ්‍ය බව ඔවුන් පවසා සිටී. එම පරීක්ෂණ කටයුතු 2018 දෙසැම්බර් මාසය වන විට නිමා කොට අදාළ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණද එම දින වකවානු වන විට එය සම්පූර්ණ කළ නොහැකි බව එම කොමිෂමේ ප්‍රධානී Marion Buller පවසා ඇත. අතුරුදන් හා ඝාතනය වූ සිය ගණනකගේ ඥාති හිතමිත්‍රාදීන් තම තමන්ගේ කතා මෙම කොමිෂම හමුවේ තනි තනිව කියා පෑමට බලා සිටීම නිසා මෙම කටයුත්තට බලාපොරොත්තු වූවාට වඩා බෙහෙවින් වැඩි කාලයක් ගතවන බව ඇය පවසා සිටී. එසේ හෙයින් මෙම පරීක්ෂණ කටයුතු සිදුකර වාර්තාව සැකසීම සඳහා 2020 දෙසැම්බර් 01 දා දක්වා කල් ලබා දෙන ලෙස කොමිෂමේ ප්‍රධානියා ඉල්ලා සිටී.

2018 දෙසැම්බරයේ නිමාව දැකීමට සැලසුම් කළ මෙම පරීක්ෂණ කටයුතු සඳහා මුලදී වෙන් කරනු ලැබූ පිරිවැය ඩොලර් මිලියන 54 ක් වුවත් තවත් වසර දෙකක් දිගු විය හැකි මේ පරීක්ෂණ කටයුතු සඳහා ඊට වැඩි මුදලක් වැය විය හැකි බවද ඇය පෙන්වා දේ.

මෙම පරීක්ෂණ කටයුතු කාලය දීර්ඝ කිරීම සඳහා වූ ඉල්ලීම මේ වන විට ස්වදේශීය සම්බන්ධතා අමාත්‍ය Carolyn Bennett වෙත ලබා දී ඇති අතර ඉදිරි සතිවලදී ඇය ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් හා පළාත් බලධාරීන් සමග සාකච්ඡා කොට කාලය දිගු කිරීමේ හැකියාව ගැන තීරණයක් ගැනීමට නියමිත වේ.

මෙසේ අගතියට පත් බහුතරයක් වූ දේශීය කාන්තාවන් ඝාතනය වීමට බලපා ඇත්තේ සාම්ප්‍රදායික හා ආයතනික වශයෙන් වූ අසමතුලිතතාවන් වුවත් එම සිදුවීම් වූ ආකාරය පිළිබඳව අතුරුදන් වූ හා ඝාතනය වූ ගැහැනුන් සහ ගැහැනු ළමුන්ගේ පවුල්වලට ඉතාමත් සාධාරණ හා යුක්ති සහගත පිළිතුරු ලබා දීම අවශ්‍ය බව ඇමතිනිය පෙන්වා දේ. මෙම අඛණ්ඩ ඛේදවාචකය අවසන් කොට අගතියට පත් වූවන්ට සහනදායි පිළිතුරු ලබාදීමට රජය කැපවී සිටින බවද ඇමතිනිය පවසා සිටී.

වාර්තාගත තොරතුරුවලට අනුව 1980 සිට 2012 දක්වා කාල වකවානුව තුළ ස්වදේශීය කාන්තාවන් සහ ගැහැනු ළමුන් 1,017 දෙනෙකු ඝාතනයට ලක් වී ඇතැයි ජාත්‍යන්තර ක්ෂමා ආයතනය පවසා සිටී. 2014 වසරේදී කැනේඩියානු රාජකීය පොලිසිය (RCMP) විසින් නිකුත් කළ වාර්තාවක සඳහන් වූයේ 1980-2012 කාලයේදී අතුරුදහන්ව සහ ඝාතනයට ලක්ව ඇති කාන්තාවන් සහ ගැහැනු ළමුන් සංඛ්‍යාව 1,200 ක් බවයි. කෙසේ වුවත්, අතුරුදන් හා ඝාතනය වූ කාන්තාවන් පිළිබඳව සංඛ්‍යා ලේඛන දක්වන ස්වදේශීය කාන්තාවන් සඳහා වූ කණ්ඩායමක් පවසා ඇත්තේ එම ප්‍රමාණය 4,000 ඉක්මවිය හැකි බවයි.

# ලිංගිකත්ත්වය මත සිදුවන වැටුප් විෂමතා මැඩලන්න 'Pay Transparency'

ස්ත්‍රී-පුරුෂභාවය පදනම්ව කාන්තාවන් හා පිරිමින් අතර පවතින වැටුප් විෂමතා පරතරයන් වසා දැමීම අරමුණු කර ගනිමින් 'Pay Transparency' නමින් නව ව්‍යවස්ථා පනත් යෝජනාවක් ඔන්ටාරියෝ රජය විසින් පසුගිය දා ඉදිරිපත් කරනු ලැබුණි.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ඔන්ටාරියෝ මහ ඇමතිනී කැත්ලීන් වේන් පවසා සිටියේ, කාන්තාවන්ද පිරිමින් හා උරෙනුර ගැටෙමින් සම තත්ත්වයෙන් රැකියාවන්හි නිරත වූවත් පිරිමි පාර්ශ්වය සඳහා ගෙවනු ලබන වැටුප තවමත් කාන්තාවන් හට නොලැබෙන තත්ත්වයක් පවතින බවයි.

සම අයිතිවාසිකම් සහිත කැනඩාව වැනි රටක් තුළ ජීවත් වුවත් තවමත් කාන්තාවන් යම් යම් සීමාවන්ට යටත් කර ඇති බවත් එය වහාම නතර කළ යුතු බවත් මහ ඇමතිනිය පවසා සිටී. ඔන්ටාරියෝවේ කාන්තාවන් හා පුරුෂයන් අතර වැටුප් පරතරය එක් එක් රැකියා ස්ථානය මත තීරණය වන බවත් එය ඇතැම් අවස්ථාවල සියයට 12 සිට සියයට 29 දක්වා වූ පරතරයක් සහිතව පවතින බවත් ඇය පෙන්වා දේ.

රජය විසින් ගෙන ආ 'ගෙවීම් විනිවිදභාව' පනත සම්මත වුවහොත්, ප්‍රචාරයට පත් කරනු ලබන රැකියා ඇබෑර්තු සමග වැටුප් අනුපාත හා පරාසයන් ප්‍රසිද්ධියට පත් කිරීම අනිවාර්යයෙන් කළ යුතු වේ. එසේම තම සේවාදායකයා විසින් පෙර රැකියාව කළ ස්ථානයේදී ලබාගත් වැටුප් විස්තර පිළිබඳ විමසීම් සිදුකිරීමටද සේවා යෝජකයාට කිසිදු අයිතියක් නොමැත. තවද වන්දි හෝ වැටුප් පිළිබඳව සාකච්ඡා කරන සේවකයින් එරෙහිව පළිගැනීම් සිදුකිරීම සපුරා තහනම් වේ. ඒ සියල්ලත් ඇතුළුව ලිංගිකත්වය මත පදනම්ව වැටුප් විෂමතාවන් පවත්වාගෙන යෑම සහමුලින්ම නතර කිරීමට සිදුවනු ඇත.

# 401 අධිවේගය පුළුල් කෙරේ !

ඔන්ටාරියෝවේ ප්‍රධානතම අධිවේගී මාර්ගයක් වන 401 අධිවේගී මග පුළුල් කිරීම කෙරෙහි මහාමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත.

මෙහි මිසසාගා සිට මිල්ටන් දක්වා වූ කිලෝමීටර 18 ක දුර ප්‍රමාණයක් සහිත කොටස එලෙස පුළුල් කිරීමට නියමිතව ඇත.

එය මිසසාගා හි Credit River සහ මිල්ටන් හි Regional Road 25 කොටස ලෙස දැක්වේ. 401 අධිවේගී මාර්ගයේ එම කොටසෙහි තදබදය අවම කිරීම සඳහා මංතීරු 12 ක් දක්වා පුළුල් කිරීමට නියමිතව ඇත.

මෙම පළාත් හි අඛණ්ඩව වැඩි වන ජනගහනයත් සමගම කාර්යාල වේලාවන්හිදී පමණක් නොව, සෙසු වේලාවන්හිදීද අධිවේගී මාර්ගවල දක්නට ඇත්තේ දැඩි තදබදයකි. මෙම තත්ත්වය අවම කර ජනතාවට වඩාත් කාර්යක්ෂමව සිය ප්‍රවාහන කටයුතු සිදුකර ගැනීමට අවස්ථාව සැලසීම මෙම වැඩපිළිවෙළෙහි මූලික අරමුණයි.

401 අධිවේගී මාර්ගයෙහි පීල් (Peel) සහ හෝල්ටන් (Halton) කලාපය තුළ පමණක් දිනකට රථ වාහන 118,000 ත් 175,000 ත් අතර ප්‍රමාණයක් ගමන් ගන්නා බව වාර්තාවල දැක්වේ.

ඔන්ටාරියෝ ප්‍රවාහන ඇමතිනි Kathryn McGarry සහ පාර්ලිමේන්තු මන්ත්‍රිනි Indira Naidoo Harris විසින් මේ පිළිබඳව යෝජනාව පසුගියදා පළාත වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර අධිවේගී මග සැලසුම් කිරීම සහ ගොඩ නැංවීම සඳහා වන යෝජනා ඉදිරිපත් කරන ලෙසද එහිදී දන්වනු ලැබුණි.

මහාමාර්ග සහ අධිවේගී මාර්ග වැනි අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහ ඉදිකිරීමට යොදවන මුදල් සෑම විටෙකම පළදායී ආයෝජන බව මෙම අවස්ථාවට සහභාගි වෙමින් අදහස් දැක්වූ මිසසාගා නගරාධිපතිවරයා පවසා තිබුණි.

2017/18 වසරෙහි ඔන්ටාරියෝවේ සමස්ත අධිවේගී මාර්ගයන්හි නඩත්තු කටයුතු සහ පුළුල් කිරීම් වෙනුවෙන් ඔන්ටාරියෝ රජය වෙන් කොට ඇති මුදල ඩොලර් බිලියන 2.5 කට අධිකය.

# ක්‍රීඩකයන්ගේ ආරක්ෂාවට Rowan's Law

ක්‍රීඩා භූමියේදී ආධුනික ක්‍රීඩකයන්ට සිදුවන අනතුරුවලදී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් වූ නීති පද්ධතියක් ව්‍යවස්ථාව මගින් සම්මත කිරීමට ඔන්ටාරියෝ රජය පියවර ගෙන ඇත. Rowan's Law නමින් හඳුන්වා දී ඇති මෙම නීති මාලාවට Rowan යන නම යොදා ඇත්තේ රග්බි ක්‍රීඩාවේ යෙදී සිටියදී සිදු වූ අනතුරකින් ජීවිතක්ෂයට පත් 17 හැවිරිදි Rowan Stringer ක්‍රීඩිකාව සිහිපත් වීම සඳහාය.

මේ නීතිය පිළිබඳව අදහස් දක්වමින් මියගිය රෝවන් ගේ පියා පවසා ඇත්තේ මෙම ව්‍යවස්ථා පනත කැනඩාවේ සෙසු පළාත්වලත් ක්‍රියාත්මක වනු දැකීම තම අපේක්ෂාව බවයි. Rowan's නීතියට අනුව ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිළිබඳ විශේෂ වගකීමක් පුහුණුකරුවන් සහ ගුරුවරුන් වෙත පැවරේ. ක්‍රීඩා කරන අතරවාරයේදී ඇතිවන අනතුරුවලදී විශේෂයෙන්ම හිසට සිදුවන අනතුරුවලදී ක්ෂණිකව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔවුන් දැනුවත් වී සිටිය යුතුයි. එසේම, ක්‍රීඩකයන්ගේ විවිධ තත්ත්වයන්, කම්පනයන් හඳුනාගෙන ඒ සඳහා කටයුතු කිරීමද පුහුණුකරුවන්ගේ වගකීමකි. ක්‍රීඩා කරන අතර වාරයේදී හිසට සිදුවන ඝට්ටන හැකි තරම් අවම කරන ආකාරයට හැසිරීමේ රීති සකස් කිරීමද මෙහිදී පුහුණුකරුවන් සතු කටයුත්තක් ලෙස සැලකේ.

# ණයගැතියන් වැඩිම නගරය වැන්කූවර්

කැනේඩියානුවන් අතරින් අතිබහුතරයක් නොයෙක් ආකාරයේ ණය බැඳීම්වලට යටත් වී සිටින බව අපි දනිමු. එසේ ණය බරින් මිරිකෙන සමස්ත කැනේඩියානුවන් අතරිනුත් වැඩිම ණයක් උසුලන්නේ වැන්කූවර් වාසීන් බව පසුගියදා කරන ලද අධ්‍යයනයකදී හෙළිදරව් වී ඇත.

වසර කීපයක සිට උඩු යටිකුරු වෙමින් පවතින නිවාස වෙළඳපොළ වැන්කූවර් ණය කරුවන්ගේ ණය බර වැඩි කිරීමට බෙහෙවින් ඉවහල් වී ඇති බව ආර්ථික විශේෂඥයින් පෙන්වා දේ. පසුගිය කාලයේ වැඩි වූ නිවාස මිලත් සමග ඉහළ උකස් ණය කරා යෑමට එම ප්‍රදේශවාසීන්ට සිදුවී තිබුණු අතර වර්තමානයේදී නිවාස මිල යම් තරමකට පාලනය වීමත් සමග නිවාස විකුණා ගැනීමේ ගැටලුවට ඔවුන් මුහුණ පා සිටී. පසුගිය දා ට්‍රාන්ස් යූනියන් ආයතනය විසින් නිකුත් කරන ලද ණය වාර්තාවෙහි සඳහන් වන්නේ, වැන්කූවර් වාසීන් උගස් ණය නොවන අමතර ණය බරින්ද වැඩිම පීඩාවට පත් ජනතාවක් බවයි. එම වාර්තාවට අනුව 2017 සිවුවැනි කාර්තුවේදී වැන්කූවර් වැසියකුගේ නිවාස උගස් ණය නොවන සාමාන්‍ය පාරිභෝගික ණය ශේෂය ඩොලර් 38,588 කි. ඊට පෙර කාර්තුවේදී මෙම ණය ශේෂය ඩොලර් 38,095ක් ලෙස දැක්වුණි.

SCARBOROUGH REHABILITATION CLINIC

2950 Eglinton Avenue E., Suite 04
Scarborough, ON. M1J 2E7



- PHYSIOTHERAPY
- CHIROPRACTIC
- LASER THERAPY
- MASSAGE THERAPY
- ACUPUNCTURE
- PHYSICAL THERAPY
- PSYCHOTHERAPY
- REFLEXOLOGY
- CHRONIC PAIN MANAGEMENT
- OCCUPATIONAL THERAPY



WE SPECIALIZE IN SPORTS AND WORK INJURIES

- CUSTOM ORTHOTICS
- ORTHOPEDIC SHOES
- ORTHOPEDIC MATTRESS
- COMPRESSION STOCKINGS
- TENS MACHINE
- ASSISTIVE DEVICES



- EXTENDED HEALTH CARE
- WSIB
- MOTOR VEHICLE ACCIDENT
- SLIP AND FALL
- ODSP
- ACCEPT ALL TYPES OF WORK BENEFITS

ඔබට අවශ්‍ය උපදෙස් සිංහල භාෂාවෙන් ලබාගත හැක.

Tel: 416-335-1424 | Fax: 416-335-4542
Email: scarrehab@bellnet.ca

*Please contact Rosemarie Jude for more information 416-569-7523*

# ජාතික හැඳුනුම්පතේ වයස අඩු වේ !

ශ්‍රී ලංකාවේ ජාතික හැඳුනුම්පත අයදුම් කිරීමේ වයස් සීමාව සංශෝධනය කිරීමට රජය පියවර ගෙන ඇත. ඒ අනුව මින් ඉදිරියට වයස අවුරුදු 15 සම්පූර්ණ වූ ශ්‍රී ලාංකික පුරවැසියන්ට ජාතික හැඳුනුම්පත ලබාගැනීම සඳහා අයදුම් කළ හැකිය. එම වයස් සීමාව මීට පෙර පැවතියේ වයස අවුරුදු 16 සම්පූර්ණ කළ යුතු ලෙසිනි.

මේ පිළිබඳව අදහස් දැක්වූ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා පවසා ඇත්තේ මෙම අවුරුදු 15 වයස් සීමාව 2017 වසරේ සිට ක්‍රියාත්මක වන්නක් බවයි. මෙහිදී මෙම නව වයස් සීමාව හඳුන්වා දීමේදී මූලිකව ඉලක්ක කොට ඇත්තේ අපොස සාමන්‍යපෙළ විභාගයට පෙනී සිටින සිසු දරුවන් බව කොමසාරිස්වරයා පවසා ඇත. මෙම නව වයස් සීමා වැඩ පිළිවෙළට අනුව සිසුන් සාමාන්‍ය පෙළ පන්තියට යෑමට පෙර හැඳුනුම්පත ලබාගැනීමට අවස්ථාව සැලසේ. එමගින් හැඳුනුම්පත සම්බන්ධයෙන් සිසු දරුවන්ට මුහුණ පෑමට සිදුවන විවිධ අපහසුතා මගහරවා ගැනීමට හැකි වනු ඇත.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින පාසල් සිසුන් ජාතික හැඳුනුම්පත් අයදුම් කිරීමේදී උප්පැන්න සහතිකයේ පැහැදිලි ඡායා පිටපතක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වන බවත් මෙම උප්පැන්න සහතිකය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සහතික කළ හෝ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ උප්පැන්න සහතික පිටපතක් විය යුතු බවත් සඳහන් වේ.

අලුත් හැඳුනුම්පතේ පෙර භාවිත වූ ඉලක්කම් 9 කින් යුත් අංකය වෙනුවට සියලුම පුද්ගලයන්ගේ හැඳුනුම්පත්වල පෙර භාවිත වූ අංකය අවසානයේ ඇති ඉංග්‍රිසි අක්ෂරය ඉවත් කිරීමට පියවර ගෙන ඇති අතර හැඳුනුම්පත් අංකය ඉලක්කම් 12 කින් යුතු අංකයක් ලෙස සංශෝධනය කර ඇත.

# තේ දල්ලට සීනි කලවම් කරයි

තේ කෝප්පයක් සාදා ගැනීමේදී එක් එක් අයගේ රුචි අරුචිකම්වලට සෑහෙන පරිදි ඊට සීනි කලවම් කර පානයට ගැනීම සාමාන්‍ය පිළිවෙතයි. එහෙත් තේ දල්ල කඩා වියළීමේ ක්‍රියාවලිය සිදුකිරීමේදී ඊට සීනි කලවම් කරන බවක් ඔබ මින් පෙර අසා තිබුණාද? කණගාටුවෙන් වුවත් පැවසිය යුත්තේ මෙවැනි කටයුත්තක් ශ්‍රී ලංකාවේ ඇතැම් තේ නිෂ්පාදකයින් අතින් මේ වන විට සිදුවෙමින් පවතින බවයි.

ලොව ඉස්තරම්ම ගණයේ 'තේ' නිපදවන රටක් ලෙස ඉමහත් ජනප්‍රියත්වයක් දිනාගෙන සිටි ශ්‍රී ලංකාව වර්තමානයේදී ඒ සම්බන්ධයෙන් සිදුකරන විවිධ කූඨ උපක්‍රමයන් නිසා එම කීර්තිනාමය බෙහෙවින් පළුදු කර ගනිමින් සිටී.

තේ කොළවල ගුණාත්මක බව පහත හෙළමින් ඇතැම් තේ කම්හල් තේ දලු වියළීමේදී ඊට සීනි කලවම් කරන බව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදුකළ පරීක්ෂණවලදී අනාවරණය වී ඇත. එසේ තේවලට සීනි කළවම් කළ රත්නපුරයේ තේ කර්මාන්ත ශාලා දෙකක තේ නිෂ්පාදනය සහ අලෙවිය මේ වන විටත් තහනම් කිරීමට පියවර ගෙන ඇති බව වාර්තා වේ. තේ දලු වියළීමේදී සීනි කලවම් කිරීමෙන් තේ හොඳින් කළුපාට වීම සිදුවන බව පැවසේ. විශේෂයෙන්ම තේ දලු වියළීමේදී කොළය කළු පාට වුවත් නැට්ට කළු පාට නොවී දුඹුරු වර්ණයක් ගැනීමට පිළියමක් ලෙස මෙම උපක්‍රමය භාවිත කරනු ලැබේ. සීනි කලවම් කිරීම මගින් තේ නැට්ටත් නිසි පරිදි කළු පාට වන බව පැවසේ. එසේම සීනි මිශ්‍ර කිරීම මගින් තේ දලු ඇඹරීමද පහසු වන බව මෙම කූඨ වෙළඳුන් සොයාගෙන ඇත.

නමුත් මේ ආකාරයට සීනි මිශ්‍ර කර නිෂ්පාදනය කෙරෙන තේ මාස කීපයක් ගතවන විට පුස් කෑමට ලක් වේ. මේ නිසා තේ අපනයනයේදී ඒවා ප්‍රතික්ෂේප වීම වැනි විවිධ ගැටලුවලට ලක් වීමේ ඉඩකඩ ඉතාමත් වැඩි බව ශ්‍රී ලංකා තේ මණ්ඩලය පවසා සිටී. මේ ආකාරයට විදෙස් වෙළඳපොළ තුළ ලංකාවේ තේවලට පවතින ඉහළ නාමය පිරිහී ගියහොත් එයින් තේ කර්මාන්තය කඩා වැටීම නොවැළැක්විය හැක්කකි.

# මාධ්‍ය භාවිතයේදී යුද හමුදාවට විශේෂ වාරණ

ෆේස්බුක්, ට්විටර්, ලින්ක්ඩින් ආදි සමාජ ජාල වෙබ් අඩවි භාවිත කරන යුද හමුදා සාමාජිකයන් එහිදී හමුදාව විසින් පනවන ලද විශේෂ නීතිරීතිවලට යටත් විය යුතු බව යුද හමුදා මූලස්ථානය පවසා සිටී. ඒ අනුව මෙම වෙබ් අඩවි භාවිත කිරීමේදී නිල ඇඳුම, නිල නාම, ආයතන, උපකරණ පෙන්නුම් කරමින් ඡායාරූප ඇතුළත් කිරීම තහනම් කොට ඇත.

මෙම නියෝගය යුද හමුදාපති විසින් ලිපි මගින් සියලුම කඳවුරු වෙත මේ වන විට යොමුකර ඇතැයි සඳහන් වේ. එම නියෝගයට අනුව සියලුම යුද හමුදා සාමාජිකයන් සමාජජාල භාවිත කිරීමේදී සිය නිල නාමය ඇතුළු හමුදා අනන්‍යතා තොරතුරු හෙළි කිරීමෙන් වැළකිය යුතු වන අතර නිල ඇඳුම, හමුදා උපකරණ, ආයතන පෙන්නුම් කෙරෙන පැතිකඩ ඡායාරූප හෝ පසුතල ඡායාරූප භාවිත කිරීමෙන් වැළකිය යුතු වේ.

එසේම, ජාතික ආරක්ෂාව, යුදමය කරුණු, දේශපාලනික කරුණු, දේශපාලනඥයන්ට සහ රජයේ නිලධාරීන්ට අපහාස වන ආකාරයේ කරුණු, වාර්ගික හා ආගමික සුසංවාදයට හානි පමුණුවන කරුණු ඇතුළත් නිර්මාණ, පෝස්ටර් හෝ වෙනත් තොරතුරු සමාජ ජාල තුළ උත්පතනය කිරීම, යොමු කිරීම, අදහස් දැක්වීම සහ බෙදාහැරීම යුද හමුදා සාමාජිකයන් විසින් නොකළ යුතු බවද යුද හමුදාපතිවරයාගේ නියෝගයේ සඳහන්ව ඇත.

යුද හමුදා සාමාජිකයන් විසින් මෙම නීති උල්ලංඝණය කරන්නේදැයි නිරීක්ෂණය කිරීම සඳහා යුද හමුදා ප්‍රධාන සංඥා නිලධාරි ඇතුළු කණ්ඩායමක් දැනටමත් පත්කර ඇති බවත් මෙම නීති උපදෙස් උල්ලංඝණය කරන හමුදා සාමාජිකයන් පිළිබඳව විනයානුකූල පියවර ගැනීමට කටයුතු කරන බවත් යුද හමුදා මූලස්ථානය පවසයි. එහිදී එම නිරීක්ෂණ කණ්ඩායම යුද හමුදා සාමාජිකයන් සමාජ ජාල වෙබ් අඩවි භාවිත කිරීම පිළිබඳව නිරීක්ෂණය කරනු ලබයි.

# කොළඹ ඉඩම් මිල දර්ශකයේ වර්ධනයක්

පසුගිය වසරේ (2017) දෙසැම්බර් වන විට කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් මිල දර්ශකය සියයට 10.4 ක වර්ධනයක් පෙන්නුම් කර ඇතැයි වාර්තා වේ. මෙය 2016 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව (වාර්ෂික ලක්ෂමය පදනම මත) සලකා බලා ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.

කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලැබූ නිශ්චල දේපළ අංශයේ වර්ධනය පිළිබඳ අර්ධ වාර්ෂික දර්ශකය ඉදිරිපත් කිරීමේදී මේ බව සඳහන් වී ඇත.

2016 වසරට සාපේක්ෂව 2017 දෙසැම්බර් අග වන විට නේවාසික, වාණිජ හා කාර්මික යන අනුදර්ශක තුනෙහිම මිල ඉහළ යෑම මේ සඳහා හේතු වී ඇතැයි මහ බැංකුව පවසයි. මෙම වාර්තාවට අනුව 2017 දෙසැම්බර් මස වර්ධනය යටතේ නේවාසික ඉඩම් මිල දර්ශකය සියයට 9.7 කින්ද වාණිජ ඉඩම් මිල දර්ශකය සියයට 11.2 කින්ද කාර්මික ඉඩම් මිල දර්ශකය සියයට 10.1 කින්ද වර්ධනය වී තිබේ.

මෙහිදී කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක් ආවරණය වන පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සපයන ලද ප්‍රදේශ 50 ක පමණ ඉඩම් මිල ගණන් භාවිත කර ඇත. එම ප්‍රාදේශීය කොට්ඨාස මෙසේය. කොළඹ, දෙහිවල, හෝමාගම, කඩුවෙල සහ කැස්බෑව.

කෙසේ වෙතත් 2014 වසරට සාපේක්ෂව 2015 වසරේ දෙසැම්බර් මාසය තුළදී කොළඹ ඉඩම් මිල දර්ශකය සියයට 14.5 ක වර්ධනයක් පෙන්වා ඇති අතර 2015 වසරට සාපේක්ෂව 2016 දෙසැම්බරයේදී එය සියයට 12.8 ක වර්ධනයක් පෙන්වා ඇතැයිද මහ බැංකුව නිකුත් කළ වාර්තාවේ සඳහන් වෙයි.

# බටහිර ඖෂධ ලංකාවේදීම

රටෙහි ඖෂධ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා සරිලන බටහිර ඖෂධ වර්ගවලින් සියයට 80 ක් ශ්‍රී ලංකාවේදී නිපදවීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කෙරෙමින් පවතින බව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව පවසා සිටී. මේ වන විටත් එම නිෂ්පාදන කටයුතු අරඹා ඇති අතර පසුගිය වසරේදී බිලියන 2 ක් වූ ඖෂධ පෙති සහ කරල් ප්‍රමාණයක් නිපදවා ඇත.

එම ප්‍රමාණය මෙම වසරේදී දෙගුණ කරමින් බිලියන 4 ක් දක්වා නිපදවීම සඳහා රුපියල් බිලියන 1.2 ක මුදල් ආයෝජනයක් කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව අත්‍යවශ්‍ය ඖෂධ වර්ග 54 ක් ශ්‍රී ලංකාව තුළදීම නිපදවීම සිදුකෙරෙනු ඇත.

# ශ්‍රී ලංකාව ඔස්ලෝ සම්මුතියට එක් වෙයි

පොකුරු බෝම්බවලට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය ලෙස සැලකෙන 'ඔස්ලෝ සම්මුතිය' සඳහා ශ්‍රී ලංකාව අත්සන් තබා තිබේ. ඒ අනුව 2018 මාර්තු 01 වන දා සිට පොකුරු බෝම්බ භාවිතය, පැවරීම සහ එක්රැස් කිරීම තහනම් කෙරෙන එක්සත් ජාතීන්ගේ නෛතික ලියවිල්ලට අත්සන් තැබූ බව විදේශ කටයුතු අමාත්‍යාංශය සඳහන් කර සිටී.

පොකුරු බෝම්බ සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතියට අත්සන් තැබූ 103 වන රට ශ්‍රී ලංකාවයි.

යුද ගැටුම් පැවති සමයේදී ශ්‍රී ලංකාව විසින් පොකුරු බෝම්බ භාවිත කළ බවට ඇතැම් පාර්ශ්ව චෝදනා එල්ල කළත් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා පොකුරු බෝම්බ භාවිත කළ බවට මෙතෙක් කිසිදු සාක්ෂියක් හමුවී නොමැති බවත් ඉදිරියේදීත් භාවිත නොකිරීම ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිය බවත් රජය පවසා සිටී. 2017 දෙසැම්බර් 13 වෙනි දින පුද්ගල නාශක බිම්බෝම්බ තහනම් කිරීම පිළිබඳ 'ඔටාවා සම්මුතියට' ද ශ්‍රී ලංකාව එක් විය. ඒ අනුව ඔටාවා සම්මුතියට එක් වූ 163 වන රට බවට ශ්‍රී ලංකාව පත් විය.

ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය වැනි කලාපයේ රටවල් රැසක් ඔටාවා සම්මුතිය හා එක් වී ඇතත් ඉන්දියාව, පාකිස්තානය හා චීනය වැනි ආසියානු කලාපයේ ප්‍රබල රටවල් හා ලෝකයේ සෙසු රටවල් 33 ක් තවමත් ඔටාවා සම්මුතිය හා එක් වී නොමැත.

ශ්‍රී ලංකාව මෙම සම්මුතිය හා එක් වීමෙන් පසු ඒ පිළිබඳව අදහස් දැක්වූ ඔටාවා සම්මුතියේ විශේෂ නියෝජිතවරයකු පවසා ඇත්තේ, යුද්ධයේ බිහිසුණු බව ගැනත් බිම්බෝම්බ නිසා වූ හානිය ගැනත් ශ්‍රී ලංකාවට අත්දැකීම් ඇති නිසා මෙම සම්මුතියට එක් නොවූ ලෝකයේ සෙසු රටවල් මෙම සම්මුතියට එක්කර ගැනීමේ හැකියාව ශ්‍රී ලංකාව සතුව පවතින බවයි.

ඔටාවා සම්මුතිය ක්‍රියාත්මක කරන අතරවාරයේදී ආබාධිත පුද්ගලයින්ගේ සහ විවිධාකර හැකියාවන් සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමත්, බිම්බෝම්බ නිසා විවිධාකාර ආබාධවලට ගොදුරුව සිටින පුද්ගලයින්ට ආයතනිකව හිමිවිය යුතු අවස්ථා හා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමත් සිදුකෙරේ. මෙම සම්මුතිය තුළින් පීඩිතයන් සහ වින්දිතයන් වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කිරීම මෙහි ඇති විශේෂ අංගයක් ලෙස දැක්වේ.

# පුරාවිද්‍යා ආඥා පනතට සංශෝධනයක්

ශ්‍රී ලංකාවේ පෞරාණික වටිනාකම් සහිත ස්ථානවල සාදන අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා මෙතෙක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බලයක් ලැබී නොමැති බවත්, සියල්ල සලකා බලා නුදුරු කාලයේදී පුරාවිද්‍යා ආඥා පනත සංශෝධනය කෙරෙන බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පවසයි. මෙම පනත අවසන් වරට සංශෝධනය කර ඇත්තේ 1998 වසරේදීය.

කාලයට ගැළපෙන ආකාරයට පුරාවිද්‍යා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳ වාර්තාවක් මින් පෙර විශ්වවිද්‍යාල ආචාර්යවරුන් එක්ව කලින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භාරව සිටි අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇතත් එය සංශෝධනය වී නොමැති බව පැවසේ.

දසත Dasatha
2018 මාර්තු March 2018

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editor - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the [financial] support of the Government of Canada.
«Nous reconnaissons l'appui [financier] du gouvernement du Canada'
www.canada.ca

# රට අස්ථාවර නොවිය යුතුයි

අර්බුදවල හිඟයක් නොමැතිව ඉදිරියට යන අපගේ මවුබිම වන ශ්‍රී ලංකාව වර්තමානයේ තවත් එක්තරා අර්බුදයකට මුහුණ පා ඇති සැටියක් පෙනෙන්නට ඇත. එනම් පසුගිය දා පැවති පළාත් පාලන මැතිවරණයත් සමග පැන නැග ඇති දේශපාලන ව්‍යාකූලත්වයයි. විශේෂයෙන්ම පවත්නා රජය කරවන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය අතර මතු වී ඇති ප්‍රතිවිරෝධී මත ගැටුම මෙයට හේතු වී ඇත. මැදිහත්ව බැලුවහොත් මෙම මැතිවරණයේදී ජනතාව දැල්වූ රතුඑළිය සාධාරණ එකකැයි මේ දෙපක්ෂයම පිළිගත යුත්තේ ජනතාව මේ රතු එළිය දල්වා ඇත්තේ දෙපක්ෂයටම වන හෙයිනි. රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු රජය ගෙන ගිය අදූරදර්ශී වැඩ පිළිවෙළ මේ රතු එළියට හේතු වී ඇතිවා සේම තම අත බලය තිබියදී වසර තුනක් මුළුල්ලේ එම වැරදි වැඩ පිළිවෙළ වළක්වා හරි මගට ගන්නට කිසිදු උත්සාහයක් නොගැනීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද එයට වගකිව යුතුමය.

අප මේ උත්සාහ කරන්නේ දිගින් දිගටම ඒ පිළිබඳව කතා කරන්නට නොවේ. රජයේ මේ ව්‍යාකූල තත්ත්වය යටතේ පැන නැගිය හැකි, ලෝක දේශපාලනය ඇසුරින් අප අත්දැකීම් ලබා ඇති මුළුමහත් ශ්‍රී ලාංකේය ජනතාවටම මූණ පාන්නට වන අවාසනාවන්ත තත්ත්වයක් පිළිබඳ අප දකින අනතුරක් පෙන්වා දීමටය.

පළාත් පාලන මැතිවරණය ඉකුත්ව මෙය ලියන අවස්ථාව වන විට ගත වී ඇති සති තුනකට ආසන්න කාලය තුළ රජයේ සියලු කටයුතු ඇණ හිටින තත්ත්වයක් පෙන්නුම් කළේය. රජයේ පවත්නා ව්‍යාකූල තත්ත්වය නිසා නිලධාරි ආදි සියලු පිරිස් තම කටයුතු අර පරිස්සමින් කරන තත්ත්වයකට පත් වී සිටිති. රජයේ මෙම ව්‍යාකූල තත්ත්වය යටතේ රටේ ආර්ථික ව්‍යුහයද බලවත් අර්බුදයකට මූණ පා ඇත. මේ සතිය දෙක තුළ ඩොලරයේ අගය වැඩි වෙමින් රුපියල අවප්‍රමාණය වෙමින් පැවතීම මීට කදිම උදාහරණයකි. මෙවැනි අවස්ථාවක ගනු ලබන පියවර දූරදර්ශීවත්, බුද්ධිමත්වත්, ඉක්මන්වත් නොගත හොත් අප නොසිතන, අප නොපතන බලවේගවලට ලක්මවට මූණ පාන්නට වනු නොඅනුමානය.

විශේෂයෙන්ම වර්තමානයේ මතුවී තිබෙන මෙවැනි අත්දැකීම් මෙතුවක් ශ්‍රී ලංකා දේශපාලනයෙහි මතුව නැති හෙයින් මෙය වඩාත් කල්පනාකාරී විය යුතු අවස්ථාවක් ලෙස අපි දකිමු. මෙතෙක් නිරතුරුවම මහ මැතිවරණයකදී නම් රජයක් පරාජයව නව රජයක් බලයට පත්වීමේදී එක්සත් ජාතික පක්ෂය හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ තනිව තීන්දු ගත හැකි එක් පක්ෂයක් ප්‍රමුඛව බලයට පත් වූ හෙයින් මෙවැනි ව්‍යාකූල තත්ත්වයක් අපට අත්දකින්නට නොලැබිණි. අනෙක් අතට මෙතෙක් බලයේ සිටින පක්ෂයක් යටතේ පැවති පළාත් පාලන මැතිවරණවලදී බලයේ සිටි පක්ෂයම ජය ගත් අතර මෙවර බලයේ සිටින පක්ෂ දෙකම අබිබවා විරුද්ධ පක්ෂයක් බලයට පත්වීමේ අත්දැකීමක් අප සතුව නොතිබුණි.

අප රට වසර ගණනාවක් මුළුල්ලේ දේශපාලන හා ආර්ථික වශයෙන් එක දිගටම ප්‍රශ්නකාරී තත්ත්වයක පවත්නා බවද අප කල්පනාවට ගත යුතුය. පක්ෂ දේශපාලනය යටතේ ජනතාව බෙදී වෙන්වී සිටින දේශපාලන තත්ත්වයකුත් විදේශ ණය හා දේශීය වංචා දූෂණ මගින් දුර්වලව ගිය ආර්ථික තත්ත්වයකුත් අප සතුව පවත්නා බව අමතක නොකළ යුතුය. පසුගිය දා ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා වාර්තා කළ අන්දමට ලංකාවේ සෑම පුරවැසියෙක්ම රුපියල් ලක්ෂ හතරකට වැඩි මුදලක් විදේශයන්ට ණය ගැතිව සිටිති. ඒ අතර පුරවැසියන්ගෙන් බහුතරයක් නිදහස ලබා අවුරුදු 70 ක් ගත වන මේ මොහොතේත් සිටින්නේ යහපත් ජීවන තත්ත්වයක් යටතේ නොවේ.

ලෝක ඉතිහාසයෙහි අප නොසිතූ විරූ ලෙස බලකාමී, බලලෝභී පිටස්තරයන්ගේ ග්‍රහණයට හසුවූ ඔවුන්ගේ ගොදුරු වීම් බවට පත් වූ රටවල් ගැන සලකන විට අප ඉහත විස්තර කළ අන්දමේ පසුබිමක් ඒ සෑම රටකම දක්නට ලැබුණේය. වර්තමානයේ මෙබඳු තත්ත්වයන් උදා වනුයේ ක්‍රි.පූ. යුගයේ මහා ඇලෙක්සැන්ඩර් වැනි අය කළාක් මෙන් යුද හමුදා මෙහෙයවීමෙන් නොවේ. දේශපාලනික හා ආර්ථික උපක්‍රම මගින් වැටී සිටින රටවල් තව තවත් දුර්වල කිරීමෙනි. ඔවුන්ට අත දෙන මුවාවෙන් තමන් අත රූකඩ බවට පත් කර ගැනීමෙනි. සැබෑ වුවද බොරු වුවද ශ්‍රී ලංකාවේ මාධ්‍යයන්හි පළවන ඇතැම් පුවත්වලට අනුව ඉන්දියාව, ඇමරිකාව වැනි රටවල් මේ වන විටත් අප රට තුළ ඇති වී තිබෙන මෙම තත්ත්වය පිළිබඳව විමසිල්ලෙන් පසු වන බවද අසන්නට දකින්නට ලැබේ. අපට දීමට පොරොන්දු වූ යම් යම් සහනාධාරවලට පවා මේ වන විටත් යම් යම් කොන්දේසි පනවන්නට ජාත්‍යන්තර සංවිධාන ඉදිරිපත් වන බව අසන්නට ලැබේ. ඉන්ධන මිල හා විදුලි බිල වැඩි නොකළ හොත් දෙන්නට පොරොන්දු වූ සහන නොදෙන බවට කළ අනතුරු ඇඟවීම මින් එකකි.

අප මේ තත්ත්වයත් සුළු කොට නොතැකිය යුතුය. ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේදී මේ සියලු තත්ත්වයන් දෙස දූරදර්ශීව බැලිය යුතුව තිබේ. ඉතිහාසයෙහි මෙතෙක් නොවූ විරූ අවස්ථාවකට අප මූණ දී ඇති බවත් තම පටු අදහස් හා අරමුණු වෙනුවෙන් නොව, රටේත් ජනතාවගේත් අනාගතය වෙනුවෙන් දූරදර්ශී, බුද්ධිමත් තීරණයකට එළඹිය යුතු බවත් පාලකයන් විසින් අවබෝධ කොට ගත යුතුය.

මේ අවස්ථාවේ විරුද්ධ පාක්ෂිකයන්ගේද එක් වගකීමක් වෙයි. එනම් වසර හතරහමාරක් ගත වනතුරු පවත්නා රජය විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයාට නොමැති හෙයින් තමන්ගේද සහාය ඔහුට ලබා දෙමින් තමන්ට කළ හැකි පරිද්දෙන් රටේ අස්ථාවරභාවය වළක්වා ගැනීමට රට වෙනුවෙන් ඔවුනුද කැප විය යුතු බවයි. මන්ද යත්, අස්ථාවර රටක පාලනය යනු ගිනි වළල්ලක් හිස දරා ගැනීමක් වන හෙයිනි.

# ජනතාව දුන් තීන්දුව තර්කානුකූලයි!

■ දූරදර්ශී විසිනි

ඡන්ද චර්යාව (Voting behaviour) යන්න නූතන සමාජ විද්‍යාවෙහි සාකච්ඡාවට භාජන වන සුවිශේෂ විෂයයකි. ප්‍රජාතන්ත්‍රවාදයට අනුව තම පාලකයන් තෝරා ගැනීමේ පරම අයිතිය සතුව සිටින රාජ්‍යයක ජනයා එය කරනු ලබන්නේ මැතිවරණයක් මගිනි. මැතිවරණයකදී ජනතාව ලබා දෙන තීන්දුව මගින් නැවත නැවතත් පාලකයන්ට ජනතා පරමාධිපත්‍යයෙහි බලය හා වටිනාකම අවධාරණය කිරීමටත් එමගින් වඩාත් ප්‍රගතිශීලී පාලන තන්ත්‍රයන් ගොඩනගා ගැනීමටත් අවස්ථාව සැලසෙන්නේය. මෙහිදී 'බුද්ධිමත් ඡන්ද දායකයා පුද්ගලයා, පවුල, කුලය, පංතිය, ආගම වැනි පටු සාධකවලින් ඈත් වී තාර්කික කරුණු මත පදනම් වී වඩා යහපත් හා තමන්ට වැඩදායක පාලකයින් තෝරා ගන්නේය' යන්න බහුතර සමාජ විද්‍යාඥයින්ගේ අදහස වී තිබේ. ගැටලුව වී තිබෙන්නේ මැතිවරණයකට පෙර ඔවුන් විසින් දෙනු ලබන ප්‍රතිඥා හා බලාපොරොත්තු ඡන්දදායකයා නොමග යැවීමට හේතු වන බවයි.

ඉහත කී සමාජ විද්‍යාත්මක විවරණය අනුව ශ්‍රී ලංකාවේ මෑතකදී පැවැත්වුණු පළාත් සභා මැතිවරණය පිළිබඳව විග්‍රහ කර බැලීමේදී ශ්‍රී ලාංකේය ඡන්දදායකයා පටු සාධකවලට වඩා තාර්කික කරුණු මත තම 'ඡන්ද හැසිරීම' ක්‍රියාත්මක කිරීමට තරම් පොහොසත් පිරිසක්ව සිටින බව තහවුරු වන්නේය. අප එකිනෙකා සිටින පාට, පක්ෂ, කණ්ණාඩි ඉවත් කර පියවි ඇසින් බැලුව හොත් එය ප්‍රත්‍යක්ෂ වනු ඇත.

2015 වසරේදී ඒ වන විට අති ප්‍රබලව පැවති මහින්ද රාජපක්ෂ පාලනය නොසිතූ විරූ ලෙස පෙරලා දැමූ ශ්‍රී ලාංකේය ජනතාව රාජ්‍ය බලය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාටත් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාටත් පවරා දුන්නේය. පැවති රජයේ වූ ජනතාව අනුමත නොකළ ක්‍රියාදාමයනුත් මෛත්‍රීපාල සිරිසේන රනිල් වික්‍රමසිංහ හවුල ජනතාව හමුවේ තැබූ ආකර්ෂණශීලී පොරොන්දුත් එවැනි පෙරැළියකට තුඩු දුන් බව අමුතුවෙන් කිව යුතු නැත. එහෙත් වසර තුනක් ගත වූ තැන පැවති මේ පළාත් පාලන මැතිවරණයේදී ඒ ජනතාව 'අපි ගතවූ වසර තුන තුළ රජය හැසුරුණු ආකාරය ගැන සතුටට පත් නොවන්නෙමු' යන තාර්කික හා බුද්ධිමත් පණිවුඩය දී තිබේ.

ඔවුන් මෙම තීරණය ගැනීමේදී තම තර්කයට ගෝචර කරගත් කරුණු මොනවාදැයි කෙටියෙන් විමසා බලමු.

බලයට පත්වන අවස්ථාවේ වත්මන් රජය ජනතාවට දුන් ප්‍රතිඥා අතර ප්‍රමුඛස්ථානය ගත්තේ පැවති රජය යටතේ අහස උසට නැග පැවති ජනතාවගේ ජීවන බර වහ වහා අඩු කරන බවය. එහෙත් එය දසමයකින් හෝ අඩු කරන්නට රජය සමත් වීද? ගෙන ආ සෑම අයවැය ලේඛනයකින්ම ආනයනිකයන්ට හා විවිධ කර්මාන්ත කරුවන්ට බදු පැනවූ අතර ඒ සෑම බද්දක්ම ගෙවන්නට වූයේ ජනතාවටය. ආනයනිකයෝ, කර්මාන්තකරුවෝ තමන්ට පැවරුන බද්ද පාරිභෝගිකයන්ට මිල වැඩි කොට විකිණීමෙන් පියවා ගත් අතර ඒ දෙස හැරී බලන්නට තරම්වත් බදු පැනවූ කිසිවෙකුටත් උවමනාවක් නොවීය. සහල් ටික, පොල් ගෙඩිය, පරිප්පු ටික ආදි එදිනෙදා අවශ්‍ය දෑ මෙන්ම ඇඳුම කැඩුම ආදියටද මේ වැඩි වූ බදු ගෙවූයේ ජනතාව බව රජය දැන සිටි බවක් නොපෙනුණි.

මේ කාරණය ගැන දිගින් දිගට කතා කරනු වෙනුවට ගත වූ කාලය තුළ ආර්ථික වශයෙන් ජනතාව ලැබූ පීඩනයෙහි ස්වභාවය තීරණය කරන්නට ආර්ථික විද්‍යානුකූල කරුණු දෙකක් පමණක් ඉදිරිපත් කරනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2017 නොවැම්බර් 21 දා නිකුත් කළ ප්‍රවෘත්ති නිවේදනයකට අනුව 2016 දෙසැම්බර් මාසයේ සිට 2017 ඔක්තෝබර් මාසය දක්වා වූ මාස 10 තුළ රටේ උද්ධමනය දෙගුණයකින් වැඩි වී තිබේ. 2016 දෙසැම්බර් මාසයේ උද්ධමන අනුපාතය සියයට 4.2 ක් වූ අතර 2017 ඔක්තෝබර් මාසයේ උද්ධමන අනුපාතය සියයට 8.8 ක් වූ බව එහි සඳහන්ව ඇත. මේ වැඩිවීම පැටවුණේ ජනතාවගේ ජීවන බර මතට නොවේද?

දෙවන කරුණ නම් මේ රජය බලයට පත් වූ 2015 වන විට ඩොලරයේ අගය පැවතියේ රුපියල් 132 ක මට්ටමේය. එහෙත් මෙය ලියන අද වන විට ඩොලරයේ අගය රුපියල් 155 ක් දක්වා ඉහළ නැග තිබේ. මෙහි සරල අරුත නම් ශ්‍රී ලාංකිකයන් මිල දී ගන්නා සෑම භාණ්ඩයකටම රුපියල් 13 ක් වැඩිපුර ගෙවිය යුතු බව නොවේද? මෙය පාලනය කොට ජනතාවගේ ජීවන බර අඩු කරන්නට රජය ගත් කිසිදු පියවරක් ගැන කිව නොහැකිය. පළාත් පාලන මැතිවරණයේදී මේ තත්ත්වයත් තාර්කිකව කල්පනා කරන්නට තරම් ජනතාව බුද්ධිමත් වීම අගය කළ යුතුය. ඔවුන් එසේ නොකොට පටු තීරණයක් ගත්තේ නම් ඉදිරියේ ආර්ථිකව මූණ පාන්නට වන තැන කොතැනදැයි සිතාගත නොහැකි වනු ඇත.

මේ රජය බලයට පත්වීමේදී ජනතාවට දුන් තවත් පොරොන්දුවක් නම් පැවති රජය අවදියේ මහා පරිමාණයෙන් මැති ඇමතිවරුන් සහ නිලධාරීන් විසින්

22 වන පිටුව බලන්න

# උඩරට ගිවිසුම ව්‍යාජ ලියකියවිල්ලක්ද?



මෙම වැදගත් අවස්ථාව සඳහා හමුදා සේනාංකය පෙළගැසී සිටියේ සන්නාහ සන්නද්ධවය. දේශපාලන හා සිවිල් කටයුතු විශාල පෙරළියකට තුඩුදුන් මේ අවස්ථාවේදී ඩොයිලි මහතා (අල්ලාගත්) රජතුමාගේ සුවපහසුකම් සැලසීමෙහි නිරතව සිට දින 08 ක් තුළ රාජකාරිය සඳහා නොපැමිණි හෙයින් කිසිදු සාකච්ඡා සම්මේලනයක් නොපැවැත්විණි. එහෙත් ඔහු ආපසු පැමිණ පණිවුඩ මගින් ගිවිසුම්කරුවන් ගෙන්වා ඊයේ සම්මුතිය එළැඹීමට තීරණය ගන්නා ලදී. වේලාව සවස 3.00 ට පමණ ළං වෙත්ම මහනුවර නගරය ආරක්ෂා කරමින් සිටි සේනාංකයන් හා කන්ද උඩරට ජයග්‍රහණය ලබාගැනීමට මහෝපකාරී වූ මේජර් කෙලිගේ සේනාංකයද මාලිගය ඉදිරියෙහි වූ චතුරස්‍රයෙහි ආයුධ සන්නද්ධව පෙළ ගැසී සිටියහ. අනතුරුව උඩරට රාජධානියේ රදළවරු, ප්‍රධාන නායකයන් සමග මඟුල් මඩුවේ දොරටුව දක්වා පෙළගැසී සිටි හමුදා බළකාය මැද්දෙන් පියනගන්නට වූහ.

බ්‍රිතාන්‍ය ආණ්ඩුව යටතේ කිසිම නිලයක් දැරීමට අසතුටුව 'බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ මිත්‍රයා' යන නාමයෙන් පමණක් පෙනී සිටීමෙන් සෑහීමකට පත්වන බව පැවසූ ඇහැලේපොල මහ නිලමේතුමා ප්‍රථමයෙන්ම හුදෙකලාවේම ශාලාවට ප්‍රවිෂ්ට විය. ආණ්ඩුකාරයා විසින් එතුමා මහත් හරසරින් පිළිගනු ලැබීමෙන් පසු ආණ්ඩුකාරවරයාගේ දකුණු පසින් අසුන් ගන්නට යෙදුණි.

මේ අවස්ථාවේදී මහ අදිකාරම ලෙස කටයුතු කරමින් මොල්ලිගොඩ මහ නිළමේතුමා ඊට පසු ඇතුළු වූයේ ප්‍රාදේශීය දිසාවරු හා අනෙකුත් ප්‍රධානීහුද සහපිරිවර කොටගෙනය. මොවුන් ඇතුළු වන විට ආණ්ඩුකාරවරයා සහ ඇහැලේපොළ මහ නිලමේතුමාද හුන් අසුන්වලින් නැගිට ඔවුන් පිළිගත්හ. උඩරට නිල ඇඳුමින් සැරසුණු සිංහල නායකයන්ගෙන්ද මුලසුනෙහි සිටි ආණ්ඩුකාරවරයා සහ ඔවුන් වටකොට දෙපසින් පේළියට සීරුවෙන් හුන් ඉංග්‍රීසි හටයන්ගෙන්ද සුසැදුනු ශාලාව ඉමහත් සිරියක් ඉසිලීය.

ආණ්ඩුකාරවරයා විසින් සිංහල නායකයන් හා සමඟ කෙරුණු සතුටු සාමිචි කථාවලින් පසු සභාවේ වැඩ අරඹන ලදී. සිංහල නායකයෝද ආණ්ඩුකාරවරයාගේ තොරතුරු විමසීමෙන් තුටු පහටු වූහ. අනතුරුව සභාව ඇමතූ ආණ්ඩුකාරවරයාගේ තව හමුදා සේනාංකයන් උඩරට ජයගැනීමට නා නා දිසාවලින් ගමන් ගන්නා විට ඒ ඒ දිසාවරුන් දක්වන්නට යෙදුණු සැලකිලිවලට ස්තූතිය ප්‍රකාශ කළේය. මෙහිදී තමාගේ හා යුද සේනාවේ පැමිණීමෙන් සිංහල වැසියන් කෲරතර ආඥදායකත්වයකින් මුදාගැනීමට හැකිවූ බව ඒත්තු ගැන්වීමට සමත් විය.

තමන්ට හා තම සේනාවට සිංහල වැසියන් ආඥදායකත්වයෙන් ගලවා ගැනීමට හැකිවීම පිළිබඳ ප්‍රීතිය පළ කරමින් තවදුරටත් කතා කළ ආණ්ඩුකාරවරයා පුද්ගලික නිදහස මෙන්ම දේපොළ ඇතුළු අනෙකුත් සියලුම අයිතිවාසිකම් රැක දෙන බවට පොරොන්දු වෙමින් තමා රට පාලනය කරන කාලපරිච්ඡේදය තුළ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ සාධාරණ ආශිර්වාදය සිංහලයන්ට ලබාදෙන බවට ප්‍රතිඥා දුන්නේය.

ඊට පසු බ්‍රිතාන්‍ය ආණ්ඩුවට රට පවරාදීම හා එහි පාලනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්ම ගිවිස ගන්නා ලද, කලින් පිළියෙළ කරගත් ලියකියවිල්ලක් ඇති බව සිංහලයේ නායකයන් වෙත දන්වන්නට යෙදුණි. එය කියවීමට අනුමැතිය ලබාගැනීමෙන් පසු ආණ්ඩුකාරවරයාගේ නියෝජ්‍ය ලේකම් ජේම්ස් සදර්ලන්ඩ් මහතා විසින් එදා ඉංග්‍රීසියෙන් කියවන ලදුව ඒබ්‍රහම් ද අල්විස් වාසල මුදලි විසින් සිංහලෙන් කියවන්නට යෙදුණි.

සිංහල නායකයන් සියලු දෙනා මෙම ලේඛනය කෙරෙහි ගෞරව සම්පන්න තියුණු කල්පනාවකින් යුතු අවධානයක් යොමු කළ අතර, නිශ්ශබ්දතා නිමග්නව ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ සුහද එකඟත්වය පළකර සිටීම සතුටට කාරණාවක් විය.

ආණ්ඩුකාරවරයා විසින් ගිවිසුමට අදාළ කරුණු පිළිබඳ පැහැදිලි විස්තරයක් ඩොයිලි මහතාට දැන්වීමෙන් පසු ඔහු එම කරුණු මොල්ලිගොඩ අදිකාරම වෙත දන්වන ලදුව




මොල්ලිගොඩ මහ අදිකාරම්තුමා ඒ අදහස් සභාවට තවත් පැහැදිලි ලෙස විස්තර කළේය. මේ මුළු සභා ගර්භයේම දැනුමෙන් මෙන්ම හැඩරුවින්ද තේජස් විලාසයක් හා පැසුණු බවක් පළ කරමින් සිටි ප්‍රසන්න සිරුරකින් යුතු පුද්ගලයකු විය. උසින් හා මහතින් වැඩුණු ඔහුගේ දේහය සභාවේ ඉහළින් මතුවී පෙනුණේය. කැපී පෙනුණු පුළුල් නළල් තලයකින් හා දීප්තිමත් එහෙත් තැන්පත් නෙත් සඟලකින්ද, සුදට සුදේ දිගට වැඩුණු රැවුලකින්ද යුතු මේ පුද්ගලයා හැඳ සිටි තුප්පොට්ටිය, සැට්ටය හා පැළඳ සිටි සතර මුළු තොප්පියද නිසා දක්ෂ චිත්‍ර ශිල්පියකුගේ තෙළි තුඩින් බිහි කළ හැකි අගනා චිත්‍රයකට උචිත දර්ශනයක් ගෙන හැර පෑවේය.

හේ අන් කවරකුවත් නොව ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ ප්‍රියතම නායකයකු මෙන්ම එතුමාගේ අවසාන කාලය දක්වා රාජ සේවයේ යෙදුණු ගොඩපොළ මිල්ලව දිසා මහත්තැනය. මිල්ලව දිසා මහතැන අනෙකුත් නායකයන් ගිවිසුම සම්බන්ධයෙන් කළ සාකච්ඡාවලට නිහඬව සවන් දෙමින්ද නා නා කාරණා පැහැදිලි කර දෙමින්ද සියලුදෙනාගේ සම්මුතිය ලබා ඒ බව මොල්ලිගොඩ මහ අදිකාරම්තුමා වෙත දන්වන්නට යෙදුණි.

ඇහැලේපොළ නිලමේ තුමා ප්‍රධානත්වයක් ගෙන මෙම සාකච්ඡාවට සහභාගි නොවුවද, සිදුවන හැම කටයුත්තක් කෙරෙහිම විශේෂ සැලකිල්ලකින් පසු විය. එතුමා තේජාන්විත ලීලාවෙන් හා සිත් ගන්නා අයුරින්ද සැදී පැහැදී සිටි අතර කරුණාන්විත කතාවෙන්ද යුතු විය.

ඊට පසු මොල්ලිගොඩ මහ අදිකාරම්තුමා හා අනෙකුත් නායකයන්ද මගුල් මඩුවේ දොරටුව වෙත පැමිණියහ. ඉන් පිටත රැස්ව සිටි නා නා දිසාවල මොහොට්ටාලවරු, කෝරාළවරු, විදානේවරු හා ගම්මුලාදැනිවරුද ඔවුන් සමග පැමිණ සිටි පිරිස ද අමතා කතා කළ මොල්ලිගොඩ මහ අදිකාරම්තුමා ඒ ඒ දිසාවල වැසියන්ට පිළිවෙළින් රැස්වන ලෙස කීහ.

එහිදී මුදලිවරයා විසින් යළිත් ගිවිසුම සිංහලෙන් කියවන ලදී. අනතුරුව ඉංග්‍රීසි ධජය මහනුවර අහසේ ප්‍රථම වරට ළෙල දෙන්නට වූ අතර නගරයේ කාලතුවක්කුවලින් නැගුණු වෙඩිමුර ආධාරයෙන් මුළු මහත් ශ්‍රී ලංකාද්වීපයම බ්‍රිතාන්‍යයේ තුන්වැනි ජෝර්ජ් මහාරාජෝත්තමයාණන් වහන්සේගේ අණසකට පත්වූ බව ප්‍රකාශ විණි.

(උඩරට ගිවිසුම - නුවරඑළියේ හේමපාල පිටු 14-18)

### ජෝන් ඩොයිලි තම දින පොතේ මෙසේ සඳහන් කරයි.

මාර්තු මස 02 වැනි දින (1815) මඟුල් මඩුවේදී සවස 4.00 ට පමණ ආණ්ඩුකාරයා විසින් කන්ද උඩරට පළාත් පිළිබඳ සකස් කරන ලද රාජ්‍ය ආඥා පනත කියවන ලදී. එය ඇසීමට අදිකාරම්වරු, දිසාවේවරු හා අනෙක් උඩරට ප්‍රභූන් පැමිණ සිටියහ. පසුව මොහොට්ටාලවරු හා පහත් නිලදරයන් හැර අනෙක් වැදගත් ප්‍රභූන්ටද කියවන ලදී. රාජකීය ධජය ඔසවන ලදී. රාජකීය ආචාරය පවත්වන ලදී. යහපත් උණුසුම් දිනයකි. අහස පැහැදිලිය.

### මේ පිළිබඳව වෛද්‍ය හෙන්රි මාර්ෂල් මෙසේ කියයි.

ගරුගම්භීර සම්මේලනයක් හෙවත් සභාවක් මාර්තු මස 2 වැනි දින මහනුවර මාලිගාවේ මඟුල් මඩුවේදී පවත්වන ලදී. මෙහිදී මහරජතුමාණන් හා රාජ්‍ය පාලක කුමාරයාණන්

8 වන පිටුව බලන්න

### ■ මහ දිසාවේ බංඩාර ඇටිපොළ

සිංහලේ අවසාන රාජකීයයා වූ ශ්‍රී වික්‍රමරාජසිංහ රජු (ක්‍රි.ව. 1798 - 1815) ඉංග්‍රීසීන්ගේ අත්අඩංගුවට පත්වීමෙන් ඉක්බිතිව උඩරට ප්‍රදේශ පාලනය පිළිබඳ සමතයක් ඇතිකර ගනු වස් කටයුතු ලහිලහියේ සංවිධානය කෙරිණි.

මෙහි ප්‍රධාන වගකීම භාර වූයේ උඩරට ආක්‍රමණය සාර්ථක කරගනු වස් උපාය ඥානය මෙහෙය වූ විශිෂ්ට රාජතාන්ත්‍රිකයකු වූ ජෝන් ඩොයිලිටය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු විසින් කෙටුම්පත් කොට සකස් කරන ලද උඩරට ගිවිසුම වර්ෂ 1815 මාර්තු මස 02 වැනි දින පෙරවරු 4.00 හෝරාවට අති උත්සවාකාරයෙන් රාජ මාලිගයේ මගුල් මඩුවේදී පැවැත්විණි. සිංහලයේ ස්වාධීනත්වය තීරණාත්මක ලෙස තුරන් කරන අවසාන ජවනිකාව ලෙස මෙම ඓතිහාසික සිදුවීම තත්ත්වාකාරයෙන් දැකගනු වස් හැකි එකම මාර්ගය නම් ඒ වකවානුවේදී ලේඛනගත කරන ලද ලිපි ලේඛන මැනවින් විමර්ශනයට ලක් කිරීමයි.

එදා සිංහල පක්ෂය වෙනුවෙන් නිල වාර්තා කිරීමක් සිදු නොවුණු නමුදු ඉංග්‍රීසි පක්ෂය වෙනුවෙන් පමණක් නිල වශයෙන් වාර්තා කිරීමක් සිදුවිය. එහි සත්‍ය අසත්‍ය කුමක් වුවද වර්ෂ 1815 මාර්තු මස 02 වැනි දින ඓතිහාසික මගුල් මඩුවේදී ප්‍රකාශයට පත්වුණු උඩරට ගිවිසුම පිළිබඳ වාර්තාමය සටහන පිළිබඳ ඉංග්‍රීසීන්ගේ නිල වාරිකය වූ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ වර්ෂ 1815 මාර්තු මස 06 වැනි දින මෙසේ සඳහන් විය.

### බ්‍රිතාන්‍ය මූලස්ථානය මහනුවර 1815 මාර්තු 02

මහ රාජෝත්තමයාණන් වහන්සේගේ ආණ්ඩුව කන්ද උඩරට දිසාවල පිහිටුවාලීම සඳහා මුලින් ඇති කරගන්නා ලද සම්මුතියේ කොන්දේසිවලට අනුව පිළියෙල කරන ලද්දා වූ ප්‍රසිද්ධ ලේඛනයන් හෙවත් ගිවිසුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලදුව එය පළමුව ඉංග්‍රීසියෙන්ද දෙවනුව සිංහලෙන්ද කියවීමෙන් පසු ඒකමතික තීරණයකට එළඹ ගන්නා ලදී.

බ්‍රිතාන්‍යයේ අති උතුම් රිජන්ට් කුමාර මහ රාජෝත්තමයාණන් වහන්සේ හා හමුදා සේනාධි නායකයානෝ එක් පාර්ශ්වයකින්ද, අදිකාරම්වරු, දිසාවේවරුද ඇතුළු මහනුවර දිසාවේ ප්‍රධානීහු අනෙක් පාර්ශ්වයෙන්ද රටවැසියන් වෙනුවෙන් රැස්වී මොහොට්ටාලවරු, කෝරාළලා, විදානේලා ආදී රට ඇතුලේ සුළු ප්‍රධානීන් හා වැසියන්ද මහත් සමූහයක් ඉදිරිපිටදී අද දින රජ මාලිග අභ්‍යන්තරයේ මගුල් මඩුවේ ශාලාවේදී අතිගරු ගම්භීර සම්මන්ත්‍රණයක් පවත්වන්න යෙදුණි. මහ රාජෝත්තමයාණන් වහන්සේගේ ආණ්ඩුව, කන්ද උඩරට දිසාවල පිහිටුවීම සඳහා මුලින් ඇති කරගන්නා ලද සම්මුතියේ කොන්දේසිවලට අනුව පිළියෙල කරන ලද්දාවූ ප්‍රසිද්ධ ලේඛනයක් හෙවත් ගිවිසුම් පත්‍රයක් ඊට පෙර ඉදිරිපත් කරන ලදුව එය පළමුව ඉංග්‍රීසියෙන්ද දෙවනුව සිංහලෙන්ද කියවීමෙන් පසු ඒකමතික තීරණයකට එළඹ ගන්නා ලදී.

ඊට පසු ප්‍රථම වරට ඉංග්‍රීසි ධජය එසවීමෙන් පසු නගරය දෙසින් නැගුණු කාලතුවක්කු වෙඩි මුර ආචාරයකින් රට අභ්‍යන්තරය බ්‍රිතාන්‍ය යටත් විජිතය යටතට පවරා ගන්නා ලද බව පළ විණි.

දසත Dasatha

## උඩරට ගිවිසුම...

7 වන පිටුවෙන්

වෙනුවෙන් (කියන ලද පරිදියි) අදිකාරම්වරුද දිසාපතිවරුද උඩරට පළාත්වල අනෙක් ප්‍රධාන නිලමේවරුද පෙනී සිටියෝය. ඉහත සඳහන් පරිදි මේ සාකච්ඡා සභාව පවත්වන ලද්දේ මාලිගාවේ මහ මඟුල් මඩුවේය. එහෙත් මෙවැනි අවස්ථාවන්හිදී රජතුමා සිරිත් වශයෙන් පරිහරණය කළ යාබද කාමරය පරිහරණය කිරීම ආණ්ඩුකාර තැන ප්‍රතික්ෂේප කළේය. උත්සව අවස්ථාවන්හිදී රජතුමා මෙහි තිබුණු උස් සිංහාසනයෙක බද්ධපර්යංකයෙන් වාඩිවී සිටියේය. ශාලාවේ ඉහළ කෙළවරේ පිහිටි මේ කාමරය තිරයකින් වෙන් කොට තිබිණි. මේ අවස්ථාවේදී ආණ්ඩුකාර තැන කාමරයේ දොරට පිටුපා සිටියේය.

මහනුවර ආරක්ෂක භට පිරිසට අයත් හේවායෝද මේ අවස්ථාව සඳහා මහනුවරට ගෙන්වන ලද ලංකා අශ්වාරෝහක හමුදාවේ භටයෝද සවස තුනට මාලිගාව ඉදිරිපිට පිහිටි විශාල චතුරශ්‍රයේ දෙවටක් සෑදෙන සේ පෙළගැස්වන ලදහ. අදිකාරම්වරුද අන්‍ය ප්‍රධාන නිලමේවරුද මේ දෙවට මැදින් ශාලාවට පැමිණියහ.

මේ උත්සව සභාව චාරිත්‍ර විධි නොඉක්මවා පැවැත්විණි. මඟුල් මඩුවට පළමු කොට පිවිසුණේ අතිශයින් ශෝභන, බුද්ධි සම්පන්න පෙනුමකින් යුතු ඇහැලේපොළය. ආණ්ඩුකාරතුමන් විසින් සුවිශේෂ ගෞරවයෙන් පිළිගන්නා ලද ඔහු ආණ්ඩුකාරතුමන්ගේ දකුණුපසින් පුටුවක වාඩිකරවන ලදී. පළමු වැනි අදිකාරම් පදවියට පත් කරනු ලැබූ මොල්ලිගොඩ, දිසාපතිවරුන්, අනෙක් ප්‍රධාන නිලමේවරුන් ඇතුළු විසිදෙනකු පමණ පිරිවර, පිළිගුට පැමිණියේය. ආණ්ඩුකාරතුමා ඔවුන් පිළිගැනීමට නැගිට සිටියේය. සභාව මුළු දෙවුණු මුළු කාලය තුළ ඇහැලේපොළ ඇතුළු හැම දෙනම නැගිට සිටියෝය. ශාලාවේ දෙපස බ්‍රිතාන්‍ය නිලධාරයෝ පෙළගැසී සිටියෝය.

සාකච්ඡාව ඇරඹුණේ නිලමේවරුන් විසින් අසන ලද අභිනන්දනාත්මක ප්‍රශ්නවලිනි. මෙයට ස්තුති පූර්වකව පිළිතුරු දුන් ආණ්ඩුකාරතුමා පෙරළා ඔවුන් ගෙනුදු එබඳු ප්‍රශ්න ඇසීය. ආණ්ඩුකාර තැන, බ්‍රිතාන්‍ය යුද්ධ භටයන් මහනුවර කරා එන විට දැක්වූ සැලකිල්ල ගැන දිසාපතිවරුන්ට ස්තුති කෙළේය. ඔවුනට සැලකිලි දක්වන ලද්දේ ආරක්ෂකයන් වශයෙනි. ආණ්ඩුකාරතුමා හා යුද සෙනඟ මහනුවරට පැමිණීමෙන් දුෂ්ට පාලනය හා හිංසා පීඩා අවසන් විය. ඔවුන් නිදහස් කරගත හැකිවීම ගැන තම සතුට පළ කළ ආණ්ඩුකාරතුමා ඔවුන්ගේ ජීවිත, දේපළ හා අයිතිවාසිකම් මුළුමනින් ආරක්ෂා කරන බව සහතික කොට, ඔහු මේ දිවයිනේ පාලන බලය දරන කාලය තුළ ඔවුන්ට මහ රජතුමන්ගේ දයාන්විත ආණ්ඩුවේ ආශිර්වාදය භුක්ති විඳීමට ඉඩ දීම තම විශේෂ ප්‍රයත්නයයි පැවසීය.

උඩරට පාලනය සම්බන්ධයෙන් මහරජතුමන්ගේ රජය අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිපත්ති විදහා දක්වෙන ලිපියක් සම්පාදනය කොට ඇතැයිද එය මොහොතකින් කියවනු ලබේ යැයිද ප්‍රධානයන්ට දන්වන ලද්දේ මේ අවස්ථාවේදීය. ඔවුහු එය කියවන ලෙස ඉල්ලා සිටියෝය. රජයේ උප ප්‍රධාන ලේකම් තැන්පත් සදර්ලන්ඩ් මහතා විසින් මේ ලිපිය හෙවත් ගිවිසුම් පත්‍රයයි හැඳින්වෙන ප්‍රකාශ පත්‍රය ඉංග්‍රීසියෙන් කියවන ලදී. පසුව සිංහලයෙන්ද කියවන ලද්දේය. මේ සාකච්ඡාවේදී ගරුතර ආණ්ඩුකාරතුමන් විසින් දැන්විය යුතු දෑ ඩොයිලි මහතාට පවසන ලදුව ඔහු විසින් මොල්ලිගොඩ අදිකාරමට දන්වන ලදී. ඔහු ඒ කරුණු රැස්වූ පිරිසට ශබ්ද නගා පැවසීය.

මේ රැස්වීමේදී කථිකයා වශයෙන් ක්‍රියා කෙළේ වෙල්ලස්සේ දිසාවේ තැන්පත් මිල්ලවය. ඔහු ප්‍රධානයන්ගේ හැඟීම් වැඩි වශයෙන් නිහඬවද එහෙත් ඉඳහිට කරුණු පැහැදිලි කරදීමෙන් පසුවද රැස්කොටගෙන මොල්ලිගොඩට කී බව පෙනිණි. ඇහැලේපොළ නිල බලයෙන් සාකච්ඡාවට සහභාගි නොවූ නමුදු කෙරෙන කටයුතු ගැන සාවධාන වූ බව පෙනිණි. සත්‍ය කතා විලාසය, ආචාර සම්පන්න බව හා ස්වභාවිකත්වය නිසා ඔහුගේ හැසිරීම විශිෂ්ට විය. රැස් වූ නිලමේවරුන් උසස් ගෞරව සම්මාන සහිතව ඔහුට සලකන බව දක්නට ලැබුණේය.

ගිවිසුම් පත්‍රය සිංහල භාෂාවෙන් කියවූ පසු මොල්ලිගොඩ අදිකාරම සහ අනෙක් ප්‍රධානයෝ, අනුගාමිකයන් ටික දෙනකු සමග ඒ ඒ පළාත්වලින් පැමිණි මොහොට්ටාලලා, කෝරාලලා, විදානෙලා හා අනෙක් සුළු මුලාදෑනිවරු රැස්ව සිටි මඟුල් මඩුවේ ප්‍රධාන දොරටුව වෙත ගියෝය. අදිකාරම් තැන ඒ මුලාදෑනීන්ට පළාත් අනුව පෙළගැසෙන සේ නියම කොට ගිවිසුම් පත්‍රය නැවතත් සිංහලයෙන් කියවීය. මෙයින් පසු බ්‍රිතාන්‍ය ධජය පළමුවැනි වරට මහනුවර නගරයේ ඔසවන ලද්දේය. කඳු දිගේ බලවත් පරිශ්‍රමයෙන් ඇදගෙන එන ලද කාලතුවක්කුවෙන් රාජකීය වෙඩිමුර ආචාරයක් පැවැත්වීමෙන් තුන් වැනි ජෝර්ජ් මහ රජතුමා මුළු ලංකාද්වීපයේ මහ රජු යැයි ප්‍රකාශ කරන ලදී. මහනුවරට පෙරළා පැමිණ සිටි නගර වැසියෝ මාලිගාවේ පවත්වන ලද කටයුතු පිළිබඳ කිසි සැලකිල්ලක් නොදැක්වූහ. ඔවුහු මඟුල් මඩුව අබිමුඛයෙහි පිහිටි මහ මළුවේ පැවැති පෙළපාලියට සහභාගි වූ යුද සෙනඟ දෙස බැලීමට පවා තම ගෙදර දොරේ කටයුතු අත් නොහැළහ. ඔවුන් පෙරදිග රජ පෙළපතකට හිමිව පැවැති රාජ්‍යය යුරෝපීය රජ පෙළපතකට පැවරීම උපේක්ෂා සහගතව සැලකූ බව පැහැදිලිය. (සිංහලේ 137-139 පිටු)

### ප්‍රවීණ ඉතිහාසඥයකු හා නීතිවේදියකු වූ ශ්‍රීමත් පෝල් ඊ පීරිස් මහතා මෙසේ කියයි.

ගිවිසුමෙහි අන්තර්ගතය ව්‍යාකූල වුවද එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රධාන නායකවරු සැකයකින් තොරව වටහා ගත්හ. එනමුදු එහි සිංහල අනුවාදය ශක්ෂයකුගේ වටහාගැනීමේ ශක්තිය අභිබවා යන සංකීර්ණ වාක්‍යවලින් යුක්ත විය. නුහුරු කොන්දේසි හා ආගන්තුක හා විදේශීය මනෝභාවයන් සියල්ල දේශීය සළුපිළිවලින් සරසා තිබූ ආකාරයක් දක්වා තිබුණි. කෙසේ වුවද අති දක්ෂ ඒබ්‍රහම් ද සේරම් මේ දිගු ලේඛනයේ හරය වටහා ගෙන කියවූ බවට සැක නැත්තේ මෙවැනි අධිකරණ රාජකාරි පිළිබඳ ඔහුට තරම් පරම්පරාගත පුරුද්දක් තිබූ හෙයිනැයි සිතිය හැක. පළමුවරට මෙය කන වැකෙන අයකුට නම් ඔවුනතර සිටි මලබාර් (නායක්කාර්) රජු වෙනුවට ඈත දුර රටක වෙසෙන යුරෝපීය රජෙකුගේ ආදේශය පිළිබඳව නිශ්චිත හැඟීමක් එල විය හැකි වුවද, තමන්ගේ ආගම සහ සිරිත් විරිත් චාරිත්‍ර, සම්ප්‍රදායික නීති ඉදිරියට ගෙන යෑමට ඒ වෙනස බලනොපාන බැව් හැඟවිය.

- (Sinhale and the Patriots - 1950)

ඉහත සඳහන් ඓතිහාසික විස්තරවලට අනුව වර්ෂ 1815 මාර්තු මස 02 වැනි දින ඓතිහාසි මඟුල් මඩුවේදී සිදුව ඇත්තේ උඩරට ගිවිසුම පිළිබඳව ගම්භීර සම්මන්ත්‍රණයකි. එහිදී අත්සන් කිරීමක් සිදුවී නොමැත. මෙම උඩරට ගිවිසුමේ වගන්ති 12 එදින රැස්ව සිටි පිරිසට සිංහල, ඉංග්‍රීසි යන භාෂා ද්වයෙන්ම පැහැදිලි කිරීමේ අවස්ථාවක් මිස අත්සන් තැබීමේ නීතිමය අවස්ථාවක් නොවේ. මේ දිනය වන විට උඩරට ප්‍රධානීන් විසින් දරන ලද තනතුරු සියල්ල/රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා විසින් අහෝසි කර දමා තිබුණ බැවින් මෙම උඩරට ගිවිසුමට අත්සන් කිරීමට උඩරට ප්‍රධානීන්ට නීතිමය බලයක් නොවීය. මෙකී බලතල ඔවුනට නැවත ලබාදෙන ලද්දේ වර්ෂ 1815 මාර්තු මස 03 වැනි දිනය.

### උඩරට ගිවිසුම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව කටයුතු කර ඇත්තේ අදියර තුනකිනි.

1. උඩරට ගිවිසුම කෙටුම්පත් කිරීමේ අවස්ථාව. (මෙම කාර්යයෙහිලා ඉංග්‍රීසි පාර්ශ්වය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ටසිද්ධ කරන ලද්දේ සිංහල භාෂාව පිළිබඳ හසල දැනුමකින් හෙබි භාෂා පරිවර්තක ජෝන් ඩොයිලිය.)
2. උඩරට ගිවිසුමේ වූ වගන්ති ප්‍රසිද්ධියේ කියවීමේ අවස්ථාව (මෙම අවස්ථාවේදී උඩරට ගිවිසුමේ ඇතැම් වගන්ති (එනම් 5 වැනි වගන්තිය) පිළිබඳව විරෝධතා පැන නැගී ඇත)
3. අත්සන් තැබීමේ අවස්ථාව. (මෙම අවස්ථාවේදී පැන නැගුණ විරෝධතා නිසා අත්සන් තැබීම අවස්ථා කීපයකින් සිදුවී ඇත. මෙම උඩරට ගිවිසුමට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා ඇතුළු නිලමේවරුන් කීපදෙනකු මාර්තු මස 10 වැනි දින අත්සන් තැබූ බව ඩොයිලිගේ දිනපොතේ වැඩිදුරටත් සඳහන් වේ.)

ඩොයිලිගේ දිනපොතෙහි සඳහන් කරුණු කාරණාවලට අනුව උඩරට ගිවිසුමට අත්සන් තැබූ වේලාවන් - දිනයන් පිළිබඳව පවතින පරස්පරතාවලින් පෙනී යන්නේ එය මඟුල් මඩුවේදී කියවන අවස්ථාවේදී මහත් විරෝධතා පැන නැගුණු බවයි.

මෙකී සියලුම කරුණු කාරණා විමර්ශනය කර බලන කල්හි අපට ගම්‍ය වනුයේ වර්ෂ 1815 මාර්තු මස 02 වැනි දින ඓතිහාසික මඟුල් මඩුවේදී උඩරට ගිවිසුම අත්සන් නොකළ වග නොවේද?

### උඩරට ගිවිසුම වගන්ති 12 කින් සමන්විතය. ඒවා සැකෙවින් මෙසේය.

1. වැනි වගන්තියෙන් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කෲර හා දුර්දාන්ත පාලනය පිළිබඳව ප්‍රකාශ විය.
2. වැනි වගන්තිය - රජු රාජත්වයෙන් නෙරපන ලද බවත් ඔහුගේ පවුලේ උදවිය හා නෑදෑ පරපුරට සදහටම රාජ්‍යත්වය අහිමි කළ බවත් කන්ද උඩරට ප්‍රදේශවල ආදිපත්‍ය පිළිබඳ මලබාර් (එනම් වර්තමාන කේරළයේ) වංශයට තිබුණු අයිතිවාසිකම් අවලංගු කර දැමූ බවත් ප්‍රකාශ විය.
3. වැනි වගන්තිය - ශ්‍රී වික්‍රමරාජසිංහ රජුගේ පිරිමි පාර්ශ්වයේ නෑදෑයින් උඩරට රාජධානියේ සතුරන් වශයෙන් අච්චු තබා ඔවුනට ඉංග්‍රීසි ආණ්ඩුවේ නිසි බලපත්‍රයක් නොමැතිව උඩරට ප්‍රදේශවලට ඇතුළුවීම සපුරා තහනම් කරන බව ප්‍රකාශ විය.
4. වැනි වගන්තිය - බ්‍රිතාන්‍ය ආණ්ඩුව මගින් පාලන නිලධාරීන් පත්කරන බවත් ඔවුන් වෙත පෙර පරිදිම බලතල පවරන බවත් සිංහල සිරිත් විරිත් ගරු කරමින් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයකු හා දිසාපතිවරු විසින් රටේ පාලන කටයුතු ගෙන යන බවටත් පොරොන්දු විය.
5. වැනි වගන්තිය - උඩරට ප්‍රධානීන් හා සාමාන්‍ය වැසියන් අදහන බුද්ධාගමත්, බුද්ධ ශාසනයත් දේව

19 වන පිටුව බලන්න

1 වන පිටුවෙන්

## නිවාස වෙළඳපොළ...

ප්‍රතිශතයක් වශයෙන් ගත් කල එය සියයට 34.9 ක පහත වැටීමක් ලෙස දැක්විය හැක.

කලාපය තුළ විකුණනු ලබන තනි මාදිලියේ නිවාසයක සාමාන්‍ය මිල සියයට 12.4 කින් පහත වැටී ඇති අතර එය සංඛ්‍යාත්මකව ඩොලර් 767,818 ක් ලෙස දැක්වේ.

ටොරොන්ටෝ දේපළ වෙළඳාම් සංගමය මගින් සිදුකළ නිරීක්ෂණයකට අනුව මිලෙන් වැඩිම නිවාස මාදිලිය Detached නිවාසයි (තනි මාදිලියේ නිවාස). වෙළඳපොළ තත්ත්වය පහත වැටීම තුළ මෙම Detached නිවාසයන්හි විකුණුම් සහ ගැනුම් මිලද යම් මට්ටමකින් පහත වැටීමට බලපෑ හැකි නමුත් එය එතරම් විශාල ලෙස වෙතැයි අපේක්ෂා කළ නොහැකි බව ඒ පිළිබඳ විශේෂඥයෝ පවසති. තනි මාදිලියේ නිවාස මිල ගණන්හි පවතින ඉහළ මිල නිසා මේ වන විට ටවුන්හවුස් නිවාස සහ කොන්ඩොමිනියම් නිවාසවල ඉල්ලුම තරමක් ඉහළ ගොස් ඇතැයි වාර්තා පෙන්වා දේ.

ෆෙඩරල් රජය විසින් නිවාස උගස් ණය සම්බන්ධයෙන් ගෙන ආ නව නීති රෙගුලාසි හා පළාත් රජය විසින් ගෙන ආ විවිධ නීති රෙගුලාසි ටොරොන්ටෝව ඇතුළු ආසන්න නගරවල නිවාස වෙළඳපොළ තත්ත්වය පහත වැටීමට ප්‍රධාන වශයෙන් බලපෑම් එල්ල කළ හේතු විය.

නමුත් ෆෙඩරල් රජය විසින් නිවාස උගස් ණය සම්බන්ධයෙන් ගෙන ආ නව නීති රෙගුලාසි ක්‍යුබෙක් පළාතේ මොන්ට්‍රියල්හි නිවාස වෙළඳපොළ මන්දගාමී කිරීමට බල පා නොමැති බව ඒ පිළිබඳව ඇති වාර්තා හෙළි කොට සිටී. 2012 වසරේ සිට සලකා බැලීමේදී වඩාත්ම කාර්යබහුල මාසය පසුගිය පෙබරවාරි මාසය බව මොන්ට්‍රියල් දේපළ වෙළඳාම් සංගමය පවසා සිටී. පසුගිය කාලයේදී ටොරොන්ටෝවේ සිදුවූ අසාමාන්‍ය මිල වැඩිවීම තරම් නොවුවත් පසුගිය මාසයේදී මොන්ට්‍රියල් හි නිවාස විකුණුම් සියයට පහකින් වැඩි වී ඇති බවත් සියලුම දේපළවල මිල ගණන් ඉහළ ගොස් ඇති බවත් සඳහන් වේ.

ඒ අනුව මොන්ට්‍රියල් ප්‍රධාන නගරය (Greater Montreal) තුළ තනි මාදිලියේ නිවසයක් ඩොලර් 310,000 ලෙසද (පසුගිය වසර කීපය සමග සංසන්දනය කිරීමේදී සියයට 6 ක ඉහළ යෑමක් පෙන්වයි), නිවාස කීපයක් සහිත Plexes මාදිලියේ නිවසක් ඩොලර් 481,000 ක් ලෙසද (මෙය සියයට 1 ක ඉහළ යෑමක් පෙන්වයි), කොන්ඩොමිනියම් නිවසක් ඩොලර් 250,000 ක් ලෙසද (මෙය සියයට 5 ක ඉහළ යෑමක් පෙන්වයි) ඉහළ ගොස් ඇත.

මේ අතර ටොරොන්ටෝවේ නිවාස වෙළඳපොළ තත්ත්වය පිළිබඳව සඳහන් කරන ටොරොන්ටෝ දේපළ වෙළඳාම් සංගමය පවසන්නේ වර්තමානයේදී වෙළඳපොළට විකිණීම සඳහා පැමිණෙන නිවාස සංඛ්‍යාවේද සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබෙන බවයි. පසුගිය වසරේ පෙබරවාරියේදී නිවාස 13,362 ක් වෙළඳපොළ තුළ දක්නට ලැබුණු අතර මේ වසරේදී එය 10,520 දක්වා අඩු වී ඇත.

එළඹෙන වසන්ත සහ ගිම්හාන සමයේදී මෙම තත්ත්වයෙන් බැහැර වී ගොස් නැවතත් නිවාස වෙළඳපොළ යථා තත්ත්වයට පත්වනු ඇතැයි ටොරොන්ටෝ දේපළ වෙළඳාම් සංගමය විශ්වාසය පළ කොට සිටී.

## කැනඩා මහ බැංකුව...

මෙවර මහ බැංකුව පොලී අනුපාතය නොවෙනස්ව පවත්වාගෙන යාමට තීරණය කර ඇති අතර මීළඟ පොලී අනුපාත නිවේදනය අප්‍රේල් 18 වෙනි දින ඉදිරිපත් කිරීමට නියමිත බව දන්වා සිටී.


SRI LANKA'S NO.1
TRICO
TRICO MARITIME
(Sole Authorized Agent of
Trico Meritime (Pvt) Ltd. Sri Lanka)
The first Customs Bonded Warehouse for Personal Effects and gift items clearance in Sri Lanka
Serving People Worldwide Reliably for 35 Years
SRI LANKA'S BEST AND LARGEST CLEARING FACILITIES IN THREE MAJOR CITIES SINCE 1980
COLOMBO
GALLE
KURUNEGALLA
DOOR TO DOOR SERVICE
to any part of Sri Lanka
special service to
Colombo, Jaffna, Kilinochchi, Batticaloa, Trincomalee, Vavuniya & Mannar
NEW
INTERNATIONAL COURIER
DOCUMENTS & PARCEL SERVICE WORLDWIDE
-OVER 220 COUNTRIES-
TRICO
SINCE 1976
TRICO MARITIME FREIGHT FORWARDING CANADA INC.
TORONTO: DERRICK ANTON
647.833.3020 | 416.335.8800
Our Canadian Agents
OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL) • VANCOUVER: 604 219 6232 (VIJE)
CALGARY: 403 971 6721 (SAMAN) • ALBERTA : 587 708 5665 (TONY) • WINNIPEG: 204 800 2364 (MANGALIKA)
Trico Maritime Customer Services & Warehouses in Sri Lanka
HEAD OFFICE
Trico Maritime (Pvt) Ltd
50K Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580 / 2345581
Fax: 2432000
COLOMBO WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
414/17 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2448270 / 2440114
Fax: 2432000
KURUNEGALA WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
Humbara Road Sandagala
Uhumeeya
Tel: 073 2238924 / 037 2238925
Fax: 037 2238967
GALLE WAREHOUSE
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd, Kangoda, Galle
Tel: 091 2234842
Fax: 2234841
Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On.
335 8800
email: info@tricomaritim
Intersection: Markham Road/Nashdene Road
Fax: 416 335 8848
www.tricomaritime.ca

දසත Dasatha

ඕෂෝ චින්තනය

# ජීවිතයේ තහනම් වචනය මරණය



**ප්‍රවීණ මාධ්‍යවේදී ජෝ සෙනෙවිරත්න මහතා පසුගියදා අභාවප්‍රාප්ත විය. මානවවාදී දේශපාලන ක්‍රියාකාරිකයෙකු ලෙසද ප්‍රසිද්ධියට පත්ව සිටි ඒ මහතා හිටපු පළාත් සභා අමාත්‍යවරයෙකු හා ග්‍රන්ථ පරිවර්තයෙකුද විය. ඉන්දියානු දාර්ශනිකයකු වූ ඕෂෝ ගේ සංවාද සිංහල පාඨකයාට හඳුන්වා දීමේ පුරෝගාමියෙකු ලෙස කටයුතු කළ ඔහු එම සංවාද ඇතුළත් පොත් කිහිපයක්ම ලියා පළ කරනු ලැබුණි. ජෝ සෙනෙවිරත්න මහතා විසින් ලියන ලද 'ඕෂෝ සංවාද' ඇතුළත් ලිපි වරින් වර දසත පුවත්පතේද පළ වූ අතර මෙම ලිපියද එම ලිපි අතරින් උපුටා ගත්තකි.**

**පරිවර්තනය**
**■ ජෝ.සෙනෙවිරත්න**

ආගම ගැන කරන විමසුමකදී දෙවියෝ ඇත්තෙන්ම එහි කේන්ද්‍රය වෙන්නෙ නැහැ. මරණය නැතිව කොහොමටවත් තිබෙන එකක් නැහැ. මරණය තමයි මිනිසා එයින් ඔබ්බට සොයන්න බලන්න සිද්ධ කළේ. බහුතරයක් මනුෂ්‍යයනුත් අර්ධ - මානුෂිකයි. මිනිසෙක් සැබෑ ලෙසම පරිණත මිනිසෙක් වෙන්නේ මෙන්න මේ නිගමනයට ආවාමයි. වෙනත් සෑම කෙනෙකුටම මරණය සිදුවෙනවා නම්, එවිට මම ව්‍යාතිරේකයක් වෙන්න බැහැ වරක් මේ නිගමනය ඔබගේ හෘදයේ ගැඹුරට කිඳාබැස්සාම, ඔබේ ජීවිතයෙ කවදාවත් ඒකම වෙන්නේ නැහැ. ඔබට පරණ තාලෙට ජීවිතය ඇලී ඉන්න බැහැ. එය ඔබෙන් ඉවත් කෙරෙන්නයි යන්නේ. ඔය තරමට අයිතිකර ගැනීමේ ආශාවේ සිටීමේ ඇති අරුතක්තියෙනවද එය දවසකදි අතුරුදන් වෙන්න යනව නම්. ඇයි එල්බගෙන වද විඳින්නේ. එය සදහටම පවතින්න හොයනවා නම්, ඇයි එහෙම නම් මේ තරම් අභාග්‍යයක ඉන්නේ, වේදනාවක. දුකක? ඒක යන්නයි යන්නේ. එය යන්තම් යන්නයි යන්නේ. එය කොයි වෙලාවක යනවද යන්න වැදගත් නැහැ. වේලාව ඒ තරම් වැදගත් නැහැ. අද හෙට අනිද්දා. නමුත් ජීවිතය ලිස්සා යන්නයි යන්නේ ඔබේ අත්වලින්.

ඔබ මැරෙන බව ගැන ඔබ දැනුවත් වන දවසේ, ඔබේ මරණය සම්පූර්ණයෙන්ම සත්‍යයක්. ඇත්තෙන්ම ජීවිතය ගැන අපි එකම සත්තාව මරණයයි. වෙනත් කිසිම දෙයක් මේ තරම් සම්පූර්ණයෙන් සහතික නැහැ. නමුත් කොහොම හරි අපි ප්‍රශ්නය දිගටම මඟඅරිනවා. මේ මරණය පිළිබඳ ප්‍රශ්නය. අපි වෙනත් කාරණාවල දිගටම නියැලී සිටිනවා. සමහර විට අපි ශ්‍රේෂ්ඨ දේවල් ගැන කතා කරනවා. දෙවියෝ, ස්වර්ගය සහ අපාය හුදෙක් සැබෑ ප්‍රශ්නය මඟහරින්න. හැබෑ ප්‍රශ්න දෙවියෝ නෙවෙයි, වෙන්න බැහැනේ. මොකද දෙවියෝ සමඟ ඔබට මොනවද ඇති දැන හැඳුනුම්කම? ඔබ මොනවද දන්නේ දෙවියෝ ගැන. ඔබ සහමුලින්ම නොදන්නා දෙයක් ගැන ඔබ කොහොමද විමසීමක යෙදෙන්නේ? ඒක ඉතාමත් හිස් විමසුමක් වේවි. වැඩිම වුණොත් එය කුතුහලයක් වෙන්න පුළුවන්. එය බාලවයස්කාර ළමා මෝඩ ක්‍රියාවක් වේවි.

මෝඩ මිනිස්සු දෙවියන් ගැන අහනවා. බුද්ධිමත් පුද්ගලයා අහන්නේ මරණය ගැනයි. දෙවියෝ ගැන අසමින් සිටින මිනිස්සු කවදාවත් දෙවියන් සොයාගන්නේ නැහැ. මරණය ගැන අසන පුද්ගලයා දෙවියන් සොයා ගනීවි. මරණය ඔබව පරිවර්තනය කරන නිසා ඔබේ දැක්ම, ඔබේ සවිඥනකභාවය මුවහත් වෙනවා. ඔබ සැබෑ ප්‍රශ්නය මතුකර තිබෙන නිසා, අව්‍යාජ ප්‍රශ්නයේ ජීවිතයේ වඩාත්ම වැදගත්ම ප්‍රශ්නය. ඔබ ඒ තරම්ම විශාල අභියෝගයක් නිර්මාණය කර තිබෙන එකේ, ඔබට වැඩිකල් නින්දෙ පසුවෙන්න බැහැ. ඔබ අවදියෙන් සිටිය යුතු වෙනවා. ඔබ සිහිබුද්ධියෙන් සිටිය යුතු වෙනවා. ප්‍රමාණවත් අන්දමට මරණයේ යථාර්ථය සම්මුඛ වෙන්න.

ඒ විදිහටයි බුද්ධගේ විමර්ශනය ආරම්භ වෙන්නේ. බුද්ධ උපන්න දවසේ.... ඔහු මහා රජෙකුගේ එකම පුත්‍රයා. ඔහු උපන්නේ රජු මහලු වියට පා නගමින් සිටියදී. එනිසා රාජධානියේ මහා ප්‍රීති උත්සවයක් පැවැත්වුණා. රටවැසියෝ මේ අවස්ථාව එනකල් බොහෝ කල් බලා සිටියා. රජු ජනතාවගේ මහත් ආදර ගෞරවයට පාත්‍ර වූ කෙනෙක්. ඔහු ඔවුන්ට සේවය කර තිබුණා. ඔහු කරුණාවන්තයි. දයාබරයි. ඔහු ආදරණීය සහ බෙදා හදා ගත්තෙක්ව සිටියා. ඔහු තම රාජධානිය වත්පොහොසත් බවින් දියුණු කළා. එදා තිබූ ලස්සනම රාජධානියක් එය.

ජනයා යාඥා කරමින් සිටියේ ඔවුන්ගේ රජුට පුත්‍රයෙක්ලැබෙන්න කියලා රජුගෙන් පසුව සිහසුනට උරුමක්කාරයෙක් නොසිටි නිසා. බුද්ධ උපදින්නේ රජුගේ මහලු වයසේ. ඔහුගේ උත්පත්තිය බලාපොරොත්තු නොවුණ එකක්. මහා උත්සව, මහා මංගල්‍යයක්. රාජධානියේ සියලුම ජ්‍යොතිර්වේදීන් එක්රැස්වුණා කුමාරයාගේ අනාගතය ගැන අනාවැකි කියන්න. ඔහුට නම තිබ්බේ සිද්ධාර්ථ කියලා. ඔහුට මේ නම තැබුවේ. ඔහු අර්ථ සිද්ධ කරන නිසා. රජුගේ ආශාව සපුරාලන්නෙක්. ඔහුගේ ගැඹුරුතම ආශාව වුණේ සපුරාලීමයි. ඔහුට ඕනෑකර තිබුණේ පුත්‍රයෙක්. ඔහුගේ මුළු ජීවිතයේම ප්‍රාර්ථනය ඒකයි. එම නිසාමයි සිද්ධ අර්ථ නම යෙදුවේ. එහි සරලතම අර්ථය වුණේ ගැඹුරුතම ආශාව සපුරාලීම යන්නයි.

මේ පුතා රජුගේ ජීවිතය අර්ථවත් කළා. වැදගත් බවට පත්කළා. ජ්‍යොතිර්වේදීන් මහ ජ්‍යෝතිෂඥයෝ අනාවැකි පළ කළා. ඔවුන් සියලු දෙනා එකඟයි, රජු "මගේ පුතාගේ ජීවිතයට සිදුවන්නට යන්නේ මොනවද?" කියා විමසුවා. සියලුම ජ්‍යොතිර්වේදීන් ඇඟිලි දෙකක් ඔසවා සංකේතයක් දක්වා හිටියා කොණ්ඩඤ්ඤ ඇර. ඔහු එක ඇඟිල්ලක් පමණක් පෙන්වා සිටියා.

රජු කියා සිටියා, "කරුණාකර සංකේතවලින් කතා කරන්න එපා. මම සාමාන්‍ය මිනිහෙක්. මම ජ්‍යොතිර්වේදය ගැන මොකුත්ම දන්නෙ නැහැ. මට කියන්න. ඔබ ඇඟිලි දෙකකින් අදහස් කළේ මොනවද?"

ඔවුන් සියලු දෙනා කීවා. "එක්කෝ ඔහු චක්‍රවර්ති රජු වෙනවා. ලෝක පාලකයෙක්. නැති නම් ඔහු ලෝකය ප්‍රතික්ෂේප කරාවි. ඔහු අවබෝධය ලත් තැනැත්තෙක් බවට බුදුවරයෙක් බවට පත් වේවි. මේ විකල්ප දෙකම තිබෙනවා. එනිසයි ඇඟිලි දෙකක් ඉස්සුවේ."

රජු දෙවැනි විකල්පය ගැන කණස්සල්ලට පත්වුණා. "ලෝකය ප්‍රතික්ෂේප කරනවා නම් කවුද මගේ රාජ්‍යයේ උරුමය ගන්නේ?" ඊළඟට ඔහු කොණ්ඩඤ්ඤ විමසුවා. "ඔබ මොකද එක ඇඟිල්ලක් පෙන්නුවේ?"

කොණ්ඩඤ්ඤ කීවා. "මට සම්පූර්ණයෙන්ම සහතිකයි ඔහු ලෝකය ප්‍රතික්ෂේප කර හෙළාදකින බවට. ඔහු බුදුවෙනවා. අවබෝධයට පත්, අවදියෙන් සිටින කෙනෙක් බවට පත්වෙනවා."

රජු කොණ්ඩඤ්ඤ සමඟ සතුටු වුණේ නැහැ. ඇත්ත පිළිගැනීම ඉතාමත් දුෂ්කරයි. ඔහු කොණ්ඩඤ්ඤ ගණන් නොගෙන ඇරලා. කොණ්ඩඤ්ඤට කොහොමටත් තෑගි සම්මාන ලැබුණෙ නැහැ. සත්‍ය මේ ලෝකයේ සම්මානයට පාත්‍ර වෙන්නේ නැහැ. ඊට පටහැනි ආකාරයට සත්‍යය දහසකුත් එකක් ආකරවලින් දඬුවමට භාජනය වෙනවා. ඇත්තෙන්ම, කොණ්ඩඤ්ඤගේ කීර්තිය පහළ ගියා. ඔහු රජුගෙ සම්මානයට පාත්‍ර නොවුණ නිසා. කටකතා පැතිරුණෙ ඔහු මෝඩයෙක් කියලයි. සියලුම ජ්‍යොතිර්වේදීන් එකඟ වෙද්දී, ඔහු පමණයි එකඟ නොවුණ තැනැත්තා.

රජු අනෙක් ජ්‍යොතිර්වේදීන්ගෙන් විමසුවා. "ඔබ මොනවද යෝජනා කරන්නේ? ඔහු ලෝකය ප්‍රතික්ෂේප නොකරන්න මම මොනවද කළ යුත්තේ? මට ඕනෑ නැහැ ඔහු යාචකයෙක් වෙනවා බලන්න. ඔහු සන්‍යාසි කෙනෙක් වෙනවා බලන්න ඕනේ නැහැ. මට ඕනේ ඔහු චක්‍රවර්ති රාජයෙක් වෙනවා දකින්න, මහාද්වීප හයේම පාලකයා වෙනවා දකින්න" සියලු මාපිය අපේක්ෂාවන් එහෙමයි. කවුද කැමති වෙන්නෙ තමන්ගෙ දුව හෝ පුතා ලෝකය ප්‍රතික්ෂේප කරලා කඳුකරයට ගිහිල්ලා තමන්ගේම අභ්‍යන්තරයට යනවට තමන්ගේ ආත්ම ගවේෂණය පිණිස.

අපේ ආශා අපේක්ෂා බාහිරයට නැඹුරුයි. රජු සාමාන්‍ය මිනිසෙක්. හුදෙක් අප කවුරුත් වාගෙයි. එම ආශාවන් සමඟ එම අපේක්ෂාවන්ම සහිතව ජ්‍යොතිර්වේදියා කීවා. "ඒක සංවිධානය කරන්න පුළුවන්. ඔහුට දිය හැකි සතුට ප්‍රීතිය උපරිමයෙන් දෙන්න. ඔහු අතිශයෙන් සුවපහසුව ඇතිව තබන්න. මානුෂිකව කළ හැකි උපරිම ආකාරයට. ඔහුට රෝගාතුර වීම ගැන, මහලුවීම ගැන විශේෂයෙන්ම මරණය ගැන ඔහුට දැනගන්නට ඉඩ තියන්න එපා. ඔහුට මරණය දැනගන්නට ඉඩ දෙන්න එපා. එහෙම කරනවා නම් ඔහු කවදාවත් ලෝකය ප්‍රතික්ෂේප කරන්නේ නැහැ"

එක ආකාරයකට ඔවුන් හරි. මරණය කේන්ද්‍රීය ප්‍රශ්නය නිසා. වරක් එය ඔබේ හදවතේ පැන නැගුණාම ඔබේ ජීවිත රටාව වෙනස් වෙන්න ගන්නවා. ඔබට පරණ මෝඩ විදියට ජීවත්වෙන්න බැරි වෙනවා. මේ ජීවිතය මරණයෙන් කෙළවර වෙන්න යනවා නම් එවිට මේ ජීවිතය සැබෑ ජීවිතය වෙන්න බැහැ. එහෙම නම් මේ ජීවිතය මායාවක් විය හැකියි. සත්‍ය සදාකාලික වෙන්න ඕනේ එය සත්‍ය නම්. අසත්‍ය පමණයි මොහොතකට ජීවත් වෙන්නේ. ජීවිතය මොහොතකට පවතින්නක්, එවිට එය මායාවක්, බොරුවක, වැරදි සංකල්පනාවක්, වැරදි වටහා ගැනීමක්. එහෙනම් ජීවිතය මුල් බැස තිබිය යුත්තේ නොදන්නා තැනක විය යුතුයි. අප ජීවත් වෙන්නේ එවන් ආකාරයකටයි.

අපට වෙනස් ආකාරයකට ජීවත් වෙන්න පුළුවන්. එවිට අපට පුළුවන් පැවැත්මේ සදාකාලික ගලනයේ කොටසක් බවට පත්වෙන්න. මරණය පමණයි ඔබට එවන් රැඩිකල් වෙනස්වීමක් දෙන්නේ.

ඉතින් ජ්‍යොතිර්වේදීන් කීවා "කරුණාකර ඔහුට මරණය ගැන කිසිවක් දැනගන්න ඉඩ තියන්න එපා" රජු සියලු අවශ්‍ය විධිවිධාන සකස් කළා. සෘතු තුන වෙනුවෙන් වෙනත් නිධාන තුනක් සූදානම් කළා. සිද්ධාර්ථට, එවිට ඔහුට සෘතුවලදී ඇතිවන අපහසුතා ගැන දැනගන්න වෙන්නෙ නැහැ. උෂ්ණ සමයේ ඔහුට සීතල කඳුකරයේ මනරම් තැනක් සූදානම් වුණා. ශීත සමයේ ඔහුට ගඟ අසබඩ උණුසුම් ස්ථානයක් සූදානම් කෙරුණා. ඔහුට කිසිම අපහසුවක් නොදැනෙන ආකාරයට සියල්ල සූදානම් කළා.

ඔහු ජීවත් වූ කිසිම මාලිගාවකට කිසිම මහලු ගැහැනියකට හෝ පිරිමියකු ඇතුළු වීම වළකා තිබුණා. තරුණ අය පමණයි එහි යා හැකිව තිබුණේ. ඔහු රාජධානියෙ සියලු ලස්සන තරුණ කතුන් ඔහු හා වාසය කළා. එවිට ඔහුට නිතර නියැලී සිටින්නට හැකිවුණා ඇල්මෙන් යුතුව. එවිට ඔහු සිහිනවල, ආශාවල පසුවේ. ඔහු වෙනුවෙන් මිහිරි සිහින ලෝකයක් නිර්මාණය වුණා. උයන්පල්ලන්ට කියා තිබුණ මැරුණ කොළ අතු රාත්‍රියේ ඉවත් කර තබන්න, පරව යන, දුර්වර්ණ වන මල රාත්‍රියේදී ඉවත් කෙරුණා. කවුද දන්නේ මොනවා වේවිද කියලා? මියගිය කොළයක් දැක ඔහු ඒ ගැන ප්‍රශ්න නගන්න ඉඩ තිබෙනවා. එම කොළයට මොකද වුණෙ කියලා එයින් මරණය ගැන ගැටලුව පැන නැගෙන්න ඉඩ තිබෙනවා. මැරී යන රෝස මලක පෙති ගැලවී වැටෙනවා දැක ඔහු අහන්න ඉඩ තිබෙනවා. මරණය ගැන.

නමුත් කොයිතරම් කාලයකටද ඔබට මෙය දැරිය හැක්කේ? මරණය ඒ තරමට වැදගත් ප්‍රපංචයක්, කොතරම් කාලයකටද ඔබට රැවටීම කළ හැක්කේ? පරක්කු වෙලා හෝ ඉක්මනින්ම හෝ ඔහු ලෝකයට ඇතුළුවෙන්න ඕනේ. දැන් රජු ඉතාමත් මහලුයි. පුතා ලෝකේ හැටි දැනගත යුතුයි. එනිසා සෙමින් ඉතා සෙමින් ඔහු ලෝකය හමුවට එන්න ඉඩ ඇරියා. නමුත් ඔහු නගරයක මහා වීථියක් හරහා ගමන් කරන්නට පෙර එහි සිටි සියලු මහලු ස්ත්‍රීන් පුරුෂයන් ඉවත් කරනු ලැබුවා. සිඟමන් යදින යාචකයන් ඉවත් කරනු ලැබුවා. ඔහු පසුකර යන මඟක් හරහා කිසිම සන්‍යාසිවරයකුට ගමන් කරන්න දුන්නෙ නැහැ. සන්‍යාසි කෙනෙක් දුටුවම ඔහු අහන්න පුළුවන් "මොන වර්ගයක මිනිහෙක්ද මේ? ඇයි ඔහු කසාවතින් සැරසී සැරසී සිටින්නේ? ඔහුට කුමක් වෙලාද? ඔහු වෙනස් විදියකට පෙනෙන්නේ නොඇරුණ, දුරස්ථ විදිහට පෙනෙන්නේ ඇයි? ඔහුගෙ ඇස්වල වෙනසක්. ඔහුගේ ගතිය වෙනස්. ඔහුගේ වාසනය සහ පෙනීම වෙනස් ඇයි? ඔහුට මොනවා වෙලාද?" ඊළඟට සියල්ල අත්හැරීමේ ප්‍රශ්නයක්. මරණය පිළිබඳ මූලික ප්‍රශ්නයක්. නමුත් එක දවසක එය සිදුවුණා. එය මඟඇරිය නොහැකි වුණා.

අපත් කරන්නේ ඔය ටිකමයි. යම් කෙනෙක් මැරිලා නම්, අවමඟුල් පෙරහැර අප

**22 වන පිටුව බලන්න**


SPECIAL RATE
ON RENEWALS
&
INSURED
MORTGAGES
ANTON DHARMASEELAN
MORTGAGE AGENT
LIC #M14000425
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST FOR ALL
YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS - BEST RATES
ANTON@MYHOMEMLS.CA
MORTGAGE ALLIANCE
FAX: 1-800-566-3068

ඇමෙරිකානු සංචාරයක මතකය....

# SOUND OF MUSIC

## චිත්‍රපටයේ ගී ගයන Trapp පවුල සොයා

# වර්මොන්ට් ප්‍රාන්තයට...




■ සටහන සහ සේයා රූ

අනුරුද්ධ වැලිගමගේ

1965 මාර්තු 2 වැනි දා මංගල දර්ශනයෙන් පටන් ගෙන අද වනතුරුත් මිලියන ගණනාවක් ප්‍රේක්ෂක ආදරය දිනාගත් Sound of Music චිත්‍රපටය සෑම මට්ටමකම සම්මාන උළෙලවලින් තෑගි පිට තෑගි දිනූ වාර්තා තැබූ චිත්‍රපටයක්. රඟ පෑ නළු නිළියන් මිය ගියත් වසර 53 කට පසු අදත් එහි ජනප්‍රියතාවයේ අඩුවක් නැහැ .

Maria Vonn Trapp විසින් රචිත කථාවක් ඇසුරින් නිර්මාණය වූ එයට පසුබිම් වූයේ ඔස්ට්‍රියානු හමුදාවේ ප්‍රබල නාවික නිලධාරියෙකුගේ දරුවන් හත්දෙනා බලා ගැනීමට එන පාලිකාවකගේ කතාවයි. කලක් යුරෝපයේ ඉතා ජනප්‍රිය වූ ට්‍රැප් පවුලේ සංගීත කණ්ඩායම (Trapp Family Singers) දෙවන ලෝක යුද්ධ සමයේදී ඔස්ට්‍රියාවෙන් පලා ආවේ ඉතාලිය, එංගලන්තය හරහා ඇමෙරිකාවට.

ඒ චිත්‍රපටයටත් පසුබිම් කතාවටත් ආදරය කළ අප ඔවුන් ඇමෙරිකාවේදී නැවතුණු වර්මොන්ට් ප්‍රාන්තයේ ස්ටෝවේ (Stowe) නගරයට දසත සංචාරයක මතකය ගෙන යන්නට හිතුවා. ඒ අප අත්විඳි මිහිර ඔබත් එක්ක බෙදාගන්න. විද්‍යුත් තැපෑල හරහා අපව සම්බන්ධ කරගත් සංචාරයක මතකය කියවන හිතවත් කිහිප දෙනෙක් ලියා තිබුණේ ගිම්හාන නිවහනක අත්දැකීමක් බෙදාගන්න කියලයි. මේ ලිපිය ඉක්මන් කරන්නට ඒකත් හේතුවක් වුණු බව කිව යුතුයි.

ටොරොන්ටෝවේ සිට පැය 7 1/2 ක් පමණ රථ ධාවනයකින් ඔබට ස්ටෝවේ නගරයට ළඟා වන්නට පුළුවන්. හිම ක්‍රීඩා සඳහා ඉතා ජනප්‍රිය මේ කුඩා කඳුකර නගරය අපට සිහිපත් කළේ ලංකාවේ නුවරඑළියට ගිය ගමන් මතකයන්. ශීත කාලයට නම් මේ ප්‍රදේශයේ නවාතැන් ඉතා කාර්යබහුල වගේම ඉතා ඉහල මිල ගණන්වලට අලෙවි වෙනවා. අප මේ ප්‍රදේශය තෝරා ගත්තේ ගිම්හාන සංචාරයකට. නගරයෙන් තරමක් ඈතට වන්නට පිහිටි මේ මනරම් හුදෙකලා නිවහනේ ගෙවූ ඒ සතියකට වැඩි කාලය අපේ ගමන් සගයන් වුණු අනෙක් පවුල් දෙකත් සමග කළ සාර්ථක සංචාරයන් අතරින් එකක්. මේ ගමනේදී දේශසීමා තරණය කළ යුතු නිසා ගමන පටන් ගන්නා වේලාව මෙන්ම කපොල්ල කලින්ම තීරණය කර ගැනීම කාල කළමනාකරණයට වැදගත්. Kingston හරහා ගමන් ගන්නා විට නාස්ති වන කාලය ඉතිරි කර ගැනීමට හැකි නිසා එසේ ගොස් ආපසු ඒමේදී අප තෝරාගත්තේ එතරම් තදබදය නැති Montreal නගරයට කිට්ටු කුඩා දේශසීමා කපොල්ලක්.

## ට්‍රැප් පවුලේ තානායම
## Trapp Family Lodge

1938 දී නාසි ආක්‍රමණවලට බියෙන් පලා ආ ට්‍රැප් පවුල ඇමෙරිකාවේදී 1947 ඉදි කළ ට්‍රැප් පවුලේ තානායම ඔස්ට්‍රියානු ඌරුවට ඉදි වූ කදිම නවාතැනක්.
අක්කර 2500 ක සුවිසල් බිම් කඩක විසිරුණු මේ පරිශ්‍රයේ ඇති නවාතැන කාමර 93 ක සුඛෝපභෝගී එකක්.
මෙහි නවතින්නට නම් ඉතා විශාල මුදලක් ගෙවන්නට වේවි. ඔවුන්ගේ තේමා පාඨයෙන් කියැවෙන විදිහටම ඔස්ට්‍රියාවෙන් බිඳක් වර්මොන්ට් ප්‍රාන්තයට ගෙනැවිත් තිබෙන මෙහි ඇත්තේ ඔස්ට්‍රියානු ගෘහ නිර්මාණ ශිල්පයන්ට අනුව ඉදි කළ ගොඩනැගිලි.

ඒත් ඔස්ට්‍රියානු මලින් ගහ කොළින් පිරි ඇති එහි වත්තේ සංචාරයක යෙදෙන්න ඔබ එහි නවතින්නට අවශ්‍ය නැහැ. ඒ අත්දැකීම හරියට ඔබ ඕස්ට්‍රියාවට ගියා වගෙයි කියලයි ඕස්ට්‍රියාවට හැබැහින් ගිය අපේ ගමන් සගයෙකු කීවෙ. පොතත්, චිත්‍රපටයත් තුළින් දැන සිටි බොහෝ කරුණු චාරිකාවේ නියාමකවරියගේ විස්තර එක්ක ගැලපිලා පරිසරයත්, කැමරාවත් එක්ක ගෙවුණු හෝරාවකට අධික කාලය තවමත් මතකයේ තියෙන්නේ ඒ නිසා.



## ස්ටර්ලින් විල
## Sterlin Pond

ස්ටෝවේ නගරයට කිට්ටුවෙන් ඇවිදින මංපෙත් (Walking Trails) බොහෝ ගණනක් තිබෙනවා. ඒ අතුරින් අප කණ්ඩායමේ සිත් ගත් තැනක් තමයි ස්ටර්ලින් විල. මෙය දකින්නට නම් අඩි 1010 උස කඳු මුදුනකට නගින්න වෙනවා.

කිලෝමීටර 4 ක (සැතපුම් 2.5 ක) දුරක පා ගමනකට පස්සෙ දකින්නට ලැබෙන විලේ මනරම් දර්ශනය ගමන් මහන්සිය නිවා දමනවා සිකුරුයි. ඒ ගමනේ පළමු කිලෝමීටර 2 ක අසීරු වන්නේ ගල් පඩිපෙල ක්‍රමවත්ව නැති නිසා.

මේ පරිශ්‍රය කුරුල්ලන් බලන්නන්ගේත්, රැහැන්වල එල්ලී කඳු නගින සංචාරකයින්ගේත් ජනප්‍රිය තැනක්. මගේ මතකයට ආවේ මිල්ටන් නගරයේ තියෙන ගැරඬියා කන්ද(Rattlesnake Point) මුදුනයි.

මේ ගමනේදී උදෙන්ම ගියොත් ඉඳහිට කැළෑ සතුන්ද දකින්නට පුළුවන්. ඔබේ ජංගම දුරකථනයට හෝ කැමරාවට දකින මනරම් දසුන් නිසා විවේකයක් නැතිවේවි.

## මොස් ග්ලෙන් දියඇල්ල
## Moss Glen Falls



ලංකාවේදී සහ නයගරාවේදී ඇති තරම් දියඇලි දැක ඇති ඔබට මෙය තරමින් කුඩා එකක් වේවි. ඒත් ඔබ පරිසර සංචාරයකට කැමති කෙනෙක් නම් මෙතැනත් යන්න තවත් හොඳ තැනක්. කිලෝමීටර් 3 ක තරම් අසීරු කඳු නැග්මකට පස්සෙ කඳු මුදුනේදී මේ දිය ඇල්ල දකිනකොට දැනෙන මහන්සිය කොහේදෝ ගියා කියලයි අපට හිතුණෙ. මෙතැනත් කැමරාවලට ඉවරයක් නැති පසුතල මවනවා. මෙතැන තියෙන වාහන නැවතුම්පළ නම් බොහොම කුඩා එකක්.

## ගිම්හාන නවාතැන
## Cottage



මේ ගමනේ අපේ ප්‍රධාන බලාපොරොත්තුව වුණේ අපේ ගමන් සගයන් සමග විවේකීව ගත කිරීමයි. යන්නටත් එන්නටත් දිනය බැගින් ගත වුණු නිසා අපි වැඩි දුරක් ඇති දේ බලන්න ගියේ නැහැ. කුඩා පෞද්ගලික විලක් තිබුණු ඒ නිවහන වටාම ඉතා විශාල වනගත ප්‍රදේශයක් තිබුණු නිසා උදෑසනට මුවන් ඇතුළු කුඩා සතුන් දකින්නට ලැබීම අරුමයක් වුණේ නැහැ. කුඩා පවුල් 2 -3 කට දවස් කිහිපයක් කල් ගත කරන්නට අවශ්‍ය සියලු පහසුකම් එහි තිබුණා.

## වෝටබරි මධ්‍යස්ථානය ආශ්‍රිත උද්‍යානය
## Waterbury Centre State Park

කඳු මුදුන්වල සිට එන විශාල ගංවතුර පාලනය සඳහා තැණුනු ජලාශයක් ආශ්‍රිතව මේ උද්‍යානය පිහිටුවා තිබෙනවා. මේ පරිශ්‍රය අපේ ගමන් සගයින් හැමෝටම විනෝදයක් ගෙන දුන් තැනක්. කඳු නැගීම්වලට එක් නොවූ වැඩිහිටි අයත් Picnic Tables වල ඉඳගෙන මේ පරිශ්‍රයේදී පරිසරයේ අසිරිය මැනවින් විඳි බව කිව යුතුයි. මෙය පිහිනන්නටත්, නාන්නටත් කදිම තැනක්. ඒ අතර තරුණ පිරිස් බෝට්ටු සහ උපකරණ කුළියට ගෙන ජල ක්‍රීඩාවල යෙදුණා. මේ පරිශ්‍රය පළාත් උද්‍යානයක් නිසා දවසක්ම ගත කරන්න සියලු පහසුකම් තිබෙනවා. ස්ටෝවේ නගරයට කිලෝමීටර 10 ක් පමණ දුරින් මෙය පිහිටා තිබෙනවා.

## බෙන් සහ ජේරි අයිස්ක්‍රීම් කම්හල් චාරිකාව
## Ben & Jerry Ice cream factory tour




ඇමෙරිකාවේ ජනප්‍රිය මේ අයිස්ක්‍රීම් නිෂ්පාදන කැනඩාවේ සමහර වෙළඳසැල්වලත් දකින්නට පුළුවන්. සාමාන්‍ය පොදු රසයන්ගෙන් වෙනස් සුවිශේෂ රස රැසක් අත්විඳින්නට ලැබෙන මේ චාරිකාවේ අත්දැකීම වෙනස්.

1978 දී බෙන් කොහෙන් (Ben Cohen) සහ ජේරි ග්‍රීන්ෆීල්ඩ් (Jerry Greenfield) මිතුරන් දෙදෙනා වසා දමා තිබූ කුඩා ගෑස් හලක පටන් ගත් මේ අයිස්ක්‍රීම් කම්හල අද ඉතා විශාල එකක්. මේ පරිශ්‍රයේ කරන චාරිකාව බාල මහලු සියලුදෙනාට විනෝද විය හැකි ලෙස සකස් කර තිබෙනවා. හැමෝම ආසා කරන්නේ  තමන් කැමතිම අයිස්ක්‍රීම් රස බලන එකටයි. මේ පරිශ්‍රය පිහිටා තිබෙන්නේ ස්ටෝවේ නගරයේ සිට කිලෝමීටර් 16 ක් තරම් දුරින්.

මේ ගමනේදී අප දුර ගමන් යොදා නොගෙන ගිම්හාන නවාතැනේ වැඩි කාලයක් ගත කරන්නට උත්සාහ ගත් බව කිව යුතුයි. කිලෝමීටර 5 - 6 දුරින් පිහිටි ස්ටෝවේ නගරයෙන් අවශ්‍ය දෙයක් ගන්නත් පුළුවන්. විශේෂයෙන්ම පැය 4 - 5 කට වඩා වැඩි කාලයක් රථ ධාවනයේ යෙදෙන ගමන්වලදී වැඩි විවේකයක් තබා ගත යුත්තේ ගමන නිසි ලෙස විඳින්නටයි. නොඑසේ නම් ඔබ වියදම් කරන මුදලත්, කාලයත් මහන්සියක් වී අපතේ යනු ඇති.

**ඔබේ ඉල්ලීම් සහ තොරතුරු සඳහා අලුත් විද්‍යුත් ලිපිනයක් පටන් ගත්තා. dasatha. sancharayakamathakaya@gmail.com විස්තර සඳහා ලියන්න. ඉඩ ලැබෙන පරිදි පිළිතුරු ලියන්නම්.**

**තවත් ගමනක් සමග මීළඟ කලාපයෙන් හමුවෙමු.**

# හණ මිටිය

එකෝමත් එක රටක එක් ගම්මානයක යහළුවන් දෙදෙනෙක් සිටියා. ගමෙන් පිට පළාත්වලට ගිහින් කුලී වැඩපළ කරල තමයි මේ දෙන්නා ජීවිකාව ගෙන ගියේ. එහෙම ගියාම ඒ ඒ පළාත්වල තියෙන දේවල් ගමට ගෙනත් විකිණීමෙන් මේ දෙන්නා අමතර ආදායමකුත් උපයා ගත්තා. මේ මොන දේ කළත් සුවපහසුවෙන් ජීවත් වීමට තරම් මුදලක් සොයා ගැනීමට මේ දෙදෙනාට හැකි වුණේ නෑ.

එදත් මේ යහළුවන් දෙදෙනා ටිකක් ඈත ගමක කුලී රාජකාරියකට ගිය දවසක්. හවස් වෙලා වැඩකටයුතු ඉවර වුණාම දෙන්නා අතට එදින වැටුප ලැබුණා.

"අද නම් ගමට ගෙනිහින් විකුණාගන්න දෙයක් ගන්නවත් මේ ලැබුණු මුදල මදි" එක් යහළුවෙක් කිව්වා.

"ඔව්.... ඒත් වටපිට බලමු. මොනවහරි දෙයක් ලැබේවි" අනෙකා පැවසුවා.

යහළුවන් දෙදෙනා වටපිට බලමින් කතා කර කර ආවා. මෙහෙම වෙල් යායක් මැදින් එද්දි හොඳ සරුවට වැවුණු හණ යායක් ඔවුන්ට පෙනුණා.

"අද අපි ළඟ වටිනා දෙයක් ගන්න සල්ලිත් නෑ. ඒත් නිකම්ම ගමට යන්නත් බැරි නිසා මේ හණ ටිකක් කපාගෙන අරන් යමු" යහළුවන් දෙදෙනා කතා වුණා.

දෙන්නත් එක්ක වෙලට බැහැලා හණ කොළ කැපුවා. කපල ලොකු මිටි දෙකක් බැඳගෙන හිස තබාගෙන ගමට යන්න පිටත් වුණා. ඉතිං ඔහොම යනකොට රෑ කළුවරත් වැටුණා.

ඉස්සර කාලෙ අද වගේ රථ වාහන නෑනෙ. මේ යහළුවෝ පැමිණි මග දිගේ රාත්‍රියට කරත්තයක්වත් යන්නෙ නෑ. සතා සරුපයා එළියට බහින වෙලාව නිසා බිම් කළුවර වැටුණම මිනිස්සු එළි පහළියෙ ඇවිදින්නෙ නෑ. මෙහෙම යන එන අයට ගමන් විඩාව නිවාගන්න, රැය පහන් කරගන්න අම්බලම් තිබුණා. ඉතිං මේ යහළුවෝ දෙන්නත් ඒ රාත්‍රියෙ අම්බලමකට ගොඩ වුණා.

පහුවදා පාන්දරමින් නැගිටලා හණ කොළ මිටි දෙකත් හිස තබාගෙන ගමට යන්න පිටත් වුණා. එක් ගමක් මැදින් යද්දි ඒ ගමේ ගැමියෙක් මේ දෙන්නා ඉස්සරහට ආවා.

"මේ උන්නැහෙලා මොනවද මේ බරට බරේ ඔසවාගෙන යන්නෙ?" ඒ ගැමියා ඇහුවා.

"ආයිබොවං, අපි මේ එහා ගමෙන් හණ මිටි දෙකක් කපාගත්ත. ඒවා අපේ ගමට අරන් යනවා විකුණන්න"

"අපොයි මොනාටද හණ කොළ උස්සන් යන්නෙ. මේ ගමේ හණ නූල් හරිම ලාභයි නොවැ. ඔය හණ කොළ විකුණලා හණ නූල් ටිකක් අරන් යනවලා"

මේක අහපු එක යහළුවෙකුට හරිම සතුටුයි. එයා හණ කොළ මිටිය විකුණලා ඒ මුදලින් හණ නූල් ගත්තා. ඒත් අනික් යහළුවා ඒකට කැමති වුණේ නෑ. එයා මෙහෙම කිව්වා.

"ඊයේ රෑ වෙනකම්ම වෙලේ බැහැගෙන කපපු මේ හණ කොළ මිටිය මෙච්චර මහන්සියෙන් මෙපමණ දුරක් ඔසවාගෙන ඇවිත් මෙතනදි විකුණනන්න මට බෑ. මම මේ හණ කොළ මිටිය ගමට ගෙනිහින්ම විකුණනවා"

හණ නූල් ගත්ත යහළුවාගේ ඔළුවට දැන් සැහැල්ලුයි. ඇයි හණ කොළ මිටිය තරම් හණ නූල් මිටිය බර නෑනේ. එයා බොහොම නිදහසේ හණ නූල් මිටිය ඔසවාගෙන යනවා. හණ කොළ මිටිය හිස තියාගෙන ආව යහළුවා පෙර පරිදිම ඉතාමත් අමාරුවෙන් අපහසුවෙන් හති දමමින් හණ කොළ මිටිය ඔසවාගෙන යනවා.

ඔහොම තවත් ටික දුරක් යද්දි තවත් ගම්මානයකට ආවා. මේ ගම මැදින් යද්දි නැවතත් ඒ ගමේ ජීවත් වෙන ගමරාළ කෙනෙක් මුණ ගැසුණා.

"ඔහේල බොහොම දුර බැහැර ඉඳලද එන්නෙ...? හරිම මහන්සි පාටයි නොවැ. මොනවද මේ බරට බරේ ඔසවාගෙන යන්නෙ?"

"මේ හණ කොළ මිටියක්"

"මා ළඟ නම් තියෙන්නෙ හණ නූල් මිටියක්" යහළුවන් දෙදෙනා තම තමන් ළඟ ඇති දේවල් ගැන කිව්වා.

"ඕවා මොනවටද උස්සන් යන්නෙ. අපේ ගමේ හණවලින් වියපු රෙදි හරිම ලාභෙට ගන්නට පුළුවන්. ඕව විකුණලා දාලා ඒ රෙදි ටිකක් අරන් යනවා"

"මොනවා යහළුවේ.... මෙහෙ හණ රෙදි ලාබෙට තියෙනවද?"

"අපොයි ඔව්... මෙහෙ හැම ගෙදරකම හණ රෙදි කර්මාන්තය කරනවා නොවැ.... අන්න අර ඈත පෙනෙන නුග ගසට එහායින් වෙල මැද්දෙ තියෙන ගෙදරට ගියා නම් ඉස්තරම්ම හණ රෙදි ගන්න පුළුවන්" මෙහෙම කියමින් ඒ ගමරාළ යන්න ගියා.

අර හණ නූල් මිටිය උස්සාගෙන ආව යාළුවාගේ කැමැත්ත හණ රෙදි මිල දී ගැනීමටයි. ඉතිං එයා යහළුවාටත් ඒ ගැන කිව්වා.

"මම අර ගෙදරට ගිහින් මේ නූල් මිටිය විකුණලා හණ රෙදි ගන්නවා. ඔබත් ඔය හණ මිටිය විකුණලා රෙදි ටිකක් ගන්න. අපිට ගමට ගෙනිහින් හොඳ මිලකට විකුණාගත හැකියි"

"නෑ නෑ නෑ... මම මේ හණ මිටිය කපාගත්තෙ ගමට ගිහින් මුදල් කරගන්නයි. අතරමගදි එය විකුණා දකින දකින් දේ මිලට ගන්න මට ඕන නෑ... ඔබට ඕන නම් ඒ ගෙදරට ගිහින් හණ රෙදි අරන් එන්න. මා මෙතැන සිටින්නම්"

කොපමණ කරුණු තේරුම් කරවන්න හැදුවත් ඒ යහළුවා කැමති වුණේම නෑ මුලින් හිසට ගත්ත හණ මිටිය අත හරින්න. ඉතින් මොනව කරන්නද? යහළුවා විශාල ගසක් යට ගිමන් හරිද්දි හණ රෙදි ගන්න ඕන වුණු යහළුවා අර ගෙදරට ගිහින් හණ නූල් මිටිය විකුණලා හණ රෙදි මිලට ගත්තා.

ඔන්න දැන් දෙන්නත් එක්ක ආයෙමත් ගමට යන්න පිටත් වුණා. ටික දුරක් යද්දි දහවල් කෑම කන වේලාවත් ළං වුණා. ඒ මග අසල තිබුණු පුංචි කඩයකට ගොඩ වෙලා කෑම කන ගමන් කඩේ සිටි අය සමගත් ආගිය කතා කියාගත්තා.

"මොනවද මේ ඔහේලා උස්සන් යන බඩු පොදි?" එතැන සිටි අයෙකු ඇසුවා.

"මේ හණ කොළ මිටියක්"

"මේක හණ රෙදි මිටියක්" යහළුවන් එසේ කිව්වා.

"මොනවටද මේවා ගෙනියන්නෙ?"

"අපේ ගමට ගෙනිහින් විකුණන්න"

"මොනවටද මේ හණ කොළයි, හණ රෙදියි ගෙනියන්නෙ. අපේ ගමේ හොඳ පට රෙදි හරි ලාබෙට ගන්න පුළුවන්නෙ"

"ඔය ඇත්තමද?" හණ රෙදි මිටිය හිස තබාගෙන ආ යහළුවා පුදුමයෙන් ඇසුවා. අනෙක් යහළුවා නම් ඒ ගැන කිසිම උනන්දුවක් දැක්වූවේ නෑ.

"ඔව්... මෙතනින් හැරිල ගියාම ඔබට පට රෙදි විකුණන තැනකට යන්න පුළුවන්"

"දැන්වත් ඔබ උස්සාගෙන යන හණ කොළ මිටිය විකුණලා මේ හොඳ පට රෙදි ටිකක් ගමු යහළුවේ. දන්නවනේ අපේ ගමේ පට රෙදිවලට තියෙන ඉල්ලුම. අපිට හොඳ ලාභයක් ගන්න පුළුවන්"

"නෑ නෑ... මම මෙච්චර දුර උස්සන් ආව හණ මිටිය මට හොඳයි. ඔබට වගේ සැරින් සැරේ වෙනස් වෙන්න මට බෑ. ඔබ ගොහින් පට රෙදි අරගන්න. ඔබ එනතුරු මම මේ කඩ පිළේ සිටින්නම්"

තමන්ගේ යහළුවාට කරුණු කීමෙන් පළක් නැති බව වටහාගත් හණ රෙදි ගෙනාව යහළුවා පට රෙදි තියෙන තැන සොයාගෙන පිටත් වුණා. ගිහින් හණ රෙදි විකුණලා පට රෙදි අරන් ආවා.

ඉන්පස්සෙ ආයෙමත් දෙන්නත් එක්ක ගමට යන්න පිටත් වුණා. හවස් වේගෙන එද්දි ගමට ආවා. ගමට ඇවිත් පැය කිහිපයක් යද්දිම ගමෙන් ගිය යහළුවන්ගෙන් කෙනෙක් හොඳ පට රෙදි ගෙනවිත් ඇති බවට ආරංචිය පැතිර ගියා. ඉතාමත් ඉක්මනින් ඒ පට රෙදි මිටිය විකිණී අවසන් වුණා. ඒ යහළුවා විශාල ලාබයකුත් ලබා ගත්තා.

ඒත් අර හණ මිටිය හිස තියාගෙන ආව යහළුවාට නම් ඒ හණ මිටිය විකුණා ගන්න හැකි වුණේ නෑ. ඒ ගමේ හණ කර්මාන්තය කරන්න දන්න අය සිටියේ නැති නිසා කවුරුවත් හණ මිටිය මිල දී ගත්තේ නෑ. අවශ්‍ය තැනේදී අවශ්‍ය විදියට කටයුතු නොකළ නිසා හණ මිටිය හිස තියාගෙන ආව මහන්සියවත් ඒ යහළුවාට සොයාගැනීමට නොහැකි වුණා.

## ළමා ගී

### රිදී වලාවේ....

වරෙන් හීන්සැරේ - වරෙන් හීන්සැරේ
වරෙන් හීන්සැරේ රිදී වලාවේ
අනේ හෙමින් හෙමින් ඇදී යන්න වලාවේ
සිසිල් පවන් බිඹී කිරා වැටේ
සිහින ලොවේ අඩ නින්දේ සතුන් මෙ යාමේ
වරෙන් හීන්සැරේ රිදී වලාවේ.....

රෑ යාමයේ
හීන්සැරේ
වරෙන් අනේ
හාවෝ පෙම් කෙළියේ යන්නේ රෑ යාමෙදෝ
රෑ යාමෙදෝ රෑ යාමෙදෝ
හාදු දිදී තණ පඳුරේ නටන්නේ පනින්නේ
හාවෝ හාවෝ
අනේ හීන්සැරේ හහා හීන්සැරේ
වරෙන් හීන්සැරේ රිදී වලාවේ

ඇයිද සැලී සැලී සර සර ගා හඬන්නේ
ලියේ නිදන් තුරු හිමි හා තුරුල්ලේ
අන්න මහමූණා හොරෙන් පියා හඹා ඒ
වවුලෝ කියාපන්කො වාසි අතට හෝයියා
ඒත් හීන්සැරේ.... හහා හීන්සැරේ
වරෙන් හීන්සැරේ රිදී වලාවේ

හඳ මාමා කිරි දෝලා කිරි මුට්ටිය බිඳ දාලා
හීන් සැරේ බඩගා එනවෝ
අනේ සුදු මූණත් රැළි වැටිලා නොවේදෝ
අයියෝ රිංගාලා බඩගාලා සීරිලා
මාමේ මාමේ
අනේ හීන්සැරේ හහා හීන් සැරේ
වරෙන් හීන්සැරේ රිදී වලාවේ

රෑ යාමයේ
හීන්සැරේ
වරෙන් අනේ
රෑ යාමයේ

සංගීතය සහ පද පෙළ: සුනිල් ශාන්ත සූරීන්
මුල් ගැයුම : සුනිල් ශාන්ත සූරීන්
පසුව ගැයුම - අයිවෝ ඩෙනිස්



# අප්‍රේල් දෙවැනිදාට යෙදෙන ජාත්‍යන්තර ළමා පොත් දිනය




■ **ආචාර්ය ස්වර්ණා චන්ද්‍රසේකර**

අප්‍රේල් 02 වන දින 'ජාත්‍යන්තර ළමා පොත් දිනය' වශයෙන් හැඳින්වෙයි. 1967 සිට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ළමා පොත් දිනය පැවැත්වෙන්නේ හෑන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් (1805-1875) නමැති ශ්‍රේෂ්ඨ ලේඛකයාගේ ජන්ම දිනය නිමිත්තෙනි. බොහෝ රටවල ජාත්‍යන්තර ළමා පොත් දිනය සමරන අතර කැනඩාවේ මහජන පුස්තකාලවල ද විශේෂ වැඩසටහන් පැවැත්වෙයි. විශේෂයෙන්ම හෑන්ස් ඇන්ඩර්සන්ගේ සුරංගනා කතා පොත් ප්‍රදර්ශනය කෙරෙයි.

1805 දී ඇන්ඩර්සන් උපත ලැබුවේ ඩෙන්මාර්කයේ දීය. ඔහු නවකතා, පද්‍ය සහ නාට්‍ය කෘතීන් සෑහෙන සංඛ්‍යාවක් රචනා කර තිබුණ ද වඩාත් ප්‍රසිද්ධියට පත්වූයේ ඔහු විසින් රචනා කරන ලද සුරංගනා කතා නිසාය. ඔහු කුඩා වියෙහි දී අසමින් රස විඳි සුරංගනා කතා තුන් දහසක් පමණ රචනා කොට ඇති අතර, භාෂා එකසිය විසිපහකට පමණ පරිවර්තනයවී ඇත. සිංහලයට ද මෙම කතා බොහොමයක් පරිවර්තනය කොට තිබේ.

අධිරාජයාගේ අලුත් ඇඳුම (Emperor's New Cloth), පුංචි දිය කිඳුරී (The Little Mermaid), කෝකිලාවිය (The Nightingale), හිම රැජිණ (The Snow Queen), අවලස්සණ තාරාවා (The Ugly Duckling), තම්බෙලිනා (Thumbelina), කුමාරිකාව සහ බෝංචි ඇටය (The Princess and the Pea) හෑන්ස් ඇන්ඩර්සන්ගේ වඩාත් ජනප්‍රිය වූ කතන්දරයි. ඔහුගේ සුරංගනා කතාවල බලපෑම හේතු කොට ගෙන වෙනත් ලේඛකයන් අතින් ද අගනා ළමා සාහිත්‍ය කෘති බිහි වූ බව පැහැදිලිය. කෙනත් ග්‍රැහැම්ගේ The Wind in the Willows (1908) සහ ඒ. ඒ. මයින්ගේ Winnie the Pooh (1926) මෙයට කදිම නිදසුන්ය. එමෙන්ම ලුවිස් කැරල්ගේ Narnia පොත් පෙළ සහ ජේ. කේ. රොව්ලින්ගේ Harry Potter පොත් පෙළ සුරංගනා කතාවන්ගෙන් ආභාෂය ලද කෘතීන් ලෙස දැක්විය හැකිය.

ළමා සාහිත්‍යයට පමණක් නොව, වැඩිහිටියන් සඳහා ලියැවුණු ප්‍රබන්ධ කතාවලට ද ඇන්ඩර්සන්ගේ කෘතීන් බලපා ඇති ආකාරයට, කාරා ඩල්කි ගේ The Chrysanthemum Robe (emperor's new clothes), ග්‍රෙගරි ෆ්‍රොස්ට් ගේ Sparks (The Tinderbox), ජැනිස් ගාඩිනර් ගේ The Pangs of Love (The Little Mermaid), මෙලීසා ලී ෂෝ ගේ The Sea Hag (The Little Mermaid), නැන්සි ක්‍රෙස් ගේ Steadfast (The Steadfast Tin Soldier) නමැති කෙටිකතා ද ජුලියට් මැරිලියර් ගේ Daughter of the Forest (The Wild Swans), ජොඈන් ද වින්ග් ගේ Snow Queen (The Snow Queen) ආදි නවකතා ද නිදසුන් වශයෙන් දැක්විය හැකිය.

ළමා අධ්‍යාපනයේදී 'කතන්දරයකින් පටන් ගන්න' (Start With a Story) යන්න අද ආදර්ශ පාඨයක් බවට පත්වී ඇත. කතන්දර පාසල් විෂයමාලාවට ද එක් වී ඇති අතර එයින් අධ්‍යාපන අරමුණු රාශියක් ද ඉටුකර ගත හැකිය.

ප්‍රාථමික අධ්‍යාපනයෙහිලා ප්‍රධාන අරමුණ වන්නේ ළමයා තුළ ශ්‍රවණය, කථනය, කියවීම හා ලිවීමේ කුසලතා වර්ධනය කිරීමයි. ළමයින්ගේ සිත් සතන් ඇද බැඳ ගැනීමට සමත් සුරංගනා කතා මෙහිලා බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි. කතාවේ 'මැජික් බලය' නිසාම දරුවා සවන්දීමට මෙන්ම කියවීමට ද පෙළඹෙයි. එහෙයින් සුරංගනා කතා ළමයාගේ කියවීම වර්ධනය කිරීමට ද උපයෝගී කොටගත හැකිය. සෑම සුරංගනා කතාවක්ම එකසේ සුදුසු යයි මෙයින් අදහස් නොකෙරේ. ළමයාගේ වයස, සංවර්ධන මට්ටම හා අධ්‍යාපන මට්ටමට ගැළපෙන කතන්දර තෝරාබේරා ගැනීම දෙමාපියන්ගේ වගකීමකි. මේ සඳහා පුස්තකාල කාර්ය මණ්ඩලයෙන් උපදෙස් ලබාගත හැකිය.

බොහොමයක් සුරංගනා කතා අවසන් වන්නේ සතුටිනි. 'ඉක්බිති සියල්ලෝම සතුටින් ජීවත් වූහ' (They lived happily ever after) යන්න ළමා මනසට අතිශයින්ම උචිතය. සැබෑ ලොවෙහි දී කිසිවක් සතුටින් කෙළවර නොවන බව සැබෑවකි. එහෙත් ළමයාගේ පෞරුෂ වර්ධනය සඳහා ජීවිතය පිළිබඳ යහපත් අපේක්ෂාවන් ළමයා තුළ රෝපණය කරවීමට 'බලාපොරොත්තු' බෙහෙවින් වැදගත් වෙයි. ජීවිතයේ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට මහඟු ආධාරකයක් වෙයි. ළමයින්ට පමණක් නොව වැඩිහිටියන්ට ද 'මනෝමය ලෝකය' වැදගත් වන බව මහාචාර්ය සරච්චන්ද්‍රයන් ගේ පහත සඳහන් ප්‍රකාශයෙන් පැහැදිලි වෙයි.

"තම ආශාවන් මැඩ ගැනීමෙහි අපොහොසත් වූ පෘථග ජනයා සැබෑ ලෝකයේ තතු එතරම් සැපදායක නොවන හෙයින්, තම කල්පනා ශක්තිය මෙහෙයවා තවත් ලෝකයක් මවා ගනී. සිතට තෘප්තිය නොදෙන සැබෑ ලෝකයෙන් ඔහු වරින්වර ඉවත්ව ගොස්, තමා විසින් මවාගන්නා ලද කල්පනා ලෝකයෙහි ස්වල්ප වේලාවක් හිඳ කටයුතු සඳහා පමණක් සැබෑ ලෝකයට එයි." (කල්පනා ලෝකය, 1985, 25 පිටුව)

සුරංගනා කතා ළමයාගේ පරිකල්පන ශක්තිය වර්ධනය කිරීමට උපකාරී වෙයි. විය හැකි දේත් නොවිය හැකි දේත් සංකලනයෙන් ගෙතුණු රසවත් කතන්දර ළමයා තුළ සංකල්ප සාධනය ඇති කරවීමට සමත් වෙයි. රසවත් කතන්දරයකට සවන්දෙන ළමයාගේ මනසෙහි කතන්දරයේ චරිත, අවස්ථා නිරූපණ, පරිසරය ආදිය පිළිබඳව චිත්තරූප මැවෙයි. මෙම සංකල්ප සාධනය ළමයාගේ නිර්මාණ ශක්තිය වර්ධනය කිරීමට ද භාෂා සංවර්ධනයට ද මහෝපකාරී වෙයි.

සදාචාර වර්ධනය අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථයකි. ළමයා තුළ යහපත් ගුණධර්ම වගා කරවීමට සහ සමබර පෞරුෂයක් ඇති කරවීමට සුරංගනා කතා උපයෝගී කොටගත හැකිය. බොහෝ කතන්දරවල අන්තර්ගත වන්නේ මෛත්‍රී කරුණාව හා දුෂ්ටත්වය අතර අරගලයකි. අවසානයේදී අසත්පුරුෂයන් පරදවා සත්පුරුෂයෝ ජයගනිති. එයින් වක් මගින් ළමයාට වටිනා උපදේශයක් ලැබෙයි. කෙළින්ම දෙන ඔවදන්වලට වඩා වක්‍රෝක්තියෙන් දෙන උපදෙස් පිළිගැනීමට ළමයින් කැමතිය.

'සින්ඩරෙල්ලා' කතන්දරය මෙයට කදිම නිදසුනකි. විවිධ රටවල විවිධ සංස්කෘතීන්ගෙන් බිහිවුණු සින්ඩරෙල්ලා කතන්දර තුන්සිය ගණනක් දක්නට ලැබෙයි. මෙහි කතා නායිකාව මව මිය යාමෙන් අසරණ වූ සුන්දර යුවතියකි. පියා නැවත විවාහයක් කරගැනීම හේතු කොටගෙන ප්‍රශ්න රැසකට මුහුණ දීමට ඇයට සිදුවිය. කුඩම්මා සහ ඇගේ දියණියන් දෙදෙනාගේ අකාරුණික ක්‍රියාකාරකම්, තාඩන පීඩන ආදියට ගොදුරු වීමට ඇයට සිදුවිය. එහෙත් කෙතරම් බාධක මධ්‍යයේ වුව ද මැදහත් සිතින් සියල්ල විඳ දරාගෙන යහපත් දැරියක් ලෙස ජීවිතයට මුහුණ දීමට ඇයට හැකි විය. ඇගේ ස්ථිර අධිෂ්ඨානය ඇය ජයග්‍රහණය කරා ළඟා කරවීමට සමත් විය. අවසානයේදී ඇය රජ බිසවක් වන්නේ ඇගේ සත්පුරුෂ භාවයේ ආදර කරුණාවේ ප්‍රතිඵලයක් ලෙසය.

සුරංගනා කතා තුළින් හමුවන්නේ විවිධ රටවල සිටින විවිධ ආකාරයේ පුද්ගලයන්ය. ඔවුන්ගේ සිරිත් විරිත් හා ජීවන අරගලය. එකී තොරතුරු අසන ළමයා තුළ අනෙකුත් ජාතීන් හා අනෙකුත් සංස්කෘතීන් පිළිබඳව කරුණාවක් හා ගෞරවයක් ඇතිවෙයි. එමෙන්ම සමානාත්මතාව පිළිබඳ සංකල්ප වර්ධනය වෙයි. අන්තර් සංස්කෘතික සම්බන්ධතා පිළිබඳ අවබෝධයක් ලැබෙයි. එමෙන්ම සමාජ විෂමතා හා දුර්වලතා පිළිබඳ වැටහීමක් ද ඇති වෙයි. 'දුගී බව' සමාජ විෂමතාවෙහි ප්‍රතිඵලයකි. එහෙත් උත්සාහවන්තයාට ජයගත හැකිය. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය ආදිය මිනිස් දුර්වලතාවන්ය. සමාජ සම්බන්ධතා පැවැත්වීමේ දී ආවේග කාරී හැඟීම් පාලනය කොටගෙන බුද්ධිමත්ව හැසිරිය යුතුය.

ප්‍රශ්න නිරාකරණයේ දී බුද්ධිමත්ව ක්‍රියා කළ යුතුය. එහෙයින් සුරංගනා කතා ළමයාට සමාජානුයෝජනය පිළිබඳ අවබෝධයක් ලබාදීමට ආධාර කොටගත හැකිය.

එමෙන්ම ළමයා තුළ සත්ත්ව කරුණාව ඇති කරවීමට ද පරිසරයට ආදරය කිරීමට ද සුරංගනා කතා යොදාගත හැකිය. බොහෝ සුරංගනා කතාවල සිටින්නේ කතා කරන සතුන්ය. සමහරවිට ප්‍රධාන චරිත ද සතුන්ය. සතුන් අතර ද බුද්ධිමත්, වංචාකාර, කපටි සතුන් මෙන්ම අහිංසක සත්තු ද වෙති. ඔවුන්ගේ ජීවන අරගලය ද මිනිසා ගේ ජීවන අරගලයට සමාන වෙයි. එහෙයින් ඔවුන් පිළිබඳව කරුණාවක් ජනිත වෙයි. පරිසරය සුරැකීම පිළිබඳ කතන්දර රාශියක් සුරංගනා කතාවන්හි අන්තර්ගතය. පලතුරු සහ ඖෂධීය පැළෑටි, වනාන්තර, මිනිස් ජීවිතයට කොතරම් වැදගත් ද යන්න සුරංගනා කතාවකින් පහසුවෙන් අවබෝධ කරවිය හැකිය. එමෙන්ම විද්‍යා ඥානය හා ගණිත ඥානය වර්ධනය කිරීම, ගවේෂණ කෙරෙහි නැඹුරු කරවීම, සංවර්ධන සහභාගිත්වය ආදි බොහෝ අරමුණු සුරංගනා කතා තුළින් සාක්ෂාත් කරගත හැකිය.

සිනාවක් මුවට නංවන රසවත් කතන්දර රස විඳීමට ළමයා කැමතිය. හෑන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් ගේ The Princess and the Pea (කුමාරිකාව සහ බෝංචි ඇටය) නමැති සුරංගනා කතාවෙන් මෙම ලිපිය අවසන් කෙරෙයි. මෙය වඩාත් උචිත වන්නේ පෙර පාසල් දරුවන්ටය.

## කුමාරිකාව සහ බෝංචි ඇටය

ඔන්න එකෝමත් එක රටක එක රාජ කුමාරයෙක් හිටියා. ඒ කුමාරයාට ඕනෑ වුණේ 'නියම රාජ කුමාරිකාවක්' විවාහ කර ගන්නටයි. සාමාන්‍ය රාජ කුමාරියක් හෙම නෙමෙයි. ඔය කියන නියම රාජ කුමාරිකාවක් හොයන එක ලේසි පහසු දෙයක් නෙමෙයිනෙ.

ඉතින් මේ කුමාරයා

15 වන පිටුව බලන්න




■ රමණී සුබසිංහ

**මිනිසකුගේ ජීවිත කාලයෙන් තුනෙන් එකක් පමණ ගත කරන්නේ නින්දේ බව ඔබ දන්නවාද? වටිනා ජීවිතයෙන් මේ තරම් කාලයක් නින්දට වැය කරන්නේ කුමක් සඳහාදැයි ඔබට සිතෙන්නට පුළුවන්. එහෙත් අවදිව සිටීම මෙන්ම හොඳ නින්දද මිනිසාට අත්‍යවශ්‍යයි. සුවබර නින්ද කෙනෙක් කායිකවත් මානසිකවත් ප්‍රබෝධයෙන් තබයි. අද සාකච්ඡා කෙරෙන්නේ නින්ද ගැන බොහෝ දෙනකුට බලපාන ගැටලු පිළිබඳවයි.**

**Q නිරෝගී ජීවිතයක් පවත්වා ගැනීමට සාමාන්‍ය පුද්ගලයකු දිනකට කොපමණ වේලාවක් නිදාගත යුතුද?**

එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්. වයොවෘද්ධ අය සාමාන්‍යයෙන් නින්දට වෙන් කරන්නේ පැය හයකටත් අඩු කාලයක්. එහෙත් කුඩා දරුවන් දවසේ දිගු කාලයක්. පැය 12 - 16 ක් තරම් නිදා ගන්නවා. තරුණයන් හා වැඩිහිටියන් පැය 7 - 8 ක් නිදා ගැනීම ප්‍රමාණවත්.

**Q සමහර අය තමන්ට නින්ද නොයන බව කියමින් වෛද්‍ය ප්‍රතිකාර පවා ලබා ගන්නවා. එසේ නින්ද නොයාමට හේතුව කුමක්ද?**

හේතු රාශියක් බලපෑ හැකියි. විශේෂයෙන් සෞඛ්‍ය සම්පන්න, ජීවිතයේ කරදර අඩු කෙනෙකුට නින්ද නොයන්නේ ඉතාම කලාතුරකින්. එහෙත්, නිදාගන්නා රටාව වෙනස් වූ විට කෙනෙකුට නින්ද නොයන්නට පුළුවන්.

රාත්‍රී වැඩ මුර ඇති අයට, රාත්‍රී කාලයේ වරින් වර ඇහැරෙන්නට සිදුවන අයට නිදා ගැනීමේ අපහසුතා ඇතිවිය හැකියි. එවැනි අය නින්දට පෙර මඳක් උණුසුම් ජලයෙන් ඇඟපත සෝදා ගැනීම, කහට නොදැමූ කිරි වීදුරුවක් පානය කිරීම වඩාත් සුදුසුයි. නිදිමත එනතුරු ප්‍රියකරන පොතක්, පත්තරයක් කියවීම මගින්ද නැවත හොඳ නින්දකට පිවිසිය හැකියි.

**Q ව්‍යායාම නොකිරීමත් නින්දට බාධාවක් ද?**

ඔව්. ව්‍යායාමවල නිරත වන ක්‍රීඩකයන්ට හොඳින් නින්ද යනවාදැයි විමසුවහොත් ඔවුන්ගෙන් ලැබෙන පිළිතුර ඉතාම සුවදායක ලෙස නින්ද යන බවයි. මීට හේතුව කායික ව්‍යායාම නින්දේ ගුණාත්මක බව වැඩි කිරීමයි. ව්‍යායාම කිරීමම නොවෙයි. අවශ්‍ය වන්නේ මොන යම් ආකාරයක හෝ ඇඟ වෙහෙසවීමයි. ගෙදර වැඩ, ගෙවත්තේ කුඹුරේ වැඩ, බයිසිකල් පැදීම, ඇවිදීම සහ නැටීමත් සුදුසුයි. හොඳ පිරිසිදු වාතය ආශ්වාස ප්‍රශ්වාස කරමින් අඩු තරමින් සතියකට දින තුන හතරක් හෝ පැය භාගයක කාලයක් ව්‍යායාමවල නිරත වීමෙන් සුවදායී නින්දකට පිවිසිය හැකියි.

**Q තේ කෝපි වැඩිපුර බීම හා නින්ද නොයාම අතර සම්බන්ධයක් තිබෙනවාද?**

ඔව්. කෝපි සහ තේවල අඩංගු කැෆේන් සහ ටැනින් යන සංයෝග නිදිමත නැති කරනවා. ඒ වගේම චොකලට් සහ චීස් වර්ග, රතු වයින්, කෝලා පානයන් නිදිමත නැති කරන ආහාරපාන. මේවා අඩුවෙන් ආහාරයට ගැනීම සහ විශේෂයෙන් රාත්‍රී නින්දට පෙර ආහාරයට ගැනීමෙන් වැළකිය යුතුයි.

**Q අධික වෙහෙසත් නින්දට බාධාවක්ද?**

කලබලකාරී මනසට වරින් වර විවේකය ලබා දීම අත්‍යවශ්‍යයි. දවස තිස්සේ එක දිගට ඇඟපත වෙහෙසවා වැඩ කිරීමත් මිනිසුන්ට කළ හැකි දෙයක් නොවෙයි. සිරුරටද වරින් වර විවේකයක් ලබා දෙමින් විඩාව මඟ හරවාගත යුතුයි. කෙනෙක් දවසේ එක දිගට වැඩ කොට, වැඩ නිම කළ සැණින්ම නිදා ගැනීමට උත්සාහ කරනවානම් එය එලදායී නොවිය හැකියි. මේ අය නින්දට යෑමට පෙර පැයක් හෝ දෙකක් විවේකීව සිටිය යුතුයි. පවුලේ සාමාජිකයන් සමඟ සතුටු සාමීචියේ යෙදීම, නවකතාවක් හෝ වෙනත් කැමති පොතක් පතක් කියවීමෙන් නොදැනුවත්වම පහසුවෙන් නින්ද ළඟා කරගත හැකියි.

**Q ආහාර ගැනීමත් සමඟම කෙනෙක් නින්දට යනවා නම් එය ආහාර ජීර්ණයට බාධාවක්ද?**

නෑ. නුසුදුසු වන්නේ ආහාර ගැනීමත් සමඟම ව්‍යායාම හා ක්‍රීඩාවල නිරත වීමයි. එවිට ආහාර මාර්ග පද්ධතියට, කුඩාන්ත්‍රයට රුධිර සංසරණය වීම අවම වෙනවා. එය ආහාර ජීර්ණයට බාධාවක්. ආහාර ගත් විගස නින්දට යාමෙන් ආහාර ජීර්ණයට බලපෑමක් වන්නේ නෑ. ආහාර ගැනීමෙන් පසු මඳ වේලාවක් විවේක ගැනීම, කට වහරේ කියන ලෙස ඇලවී සිටීම වඩාත් සුදුසුයි.

**Q රාත්‍රී ආහාර ගත් විගස නින්දට යෑම නුසුදුසුයි කියන්නේ ඇයි?**

රාත්‍රී නින්දට පෙර දිරවීමට අපහසු, බර ආහාරයක් ගත් විට සිරුරේ රත්වීම වැඩි වෙනවා. හෘද ක්‍රියාකාරීත්වය ඉහළ යනවා. එය නින්ද අපහසු කරන සාධකයක්. රාත්‍රී නින්දට පෙර අඩුම තරමින් පැය දෙකකට හෝ කලින් රාත්‍රී ආහාර වේල ගැනීමෙන් ඒ අපහසුතාව මඟ හරවා ගත හැකියි.

**Q සමහර අය පුරුද්දක් ලෙස දහවල් ආහාරයෙන් පසුව නින්දට වැටෙනවා. මෙය ශරීර සෞඛ්‍යයට අහිතකරද?**

ශරීරයේ ජීව විද්‍යාත්මක රටාව පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්. කෙනෙකුට දහවල් ආහාරයෙන් පසු නිදාගන්න අවශ්‍ය නම් නිදා ගත යුතුයි. නිදිමත දැනෙන්නේ සිරුරට නින්ද අවශ්‍ය නිසයි. පැය ගණනක් නිදා ගැනීම අවශ්‍ය නොවුණත් සුළු වේලාවක් හෝ නිදා ගැනීමෙන් ශරීරයට ප්‍රබෝධවත් බවක් ඇති වෙනවා. නිදිමතේ වැඩ කරන්නට යාමෙන් සිදු වන්නේ නින්දත්, වැඩත් දෙකම නිසියාකාරව සිදු නොවීමයි.

**Q බර ආහාරයක් ගත් විට වැඩියෙන් නිදිමත දැනෙන්නේ ඇයි?**

අප ගන්නා ආහාර සැහැල්ලු නොවේ නම්, බර වැඩි නම් ආහාර මාර්ග පද්ධතියට, කුඩාන්ත්‍රයට රුධිර සැපයුම වැඩි වෙනවා. හිසට රුධිර සැපයුම අඩු වෙනවා. එවිට නිදිමත ඇතිවීම ස්වභාවිකයි. වැල, වරකා, පැණි වැනි ආහාර වැඩියෙන් ගැනීමත් නිදිමත ඇතිවීමට හේතුවක්.

**22 වන පිටුව බලන්න**

## අප්‍රේල් දෙවෙනිදාට...

14 වන පිටුවෙන්

ගමින් ගමට ගියා. රටින් රට ඇවිද්දා. ඒත් නියම රාජ කුමාරිකාවක් හමු වුණේ නෑ. නිකං මහන්සි වුණා විතරයි. අන්තිමේදී කුමාරයා ආපහු මාලිගාවට ආවා. "නියම රාජකුමාරියක් හමුවෙන තුරු මගේ විවාහය සිද්දවෙන්නෙ නෑ" කුමාරයා තමුන්ගෙ දෙමාපියන්ට තරයේම කියා හිටියා.

ඉතින් ඔහොම කාලයක් ගතවුණා කියමුකො. එක දවසක් මුළු පළාතම දෙදරවාගෙන, ගස් ගල් පෙරළාගෙන මහා කුණාටුවක් හැමුවා. විදුලි කෙටුවා. අකුණු ගැහුවා. මහා ධාරනිපාත වර්ෂාවක් වැටුණා. ඔය අතරෙ මාලිගාවෙ ගේට්ටුවට මහ හඬින් ගහන සද්දයක් ඇහුණා. කුමාරයාගේ මහලු පිය රජතුමා ගේට්ටුව අරින්න කියලා සේවකයන්ට අණ කළා.

ගේට්ටුව ගාව හිටගෙන හිටියෙ හරිම ලස්සණ කුමාරිකාවක්. මහ වැස්සට තෙමිලා එයාගෙ හැටි. හිසෙන් වතුර බේරෙනවා. ඇඟෙන් වතුර පෙරෙනවා. ඇඳගෙන හිටිය ඇඳුම් සේරම දියබත් වෙලා. සපත්තු දෙක වතුරට පෙඟිලා.

"මම නියම රාජකුමාරිකාවක්" කුමරිය රජතුමාට කීවා. රජතුමා හිස වැනුවා.

"හොඳයි.... හොඳයි.... මම හොයාගන්නම්කො" මවු බිසව හිතුවා. ඒත් වචනයක්වත් කටින් පිට කළේ නෑ. කුමාරිකාව කැඳවාගෙන මාලිගාව ඇතුළට ගිහින් තෙත ඇඳුම් ඉවත් කරලා අලුත් ඇඳුම් අන්දන්න කියලා සේවිකාවන්ට අණ කළා.

ඉන්පසු මවු බිසව කුමාරිකාවට නිදාගන්න සැප, පහසු කාමරයක් සූදානම් කළා. "ඇඳේ මෙට්ටය ඉවතට ගන්න" කියලා සේවකයන්ට අණ කළා. ඊට පස්සෙ මවු බිසව බෝංචි ඇටයක් ඇඳේ මැදට වෙන්න තිව්වා. ඉන්පසු බෝංචි ඇටයට උඩින් මෙට්ට විස්සක් තියන්න කියලා සේවකයන්ට අණ කළා. සේවකයොත් මෙට්ට විස්සක් තියලා ඇඳ ඇතිරිලා දැමුවා. සමහරවිට ඉනිමග කුත් තියන්න ඇති ඇඳට නගින්න.

එදා රෑ කුමාරිකාවට නිදාගන්න සිද්ද වුණේ උඩම තියන සැප පහසු විසිවෙනි මෙට්ටය උඩ. මී..... හරිම සැපයි. ඔහොම රාත්‍රියත් ගෙවී ගියා කියමුකො.

කුණාටුවත් නැවතුණා. ඔන්න ඉතින් පහුවදා උදේ පාන්දරින්ම මවු බිසව කුමාරිකාවගේ නිදන කාමරයට ගියා. ගිහින් මෙහෙම ඇහුවා.

"කොහොමද දරුවො ? ඊයෙ රෑ හොඳට නින්ද ගියාද ?"

"අපොයි නෑ" කුමරිය ගත් කටටම කීවා.

"මට යන්තම්වත් ඇහැ පියාගන්න බැරි වුණා. මේ ඇඳේ තිබිලා මොකක්දෝ තදම තද දෙයක් මගේ ඇඟේ වැදුණා. මේ බලන්න මම එහාට මෙහාට හැරිලා දඟලනකොට ඒක වැදිලා මුළු ඇඟම නිල් පාට වෙලා"

ඒ කතාව අහලා මවු බිසව බොහොම සතුටට පත් වුණා.

"ඔබ නියම රාජ කුමාරිකාවක්" මවු බිසව සතුටින් කීවා. ඔබ නම් නියම රාජ කුමාරිකාවක්"

ඉතින් රාජ කුමාරයා බොහොම ජයට උත්සවයක් පවත්වලා කුමාරිකාව විවාහ කරගත්තා. ඒ රටේ මිනිස්සුත් බොහොම සතුටු වුණා. අර බෝංචි ඇටය වීදුරු පෙට්ටියක දාලා මාලිගාවෙ ප්‍රදර්ශනයට තිබ්බා. කවුරුහරි හොරකම් කලා නැත්තම් ඒ අපූරු බෝංචි ඇටය තවම ඇති.

## දැනුම සමග කටට රසට

# සීනි සම්බෝලය



■ **තිසරි ශිබා** - shikifood

මගේ නිවසේ සීනි සම්බෝලයක් සෑදෙන සෑම දිනකම මට සකුන්තලා රාණි මතකයට නැගෙන්නේ නිරන්තරයෙනි. මාධ්‍ය ජීවිතය තුළ මට මුණ ගැසුණු බොහෝ ගැහැනුන්, මිනිසුන් අතරින් සකුන්තලා වැනි දිරිය ගැහැනුන් ගැන මගේ සිතේ ඇත්තේ අප්‍රමාණ ගෞරවයකි. ආදරයකි.

ඒ හරියටම 2008 වසරේ මුල භාගය වන්නට ඇත. වෙනදා වැඩ අවසන් කරන වේලාවේ - අවේලාවේ මට තවත් රාජකාරියක් පැටවී තිබුණි. ඒ සකුන්තලා රාණිව සොයා කැලණි පාලම යට ඇති ඇගේ නිවසට යෑමටය. ගෘහසේවිකාවක් ලෙස කහවණු සොයා ගිය ඈ 2008 වසරේ ඉරාකයේ පැවති යුද්ධයට මැදි වී දෑත අහිමි වී නැවත පැමිණ සිටියේ ජීවිතේ අන්තිම සිහිනයේ කැබලිද අහුලා ගැනීමටවත් නොහැකිවය. සකුන්තලාගේ සිහිනයේ කැබලි එකතු කර එය යථාර්ථයක් කර ලීමට මට හැකි දැයි ප්‍රධාන කතුවරයා මගෙන් විමසා සිටියේය. වෙලාව හරියටම සවස පහ පසු වී තිබෙන්නට ඇත. මොර සූරමින් උදේ සිට වැටුණු වැස්ස නැවතී තිබුණේද නැත. නිවසට යාමට මත්තෙන් මට සකුන්තලාගේ නිවස බලා යෑමට හැකි යැයි ප්‍රධාන කතුවරයාට පැවසුවේය. මා සමග අප පුවත්පතේ ඡායාරූප ශිල්පියාත්, සිළුමිණ, සන්ඩේ ඔබ්සවර් සහ ඩේලිනිවුස් පුවත්පතේ සහෝදර මාධ්‍යවේදීන් කිහිප දෙනෙකුත් එක් වී සිටියහ. අප කැලණි පාලම යට සකුන්තලා රාණිගේ නිවස බලා පිටත්වන විට ගොම්මන් කළුවර වැහි අඳුර හා මුසු වී හාත්පස ගිල ගනිමින් තිබුණි. වැස්ස තුරල් වී තිබුණත් ඉද හිට ගසන අකුණු නිසා හිතට දැනුණේ නොඉවසුමකි. ඉක්මනින් ගෙදර යෑමට ඇත්නම් යැයි මට නොසිතුණාම නොවේ. පාලම අසලින් පහළට වාහනය ගත් රියදුරු පැවසුවේ මෙතනින් එහාට වාහනයෙන් යෑමට නොහැකි බවයි. වාහනයෙන් බැස ගත් අප එකිනෙකට යා වූ ගෙවල් පේලි අස්සෙන් ඉදිරියට ඇදුනේ සකුන්තලා සොයා ගෙනය. පහන් කණුවක් යට හොඳින් හැද පැළඳගෙන සිටි ගැහැනියක් අප දෙස විමසුම් ඇසින් බැලුවාය. ඕ රෑ සමනළියක යැයි ඇසක් වසමින් පැවසුවේ අප ඡායාරූප ශිල්පියාය. මඩ කඩිති මතින් පැල්පත් අතරින් අප ඉදිරියට ඇදුනෙමු. තැන තැන වතුර වලවල් අසල සෙල්ලම් කරන පුංචි දරුවෝ කිහිප දෙනෙකු වැස්සේ තෙමෙමින් කඩදාසි ඔරු පා කරති. කටගොන්නක් බී ගත් මිනිසෙකු ජෝතිපාලයන්ගේ ගීතයක් ගයමින් අප පසුකර ගියේය. ගැහැනියක පරුෂ වචනින් කාටදෝ බැන වැදෙනු ඇසුණු විට ඩේලිනිවුස් පුවත්පතේ මාධ්‍යවේදිනිය මා දෙස බැලුවාය. සුළඟට මුසු වී පැමිණි ඉවසිය නොහැකි දුගඳක් විටින් විට අප නාස්පුඩු හකුළුවා ලීය. තැන තැන නිවෙස්වලින් පහන් දැල්වෙමින් තිබුණි. මට දැනුනේ මහා හිස්කමකි. ඉක්මනින් ගෙදර යා යුතුව ඇත. දැරූ බොහෝ වෙහෙසකින් පසු අපට සකුන්තලාගේ පැල්පත සොයා ගැන්මට හැකි විය. ඕ අප එනතුරු මග බලා සිටියාය. සිනාමුසු මුහුණින් අප පිළිගත් ඕ,

"මට විදේශ නියුක්ති කාර්යාංශයේ මහත්තුරු වගයක් පණිවිඩයක් එව්වා අද පත්තරෙන් එනවා කියලා. තියෙන හැටියට වාඩි වෙමු මිස්" යැයි පැවසුවාය.

ටකරන්වලින් ආවරණය කර තිබූ ඒ නිවසේ කැඩුනු වැල් පුටු දෙකක්, මේසයක්, ලනු ඇඳක්, ප්ලාස්ටික් පුටු දෙක තුනක් හැර වෙනත් කිසිවක් තිබුණේ නැත. දැල්වුණු භූමිතෙල් ලාම්පුවේ එළියෙන් මා සකුන්තලා දෙස විපරමින් බැලුවාය. වයසට වඩා වියපත් පෙනුමක් දිස් වූ මුත් ඈ සුන්දර ගැහැනියකැයි මට සිතුණි. දරුවන් සතර දෙනෙක් සිටින ඇගේ සැමියා ඈ හැර ගොස් තිබුණේ මීට බොහෝ කලකට පෙරය. සැමියා නොමැතිව ජීවිත රෝදය තනියම කැරකැවීමට ඈ ගත් අපමණ වෙහෙස ඕ පැවසුවාය. ජීවිතය නරකාදියක් වුවත් එයින් ගොඩ වීමට විනා ඒ නිරයේම රැඳී සිටීමට ඇයට අවැසි නොවූ නිසා කෙටි මං ඔස්සේ නොගිය බව පැවසුවාය. දරුවන් තම මව ළඟ තබා ඇය මැදපෙරදිග ගියේ ඒ නිසා බව පැවසුවාය.දරුවන් රැක ගැන්මට ඈ කහවනු සොයා ගිය අතර අවුරුදු දෙකකට පසු නොසිතූ ලෙස නැවත සියරට බලා ඒමට සිදු වී තිබුණේ තම දෑතම අහිමි කර ගනිමිනි.

බිම වාඩි වූ ඕ තම ජීවිත කතාව පවසන විට කඳුළු බිදු රෑරා පහළට වැටෙනයුරු දැල් වූ පහන් එළියෙන් මට පෙනුණි. සකුන්තලාගේ නිවසේ දැන් වැඩපළ කරන්නේ ඇගේ දියණිය බව පැවසූ ඕ ඇයට ඕනෑම වැඩක් කළ හැකි බව පැවසුවාය. දාහතර වියැති දියණිය මව ළඟින් වාඩි වී සිටියාය. හෝරා කිහිපයක් අප ඇයගේ නිවසේ ගත කළ අතර අපට ආගන්තුක සත්කාර කිරීමට ඔවුන් දැඩි උනන්දුවක් දැක්වීය. මා සමග පැමිණි අනෙක් මාධ්‍යවේදීන් එය ප්‍රතික්ෂේප කළ විට මට එසේ කිරීමට හැකියාවක් තිබුණේ නැත.

"අනේ කන්න නෝනෙ. අපි කිරිබත් හැදුවෙ කන්න දෙන්න බලාගෙනමයි" කුඩා දැරිවිය ගෙන ආ කිරිබත් පිගානෙන් කැබැල්ලක් ගෙන ඇය පිළිගැන් වූ සීනි සම්බල් සමග මා කිරිබත් කැබැල්ලක් කටට රුවා ගතිමි. බඩගින්නක් නොතිබුණත්, අවේලාවේ කෑමට ප්‍රියක් නොතිබුණත් මා එය ප්‍රතික්ෂේප නොකළේ ඔවුන්ගේ සිත් රිදේවි යැයි බියෙනි.

"සීනි සම්බල නම් රසම රසයි" මා එසේ පැවසූ විට දැරියගේ දෑස දීප්තියෙන් බැබලුණි.

ඉන් දෙදිනකට පසු සකුන්තලාගේ ලිපිය මැද පිටුවේ පළ වූ අතර එකල බන්දුල පද්මකුමාරයන් විසින් මෙහෙය වූ මුල් පිටුවේද එම ලිපියට විශේෂ තැනක් හිමි විය. ඉන්පසු කැලණි පාලම උඩින් එන හැම විටම පාලම යට ජීවත් වීමට වෙර දරන සකුන්තලා ලා ගැන මට දැනුනේ අසීමිත දයාවකි.

මාස දෙකක් පමණ ගත වන්නට ඇත. දිනක් පිළිග ැනීමේ නිලධාරිනිය මා අමතා කීවේ මා හමු වීමට අමුත්තෙක් පැමිණ ඇති බවයි. සෑම දිනකම පැමිණෙන අමුත්තන් නිසා එය මට විශේෂ දෙයක් නොවුන හෙයින් මා පහලට බැස්සේ තවත් හෝරා කිහිපයකින් පසුවය. සකුන්තලා ඇගේ දියණියන් දෙදෙනෙකු සමග මා බැලීමට පැමිණ සිටියාය. ඒ හිස් අතින් නොව සීනි සම්බෝල බෝතලයක්ද සමගිනි. එවකට සිටි නිවාස ඇමතිවරයා ඇයට නිවසක් දීමට පොරොන්දු වී තිබුණු අතර ස්වයංරැකියාවක් වෙනුවෙන් යම් කිසි මුදලක් දීමට කටයුතු කර ඇති බව සකුන්තලා මට පැවසුවේ දෑසේ කඳුළු පුරෝගෙනය. මා ඇයට හදවතින් සුබ පැතුවෙමි. අද සකුන්තලා කොහේ සිටිනවාදැයි මා දන්නේ නැත. තවත් බොහෝ සකුන්තලා ලා කැලණි ගඟ අසබඩ ජීවිතය ගැට ගසා ගැනීමට සටන් කරන බව පමණක් දනිමි. ඒ දිරිය ගැහැනුන්ට මේ සටහන උපහාරයක් වේවා!

**Shikifood**

thisu.shika@gmail.com

### සීනි සම්බෝල හදමු

**අවශ්‍ය දේ**

- රටලූනු කිලෝ 2
- කැබලි කර ගත් උම්බලකඩ කෝප්ප කාලක්
- කෑලි මිරිස්
- තලා ගත් කරාබු නැටි සහ එන්සල් කරල් කිහිපයක්
- රම්පෙ, කරපිංචා සහ සේර කබැල්ලක්
- කහ තේ හැදි කාලක් පමණ
- රස අනුව ලුනු
- සියඹලා ඉස්ම කෝප්ප කාලක්
- රස අනුව සීනි
- තෙල්

**සාදා ගන්නා ආකාරය**

රටලූනු ඉතා සිහින්ව කපා ගන්න. මැටි හට්ටියක් ගෙන එයට තෙල් දමන්න. තෙල් රත් වන විට එයට තලා ගත් කරාබු නැටි සහ එන්සල් කරල් ටික දමන්න. එයටම උම්බලකඩ දමා ටික වේලාවක් බැදගන්න. දැන් රම්පෙ, කරපිංචා සහ සේර එකතු කරන්න. මේ ටික බැදී ගෙන එන විට රටලූනු, කෑලි මිරිස් සහ කහ එකතු කර තෙලෙන් බැද ගන්න. රටලූනු තෙලට එකතු කළ විට උනන වතුර ගතිය නැති වෙනතුරු තෙලෙන් බැද ගන්න. අන්තිමට සියඹලා යුෂ, සීනි සහ රස අනුව ලුනු එකතු කරන්න. සියඹලා යුෂ හිඳෙන තුරු ලිපෙන් ඉවත් කරන්න එපා.




NOVA Immigration Solutions Inc.
A CANADIAN IMMIGRATION CONSULTANCY FIRM
100% PARENTAL SUPER VISA AND 98% STUDENT VISA SUCCESS RATES
416 298 0990
shani.hanwella@novaim.ca
SHANI HANWELLA
Registered Canadian Immigration Consultant, CEO,
Former Visa Officer, Canadian High Commission,
Colombo, Sri Lanka
1585 Markham Road, Suite 405, Scarborough, ON M1B 2W1
www.novaim.ca


A NAME SYNONYMOUS WITH
PREMIUM QUALITY.
කිරට හෝ මිරිසට උපරිම රසයකින්
PLAZA MACKEREL
Premium Quality
Original
Plaza
BRAND
2 Pieces
Poids Net 425 g 15 oz
Poids Egoutte 300 g 10.5 oz
CHINCHARD
dans l'eau
Original
Plaza
TWO CHUNKS ONLY!
CONTAINS OMEGA-3
CAUGHT WILD
FRESH • TASTY • DELICIOUS -TRY IT!
YOUR LONG TIME FAVOURITE!
AVAILABLE IN YOUR FAVOURITE SRI LANKAN STORE.
PLAZA MACKEREL EXCLUSIVELY IMPORTED AND DISTRIBUTED BY.
MARKETED AND DISTRIBUTED BY
GEESHAFOODS INTERNATIONAL INC.
FOR MORE INFO
416.804.0762
WWW.GEESHAFOODS.COM

# එදා 'මයිනා කෑම්ප්' හමුදා කඳවුර අද කැලණි විශ්වවිද්‍යාල බිමයි

දෙවන මහා ලෝක සංග්‍රාමයේදී බ්‍රිතාන්‍ය හමුදාව ඔවුන්ගේ සහාය සඳහා නේපාල ගුරුකාවරුන්, අප්‍රිකානු හා අනික් යටත් විජිතවලින් සොල්දාදුවන් ලංකාවට ගෙන්වූහ. ඔවුන් අතරින් නේපාල ගුරුකාවරුන් රණකාමී හා නිර්භීත හටයින් බව ගම්මු නිතරම කීහ.

දැනට කැලණිය විශ්වවිද්‍යාලය පිහිටා ඇති ඉඩම එකල ඝන කැළෑවකි. මෙම කැළය මැද්දේ 'මයිනා කෑම්ප්' නමින් යුද්ධ අභ්‍යාස සඳහා විශාල කඳවුරක් සාදා තිබුණි.

නුවර පාරෙන්ද මෙයට ළඟා විය හැකි වුවත්, වෙනම රහසිගත මාර්ගයක්ද උපයෝගී කරගෙන තිබුණි. වනවාසල - හුනුපිටිය හරහා අඩි දෙකක් පමණ පළල රහසිගතව සකස් කර තිබූ මේ පාර පිහිටා තිබුණේ කටු කැළයක් මැදිනි.

මයිනා කෑම්ප් එකට යෑම ඉතාම දුෂ්කර හා අන්තරාදායක ගමනක් බව දිප්පිටිගොඩ, හුනුපිටිය අවට ගම්වාසීන් අම්බලමේදී නිතරම කතා කරනවා මා අසා ඇත.

එක් දිනෙක වනවාසලින් පැමිණි ගැමියෙක් ඉතා රසවත් කතාවක් කීය. අපි එදා අම්බලමේ ලෑල්ල මත හිඳ මගදී කඩාගත් පලතුරු අනුභව කරමින් සිටියෙමු. අප අසල වාඩි වූ ගැමියෙක් මෙසේ කතාව පටන් ගත්තේය.

"ඔය කටුවා කැලේ කෑම්ප් එකට කිසි කෙනෙක් නොගියේ, කැලේ සිටි සතා - සරපයි නිසා නොවෙයි, එම දුෂ්කර පාරේ යාම ඉතා අමාරු නිසා හා කෑම්ප් එකෙන් පැන යන මිනී කන කාපිරි නිසා. කාපිරින්ගේ කටේ ඉබ්බන් දමා කට වහලා තියනවා. ඒ ඔවුන් මිනි කන නිසයි. දවසක් මෙහෙම සිද්ධියකුත් වෙලා.

කෑම්ප් එක කිට්ටුව එක්තරා කන් නෑසෙන අත්තම්මා කෙනෙක් මුනුපුරෙක් සමඟ සිටියා. මුනුපුරා දවස ගානේම සෙල්ලම් කර ගෙදර එන්නේ පරක්කු වෙලයි. අත්තම්මා මුනුපුරා ගෙදර එන තෙක් නිදියන්නේ නැහැ.... එක දවසක් මුනුපුරා ගෙදර එන්න හොඳටම පරක්කු වුණා. සවස හත අට වෙනකොට හොඳටම කළුවරයි. මුනුපුරා ගෙදර ආවේ නෑ. අත්තම්මාගේ ගේ අවට කිසි කෙනෙක් පදිංචි වී සිටියේ නැහැ. අත්තම්මා මොකද කළේ? ගෙදර තිබෙන ලන්තෑරුමත් පත්තු කර, "පුතේ... පුතේ" කිය කියා කටුව කැළේ පාර දිගේ ගමන් කළා. ලන්තෑරුම එල්ලා ගෙන "පුතේ... පුතේ...." කිය කියා ගිහින් තියෙන්නේ මයිනා කෑම්ප් එකටයි. ඒ කාලේ කෑම්ප් එක මුර කළේ මිනී කන කාපිරි. අත්තම්මා ලන්තෑරුමත් අරගෙන ඉදිරියට යද්දි, කාපිරියා "හෝල්ට්" කියද්දිත් ආත්තම්මා ඉදිරියටම ගියා. අත්තම්මාට කන ඇහෙන්නේ නැති හින්දා. කාපිරියාට අත්තම්මා මොනවා කියනවාද කියා තේරුම් ගියෙත් නැහැ. දෙවෙනි වර "හෝල්ට්" කියනවාත් සමඟම ඉදිරියට එන අවතාරයට කාපිරියා වෙඩි තිබ්බා. ආත්තම්මා එතැනම මැරී වැටුණා. ආත්තම්මා ගේ මිනිය පවා මුදවා ගැනීමට ගම්මු කෑම්ප් එකට යන්න බිය වුණා." කතාව අවසන් කොට ගැමියා බය වෙලා වගේ බලාගෙන හිටියා.

කටුව කැළේ අද නැහැ. 'මයිනා කෑම්ප්' එක වෙනුවට එහි ඇත්තේ කැලණි විශ්වවිද්‍යාලයයි.

කටුවකැළේ කුඩා අතු පාර දුෂ්කර පාරක් වූ හෙයින් මෙම පාර රහසිගතව උපයෝගී කර ගත්තේ, ලංකාවට පැමිණි විදේශීය අප්‍රිකානු හා ගුරුකාවරුන් පමණි. තෙලඟපාත සිට, වනවාසලට ගොස් දිප්පිටිගොඩින් හුනුපිටිය හරහා කටුවාකැළේ පාරට යා හැකිය.

අපට එහි තිබූ බංකර් හා නැවතී සිටි විදේශීය සෙබළුන් දක්නට ලැබිණ. යුද්ධය අවසන් වී තිබුණු නිසා එහි සිටි සොල්දාදුවෝ ඉතා සැහැල්ලුවෙන් හා සන්තෝෂයෙන් සිටියහ. ඔවුන් දුටු වහා අපි ඇඟිලි දෙකකින් වී V අකුරක් සාදා පෙන්නුවෙමු. මෙයින් අදහස් කළේ ජයග්‍රහණය Victory යන්නයි. ඔවුහු ඉතා සතුටට පත්ව පාසල් සිසුන් වන අපට බිස්කට් (විස්කෝතු) පැකට් දුන්හ.

අපි ආපසු ඒමට තීරණය කළෙත් කටුවකැළේ දුෂ්කර මාර්ගය හරහාය. වේවැල්, පතොක් හා එරමිණියා පමණක් නොව පලතුරු ගස් රාශියක්ද තිබිණ.

මෙහි සඳුන් දිවියන්, ඉත්තෑවුන්, මීමින්නෝ හා විෂකුරු සර්පයන් සිටින බව අවට ගම්වාසීහු අපට කීහ.

අදත් මේ පෙදෙස කටුවකැළේ නමින් හැඳින්වේ. එහෙත් එහි කටු කැළයක් නැත.

**ජිනදාස ජයවර්ධන මහතා විසින් රචනා කරන ලද**
**'මා දුටු සුන්දර ගම තෙලඟපාත' ග්‍රන්ථයෙනි**



# බොරු ඇළ බොරැල්ල වූ හැටි



■ **කුමාරි හේරත්**

නම් ගම් උපත හා බැඳි රසකතා බොහෝය. ඒවා සත්‍ය සිදුවීම් හෝ පටබැඳි කතා හෝ විය හැකිය. ඇතැම්විට සත්‍ය සිදුවීමකට කතාවක් පටබැන්දාද විය හැකිය. ඒ නිසාම එකම ගමකට බද්ධ වූ කතා කීපයක් ඇති අවස්ථා බොහෝය. ඒ කෙසේ වුවද ඒ කතාන්තරවල රසඥතාවයක් ගැබ් වී ඇත.

'පරංගියා කෝට්ටේ ගියා වගේ' යන ප්‍රස්ථා පිරුළත් රසවත් ඉතිහාස කතාවක් අනුසාරයෙන් ගොඩනැගී ඇත්තේය. ඒ වෘත්තාන්තයට සමගාමීව කොළඹට ආසන්නව පවතින 'බොරැල්ල' නගරයේ නාමකරණය පිළිබඳවද රසවත් වෘත්තාන්තයක් ඇත්තේය.

වර්තමානයේ ජනාකීර්ණ නගරයක් වූ බොරැල්ල අතීතයේ ඇළදොළ දිය කඩිති සහිත සුන්දර ප්‍රදේශයක් වූවේය.

කොළඹ වරාය ලංකාවේ පැවති ප්‍රධාන වෙළෙඳ වරාය වූ අතර එහි ඉතිහාසය දිගුය. එනම් අද සේම වර්ෂ ගණනාවකට එපිට අතීතයේත් ආනයන අපනයන වෙළෙඳාම තිබී ඇත. ඊට සාක්ෂි ලෙස නටඹුන් අතරින් හමු වී ඇති විවිධ කාල වකවානුවලට අයත් කාසි, පබළු, පෝසිලේන් නිර්මාණ, ආභරණ ආදිය පෙන්වා දිය හැකිය.

ක්‍රි.ව. 1500 කාලවකවානුව වන විට කොළඹ වරාය ආසන්න ප්‍රදේශයේ වෙළඳාමේ ආධිපත්‍ය පතුරුවා සිටියේ මුස්ලිම් වෙළෙන්ඳන්ය. ඔවුහු ඇත්දළ, මුතුමැණික්, කුළුබඩු ආදි බොහෝ දේ පිටරටට අලෙවි කළහ.

ක්‍රි.ව. 1505 දී ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු පිරිස නැව් නැගුණෝය. ඉන්දියන් සාගරය හරහා ගමන් ගත් ඔවුහු මහා සුළි කුණාටුවකට හසු වූ අතර අහඹුවකින් සේ කොළඹ වරායට පැමිණ දිවි බේරාගත්හ.

නුපුරුදු නෞකාවක් දුටු මුස්ලිම් වෙළෙන්ඳෝ කළබලයට පත්වූහ. පැමිණ සිටින්නේ කවුරුන්ද, කොහේ සිටද, කුමක් නිසා පැමිණියාද? යන ගැටලුවලට පිළිතුරු සෙවීමට කටයුතු කළහ.

වටින් ගොඩින් සොයාගන්නා ආරංචි එකතු කරගත් මුස්ලිම් වෙළෙන්ඳෝ වහාම කෝට්ටේ රාජ සභාවට ගොස් රජතුමා මුණගැසුණහ.

පැමිණ සිටින්නේ මහා භයානක මිනිසුන් කොට්ඨාසයක් බවත් ඔවුන් මෙරට සිටියහොත් සිංහල ජාතියටත්, බුද්ධ ශාසනයටත් මහා විනාශයක් සිදුවන බවත් පැවසූහ.

මුස්ලිම් වෙළෙන්දෝ පැවසූ කාරණා ඒ ආකාරයටම සිතට නොගත් කෝට්ටේ රජතුමා පැමිණ සිටින අමුත්තන් පිළිබඳව සොයා බැලීමට දූතයෙක් පිටත් කර හැරියේය.

කොළොන්තොටින් ගොඩබට පරංගීන්ද ලක්දිව සොබාසිරිය දැක වික්ෂිප්ත වී සිටියහ. විශේෂයෙන්ම මුස්ලිම් වෙළෙන්දන් වෙළඳාම් කරන ආකාරය බලා සිටි පරංගීන්ට මෙරට ඇති ස්වාභාවික සම්පත් පිළිබඳව අවබෝධයක් ඇතිවූයේය. ඔවුහු කුමන ආකාරයකට සිංහල රජු සමග මිත්‍රත්වයක් ගොඩනගා ගන්නේදැයි කල්පනා කළහ.

එවැනි වාතාවරණයක දී කෝට්ටේ රජු විසින් එවන ලද රාජදූතයා පරංගීන්ට හමුවූයේය.

ඔහුව සාදරයෙන් පිළිගත් ලොරෙන්සෝ ද අල්මේදා ඔවුන් කුණාටුවකට හසුවී අහඹුවකින් මෙරටට පැමිණි බවත් මෙරට සමග වෙළඳ සබඳතා පැවැත්වීමට කැමති බවත් රජු කැමති නම් සතුරන්ගෙන් වෙරළ තීරය ආරක්ෂාකර දීමට කැමති බවත් පැවසුවේය. දූතයාගේ හිත දිනාගත් අල්මේදා රජුටද තෑගි බෝග යැවීමට අමතක නොකළේය.

රාජ දූතයාගේ හිත පිරී ගියේය. ඔහු සතුටු සිතින් රජතුමා බැහැදැකීමට පිටත්වූයේය. රජතුමා හමුවූ පසු ආගිය ගමනේ විස්තර කියූ ඔහු පරංගින් සමග සුහඳවීම යහපතක් බව සැළකර සිටියේය.

පරංගීන් පිළිබඳව කියූ විස්තර හා තෑගි බෝග ලබාගත් රජතුමා ඔවුනට රජු බැහැ දැකීමේ අවස්ථාව උදාකර දුන්නේය. ඒ සඳහාද දූත පිරිසක් පිටත්කර හැරියේය. දූත පිරිස උපක්‍රමශීලි විය. කොළඹ සිට කෝට්ටේ රාජධානියට ඒමට ළඟ පාරවල් එමට විය. එහෙත් පරංගීන් මුලාවට පත්කරමින් කටුක දිගු මාර්ග ඔස්සේ කැඳවාගෙන යාමට ඔවුහු අදිටන් කරගත්හ.

පරංගීන් හමු වූ ඔවුහු මුලින්ම කොළඹ වරායේ සිට කෝට්ටේ රාජධානිය දක්වා රැගෙන යාමේ කටයුත්ත ආරම්භ කළහ. ප්‍රථමයෙන්ම වර්තමාන බොරැල්ල ප්‍රදේශයෙන් මිථ්‍යාව වැපිරීම ආරම්භ කළහ. දිය පිරුණු අගලක් පෙන්වා එහි මිනීකන කිඹුලන් සිටින බව පැවසූහ. ඒ අසා බියට පත්වූ පරංගීහු දිය අගල හරහා නොගොස් වෙන පාරකින් යාමට කතිකා කර ගත්හ.

දූතයන්ගේ සැළසුම සාර්ථක වූයේය. දවස් තුනක් පුරා ගිරි දුර්ග පසුකරමින් දුෂ්කර මාර්ගයක ගිය පරංගීහු, රජතුමා හමුවූහ. පළමු හමුවේදීම රජුට තෑගිබෝග පරිත්‍යාග කළ පරංගීහු රජුගේ සිත දිනාගත්හ. ඒ ආකාරයට සිත දිනාගත් පරංගීහු පසු කාලයේදී වෙරළබඩ පළාත් ආක්‍රමණය කළ අතර එය මෙරට පැවති සංස්කෘතිය පරිහානියට පත්වීමටද හේතු කාරණා විය.

එහෙත් ළඟ පාරක් තිබියදී දුර පාරකින් පරංගියා කෝට්ටේ රජු බැහැ දැකීමට ගෙන ගිය කාරණාව අලලා 'පරංගියා කෝට්ටේ ගියා' වගේ යන ප්‍රස්ථා පිරුළ ඇතිවූවේය.

එසේම මිනී කන කිඹුළන් සිටිනවා ලෙසින් පවසා පරංගියා රැවැට්ටූ ඇළ 'බොරු ඇළ' ලෙස ප්‍රචලිත වූ අතර පසු කාලයේදී බොරු ඇළ 'බොරැල්ල' බවට පත්වූවේය. බොරැල්ල නාමකරණය පිළිබඳව වූ ජනප්‍රවාදය එසේය.

# උඩරට ගිවිසුම...

8 වන පිටුවෙන්

ආගමත් ආරක්ෂා කරන බවට පොරොන්දු විය.

6. වැනි වගන්තිය - ශරීරාවයව කැපීමේ වධ බන්ධන තහනම් කිරීම ප්‍රකාශ විය.

7. වැනි වගන්තිය - මරණීය දණ්ඩනය දීමේ බලය ආණ්ඩුකාරයා සතු වන අතර, මරණ දඬුවම ලද යුතු තරමේ අපරාධ, ඒජන්තවරු ඉදිරිපිටදී විභාග කිරීමට පොරොන්දු විය.

8. වැනි වගන්තිය - සිවිල් හා අපරාධ නඩු පෙර පරිදිම සිංහල මුලාදෑනිවරුන් විසින් විභාග කරන අතර, අවශ්‍ය විටක මැදිහත්වීමේ බලය ඉංග්‍රීසි ආණ්ඩුව සතුව පැවතීම ප්‍රකාශ විය.

9. වැනි වගන්තිය - උඩරැටියන් නොවන අයගේ නඩු ඉංග්‍රීසි නීතියට අනුව විසඳීමට පොරොන්දු විය.

10. වැනි වගන්තිය - උඩරට යටත්කර ගැනීමට කලින් නිකුත් කළ (ඉංග්‍රීසි) ආඥා සියල්ලම අවංලගු කිරීමට පොරොන්දු විය.

11. වැනි වගන්තිය - සිංහලේ රාජ නියමයන් අනුව ආදායම් පාලන නඩත්තුව සඳහා ඒජන්තවරුන් විසින් එකතු කිරීමට පොරොන්දු විය.

12. වැනි වගන්තිය - උඩරට ප්‍රදේශවල වෙළඳාම් කටයුතු දියුණු කිරීමට පියවර ගන්නා බවට පොරොන්දු විය.

## උඩරට ගිවිසුමේ වූ අත්සන්

උඩරට ගිවිසුමට ඉංග්‍රීසි පාර්ශ්වය වෙනුවෙන් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාද සිංහල පාර්ශ්වය වෙනුවෙන් ඇහැලේපොළ මහ නිලමේ ප්‍රමුඛ උඩරට ප්‍රධානීන් දස දෙනකු අත්සන් තබන ලදී. එය සිදු කරන ලද්දේ ඉංග්‍රීසි ආණ්ඩුවේ භාෂා පරිවර්තක වූ ජෝන් ඩොයිලි හා නියෝජ්‍ය ලේකම් ජේම්ස් සදර්ලන්ඩ් යනාදීන් ඉදිරිපිටදීය. උඩරට ගිවිසුමට අත්සන් කළ උඩරට ප්‍රධානීන් 11 දෙනා මෙසේය.

1. ඇහැලේපොල අදිකාරම, 2. පළමුවැනි අදිකාරම හා සත්කෝරළේ දිසාව - මොල්ලිගොඩ, 3. සපරගමුවේ දිසාව දෙවැනි අදිකාරම - පිළිමතලාවේ, 4. සතර කෝරළේ දිසාව - පිළිමතලාවේ, 5. ඌව දිසාවේ - මොනරවිල කැප්පෙටිපොළ, 6. මාතලේ දිසාව - රත්වත්තේ, 7. තුන්කෝරළේ දිසාව - දූල්ලෑවේ, 9. වෙල්ලස්ස - බින්තැන්න දිසාව - මිල්ලෑව, 10. තමන්කඩුව දිසාව - ගලගම, 11. නුවර කලාවිය දිසාව -ගලගොඩ

## උඩරට ගිවිසුමේ වූ බරපතළ පරස්පරතාවයන්

උඩරට ගිවිසුම පිළිබඳ ගැඹුරින් විමර්ශනය කර බලන කල්හි එහි මුල් පිටපතේ වූ අත්සන් සහිත පිටුවෙන් පිටපත් කීපයක් ම විද්‍යමාන වන බව පෙනේ. උඩරට ගිවිසුමේ මුල් පිටපත වර්ෂ 1984 දී එවකට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වූ ආචාර්ය හරිස්චන්ද්‍ර ද සිල්වා මහතා විසින් සොයාගන්නා ලදුව දැනට එම දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති අතර තවත් පිටපතක් ජෝන් ඩොයිලි විසින් සකස් කරන ලදුව එයින් පිටපත් කරගන්නා ලද මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද ශූරීන් තම උඩරට මහා කැරැල්ල - 1963 නම් වූ මාහැඟි ග්‍රන්ථයේ 3 වැනි වෙළුමට ඇතුළත් කර ඇත. මෙය වනාහී මෙරට බොහෝ කෞතුකාගාරවල මහජන ප්‍රදර්ශනය සඳහා තබා ඇති සේම මෙරට සිංහල ඉංග්‍රීසි ඉතිහාස ග්‍රන්ථවලට ඇතුළත්ව ඇති උඩරට ගිවිසුමේ පිටපතයි.

ඒ අනුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වූ මුල් පිටපත හා ජෝන් ඩොයිලිගේ පිටපත එකිනෙක සන්සන්දනය කර බලන කල්හි උඩරට ප්‍රධානීන්ගේ අත්සන්වල බරපතළ පරස්පරතාවන් කීපයක්ම දැකිය හැකිය. ඒවා මෙසේය.

1. ඇහැලේපොළ මහ නිළමේගේ සුපුරුදු අත්සන (එනම් සපරගමු සන්නසට හා මුරුසි දිවයිනේ සිට එවන ලද ලිපිවලට යෙදූ අත්සන) හා මෙම උඩරට ගිවිසුමේ පිටපත් දෙකෙහිම වූ ඔහුගේ අත්සන් අතර ඇත්තේ බරපතල පරස්පරතාවකි. ඇරත් ඇහැලේපොළ මහ නිළමේ උඩරට ගිවිසුමට අත්සන් තබන ලද්දේ කුමන නෛතික බලයක් යටතේද යන්න තවත් සැකයට තුඩු දෙන කාරණාවකි. මක්නිසාද යත් ඒ වන විට ඇහැලේපොළ මහ නිළමේ කිසිදු තනතුරක් නොදරන ලද බැවිනි. යම් අයුරකින් උඩරට ගිවිසුමට ඇහැලේපොළ මහ නිළමේ අත්සන් කළා නම් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ඔහුට වගකීම් සහිත තානාන්තරයක් ලබා නොදුන්නේ ඇයි? මෙය ගැඹුරින් විමර්ශනය කළ යුතු කාරණාවකි. යට කී කරුණු කාරණාවලට අනුව ඇහැලේපොල මහ නිළමේගේ අත්සන ඉංග්‍රීසීන් විසින් ව්‍යාජව යොදන ලද අත්සනක් බව පෙනේ. උඩරට ගිවිසුම කෙටුම්පත් කිරීමෙහිලා පුරෝගාමියා වූ ජෝන් ඩොයිලිගේ දිනපොතට අනුව ඇහැලේපොළ මහ නිළමේ වර්ෂ 1815 මාර්තු මස 03 වැනි දින සිට 11 වැනි දින දක්වා අසනීපව සිටි අතර ඔහු සුවපත් වූ 11 වැනි දින බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා අසනීප වී ඇත. මාර්තු මස 18 වැනි දින ආණ්ඩුකාරවරයා පෞද්ගලිකව මුණගැසුණු අවස්ථාවේදී ඇහැලේපොළ මහ නිළමේ තම අත්සන යෙදූ බව එහි වැඩිදුරටත් සඳහන් වේ.

2. සතර කෝරළයේ දිසාව වූ කනිටු පිළිමතලාවේ දිසාවගේ අත්සන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වූ මුල් පිටපතෙහි එකී අත්සන වටා කිසියම් රවුමක හැඩයක් පෙන්නුම් කරන අතර, ජෝන් ඩොයිලි විසින් සකස් කරන ලද පිටපතෙහි එකී අත්සන හුදෙකලා වී ඇත.

3. උඩරට ගිවිසුමට අත්සන් කරන ලද උඩරට ප්‍රධානීන් තම රාජකාරි කටයුතුවලදී විවිධ ලේඛනයන්ට (උදා- සපරගමු සන්නස් වෙළුමට) තබා ඇති අත්සන් හා උඩරට ගිවිසුමේ වූ ඔවුන්ගේ අත්සන් අතර ඇත්තේ බරපතල පරස්පරතාවයකි. ඌව දිසාව වශයෙන් උඩරට ගිවිසුමට සිංහල අක්ෂරයෙන් තම අත්සන යෙදූ මොනරවිල කැප්පෙටිපොළ මහ නිළමේ මාතලේ දිසා ධුරය දරන ලද කාලයේ (වර්ෂ 1803) දී සපරගමුව සන්නස් වෙළුමට එවකට රාජසභාවට බලපෑ ද්‍රවිඩ ග්‍රන්ථාක්ෂරවලින් තම අත්සන යොදා ඇත. (ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, මහනුවර ශාඛාව අංක. 689) මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද සූරීන් මෙසේ සඳහන් කරයි. 'කඩවතේදී මේ තල්පත අතට ගත් මොල්ලිගොඩ රජු කෝපවන පරිදි ආක්‍රෝෂ පරිභව මුඛයෙන් පතක් ලියා ඇහැලේපොළගේ අත්සන එහි යෙදීය.' (උඩර මහ කැරැල්ල)

මෙම ඓතිහාසික කාරණාවත් සමගම සනාථ වනුයේ එකල්හි උඩරට ප්‍රධානීන් තම තමන්ගේ පැවැත්ම උදෙසා අන් අයගේ අත්සන් ව්‍යාජව යෙදූ බවයි.

නිගමනය - අපේ ජාතිය මිහිදන් කර අපේ දේශය පරහස්ථානගත කොට ජාතිය පරදේශයක වහලුන් බවට පත්කිරීමේ දොරගුළු විවර කළ මෙම උඩරට ගිවිසුම වනාහී ඉංග්‍රීසි පාලකයන් විසින් තම අභිමතය පරිදි සකස් කොට ඉතා සූක්ෂම සේම වංචනික අයුරින් උඩරට ප්‍රධානීන් හමුවේ තබා සම්මත කර ගන්නා ලද ව්‍යාජ ලියවිල්ලකි.

අපේ පැරණි ගැමියන් 'බඩුත් හාමුදුරුවන්ගේ නඩුත් හාමුදුරුවන්ගේ' යැයි කියා කියන්නේ මෙවැනි සිද්ධීන්ටය.



# පාරිභෝගික යෝජනාව සහ ණය ශ්‍රේණිගත කිරීම මත එහි බලපෑම

## (Consumer Proposal and its impact on credit rating)



ණය බරින් පීඩාවට පත්වී සහනයක් සොයන්නේද? බංකොලොත් වීම ඔබේ එකම විකල්පය පමණද? නමුත් සුභ ආරංචිය නම් 'එය එසේ නොවේ'. බංකොලොත් වීම මග හරවා ගැනීමට සැබෑ ප්‍රතිලාභ සහිත විසඳුම නම් 'ණය ගැටලුවලට මුහුණ දෙන පුද්ගලයන් වැඩි වශයෙන් ණය ශ්‍රේණිගත කිරීම් මත අවම බලපෑමක්' වැනි පාරිභෝගික යෝජනා සොයා ගැනීම සඳහන් කළ හැක.

### භාව්‍ය ණය ශ්‍රේණිගත කිරීම් අවබෝධ කර ගැනීම

කැනඩාවේ ඔබගේ ණය ශ්‍රේණිගත කිරීම 'R' මුලට යෙදූ 1 සිට 9 දක්වා වූ පරිමාණයකින් දැක්වේ. පහත දැක්වෙන ශ්‍රේණිගත කිරීම් පද්ධතිය මත පදනම්ව ඔබ මුදල් ලබා දිය යුතු සෑම ණය හිමියෙකුම ඔබේ ණය වාර්තාවට විශේෂිත වූ ලකුණක් ලබා දේ.

1. R1 යනු ඔබ නියමිත වේලාවට ගෙවනු ලැබේ.
2. R2 යනු ඔබේ ගෙවීම් දින 30 ක් ප්‍රමාදයි.
3. R3 යනු ඔබේ ගෙවීම් දින 60 ක් ප්‍රමාදයි.
4. R4 යනු ඔබගේ ගෙවීම් දින 90 ක් ප්‍රමාදයි.
5. R5 යනු ඔබගේ ගෙවීම් දින 120 ක් ප්‍රමාදයි.
6. R6 සාමාන්‍යයෙන් භාවිත නොවේ.
7. R7 යනු ඔබ පාරිභෝගික යෝජනාවක්, ණය කළමණාකරණ සැලැස්මක් හෝ ඒකාබද්ධ කිරීමේ ආඥාපතක සිටී.
8. R8 යනු සුරක්ෂිත ණය හිමියා සිය සුරක්ෂිත විකල්පය (උදා: ඔබගේ මෝටර් රථය නැවත ලබාගැනීම) ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇති බව යි.
9. R9 යනු එක්රැස් කිරීමට නියමිත හෝ එකතු නොකළ හැකි යැයි සැලකෙන බොල් ණය හෝ ඔබ බංකොලොත් වී ඇති බවයි.

මෙයින් අදහස් වන්නේ ඔබේ ණය වාර්තාවේ ඇතුළත් විය යුතු හොඳම ණය ශ්‍රේණිගත කිරීම R1 වන අතර ඊට වැඩි ශ්‍රේණිගතකිරීම් ඍණාව වැඩි වේ.

මූලික උපදේශන සාකච්ඡාවේදී ඇතිවන සමහර ඉතා වැදගත් පොදු අදහස්, පාරිභෝගික යෝජනාවක් පාරිභෝගිකයාගේ ණය ශ්‍රේණිගත කිරීම්වලට බලපාන අන්දමට අදාළ වේ. මෙම සැකය සාමාන්‍යයෙන් ඇති වන්නේ පාරිභෝගික යෝජනාවක් ගොනු කිරීමෙන් පසු ණය ලබාගැනීමට හෝ ලබාගත නොහැකි විය හැකි බවට වැරදි වැටහීමක් නිසාය.

නමුත්, තත්ත්වය මෙය නොවෙයි.

ඔබ සුළු මෝටර් රථ අනතුරකට පත් වූයේ යැයි සිතන්න. මූල්‍යමය වශයෙන් ගත් කල, එවිට ඔබට පොරොන්දු වූ කාලය තුළ ඔබේ ණය හිමියන්ට ණය ගෙවීමට නොහැකි වනු ඇත. දැන් පළමුවන හදිසි අනතුරෙන් මාස කිහිපයකට පසු එම පුද්ගලයාම තවත් අනතුරකට මුහුණ පෑවේ යැයි සිතන්න. එවිට ඔහුට ණයක් හෝ මෝටර් රථ රක්ෂණයක් ලබා ගැනීමට ඔහුට හැකිද? ඇතැම් විට, මෙහිදී පුද්ගලයාගේ වාර්තාව වැඩි දියුණු වන තුරු ඉහළ රක්ෂණ පොලී අනුපාතයක් තිබිය හැකිය.

ඒ හා සමානවම පාරිභෝගික යෝජනාවක් ඇතුළත් කිරීම ඔබේ ණයට කාලයකට පමණක් බලපායි. ඔබ පාරිභෝගික යෝජනාව සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් වූ විට, මෙය ඔබගේ ණය ශ්‍රේණිගත කිරීමට ඉදිරි වසර තුනක් සඳහා බලපානු ඇත. මෙම කාලය අතරතුර, මූල්‍ය ආයතන විසින් ආපසු ඔබේ අවුරුදු දෙකක් සදහා ගෙවීමේ ඉතිහාසය පරීක්ෂා කර බලා ඔබ ණයක් ලැබීමට සුදුසුකම් ලබනු ඇත්දැයි තීරණය කරයි. ද්විතීක මුදල් ණයට දෙන ආයතන (Secondary / Private lenders) ඔබ පාරිභෝගික යෝජනාව ගොනු කිරීම අවසන් කර කෙටි කාලයකදී ඔබට මුදල් ලබා දීමට එකඟ විය හැකිය. නමුත් මෙහිදී පොලී අනුපාතිකය ඉහළ යා හැක. සැලකිලිමත් කළමනාකරණයකින් පුද්ගලයෙකුට ඔහුගේ ණය ශ්‍රේණිගත කිරීම් නැවත ගොඩ නගා ගත හැකි විය යුතුය.

### තවත් ණයක් සඳහා අයදුම් කිරීමට වසර තුනක් සිටීමට සිදු වේවිද?

ඔබ පාරිභෝගික යෝජනාවක් ගොනු කළ පසු, ඔබේ වත්මන් ආදායම, ඔබ ලබා ගන්නා මුදල හා සුරක්ෂිතභාවයට තබන වත්කම්වල වටිනාකම මත ඔබගේ ණය ලබා ගැනීමේ හැකියාව තීරණය වේ.

ඔබේ පාරිභෝගික උපදේශකයා උපදෙස් ලබා ගැනීම හෝ ඔබේ පාරිභෝගික යෝජනාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මුදල් ලබා ගැනීමට ණය හිමියන්ගේ නාමවලියක් අධ්‍යනය කිරීම වඩාත් සුදුසුය. ඔබට ප්‍රමාණවත් තරම් ආදායමක් සහ අවම වශයෙන් ඩොලර් 1500 ක් සහිතව ණයපත් දෙකක් තිබෙන්නේ නම්, ඔබේ පාරිභෝගික යෝජනාව ගොනුකර දෙවසරක් අවසානයේදී නව උකසක් ලබාගැනීමට සුදුසුකම් ලැබිය හැකිය.

**ඔබට තවත් මේ සම්බන්ධව ගැටලු ඇතොත් 416 650 5400 හෝ**

**www.gtacredit.com වෙබ් අඩවිය මඟින් අප හා සම්බන්ධ වන්න.**

**වැඩි විස්තර පිටු අංක 23 හි අපගේ දැන්වීමෙහි සඳහන් වේ.**




ශ්‍රී ලංකාවේ සියලුම රූපවාහිනී නාලිකා
ක්‍රීඩා / ක්‍රිකට් / පුවත් / චිත්‍රපට / ටෙලිනාට්‍ය
දේශීය සහ විදේශීය දහසක් වැඩසටහන් ඇතුළුව

500 කට අදික රූපවාහිනී නාලිකා සජීවීව
1000 කට අදික නවීණ 2D සහ 3D චිත්‍රපට නරඹන්න
දැන් ඔබට මසකට වියදම් වන්නේ
$. 15.00 පමණී

අමතන්න
647 403 2259

IF WE DO THE CONSTRUCTION WE WILL GET YOUR
BUILDING PERMIT FREE
BUILDING PERMIT APPROVAL
LEGAL BASEMENT
BASEMENT DESIGN, RENOVATION & CONSTRUCTION
SIDE ENTRANCE
FOR FREE CONSULTATION AND ESTIMATES
CALL
647 403 2259
WeDesignBuild Inc.
www.wedesignbuild.ca

LESSON 8




Hope you had fun learning all the interesting words that we presented on the vocabulary column! Could you use them in basic conversations? That is a good way to memorize new words. You could use the words learnt so far among a group of people who study French. Did name tagging the things around you work as a good method of learning? As we always say, practice and dedication is the most important factor in learning a foreign language.
This month's Dasatha issue consists of a vocabulary section and a grammar section. Vocabulary section brings to you an important lesson about numbers in French. Conversation section will continue again in future issues after presenting you with these important vocabulary lists. The grammar lesson continues as usual to improve your grammar knowledge and help you converse and write correctly in French. Enjoy learning! Thank you!



## Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary

The vocabulary section of this months's Dasatha issue consists of the French numbers. Learning how to count in a foreign language makes learning interesting and it gives you a sense of achievement. You can read them aloud in order to memorize and once you remember everything write them down to practice the spellings.

Les Nombres (ලෙ නෝම්බ්ර) – The numbers

| | | |
|---|---|---|
| 0 | Zéro | (සේzරො) |
| 1 | Un | (අං) |
| 2 | Deux | (ද) |
| 3 | Trois | (තෘවා) |
| 4 | Quatre | (කැත්‍ර) |
| 5 | Cinq | (සැන්ක්) |
| 6 | Six | (සීස්) |
| 7 | Sept | (සෙත්) |
| 8 | Huit | (වීත්) |
| 9 | Neuf | (නෆ්) |
| 10 | Dix | (දීස්) |

| | | |
|---|---|---|
| 11 | Onze | (ඕන්ස්) |
| 12 | Douze | (දූස්) |
| 13 | Treize | (ත්‍රෙයිස්) |
| 14 | Quatorze | (කැතෝස්) |
| 15 | Quinze | (කැන්ස්) |
| 16 | Seize | (සෙයිස්) |
| 17 | Dix-sept | (දීස්සෙත්) |
| 18 | Dix-huit | (දීස්වීත්) |
| 19 | Dix-neuf | (දීස්නෆ්) |
| 20 | Vingt | (වැංග්) |
| 21 | Vingt et un | (වැංග්තෙඅං) |
| 22 | Vingt-deux | (වැංග්ද) |
| 23 | Vingt-trois | (වැංග්තෘවා) |
| 24 | Vingt-quatre | (වැංග්කැත්‍ර) |
| 25 | Vingt-cinq | (වැංග්සැන්ක්) |
| 26 | Vingt-six | (වැංග්සීස්) |
| 27 | Vingt-sept | (වැංග්සෙත්) |
| 28 | Vingt-huit | (වැංග්වීත්) |
| 29 | Vingt-neuf | (වැංග්නෆ්) |
| 30 | Trente | (ත්‍රොන්ත්) |

| | | |
|---|---|---|
| 31 | Trente et un | (ත්‍රොන්තෙඅං) |
| 32 | Trente-deux | (ත්‍රොන්ත්ද) |
| 33 | Trente-trois | (ත්‍රොන්ත්තෘවා) |
| 34 | Trente-quatre | (ත්‍රොන්ත්කැත්‍ර) |
| 35 | Trente-cinq | (ත්‍රොන්ත්සැන්ක්) |
| 36 | Trente-six | (ත්‍රොන්ත්සීස්) |
| 37 | Trente-sept | (ත්‍රොන්ත්සෙත්) |
| 38 | Trente-huit | (ත්‍රොන්ත්වීත්) |
| 39 | Trente-neuf | (ත්‍රොන්ත්නෆ්) |
| 40 | Quarante | (කැරොන්ත්) |
| 41 | Quarante et un | (කැරොන්තෙඅං) |
| 42 | Quarante-deux | (කැරොන්ත්ද) |
| 43 | Quarante-trois | (කැරොන්ත්තෘවා) |
| 44 | Quarante-quatre | (කැරොන්ත්කැත්‍ර) |
| 45 | Quarante-cinq | (කැරොන්ත්සැන්ක්) |
| 46 | Quarante-six | (කැරොන්ත්සීස්) |
| 47 | Quarante-sept | (කැරොන්ත්සෙත්) |
| 48 | Quarante-huit | (කැරොන්ත්වීත්) |
| 49 | Quarante-neuf | (කැරොන්ත්නෆ්) |
| 50 | Cinquante | (සැංකොංත්) |

## Grammaire (ග්‍රාමෑර්) Grammar



Hope you studied the irregular verbs in the –er verb group! In order to improve your writing and speaking skills in French, it is important to memorize and review all the verbs in a daily manner. If not you will have a hard time improving. As you already know, French language has no set rule when it comes to conjugating irregular verbs. Try constructing small sentences on your own using all the verbs you learnt so far to improve your writing skills. Last Dasatha issue's French lesson provided you with the conjugations of the irregular verbs in the –er verb group. This month's lesson will provide you with most the irregulars or the often used irregulars of the –ir verb group.

**The first set of irregualr verbs :**

| Appeler (අපලෙ) - to call | |
|---|---|
| je pars (ජපාර්) | nous partons (නු පර්තොං) |
| tu pars (තියුපාර්) | vous partez (වු පර්තෙ) |
| il/elle/on part (ඉල්/එල්/ඔන් පාර්) | ils/elles partent (ඉල්/එල් පර්ත්) |

For verbs like partir - to leave and all their derivatives (repartir, resortir), drop the last letter of the stem –part [except in the first and second person plural (nous and vous)] and add –s, -s, -t, -ons, -ez, -ent respectively to form the present tense.

Verbs conjugated like partir:

Dormir (දොර්මීර්) – to sleep
Mentir (මොන්තීර්) – to lie
Sentir (සොන්තීර්) – to feel
Servir (සැර්වීර්) – to serve
Sortir (සොර්තීර්) – to go out

**The second set of irregular verbs:**

| Ouvrir (ඌව්රීර්) - to open | |
|---|---|
| j'ouvre (ජුව්ර්) | nous ouvrons (නුස්'ඌව්රොං) |
| tu ouvres (තියුඌව්ර්) | vous ouvrez (වුස්'ඌව්රෙ) |
| il/elle/on ouvre (ඉල්/එල්/ඔන් ඌව්ර්) | ils/elles ouvrent (ඉල්ස්/එල්ස්ඌව්ර්) |

For verbs like ouvrir - to open and all their derivatives (recouvrir, recueillir), you have to add the endings of regular –er verb conjugations to the stem in order to form the present tense.
Verbs conjugated like Ouvrir include:

Couvrir (කුව්රීර්) - to cover
Découvrir (දෙකුව්රීර්) - to discover
Offrir (ඔෆ්රීර්) - to offer
Souffrir (සුෆ්රීර්) - to suffer
Cueillir (කයියීර්) – to plant

**The third set of irregular verbs:**

The other irregular verbs in –ir verbs group do not follow a pattern. The conjugations are different from one another. Therefore, you have to study and memorize the conjugations of all these bellow given verbs separately.

| Asseoir (අසව්වාර්) - to sit | |
|---|---|
| J'assieds (ජසියෙ) | nous asseyons (නුස්'අසියියොං) |
| tu assieds (තියුඅසියෙ) | vous asseyez (වුස්'අසියියෙ) |
| il/elle/on assied (ඉල්/එල්/ඔන් අසියෙ) | ils/elles asseyent (ඉල්ස්/එල්ස් අසෙයි) |

| Courir (කුරීර්) - to run | |
|---|---|
| je cours (ජකූර්) | nous courons (නු කුරොං) |
| tu cours (තියුකූර්) | vous courez (වු කුරෙ) |
| il/elle/on court (ඉල්/එල්/ඔන් කූර්) | ils/elles courent (ඉල්/එල් කූර්) |

| Devoir (දව්වාර්) – must / to have to | |
|---|---|
| je dois (ජදුආ) | nous devons (නුදවොං) |
| tu dois (තියුදුආ) | vous devez (වුදවෙ) |
| il/elle/on doit (ඉල්/එල්/ඔන් දුආ) | ils/elles doivent (ඉල්/එල් දුවාව්) |

| **Falloir (ෆලුආර්) – to be necessary** |
|---|
| il/elle/on faut (ඉල්/එල්/ඔන් ෆො) |

*The verb falloir takes only one subject pronoun.*

**Kumudu Abeywardena**
Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com

## ජනතාව..

6 වන පිටුවෙන්

කොල්ල කා ඇති කෝටි සංඛ්‍යාත ධනය ආපසු ජනතාවට ලබා දී එමගින් ජනතාවගේ ජීවන බර අඩු කරන බවයි. එවැනි සොරකම් කළවුන්ට ප්‍රතිඵල නිකුත් වීමත් සමග රටින් පැන යන්නට නොදෙන බවත් කටුනායක ගුවන් තොටුපළේදී අත්අඩංගුවට ගන්නා බවත් කී වත්මන් රජය සාමාන්‍ය නීතියට පවා පටහැනිව හොර පාස්පෝට් මගින් රට පනින්නට ගොස් අත්අඩංගුවට පත් වූවන් ගලවා ගැනීමට පවා නිර්ලජ්ජිතව ඉදිරිපත් වූයේය. අවුරුදු තුනක් ගත වනතුරුත් හොරුන්ට දඬුවම් දීම 'අද නොව හෙට' යන බාලගිරි දෝෂයට යටත් වූවා පමණක් නොව 'රජය මේ කරන්නේ දේශපාලන පලිගැනීමකැයි' යන හොරුන්ගේ මතය ජනතාව අතර තහවුරු වීමටද එය හේතු වූයේය. ඒ අනුව ජනතාව දුන් තීන්දුව තාර්කික නොවන්නේද?

අනුන්ගේ හොරකම් ගැන කියමින් බලයට පැමිණි රජය මාස 6 ක් ගත වන්නටත් පෙර තමනුදු මෙතෙක් ලංකාවේ සිදු වූ විශාලතම මහජන මුදල් කොල්ලයට මුල පිරුවේය. ඒ ශ්‍රී ලංකාවේ පුරවැසියකුද නොවන අර්ජුන් මහේන්ද්‍රන් මහ බැංකුවේ සභාපති කමට පත් කරමිනි. අර්ජුන් මහේන්ද්‍රන් බැදුම්කර සොරකමට ගෑවුණු තැන පටන් ඔහුත් ඔහුගේ සහචරයනුත් වෙනුවෙන් අගමැති සහ බහුපාක්ෂික මැතිඇමතිවරුන් හොරුන් බේරා ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කළ අයුරු ජනතාවට රහසක් නොවීය. තමන්ට බදු බර පැටවීමටත් පොලී අනුපාත ආදිය ඉහළ දමමින් තම ආර්ථික කටයුතු කෙරේ නොමනා බලපෑම් ඇති කිරීමටත් බැදුම්කර වංචාව 'ඉවහල් වූ බව' පැහැදිලිව අවබෝධ කර ගත් ජනතාව දුන් මෙම තීන්දුව අතාර්කික යැයි කෙසේ කියන්නද?

ඡන්ද හිමි ජනතාව තාර්කිකව හැසිරී ඇතැයි තහවුරු කරන මී ළඟ කරුණ නම් දිගින් දිගටම කළ මැතිවරණ කල් දැමීමේ අඥාන ක්‍රියා මාර්ගයයි. මෙවර පැවැත්වුණු පළාත් පාලන ඡන්දය පැවැත්විය යුතුව තිබුණේ 2015 මැයි මාසයේදීය. එදා ජනාධිපතිවරණයත්, මහ මැතිවරණයත් දිනා සිටි මොහොතේ මේ මැතිවරණය පැවැත්වූයේ නම් ප්‍රතිඵලය කුමක් වේදැයි කුඩා ළමයෙකුට වුවද සිතාගත හැකිව තිබියදී මේ අමන කල් දැමීම සිදුවිය. වසර තුනක් තිස්සේ විවිධ හේතු දක්වමින් ගෙන ගිය මේ කල් දැමීමේ පිළිවෙත ප්‍රජාතන්ත්‍රවාදී බුද්ධිමත් මහජනයා පිළිකුල් කළාට කිසිදු සැකයක් නැත. එහි ප්‍රතිඵලය වූයේ මේ තාර්කික තීරණයට ජනතාව එළඹීමයි.

අවුරුදු තුනක් පුරාවට රජයේ ඇතැම් මැති ඇමතිවරුන්ගේ මෝඩකම් පමණක් ප්‍රදර්ශනය කළ සාඩම්බර වාචාල කතාද මැදිහත් ජනතාවගේ පිළිකුලට ලක් වූවාට සැක නැත. රට හමුවෙහි පැන නැගී සයිටම් ප්‍රශ්නය, විවිධ වැඩ වර්ජන, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ උද්ඝෝෂණ ආදියෙහිදී බොහෝ ඇමතිවරුන් කතා කළේත් ක්‍රියා කළේත් තාන්ත්‍රික බුද්ධිමත් ලෙස නොව අමන වාචාලයින් ලෙසය. රාජිත සේනාරත්න, ලක්ෂ්මන් කිරිඇල්ල, ඩිලාන් පෙරේරා ඇතුළු බොහෝ දෙනෙකු මෙහිදී කැපී පෙනුණහ. මෙකී ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී ගත් දඩි බිඩි පියවරද එතරම් බුද්ධිගෝචර නොවීය. උද්ඝෝෂණ අවස්ථාවලදී පොලිස් බලය යෙදීමෙන් ඒවා මර්දනය කළ ආකාරයද බහුතරයකගේ කලකිරීමට හේතු විය.

තවත් බොහෝ කරුණු තිබුණු අතර ඒවා මෙහි විස්තර කිරීමට මෙය අවස්ථාව නොවේ. එහෙත් අවසාන වශයෙන් තවත් එක් කරුණක් නම් සඳහන් කළ යුතුමය. එනම් අමාත්‍ය මණ්ඩලය තුළ සාමූහික වගකීමත් (Collective responsibility) ශ්‍රී ලංකා, යූඇන්පී දෙපිරිස එක් වූ ආණ්ඩු පක්ෂය තුළ තිබිය යුතු ඒකීය භාවයත් (Unity) නොමැති වීමත් අවසාන කාලය වන විට රජයේ දක්නට ලැබුණු ජනතාවගේ තර්කානුකූල කළකිරීමට හේතු වූ තවත් ප්‍රබල සාධකයක් වූ බවයි. අමාත්‍ය මණ්ඩලයේදී එක්ව ගත් තීරණ එළියට පැමිණ විවේචනය කරමින් යකා නැටූ ඇමතිවරුන් දක්නට ලැබුණු අතර සාමූහික වගකීමට වඩා තමන්ගේ පක්ෂ, පාට ඉස්මතු කර ගනිමින් රටක් ගැන නොසිතා කටයුතු කරන්නට වූ අවස්ථා එමටය. සයිටම් ප්‍රශ්නය පමණක් ගත හොත් එය මෙතරම් අවුලක් කරා ඔඩු දුවන්නට හේතු වූයේ රාජිත සේනාරත්න, ලක්ෂ්මන් කිරිඇල්ල වැනි ඇමතිවරුන් කැබිනට් තීරණ පසෙක ලා තම පෞද්ගලික භූමිකා ඉටු කරන්නට යාම තුළින් බව නොකියාම බැරිය. සාමූහිකත්වයෙන් තොර මේ තත්ත්වය කොතරම් දුරට වර්ධනය වීද යත් මැතිවරණ වේදිකාවලදී දෙපක්ෂයේ මැති ඇමතිවරු විරුද්ධ පාක්ෂිකයන් විවේචනය කරනු වෙනුවට ආණ්ඩු පාක්ෂිකයන් විවේචනය කර ගන්නා තැනට කටයුතු යෙදුණෝය. මෙහි ප්‍රතිඵලය වූයේ 'මුලදී කී යහපාලන එකමුතු කම කෝ?' යනුවෙන් ජනතාවගේ සිත් තුළ ප්‍රශ්නාර්ථයක් මතු වීමය. තර්කානුකූලන ඡන්දදායකයාගේ තීරණයට එයද බලපෑවේය.

කෙසේ වෙතත් අවසාන වශයෙන්ද කිව යුත්තක් ඇත. පළාත් පාලන ඡන්ද විමසීමේ ප්‍රතිඵල අනුව ආණ්ඩු වෙනස් කිරීමක් කළ නොහැකිය. විශේෂයෙන් 19 වෙනි සංශෝධනය යටතේ ජනාධිපතිට එතෙක් පැවති ආණ්ඩු විසිරවීමේ බලයද අවුරුදු හතරහමාරක් යන තුරු කළ නොහැකිය. පළාත් පාලන මැතිවරණයෙන් ජනතාව ඉගැන්වූ පාඩමට අනුව රට වෙනුවෙන් කළ හැකි එකම දෙය නම් ගතවූ කාලය තුළ කළ වැරදි තේරුම් ගෙන දුර්වල ඇමතිවරුන් ඉවත් කොට නව ඇමතිවරුන් පත් කොට රටට නව ජීවනයක් දීමට ජනාධිපතිවරයා විසින් පියවර ගැනීමය. මේ මොහොතේ බැලිය යුත්තේ මිතුරුකම්, කළගුණ සැලකීම් ආදිය ගැන නොව, ප්‍රපාතයට යමින් සිටින රටේ ජනතාව ගොඩ ගත හැකි එබඳු පියවරක් ගැන පමණය.

## ඕසෝ චින්තනය...

10 වන පිටුවෙන්

පසුකර යනවා නම්, මවද දරුවා ගේ ඇතුළට ඇදල අරගෙන දොර වසා දමනවා.

කතාව බොහොම වැදගත් සංකේතාත්මකයි. අකාරගතයි. කිසිම දෙමාපියකුට ඕනෑ නැහැ දරුවෝ මරණය ගැන දැනගන්නවට. මොකද ඔවුන් වහාම සුවපහසු නොවන ප්‍රශ්න ඇසීම ආරම්භ කරන නිසා. ඒක නිසයි අපි සුසානභූමි නගරයෙන් පිටත ඉදිකරන්නේ. එවිට කාටවත් එහෙ යන්න ඕනේ වෙන්නෙ නැහැ. මරණය මාධ්‍ය කේන්ද්‍රීය කාරණයක්. සුසාන භූමිය සත්තකින් තිබිය යුත්තේ නගරයේ මැද ස්ථානයකයි. එවිට සෑම දෙනාම සෑම විටකම එය පසුකර යන්න වෙනවා.

හැම දවසකම කාර්යාලයට යද්දී, ආපසු එද්දී, පාසලට යද්දී එද්දී, වැඩපලට යද්දී එද්දී එවිට එය යළිත් සිහිපත් කෙරෙනවා. මරණය ගැන, නමුත් සුසාන භූමිය ගොඩ නගන්නේ නගරයෙන් පිටත. අපි සුසාන භූමිය අලංකාර ලස්සන තැනක් බවට පත් කරනවා. ගස්, මල් පඳුරු, අපි මරණය සඟවන්න හදනවා. විශේෂයෙන්ම බටහිරදී මරණය කතා නොකළ යුතු මාතෘකාවක්. හරියටම කලක් ලිංගිකයට තහංචි දමා තිබුණ වගේ මරණයටත් තහංචි. මරණය තමයි අවසාන තහංචිය.

## නිදිමත නම් ...

14 වන පිටුවෙන්

**Q භාවනාව නිදිමතට හොඳ ඔසුවක් බව කියන කතාව ඇත්තද?**

එකම විදිහට එකම ඉරියව්වකින් වැඩි වේලාවක් ඉන්නා විට, එකම සිතිවිල්ලක ඉන්නා විට නිදිමත දැනීම සාමාන්‍ය දෙයක්. පොත් කියවීමේදී නිදිමත වැඩියෙන් දැනෙන්නේ ඒ නිසයි. භාවනාවේදී සිත එක අරමුණක ඇති විට සිතට සැනසිලිදායක බවක් ලැබෙනවා. එයත් හොඳ නින්දකට බලපානවා. වාහනයක ගමන් කරන විට එකම ශබ්දයක් දිගු වේලාවක් ඇසීම නිසා නිදිමත ගතියක් දැනෙනවා. කුඩා දරුවන්ට නැළවිලි ගී කීමේදීත් සිදු වන්නේ එවැනි දෙයක්.

**Q දවල් කාලයේ නිදා ගන්නා අයට රාත්‍රියේ නින්ද යනවා අඩුද?**

ඔව්. දවල් කාලයේ නිදා ගන්නා අයට රාත්‍රියේ නින්ද යාම අඩුවීම ස්වාභාවිකයි. එමඟින් සාමාන්‍ය නිදා ගැනීමේ රටාව වෙනස් විය හැකියි. බොහෝ වැඩිහිටියන්ට මේ තත්ත්වය ඇති වෙනවා. එය රෝගයක් නොවෙයි.

**Q නිදා ගන්නා කාමරයේ දොර ජනෙල් හොඳින් වසා තැබීම සුවබර නින්දකට බාධාවක්ද?**

සුවබර නින්දකට ඔක්සිජන් සහිත පිරිසුදු වාතය අත්‍යවශ්‍යයි. අතීතයේ නම් විශේෂයෙන් ග්‍රාමීය සමාජයේ වැඩිහිටියන් වැඩිපුරම නින්දට ගියේ ගෙදර පිල්කඩේ. නිරාවරණය වූ පරිසරයේ හොඳින් වාතාශ්‍රය ලැබුණ නිසා ඔවුන්ට සුව පහසු නින්දක් ලැබුණා. නිවසේ කාමරවල දොර ජනෙල් වසා තැබුණේ පවා කලාතුරකින්. ඒත් අද මේ තත්ත්වය වෙනස්. මේ නිසා නිදන කාමරයට හොඳින් වා කවුළු තැබීම ඉතාම වැදගත්.

ශබ්ද සහ ආලෝකය ගලා නොඑන පැත්තේ ඇති ජනේල විවෘතව තැබීමෙනුත් නිදන කාමරයට පිරිසුදු වාතාශ්‍රය හොඳින් ලැබෙනවා. ජනෙල් සහ වා කවුළුවලට දැල් ගැසීමෙන් මදුරු කරදරවලින් මෙන්ම සොර සතුරු කරදරවලින්ද බේරී සිටිය හැකිය. නිදන කාමරයට හොඳින් වාතාශ්‍රය නොලැබුණත් හුස්ම ගැනීමේ අපහසුතා ඇතිවී නින්දට බාධා විය හැකියි.

ඒ වගේම දරුවන්ගේ හැඬීම, සහකරුගේ හෝ සහකාරියගේ ගෙරවිල්ල, ඝෝෂාකාරී සංගීතය, වාහනවල ශබ්ද සුව පහසු නින්දට බාධා ගෙන දිය හැකියි. තද ආලෝකයත් සමහර අයගේ නින්දට බාධාවක්. මේවායින් වැළකී සිටීමට කාමරයට අඳුරු තිර දැමීම, නිදන කාමරයේ දොර වසා තැබීම ආදිය කළ හැකියි.

**Q නිදි උලුක්කු ඇති වන්නේ නිදා ගන්නා ඉරියව්වල ඇති වරදක් නිසාද?**

ඔව්. නිදා ගන්නා ඉරියව් වැරදුණ විට නිදි උලුක්කු වගේම හන්දිපත් රුදාව, කොන්දේ කැක්කුම, හිසරදය වැනි තත්ත්වයන් පවා ඇතිවිය හැකියි. එය සුව පහසු නින්දට බාධාවක් මෙන්ම ශාරීරිකව දැඩි අපහසු බවක් ඇති කරනවා. මේ නිසා නිදා ගන්නා ඇඳ, මෙට්ටය සහ කොට්ටය නින්දට ගැළපෙන අයුරින් සකසා ගැනීම ඉතාම වැදගත්. ඇඳ ඇතිරිලිවල පවිත්‍ර බව ගැනත් සැලකිලිමත් විය යුතුයි. හොඳින් සෝදා අව්වේ වියළා ගත් ඇඳ ඇතිරිලි, කොට්ට සහ මදුරු දැල් භාවිතයෙන් ලැබෙන ප්‍රසන්න බවත් සුවබර නින්දට බලපානවා.

විශේෂයෙන් පුද්ගලයකුගේ ජීවිත කාලයෙන් තුනෙන් එකක් ගෙවෙන්නේ නිදන ඇඳ මත. මේ නිසා එවැනි තැනක පිරිසිදු බව හා ක්‍රමානුකූල බව පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්විය යුතුයි.

**Q මත්පැන් හා දුම්පානය කරන අයට අඩුවෙන් නින්ද යනවා කියන කතාව ඇත්තද?**

ඔව්. මද්‍යසාර හෝ දුම්කොළ සුළු ප්‍රමාණයකට වුවද කෙනෙක් අවදිව තැබිය හැකියි. ඊට හේතුව දුම්කොළ වැනි දේ මඟින් ස්නායු පද්ධතිය උත්තේජනය කිරීමයි. එවිට නිදිමත නැතිව යනවා. මත්පැන් ගන්නා සමහර අයට ඉක්මනින් නිදිමත දැනුණත් ඔවුන් නිදා ගන්නා කාලය අඩුයි. වේලාසනින් ඇහැරුණත් නැවත නින්ද නොයාම කායික, මානසික සුවතාවට බලපානවා. මත්පැන් හා දුම්පානයට ඇබ්බැහි වූ කෙනෙක් සුවබර නින්දක් බලාපොරොත්තු වනවා නම් කළ යුතු එකම දේ එම පුරුද්ද අත්හැරීමයි.

**Q නින්දට බාධා ගෙන දෙන රෝගී තත්ත්වයන් තිබෙනවාද?**

ඔව්. හන්දිපත් රුදාව සහ නොයෙකුත් රෝග නිසා හට ගන්නා ඇඟ පතේ වේදනාව, විශේෂයෙන් පිරිමින්ගේ පුරස්ථි ග්‍රන්ථියේ ඉදිමීම නිසා හට ගන්නා මුත්‍ර හිරවීමේ වේදනාවන්, හෘදය, පෙනහලු සහ ආහාර මාර්ගය වැනි ඉන්ද්‍රියයන්ගේ වේදනාවන් නින්දට බාධා කළ හැකියි. උදාහරණ ලෙස ආමාශයේ හා ග්‍රහණියේ තුවාල සුව පහසු නින්දට බාධාවක්. මේ රෝග හඳුනාගෙන එයට සරිලන ප්‍රතිකාර ලබා ගැනීමෙන් මීට විසඳුමක් ලබා ගත හැකියි.

ඒ වගේම මානසික කලකිරීමක්, බිය, දුක, කාන්සාව හා නිතර කනගාටුවෙන් සිටින අයට නින්ද යාම ප්‍රශ්නයක් විය හැකියි.

නින්ද නොයාමට අමතරව නිතර කේන්ති යාම, ආහාර අරුචිය, ලිංගිකත්වයට ආශාව නැති වී යාම, සිරුරේ බර අඩුවීම, පපුව ගැහීම, තමන්ගෙන් තම පවුලට හෝ සමාජයට වරදක් වූවා යැයි නිතර සිතට නැඟීම, වෙනත් අය දෙතුන් දෙනකු කතා කරන විට ඒ අය තමන්ට විරුද්ධව කතා කරනවා යැයි සැක සිතීම, ජීවිතය එපා වීම මානසික රෝගයක ලක්ෂණ. මේ අය නිසි වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු වීම වැදගත්.

**Q නින්ද නොයන අය පුරුද්දක් ලෙස නිදිපෙති ගැනීම අහිතකරද?**

නිදි පෙති ආවට ගියාට බීමට සුදුසු ඒවා නොවේ. නිදි පෙති ගැනීම කළ යුතු වන්නේ රෝගී තත්ත්වයක් හඳුනා ගැනීමෙන් පසු ප්‍රතිකාරයක් ලෙස අවශ්‍ය නම් පමණයි. ඒ පිළිබඳව තීරණයක් ගත හැකි වන්නේ වෛද්‍යවරයකුට පමණයි.

**Q නිදිපෙතිවලට හුරු වී සිටින කෙනෙක් ඒ තත්ත්වයෙන් මිදෙන්නේ කොහොමද?**

නිදිපෙති මඟින් බොහෝ විට සිදු වන්නේ සිහින තරංග නැති කර දමා සිතුම් තරංග වැඩි කිරීමයි. නිදිපෙති බීම එකවර නවතා දැමීමෙන් සිහින තරංග වැඩිපුර නිපදවීමෙන් භයානක සිහින පෙනීමටත්, නින්දෙන් බිය වී අවදි වීමටත්, පුළුවන්. ඒ හේතුව නිසාම ඒ පුද්ගලයා නැවතත් නිදිපෙති ගැනීමට පෙලඹෙනවා. එහෙත් කළ යුතු වන්නේ ටික දිනක් එම තත්ත්වය ඉවසා දරා ගැනීමයි. නින්ද පහසු කරවන සාධක ඇතිකර ගැනීමත් වැදගත්.

ඒ වගේම කාලයක් තිස්සේ කෙනෙක් නිදිපෙති ගැනීමට පුරුදු වී සිටිනවා නම් එය එකවර නතර කිරීමද නොකළ යුතුයි. කළ යුතු වන්නේ ගන්නා ඖෂධ ප්‍රමාණය ක්‍රමයෙන් ටිකෙන් ටික සති හෝ මාස කිහිපයකින් අඩු කිරීමයි. ඒ සඳහා වෛද්‍ය උපදෙස් ලබා ගැනීම වැදගත්.



MONEY PROBLEMS?™
ඔබගේ සියලුම ණය එක් කුඩා මාසික වාරිකයකින් ගෙවන්න
ඔබගෙන්ම විමසන්න....
■ ඔබගේ බැංකු අයිරාව (overdraft) සෑම විටම භාවිත කරන්නේද?
■ ඔබ රැකියාවේ නිරතව සිටින විටත් නිවසේ පසුවන විටත් නිරතුරුව ණය හිමියන්ගේ තර්ජන හිරිහැරවලට ලක්වන්නේද?
■ ඔබ නිවාස කුලිය, නිවාස උගස් වාරිකය හෝ වාහන සඳහා වන ගෙවීම් වෙනුවෙන් බලවත් පරිශ්‍රමයක් දරන්නේද?
■ ඔබගේ විවාහය සම්බන්ධයෙන් හෝ සෞඛ්‍ය ගැටලු නිසා මූල්‍යමය ගැටලුවලට මුහුණ පා සිටීද?
■ ඔබගේ ණය තක්සේරුව (credit rating) සෑම විටම අන්තරාකාරී මට්ටමක තිබේ යැයි ඔබ සිතනවාද?
■ ඔබගේ වාහනය, නිවස, RRSP, ව්‍යාපාර කොටස් හා වෙනත් වත්කම් කොයි මොහොතක හෝ අහිමි වේ යැයි බියෙන් පසුවෙත්ද?
■ ඔබට විරුද්ධව උසාවි නියෝග පනවා ඇත්ද?
■ ඔබ කැනඩා රජය හා සම්බන්ධිත ආදායම් බදු ගැටලුවලින් පීඩාවට පත්වී සිටීද?
gta™ credit
ඉහත ප්‍රශ්නවලින් එකකට හෝ පිළිතුර 'ඔව්' යන්න නම් ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට වහාම අප හමුවන්න
Scarborough / Downtown Toronto: 416-489-2000
Mississauga / Brampton: 416-650-5400
Scarborough 201-4433 Sheppard Ave. E Scarborough, ON, M1S 1V3
Toronto/Downtown 800-120 Eglinton Ave. E Toronto, ON, M4P 1E2
North York 306-1280 Finch Ave. W North York, ON, M3J 3K6
Mississauga 110-93 Dundas Street E. Mississauga, ON, L5A 1W7
Brampton 201-7990 Kennedy Rd. South, Brampton, Ontario, L6W 0B3
Mark Shamly
Sinhalese Consultant
Proudly Served over 10,000 clients since 2004
Visit : GtaCredit.Com
Ajay Oberoi
Government Certified Counsellor




TB
TISSA BOYAGODA, LLM
KNOW YOUR RIGHTS
TISSA BOYAGODA, LLM
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law
with Manitoba Legal Aid, Former Judge, Sri lanka
Areas of Practice
| Criminal Law
| Family Law
| Real Estate
| Immigration Matters
| Civil Litigation
| Small Claim Court Matters
| Power of Attorneys
| Last Wills
| Notarizations
GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED
1965 Britannia Road West, Suite 208 Mississauga, ON, L5M 4Y4
100 Consilium Place, Suite 200 Scarborough, ON, M1H 3E3
TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com
www.tissaboyagodalaw.com

දසත Dasatha

## වයසට යන විට අමතක වීම් ඇති කරන

# ඇල්ෂයිමර් රෝගය පරදවන පිළිවෙත්



■ වෛද්‍ය ජී. ජී. චමල් සංජීව

වියපත් වීම සමග අත්වැල් බැඳගන්නා රෝගී අවස්ථා අතර ප්‍රධාන ස්ථානයක් හිමි වන්නේ මානසික ක්‍රියාකාරිත්වයේ වන වෙනස්වීම්වලටය. මේ අතරින් අපගේ මොළයේ මතක ශක්තිය අඩුකරන බුද්ධිමය හැකියාව අවම කරන ඇල්ෂයිමර් රෝගයට (Alzheimerzs disease) විශාල වැදගත්කමක් හිමි වෙයි.

වියපත් වන වැඩිහිටි පුද්ගලයන් නැවත නැවත එකම දෙය කියවීම, මොහොතකට පෙර සිදුකළ ක්‍රියාව නොකළ බව පැවසීම, නැවත නැවත එකම ප්‍රශ්නය විමසීම ආදිය මෙහි රෝග ලක්ෂණ වෙයි. තත්ත්වය තවදුරටත් උග්‍ර වනවිට තමා සිටින ස්ථානය, තම නිවස, දූ දරුවන් පවා අමතක වීමට ලක්වෙයි. ලෝ ප්‍රකට පුද්ගලයන් ගණනාවක්ම මෙම රෝගී තත්ත්වයෙන් පෙළෙන හෙයින් මෙය වැදගත් රෝගී අවස්ථාවක් ලෙස වෛද්‍ය විද්‍යාත්මක පිළිගැනීමකට ලක්ව ඇත.

ඇල්ෂයිමර් රෝගය යනු වයස්ගතවීම සමග ඇතිවන ස්වාභාවික රෝග තත්ත්වයක් නොවෙයි. මෙයට අමතරව මෙමගින් අනතුරට ලක්වන්නේ අපගේ මොළයේ පවතින සංවේදක පමණක්ද නොවෙයි. කෙසේ වුවත් වයස්ගත වීම ඇල්ෂයිමර් රෝගය ඇතිවීමට බලපාන ප්‍රධාන හේතු සාධකයක් වෙයි.

ඇල්ෂයිමර් රෝගය සම්බන්ධ ජාත්‍යන්තර ආයතන පෙන්වා දෙන පරිදි 2050 වන විට අමතක වීම හෙවත් dementia රෝගයට ලොව පුරා මිලියන 65 කට අධික ප්‍රමාණයක් ගොදුරු වනු ඇත.

මෙම රෝගයට ප්‍රතිකර්ම ලෙස Reminyl, Aricept සහ Exelan වැනි බටහිර ඖෂධ වර්ග කිහිපයක්ම භාවිත වන අතර මෙමගින් මොළයේ අභ්‍යන්තරයේ රසායනික ක්‍රියා යහපත් ලෙස පාලනයට ක්‍රියා කරයි. රෝගී තත්ත්වය වැඩි වර්ධනය වනවිට එය පාලනය කිරීමට Exiba නම් ඖෂධයද දැනට භාවිත වෙයි. නමුත් මෙම සියලු ඖෂධවල ක්‍රියාකාරිත්වය තාවකාලික වන අතර ටික කලකින් යළි රෝගී ස්වභාවය ඉස්මතු වෙයි. මේ නිසා අමතක වීමේ රෝගී තත්ත්වයන් නැවත වෙනස් කළ හැකි ඖෂධ හෙවත් Disease Modifying Theraphy කෙරෙහි වෛද්‍ය විද්‍යාවේ වැඩි අවධානයක් යොමුව ඇත. වයස්ගත වීම සමග අපට අපගේ කටයුතු පවත්වා ගෙන යෑමට තවත් කෙනකුගේ සහයෝගයක් අවශ්‍ය වෙයි. මේ නිසා වැඩිහිටි පුද්ගලයන් රැක බලා ගන්නා සත්කාරකයන් මෙන්ම වැඩිහිටියන්ටද තමන්ට ආවේණික වූ ජීවිතයක් ගොඩනගා ගැනීමට ආශාවක් පවතියි. අනුන්ට අත නොපා ජීවත් වීමට සියලුදෙනාම මහත් සේ ප්‍රිය කරති. මේ නිසා ඇල්ෂයිමර් රෝගයට ස්ථිර ප්‍රතිකාරයක් සොයා ගැනීම මෙම සියලු දෙනාටම මහත් අස්වැසීමක් වනු ඇත.

අමතක වීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේදී Beta Amyloid ප්‍රෝටිනයට විශේෂ ස්ථානයක් හිමිවන අතර මෙම ප්‍රෝටීන එක්රොක් වීමේ ප්‍රතිඵලයක් ලෙස මොළයේ සෛල අක්‍රීය වීමක් සිදු වෙයි. මේ නිසා Beta Amyloid ප්‍රෝටීන ප්‍රමාණය ඉහළ යත්ම රෝගයේ අසාධ්‍යතාව වැඩි වර්ධනය වෙයි. මේ අනුව බීටා ඇමිලොයිඩ ප්‍රෝටීන ප්‍රමාණය අවම කළ හැකි ඖෂධයක් නිපදවන්නේ නම් ඇල්ෂයිමර් රෝගීන්ට පිළිසරණක් වනු ඇත.

ඇමිලොයිඩ් ප්‍රෝටීන නිපදවීම අඩාල කරන ප්‍රතිදේහ නිපදවීම මේ අතර ප්‍රධානය. ලොව පුරා පුද්ගලයන් 4000 ක් පමණ යොදාගෙන මේ සම්බන්ධව පර්යේෂණ දියත් වී ඇත. කෙසේ වුවත් මෙවැනි ඖෂධ ආශ්‍රිතව පවතින අනතුරු නිසා එය භාවිත කළ යුත්තේ මහත් ප්‍රවේශමෙනි. තවත් සමහර විද්‍යාඥයෝ ප්‍රෝටීන ඇමයිලොයිඩ් නිපදවීම අඩාල කිරීමට උත්සාහ ගනිති. මෙහිදී ඇමයිලොයිඩ් ප්‍රෝටීනය නිපදවීමට බලපාන ගැමා සෙක්‍රටේස් එන්සයිමය (Gama Secretase) අඩාල කිරීම කළ යුතුය.

ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර ආශ්‍රිතව සිදුකළ අධ්‍යයනයට අනුව PB T 2 නම් නව අණුව නිපදවීම හරහා මොළය තුළ බීටා ඇමයිලොයිඩ් ප්‍රමාණය අවම කර මතක ශක්තිය ඉහළ නැංවීමට අපේක්ෂිතය. මීයන් ආශ්‍රිතව සිදුකළ අධ්‍යයනයකට අනුව මෙම ඖෂධය ලබා දී පැය ගණනාවක්ගතවීමට පෙර ප්‍රතිඵලය නිරීක්ෂණය කළ හැකිවී ඇත.

මොළය ආශ්‍රිතව පවතින ස්නායු සෛලවල විශේෂ ප්‍රෝටීන වර්ගයක් තැන්පත් වීම නිසා එම සෛල විනාශ වී යන අතර මෙය අමතක වීමේ රෝග තත්ත්වය ඉහළ නැංවීමට හේතුවකි. මේ නිසා ස්නායු සෛලවල ඉහත ප්‍රෝටීනය තැන්පත් වීම අවම කළ හැකි ඖෂධයකට අමතක වීමේ රෝගයටද පිළිසරණක් විය හැකිය.

මොළයේ සෛල ආශ්‍රිතව පවතින සෛලවල ශක්තිජනක මධ්‍යස්ථානය වන මයිටොකොන්ඩ්‍රියාවල ක්‍රියාව වේගවත් කරන ඖෂධවලටද මතකය දියුණු කළ හැකියි. මෙම අධ්‍යයනය ආරම්භ කරන ලද්දේ රුසියාව ආශ්‍රිතවය. මේ අන්දමට දැනට ලොව පුරා ඇල්ෂයිමර් රෝගයට වැට බැඳීමට විවිධ පර්යේෂණ දියත් කරන අතර මින් නිසි සුවය ලැබීමට මෙම අධ්‍යයනයන් පුළුල් හා නව අත්හදා බැලීම්වලට ලක්විය යුතුව ඇත. මේ සඳහා ගතවන කාලය නිශ්චිත ලෙසට පැවසිය නොහැකි බව ඔස්ට්‍රේලියානු ඇල්ෂයිමර් රෝග පිළිබඳ මධ්‍යස්ථානයේ විධායක නිලධාරි සෛලේස්, 'රිඩර්ස් ඩයිජෙස්ට්' සඟරාවට පවසයි. ඇල්ෂයිමර් රෝගී අවස්ථාව ඉතා ප්‍රවේශමෙන් අධ්‍යයනය සහ නිශ්චය කරගත යුතු රෝගයකි. මෙයට හේතුව වෙනත් රෝග අවස්ථා ඇති කරන රෝග ලක්ෂණද මෙයට සමාන වීමය. මානසික ආතතිය, නොසන්සුන් බව මෙන්ම නිසි ලෙස උගත් බව නොලැබුවන් කෙරෙන්ද දිස් වන්නේ ඇල්ෂයිමර් රෝගයට සමාන රෝග ලක්ෂණයි. කෙසේ වුවත් රෝගී අවස්ථාව නිසි පරිදි නිශ්චය කරගන්නා විට රෝගය පැතිර ගොස් පවතින අවස්ථා බොහෝය. මේ නිසා රෝගී අවස්ථාව කල්තියා හඳුනාගත හැකි දියුණු තාක්ෂණික උපායන් කෙරෙහි වෛද්‍ය විද්‍යාවේ අවධානය යොමුවිය යුතු බව මෙල්බර්න් නුවර වියපත් වීම සම්බන්ධ ජාතික පර්යේෂණ මධ්‍යස්ථාන යේ මහාචාර්ය ඩේවිඩ් ඒම්ස් සඳහන් කරයි.

අපගේ ජාන පරීක්ෂාව, රුධිරයේ පවතින ප්‍රෝටීන පරීක්ෂාව, මොළය ආශ්‍රිතව ස්කෑන් පරීක්ෂණ ආදිය රෝගය කල්තියා හඳුනාගැනීමට උදව් වේවි යැයි ඔහු පවසයි. මොළය ආශ්‍රිත පරීක්ෂණවලදී මොළයේ ව්‍යුහාත්මකව වෙනස්වීම කල්තියා හඳුනාගෙන ප්‍රතිකාර ලබාදීමට හැකියාව ලැබෙයි. මෙහිදී PET ස්කෑන් වඩා ප්‍රයෝජනවත්ය. මෙමගින් මොළය තුළ බීටා ඇමිලොයිඩ් ඒකරාශි වීම පහසුවෙන් නිරීක්ෂණය කළ හැකිය. තම පවුලේ සාමාජිකයකු බීටා ඇමිලොයිඩ් ඒකරාශි වීම නිසා ඇල්ෂයිමර් රෝගී තත්ත්වයට ගොදුරුව ඇත්නම් මේ රෝගය පවුලේ අනෙක් සාමාජිකයන්ටද වැළඳිය හැකියි. මේ තත්ත්වය අවබෝධයට PET ස්කෑන් යොදාගත හැකිවීම වෛද්‍ය විද්‍යාව ලබන ලද සුවිසල් ජයක් වනු ඇත.

ඕනෑම රෝගයක් ඇතිවීමට වඩා වළක්වා ගැනීම වැදගත් වන හෙයින් එම සිද්ධාන්තය ඇල්ෂයිමර් රෝගය සම්බන්ධවද සත්‍ය වෙයි. ඇල්ෂයිමර් රෝගයට ගොදුරු වන බොහෝ දෙනා ඊට ළඟා වන්නේ වයස අවුරුදු 65 ඉක්මවා ගිය පසුවය. මේ සඳහා බලපාන විශේෂ හේතු සාධකද හඳුනාගෙන ඇත. මෙම ජානය පවතින සමහර පුද්ගලයන් පමණක් රෝගයට ගොදුරු වන අතර ජානය පවතින තවත් සමහර පුද්ගලයන්ට රෝගය නොවැළඳෙයි. මේ රහස පවතින්නේ කුමන ස්ථානයේදැයි විමසීම වටී.

මේ සම්බන්ධව අදහස් දක්වන පර්යේෂකයන් පෙන්වා දෙන්නේ හෘදයාබාධවලට ගොදුරු වන පුද්ගලයන්ට බලපාන බොහෝ හේතු සාධක මේ කෙරෙහිද බලපාන බවයි. අධිරුධිර පීඩනය මේ අතර ප්‍රධාන වෙයි. අධි රුධිර පීඩනයේ ප්‍රතිඵලයක් ලෙස මොළය අභ්‍යන්තරයේ ක්ෂුද්‍ර රුධිර වහනයක් සිදුවන අතර මෙය මතකය වියවුල් කිරීමට ප්‍රධාන වශයෙන් හේතුවෙයි. අධි රුධිර පීඩනයෙන් පෙළෙන පුද්ගලයන් තවත් දශක දෙකක් පමණ කාලයක් ගතවූ පසුව ඇල්ෂයිමර් රෝගයට ගොදුරු වීමට වැඩි ප්‍රතිශතයක අවදානමක් දරති. මේ නිසා විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ ආහාර පාලනය මගින් රුධිර පීඩනය අවම මට්ටමක පවත්වා ගැනීම සහ අවශ්‍ය විට ඖෂධ භාවිතය ඉතා වැදගත් වන බවය.

ඇල්ෂයිමර් රෝගයට ප්‍රතිකාර ලෙස ව්‍යායාම සිදු කිරීමද වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මේ අන්දමට භෞත චිකිත්සක ප්‍රතිකාර සිදු කිරීම මගින් මොළය හා මොළය ආශ්‍රිත ස්නායු සෛල උත්තේජනය රෝගයෙන් මිදීමට කදිම උපකාරයක් වනු ඇත. මොළයේ සෛල අතර සම්බන්ධතා දියුණු කර ගැනීමටත්, මොළයේ මානසික ක්‍රියා දියුණු කර ගැනීමටත් මෙය උපකාරී වෙයි. ඔස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් සරසවියේ මනෝ විද්‍යාඥ වෛද්‍ය මයිකල් වැලන්සියුලා සඳහන් කරන අන්දමට ව්‍යායාම මගින් ඇල්ෂයිමර්ජ්රෝගය සුවපත් වීමට ලැබීම වෛද්‍ය විද්‍යාවේ පුදුම සහගත පියවරකි. විශේෂයෙන් ස්නායු සෛල වැඩි වශයෙන් භාවිතයට ගැනීම ස්නායු සන්නිවේදන පවත්වාගෙන යෑමට උපකාරී වන්නෙකි. ළදරු අවධියේදී ඉහළ පෝෂණ තත්ත්වයක් ලැබීමද ඉහළ අධ්‍යාපනයක්ලබාගැනීමද මානසික ක්‍රියා දියුණු වන අවස්ථාවන්හි සහ ක්‍රියාකාරකම්වල නිරත වීමද ඇල්ෂයිමර් රෝගයෙන් මිදීමට තවත් උපකාරී වන්නකි.

### ඇල්ෂයිමර් රෝගයෙන් ඈත්වීමට පහත සරල උපායන් උදව් වනු ඇත.

- මානසික ක්‍රියා දියුණු තත්ත්වයක පවත්වා ගෙන යා යුතුය. ඉගෙන ගැනීම, ප්‍රහේලිකා පිරවීම ඇතුළු සමාජ ක්‍රියා මෙයට උදව් වෙයි.
- ආහාර තුළ සංතෘප්ත මේදය අඩු විය යුතුය. විටමින් හා ප්‍රතිඔක්සිකාරක ඉහළ අගයක පැවතිය යුතුය.
- දිනකට අවම වශයෙන් විනාඩි 30 ක් පමණ ව්‍යායාමවල නිරත විය යුතුය.
- නිරන්තරව රුධිර පීඩනය, කොලොස්ටරෝල් මට්ටම රුධිරගත සීනි මට්ටම හා ශරීරයේ බර ප්‍රමාණය ගැන අවධානයෙන් යොමුවිය යුතුය.
- සෑම විටම සමාජශීලී විය යුතුය.
- දුම්පානය මෙන්ම මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතයෙන්ද වැළකී සිටිය යුතුය.
- හිසට සිදුවන අනතුරුවලින් හැකි සෑම විටම වැළකී සිටිය යුතුය. රිය පදවන විට ආරක්ෂිත ආසන පටි පැළඳිය යුතුය.




CANADA · SRI LANKA ASSOCIATION
EQUALITY PEACE FRATERNITY
CANADA SRI LANKA ASSOCIATION OF TORONTO
PRESENTS
50th
1968 - 2018
Spectacular 50th Annual Cultural Show
Sri Lankan Sinhala & Tamil New Year Celebration 2018
කැනඩා ශ්‍රී ලංකා සංගමය
50වන වරටත්
පවත්වන අලුත් අවුරුදු උත්සවය
கனடா ஸ்ரீலங்கா ஒன்றியம்
பெருமையுடன் வழங்கும்
50வது சிங்கள தமிழ் புத்தாண்டு கலை நிகழ்ச்சி
Sir John A. Macdonald Collegiate Institute Auditorium
2300 Pharmacy Ave, Scarborough, ON M1W 1H8
Sat. April 21, 2018 at 4:00 pm
FOR TICKET INFORMATION, PLEASE CALL:
Chitral 416-707-4904
Sujeewa 416-895-0217
Raj 416-567-5104
Indica 416-578-4634
Riyaz 647-283-1966
Ackiel 416-898-9495
Tickets:
Adults: $10.00
Children: $5.00
(5-12 years)


ADVICE FROM SOMEONE YOU CAN TRUST
Wherever you are in life, strengthening your plan today will help give you and your family a brighter tomorrow.
Life insurance • Critical illness insurance • RRSPs/RRIFs
Kasun Kirtisinghe
Tel: 416-708-7255
kasun.kirtisinghe@sunlife.com
www.sunlife.ca/kasun.kirtisinghe
35 Wolfe Street, Unit 2
Frankford, ON K0K 2C0
Sun Life Financial
Life's brighter under the sun
Sun Life Assurance Company of Canada is a member of the Sun Life Financial group of companies.
© Sun Life Assurance Company of Canada, 2018.

# ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)

- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT



## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage, Refinancing, Second Mortgage, First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

**Abby Sri Haran**
**Senior Mortgage Specialist**

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

The Alumni Association of the University of Peradeniya – GTA & Suburbs

Proudly presents

# BACK TO HANTANA – 2018



**Sri Lankan Past Drama Acts**
**With leading Sri Lankan Artists**

**Madani Malwattage** and
**Dr. Jayalath Manorathna**

$35/- Adults,
$20/- Children (6 - 12 years)

**Saturday April 7th, 2018**
from 6:30 PM to 10:30 PM (Dinner will be served at the end)

**Port Credit Secondary School**
70 Mineola Road East, Mississauga, ON, L5G 2E5

Contact for Tickets:

- Nalaka - 647-519-5579
- Kapila - 647-700-7302
- Priyantha - 519-994-0286
- Dhammika - 647-924-7592

As a part of the 75th Anniversary celebration of the University




LAL LAW OFFICE
❖ Real Estate
❖ Mortgages
❖ Immigration Law
❖ Family Law
❖ Tax Law
Lal Handapangoda
Barrister & Solicitor
90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com


AJITH BERAGAMA LL.B, LL.M
BARRISTER, SOLICITOR AND NOTARY PUBLIC
experienced, quality, knowledgeable and affordable service
AB Ajith Law Office
Real Estate Law
Landlord and Tenent Law
Personal Injury Law
Wills & Estates Law
Immigration Law
Family Law
24/7 Hotline - 647 328 6623
10 MILNER BUSINESS COURT,
3 RD FLOOR SCARBOROUGH M1B 3C6
OFFICE - 647 777 8347
FAX - 647 777 8348
EMAIL - AJITH@AJITHLAWOFFICE.COM


Century 21
Leading Edge Realty Inc. Brokerage
invis
Canada's Mortgage Experts™
THUSITH WEERASURIYA
REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT
416 616 2402
THUSITH.WEE@GMAIL.COM
WWW.THUSITH.COM
"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"
Bus: 905-405-8484 Fax: 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3
*Independently owned and operated.
Markham 165 Main St N.
Scarborough 1825 Markham Rd.
Ajax 527 Kingston Rd. W
Toronto North 1053 McNicoll Ave.
Yorkville 1300 Bay St.
Stouffville 6393 Main St.
Whitby 408 Dundas St. W
Don Mills 801 York Mills Rd.

# ටොරොන්ටෝවේදී දොරට වඩින ආනන්ද විජේසිංහයන්ගේ 'පුනරාවතරණය'

කෑගල්ල දිස්ත්‍රික්කයෙහි බොස්සැල්ල නම් සුන්දර ග්‍රාමයේ උපත ලද ආනන්ද විජේසිංහ මහතා රාජ්‍ය සේවයේ විවිධ නිලතල රැසක් දැරූ ප්‍රවීණ විද්වතෙකි. සිය රාජ්‍ය සේවා කාලය තුළ තැපැල් ස්ථානාධිපතිවරයෙකු, මූලස්ථාන විමර්ෂණ පරීක්ෂකවරයෙකු හා රාජ්‍ය සේවා විනයානුකූල පරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් කටයුතු කර ඇති ඒ මහතා එම රාජකාරී සමයේදී ලැබූ අත්දැකීම් තුළින් 'මතකය අවදි කරමි' නමින් සිය මුල්ම කෘතිය ලියා පළ කිරීමට කටයුතු කරනු ලැබුණි. ඇස්. ගොඩගේ ප්‍රකාශනයක් ලෙස දොරට වැඩි එම ග්‍රන්ථය පාඨක ප්‍රසාදය ඉහළින්ම දිනාගත් කෘතියක් ලෙස සැලකේ.

විදෙස් රටවල් රැසක සංචාරය කිරීමෙන්ද රැකියාවල නිරත වීමෙන්ද ලබාගත් සජීවී අත්දැකීම් සම්භාරයක් සහිත ආනන්ද විජේසිංහ මහතා, ඔහුගේ දෙවන කෘතිය වන 'පුනරාවතරණය' ලිවීමේදී එම අත්දැකීම් පාඨකයා වෙත ගෙනවිත් ඇත්තේ ඉතාමත් මනරම් ආකාරයෙනි. මෙම කෘතිය සඳහා, අප තිලෝගුරු ශාක්‍යමුණි ගෞතම බුදුරජාණන් වහන්සේ ජන්ම ලාභය ලැබූ නේපාලය, ජම්බුද්වීපය (වර්තමාන ඉන්දියාව) සහ චීනයෙහි පවතින බුදු සසුණාත් එම රටවල ඇති පෞරාණික පූජණීය ස්ථානත් පිළිබඳව පුරාවෘත්තගත අගනා තොරතුරු රැසක් ඉදිරිපත් කිරීමට කතුවරයා සමත් වී ඇත. එහිදී පාඨකයා තුළ පහන්සංවේගය ඇති කරලමින් ඔවුන්ගේ දැනුම වඩා වර්ධනය කරමින් කතුවරයා විසින් එම කරුණු පැහැදිලි කොට ඇති ආකාරය පිළිබඳව විශේෂයෙන්ම සඳහන් කළ යුතු වේ. ඉතාමත් අලංකාර ලෙස ශ්‍රී ලංකාවේදී මුද්‍රණය කරන ලද 'පුනරාවතරණය' කෘතිය මේ වන විට ටොරොන්ටෝ වෙත ගෙනවිත් ඇත.

ආනන්ද විජේසිංහ මහතා මීට වසර ගණනාවකට පෙර කැනඩාවට සංක්‍රමණය වී ඇති අතර මේ වන විට කැල්ගරි නගරයෙහි පදිංචි වී සිටී. කැනඩාවට පැමිණි මුල් අවධියෙහිදී ටොරොන්ටෝ මහා විහාරයත්, වෙස්ට් එන්ඩ් බෞද්ධ මධ්‍යස්ථානයත් (මිසසාගා විහාරස්ථානය) ඉතාමත් ළඟින් ඇසුරු කරනු ලැබූ ඒ මහතා කැල්ගරි නගරයට පිවිසීමෙන් පසුත් ටොරොන්ටෝ මහා විහාරයේ පැවැත්වෙන විවිධ ආගමික උත්සව කටයුතු සඳහා සහභාගි වූයේ සැතපුම් දහස් ගණනක් වූ තම දුර බැහැර පදිංචිය ඊට බාධාවක් කර නොගනිමිනි.

කැල්ගරි පළාතෙහි සුවිශේෂී සමාජ ක්‍රියාධරයකු ලෙස ප්‍රකට විජේසිංහ මහතා එම පළාතේ ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් සිදුකරනු ලබන විවිධ කටයුතු රැසකට සක්‍රියව සිය දායකත්වය ලබා දී ඇත. ඒ අතරින් 2004 වසරේදී කැල්ගරිහි පළමු වරට බිහි වූ විහාරස්ථානය වන 'එහිපස්සිකෝ විහාරස්ථානය' හා දහම් පාසල ස්ථාපනය කිරීමත් එහි උන්නතිය සඳහා කැප වෙමින් කටයුතු කිරීමත් විශේෂයෙන්ම සඳහන් කළ යුත්තකි. එම කටයුතුවලදී ශ්‍රී ලංකාවේදී දීර්ඝ කාලයක් දහම් පාසල් ගුරුවරයකු ලෙස සේවය කර ඔහු විසින් ලබාගෙන තිබූ පළපුරුද්ද මැනවින් ප්‍රයෝජනයට ගෙන ඇති ආකාරයක් පෙනී යයි. එසේම ඔහු තුළ තිබූ දැනුම සහ පළපුරුද්ද ප්‍රයෝජනයට ගනිමින් ස්වේච්ඡා ගුරු භවතුන්ට මඟ පෙන්වීම සඳහා පන්තියෙන් පන්තියට සරිලන ආකාරයේ ගුරු උපදේශන (ඉංග්‍රිසි බසින්) පොත් පෙළක් (5 ක්) සම්පාදනය කිරීම විජේසිංහ මහතා විසින් සිදු කොට ඇත. ඊට අමතරව 'එහිපස්සිකෝ' යන නමින් ඉංග්‍රිසි භාෂාවෙන් සඟරාවක්ද ඔහු විසින් සංස්කරණය කර ඇත.

මෙම ප්‍රවීණ ලේඛකයා පිළිබඳව සඳහන් කිරීමේදී කලා මාධ්‍යය කෙරෙහි ඔහු තුළ ඇති හැකියාවත් එහි ප්‍රවීණත්වයත් පිළිබඳව කතා නොකිරීම අඩුවක් යැයි අපට සිතේ. එවකට 'හේවුඩ් කලායතනය' නමින් ප්‍රකට වූ වර්තමානයේ කොළඹ 7 හි පිහිටි සංගීත, දෘශ්‍ය හා රංගකලා පිළිබඳ විශ්වවිද්‍යාලය තුළින් පෙරදිග සංගීතය හැදෑරීමට විජේසිංහයන් භාග්‍යවන්ත වී ඇත. එසේම පුවත්පත් කලාවේදයෙහි හා සඟරා සංස්කරණයෙහි ලා ඉතාමත් දීර්ඝ ඉතිහාසයක් සහ මනා පරිචයක් සහිත කෘතහස්ත ලේඛකයෙකු වූ ඔහු හඳුනාගැනීම සඳහා ඔහු විසින් රචනා කොට ඇති ග්‍රන්ථ හා ලිපි ලේඛන පරිශීලනය කිරීම වුවත් සෑහේ.

පුනරාවතරණය කෘතිය පිළිබඳව සඳහන් කිරීමේදී එහි ලේඛනගත තොරතුරුවල ඇති වැදගත් කම මෙන්ම තවත් විශේෂිත තොරතුරක් පිළිබඳව අප සඳහන් කළ යුතු වේ.

ඒ මෙම කෘතිය ටොරොන්ටෝ මහා විහාරස්ථානයේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට කතුවර ආනන්ද විජේසිංහ මහතා තුළ ඇති පරම අභිප්‍රාය පිළිබඳ තොරතුරයි. මේ වන විට ටොරොන්ටෝ මහා විහාරයේ භික්ෂූන් වහන්සේලා විසින් පරිහරණය කරනු ලබන අතිශය පැරණි සංඝාවාස ගොඩනැගිල්ල වෙනුවට නව සංඝාවාසයක් සහ දහම් පාසල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට දරණ ප්‍රයත්නය සඳහා හැකි උපරිමයෙන් දායක වීමට 'පුනරාවතරණය' කෘතිය යොදා ගැනීමට එතුමා බලාපොරොත්තු වේ. ඒ අනුව, ටොරොන්ටෝ මහා විහාරයේ විහාරාධිපති ගෞරවාර්හ පූජ්‍ය අහංගම රතනසිරි නායක ස්වාමින් වහන්සේට කැප කොට ලියන ලද 'පුනරාවතරණය' කෘතිය විහාරස්ථානයේ ගොඩනැගිලි අරමුදලට ආධාර පිණිස යොදා ගැනීම ඔහුගේ අදහසයි.

විහාරස්ථානයේ උන්නතිය සඳහා අතහිත දීමට කැමති ඔබ සැමටත් මෙම අවස්ථාව පිළිබඳව ඉතාමත් ගෞරවයෙන් හා මෙත් සිතින් මතක් කර සිටින ඒ මහතා 2018 මාර්තු 31 වෙනි දින පැවැත්වෙන 'පුනරාවතරණය' දොරට වැඩුමට සහභාගි වන ලෙස ඔබ සැමට ගෞරවයෙන් ආරාධනා කර සිටී.



**ටොරොන්ටෝ මහා විහාර**
**සංඝාවාසය හා දහම් පාසල් ගොඩනැගිලි අරමුදලට**
**ආධාර පිණිස**
**ප්‍රවීණ ලේඛක ආනන්ද විජේසිංහයන් විසින් රචිත**
**'පුනරාවතරණය' කෘතිය**
**2018 මාර්තු 31 වන සෙනසුරාදා පස්වරු 4 ට**
**ටොරොන්ටෝ මහා විහාරයේදී**
**දොරට වඩින වගයි !**

**සම්මානලාභී සාහිත්‍යධරයෙකු වූ දයා ආනන්ද රණසිංහයන් 'පුනරාවතරණය' පිළිබඳව මෙසේ සඳහන් කරයි.**

**".....ඉබන්බතුතා, මාර්කෝ පොලෝ, ෂුවන් සැන්ග් භික්ෂුව, ක්‍රිස්ටෝපර් කොලොම්බස්, පාහියන් හාමුදුරුවන්, කැප්ටන් කුක්, වස්කෝද ගාමා, අර්නස්ට් හෙමිංවේ ආදි වූ සිය ගණනක් දේශ සංචාරකයින් ලොව බිහි නොවන්නට, එසේම ඔවුන් එඩිතරව එදා සිය නිවහනෙන් එළියට අඩියක් නොතබන්නට, අප විදෙස් දැනුම අතින්ද, එසේම ගෝලීය වශයෙන් අප ජීවත්වන මේ ලෝකය හා සම්බන්ධතා පැවැත්වීම අතින්ද කොතරම් දුර්වල තත්ත්වයකට අප අද වන තුරාත් පත්ව සිටින්නට තිබුණේද යන්න මසිතින් කිසිදා ඉවත් නොවන සිතුවිල්ලකි. ලෝකය සැබවින්ම එම මිනිසුන්ට ණයගැතිය.**

**'ආනන්ද විජේසිංහයන්ගේ' 'පුනරාවතරණය' මා ඉහතින් සඳහන් කළ සියලු දෙයින් පරිපූර්ණ අගනා ග්‍රන්ථයකැයි නොපැකිළ කියනු කැමැත්තෙමි."**

**- දයා ආනන්ද රණසිංහ**
**එක්සත් රාජධානිය**

**කර්තෘගේ වෙනත් කෘති.**




**පුනරාවතරණය කෘතිය ලබා ගැනීම සඳහා විමසන්න.**

**57, Scunthorpe Road, Toronto, Ontario. M1S 4V7 Tel: 1-587-890-3205**
**Email : anandaw1@yahoo.co.uk / thusharilokuge@yahoo.com**

# ලෝක ජල දිනය මාර්තු 22

ලෝක ජල දිනය 1993 වර්ෂයේ සිට සෑම වසරකම මාර්තු මස 22 වන දින සමරනු ලබයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා සභාව (United Nations General Assembly) විසින් මෙම දිනය ප්‍රකාශයට පත් කර ඇත. ලෝක ජල දිනයක් ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ ජලය හා සම්බන්ධව ඇති විවිධ ගැටලු හා ප්‍රශ්න පිළිබඳව ලෝක ප්‍රජාව දැනුවත් කර එම ගැටලු අවම කිරීම සඳහා ජනතාව යොමු කිරීමයි. මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඒ ඒ වසර සඳහා ලෝක ජල දිනය වෙනුවෙන් තේමාවක් හඳුන්වා දෙනු ලැබේ.

ලෝක ජනගහනයෙන් මිලියන 663 ක් පානය කරන ජලය පිරිසුදු සෞඛ්‍ය ආරක්ෂිත වූ ජලය නොවේ. ඒ නිසා හටගන්නා රෝග හේතුවෙන් වාර්ෂිකව මිය යන සංඛ්‍යාව 842,000 ක් පමණ වන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි. 2015 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද තිරසර සංවර්ධන ඉලක්ක (SDG) අනුව වර්ෂ 2030 වන විට සැමට සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබා දීමේ ඉලක්කය කරා ළඟාවීමට අවශ්‍ය උපායමාර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීමද මෙවන් දිනකදී වැදගත් වේ.

ලෝකයේ ඇති මුළු ජල ප්‍රමාණය ඝන කිලෝමීටර මිලියන 1386 ක් බව ප්‍රකාශිතය. එයින් 97.5% ක්ම කරදිය වන අතර මිරිදිය ඇත්තේ 2.5% කි. මිරිදිය ජලයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් ඇත්තේ ධ්‍රැවීය ප්‍රදේශවල අයිස් කඳු (ග්ලැසියර) වශයෙනි. තවත් කොටසක් හිම, භූගත ජලය, පාංශු ජලය, වායුගෝලීය ජල වාෂ්ප, ගස්වැල් තුළ, සතුන්ගේ ශරීර තුළ, වැව්, පොකුණු, වගුරුබිම්, ඇළ දොළ ආදි ස්ථානවල ඇත.

මේ අනුව බලන කල මිනිසාට පානය හා එදිනෙදා අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගත හැකි මිරිදිය ජලය ඇත්තේ ගංගා, ඇළ දොළ, ළිං, පොකුණු, වැව් ආදියේ වන අතර එම ප්‍රමාණය ලෝකයේ ඇති සමස්ත ජල ප්‍රමාණයෙන් 0.29% ක් පමණ වේ. එය කෙතරම් සුළු ප්‍රමාණයක්ද යත් ප්‍රස්ථාරයක් මඟින් හෝ පෙන්වා දිය නොහැකි තරම් කුඩා ප්‍රමාණයකි. අවබෝධ වීම සඳහා එය මෙසේ ලියා දැක්විය හැක. ලෝකයේ ඇති සමස්ත ජලය ප්‍රමාණය ඔබ කියවන මෙම පුවත්පතේ සම්පූර්ණ පිටුවකට සමාන නම් මිනිසාගේ පානීය හා අනෙකුත් දෛනික අවශ්‍යතා සඳහා ලෝකයේ ඇති ජල ප්‍රමාණය දිග, පළල අඟල් 1 ක් වූ කුඩා කොටුවක ප්‍රමාණයටත් වඩා අඩුය. එවන් ඉතාමත් සීමිත වූ ජල ප්‍රමාණය ඉතා මැනවින් කළමනාකරණය කර භාවිතා කිරීම ලෝවැසි සියලුදෙනාගේ ප්‍රමුඛ වගකීමකි.

එක් එක් වර්ෂවල 'ලෝක ජල දිනය' සඳහා යොදාගත් තේමාවන්

1994 - වසරේ ජල දින තේමාව වුයේ 'අපගේ ජල සම්පත් ආරක්ෂණය කිරීම සැමගේ වගකීම' යන්නයි.

Caring for Water Resources is Everybody's Business

1995 - ජලය හා කාන්තාව අතර ඇති සැබඳියාව පිළිබඳ අවධානය යොමු කරමින් තේමාව වූයේ 'කාන්තාව සහ ජලය' යන්නයි. Women and Water

1996 - වසරේදී සමාජ ආර්ථික සංවර්ධනයන් සමඟ නව නගර නිර්මාණය වීම තුළ ඇතිවන්නා වූ ජල ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරමින් 'පිපාසිත නගර සඳහා ජලය' නම් තේමාව මූලික කරගනිමින් ලෝක ජල දිනය සමරනු ලැබීය. Water for Thirsty Cities

1997 - ලොව පවතින සියලුම ජීවින්ට අත්‍යවශ්‍ය වූ ජල සම්පත පිළිබද මෙන්ම ඒ සඳහා වූ ඉල්ලුම හා තරග පිළිබඳව ලෝක අවධානය යොමු කරමින් 'ලෝකයේ ජලය සෑහෙන තරම් තිබේද?' යන තේමාව පෙරදැරිව ජල දිනය සමරන ලදී. The World's Water, Is There Enough?

1998 - ලෝක ජල දින තේමාව 'භූගත ජලය අනගිභවනීයයි' යන්නය. Groundwater, the invisible resource

1999 - වසරේ ලොව ප්‍රධාන ගංගාවල සිදු වූ ජල ගැලීම් හේතුවෙන් විශාල ජීවිත ගණන් හානි වීම ගැනද අවධානයට ලක් කරමින් 'සියලු දෙනා ගඟ පහළ ජීවත් වෙති' යන්න තේමාවට යොදා ගැණින. Everyone lives downstream

2000- '21 වන ශත වර්ෂය සඳහා ජලය' යන තේමාව මුල් කර ගනිමින් 2000 වසරේ ලෝක ජල දිනය හේග් නුවරදී සමරන ලදී. Water for the 21st Century

2001 - පිරිසිදු පානීය ජලය ලබා දීමෙන් සෞඛ්‍ය තත්ත්වයන් වැඩි දියුණු කිරීමට ජලයේ බලපෑම පිළිබද අවධානය යොමු කරමින් ජල දින තේමාව වූයේ 'සෞඛ්‍ය සඳහා ජල වගකීම භාර ගැනීම' යන්නයි.

Water for Health, Taking Charge

2002 - සමෝදානමය ජල සැලසුම්කරණය හා කළමනාකරණය යන පණිවිඩය මුල් කරගෙන 'සංවර්ධන සඳහා ජලය' යන තේමාව භාවිතයට ගැනුණි.

Water for Development

2003 - එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන මූලිකත්වය ගෙන සැමරූ මෙම ලෝක ජල දිනයේ තේමාව වූයේ 'අනාගතය සඳහා ජලය' යන්නයි. Water for the Future

2004 - මෙහිදී තේමාව වූයේ 'ජලය හා ආපදාවන්' යන්නයි. Water and Disasters

2005 - ජල දින තේමාව 'ජීවය සඳහා ජලය' යන්න විය. Water for Life

2006 - විවිධ ආගම් ජලය ශුද්ධ වස්තුවක් ලෙස සලකමින් විවිධ චාරිත්‍ර සහ උත්සව සඳහා යොදාග නු ලැබීම පිළිබඳ අවධානය යොමු කරමින් 'ජලය සහ සංස්කෘතිය' යන්න තේමාව ලෙස යොදා ගැණිනි. Water and Culture

2007 - ලෝක ජල දින තේමාව වුයේ 'ජල හිඟයට මුහුණ දෙමු' යන්නය. Water Scarcity

2008 - වසර වන විට අහිතකර සනීපාරක්ෂක තත්ත්වයන් හේතු කරගෙන සෑම තත්පර 20 කට වරක්ම දරුවෙකු මරණයට පත්වීම පිළිබඳ දැඩි අවධානයට ලක් කරමින් එවර ලෝක ජල දින තේමාව වූයේ 'සනීපාරක්ෂක වර්ෂය' යන්නය. International Year of Sanitation

2009 - සීමා මායිම් දුරලමින් 'සැමට සමසේ ජල සම්පත' තේමාව ඔස්සේ 2009 ලෝක ජල දිනය සමරන ලදී. Transboundary Waters

2010 - ජල තත්ත්වයන්, පරිසර පද්ධතිය හා මානව සුබ සාධනය පිළිබද තොරතුරු ලොවට ලබා දීමේ අරමුණින් ජල දින තේමාව වූයේ 'ජල ප්‍රමිතිය' යන්නයි. Water Quality

2011 - 'ජලය සහ නාගරීකරණය' ය තේමාව ලෙස ගත් මේ තුළින් බලාපොරොත්තු වූයේ වේගවත් නාගරීකරණය තුළ ජනගහන වර්ධනය කර්මාන්ත බිහිවීම දේශගුණික විපර්යාස හා ස්වභාවික විපත් ජල සම්පත කෙරෙහි බලපානු ලබන ආකාරයයි. Water for Cities

2012 - වසරේ සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට පිරිසිදු ගුණාත්මක ආහාර භාවිතාවේ වැදගත්කම පිළිබඳ අවධානය යොමු කරමින් 'ජලය සහ ආහාර සුරක්ෂිතතාව' යන්න ලෝක ජල දින තේමාව විය. Water and Food Security

2013 - වසරේ තේමාව වූයේ 'ජල සහයෝගිතාවය' යන්නයි. Water Cooperation

2014 - වසරේ ලෝක ජල දින තේමාව වුයේ 'ජලය සහ බලශක්තිය' යන්නයි. Water and Energy

2015 - ලෝක ජල දින තේමාව වූයේ 'තිරසාර සංවර්ධන හා ජලය' යන්නයි. Water and Sustainable Development

2016 - 'ජලය සහ සේවා නියුක්තිය' තේමාව ලෙස යොදා ගැනුණි. Water and Jobs

2017 අපවිත්‍ර ජලය ජනනය වීම අඩුකිරීම සහ අපජලය නැවත ප්‍රයෝජනයට ගැනීම වැඩිකිරීම පිළිබඳව අවධානය යොමුකරමින් මෙවර තේමාව වූයේ 'අපජලය' යන්නයි. Wastewater

2018 - 21 වන ශතවර්ෂයේ ජල අභියෝග ජය ගැනීම සඳහා සොබාදහම භාවිත කළ හැකි ආකාරය ගැන ගවේෂණාත්මක අවධානය යොමු කරමින් 'ජලය සහ සොබාදහම' මෙවර තේමාව වෙයි. Nature for Water





6 වන කොටස

# ප්‍රාර්ථනා මල් පිපුණා

පද්මිනී ජයතිලක

"ඉතින් මල්ලියේ තාම ඉස්තෝප්පුවෙනෙ. යමු ගේ ඇතුළට වාඩි වෙන්න. මම උදේට කන්න මුකුත් ලෑස්ති කරන්නම්"

ලොකු මැණිකේ මුළුතැන්ගෙය දෙසට ගොස් උදේ ආහාරයට පිළියෙල කර තිබූ ඉදිආප්ප, සම්බෝල සහ අල හොඳි සහිත කෑම මේසය විවෘත කර,

"පුෂ්පා තව ඉදිආප්ප කුස්සියෙ තියනවනම් මේ මේසයට ගෙනෙන්"

"හා නෝනා හාමු"

"බලපං යසරත්න ඉන්නවද කියල. ඉක්මනට කඩේට ගිහින් පාන් ගෙඩියක් ගේන්න කියපං. අපිට මදිපාඩුත් එක්ක"

"හා හා හාමු"

"ලොකු මැණිකෙ තව ඉදිආප්ප තියෙනවා කුස්සියෙ ඇති වෙයි"

"කමක් නෑ.  කමක් නෑ. ඔහෙ පාන් ගෙඩියත් ගෙනාපුවාවෙ. පුෂ්පා.... උණුකරපු කිරි තියෙනව නේද? හොඳට ඉඟුරු කෑල්ලක් හෙම දාලා හොඳ කිරි වීදුරු දෙකක් හදපං ඉක්මනට"

"එන්න මල්ලි එන්න. අර ඩ්‍රයිවර්ටත් අඬ ගහන්න"

"අක්කල වලව්වට හොඳ රෙපයාර් එකක් දීල තියෙනවා. ෂා දැන් මරුනෙ. අලුතෙන් හදපු එකක් වාගේ"

"ඔව් ඔව් පුතා තමයි ඕව කළේ. මම කොහොම කරන්නද මල්ලියෙ. මේ සාගර වාගෙ පත ගෙවල්වල රෙපයාර්"

"මං ඒත් හිතුවා මිනිහ එංගලන්තෙ නතර වෙයිදවත් කියල"

"මටත් හිතුණ මල්ලියෙ. ඒ වුණාට පුතා එහෙම කැමැත්තක් නැහැ. එහෙම වෙච්ච නැති එක කොච්චර දෙයක්ද?"

"පුතාගෙ කැමැත්ත තියෙනව දේශපාලනයටත්. මේ පාරෙන් පස්සෙ අපේ කමලවර්ණ මල්ලි දේශපාලනයට එන්නෙ නැහැ කියන්නෙ. ඉතින් බාප්පගේ කල්පනාව අපේ පුතාට ආසනය බාර දෙන්න"

"ෂා.... කොච්චර හොඳද ? රාජ්‍ය පාලනය කරන එකනෙ දේශපාලනය කියන්නෙ. අපේ කිසිම කෙනෙක් වෙන නැහැනෙ ඕවගෙ දේකට යන්න. සඳරුවන් මේ රටේම නතර වෙයි"

"ඕවා ඔක්කොම ගැන හිතල ගැලපෙන මනමාලියෙක් තමයි හොයා ගන්න ඕනි"

"ආ මල්ලි කන්න තව ඉදි ආප්ප දෙක තුනක්"

"කිරි හොද්ද නම් පංකාදුයි"

"කොහොමද අක්කෙ මේ පැත්තෙ පොල් මිල මේ දවස්වල"

"හොඳයි... නරක නැහැ. පොල් ආදායම ඇති වලව්වෙ කටයුතු ඔක්කොටම. පුතා අලුතින් වාහන දෙක තුනකුත් ගත්තා. මම දැන් පරණ කාරෙක මගෙ වැඩවලට තියාගත්තා ඩ්‍රයිවර්ගෙ පඩිය මම ගෙවනවා. දැන් දැන් ඉතින් අපිත් නිදහසේ ඉන්න එපායැ. ඔය ලේලිල ආවහම වුණත් අපි අපේ තත්ත්වෙ රැකගෙන ඉන්න ඕනි"

"දැන් කවුද මෙහෙ කුස්සියෙ වැඩට ඉන්නෙ"

"ඉස්සර හිටපු කරලැයින්. එයාගෙම මිනිබිරියක්නෙ ඔය දැන් මෙතැනට ආපු පුෂ්පා"

"පුෂ්පා, අර හිටපු පොඩි කෙල්ලද? ඒ"

"ඔව් මල්ලියෙ වැඩි වයසක් නැහැ. ඒ වුණාට මහ ගෑනියෙක් වෙලා"

"කරලැයින් තාම හොඳට ඉන්නවද?"

"ලෙඩක් දුකක් නැහැ. ඇස් පේනවා අඩුයි"

"ඉතින් අක්කෙ කණ්ණාඩි දෙකක් අරන් දෙන්නකො"

"කොහෙද කණ්ණාඩි දෙක දම්මම කන් ඇහෙන්නෙ නැහැ කියල ඒක දාන්නෙම නැහැ"

"හරි පුදුම කථාවක්නෙ"

"ඕවා කාටවත් වෙනස් කරන්න බැහැ"

"ඉවුම් පිහුම් කරන්නෙ ඔය කෙල්ල පුෂ්පා. කරලැයින් අත් උදව්වක් දෙනවා විතරයි. මොකද අපේ පුතාට පිරිසිදුවට රහට කෑම ටික ඕනිනේ"

"කෙල්ල හොඳ හැඩකාරියක්නෙ"

"ඔව්... ඔව් ටිකක් දාංගලෙත් තියෙනව. ඕව බලන්න ඉතින් මෙහෙ කවුරුත් නැහැනේ"

"අක්කෙ කතාවෙන් කතාවෙන් වෙලාව නමයටත් කිට්ටු වුණා. මම එහෙනම් යන්නම්. යන ගමන් ෆැක්ටරියට ගොඩවෙලා සඳරුවන්වත් හම්බු වෙලා මම එහෙන්ම යන්නම්. ඉතින් ඔය කටයුත්ත ගැන හඳහන එහෙම ගැලපෙනව නම් අපිට දන්වන්නකො"

"ඉන්න මල්ලියේ, මමත් එන්නම් යන්න. මේ ගමේම කට්ටිය තමයි ෆැක්ටරියෙ හුඟක් වැඩට ඉන්නෙ"

"කොච්චර දෙයක්ද? ගමටත් හොඳ සේවයක්නේ"

"මෙච්චර දුර ඉඳල ඇවිත් බත් ටිකක් කාල යන්න බැරි හැටි"

"බැහැ අක්කෙ මම පාන්දරින්ම පිටත් වුණේ අද මේ වැඩ ටික ඉවර කරගෙන යන්නම ඕනි හින්ද? දැන් මට සඳරුවන් එක්ක වචන දෙකතුනක් කතා කරල දහයමාර වෙනකොට කොළඹට යන්න පුළුවන්. කන්තෝරුවලින් කරගන්න තියෙන වැඩ ටික කරගන්න පුළුවන් හවස් වෙනකොට"

"හා හා මල්ලිගෙ කැමැත්තක්. අනේ මල්ලියෙ බොහොම ස්තුතියි. අපේ වැඩේ ගැන මෙහෙම උනන්දු වුණාට"

"මේවා අපි කරන්න ඕනි වැඩනෙ අක්කෙ. සඳරුවන් අක්කගෙ වගේම අපෙත් දරුවෙක්නෙ"

"කොහොමද අක්කෙ දුවල දෙන්නට"

"ජානකී නම් තාමත් ඇවිත් ගෝරි දාගෙන යනවා. එයාට දීපුව මදි කියලනෙ කියන්නෙ. කොහොමද මල්ලියෙ තව දෙන්නෙ. අර පාර අයිනෙ අක්කර දෙකක් දුන්න. ඒකත් දෙන්න එක්ක එකතුවෙලා විකුණගත්තා. තව ඉඩම් කෑල්ලක් දෙනව මම. ඒත් ජානකීට නෙමෙයි. අර පොඩි ළමයි දෙන්නගෙ නමට ලියල"

"ඒක හොඳයි"

"රංජන් කරන කිසිම දෙයක් හරියට කරන්නෙ නැහැ. ඉඩකඩම් විකුණ විකුණ කනව මිසක්. උළු ෆැක්ටරියක් දැම්ම ඉඩම් විකුණලා. ඒකත් බංකොලොත්. ඊට පස්සෙ ලී මෝලක් දැම්මා. දැන් ඒකත් වහල දාල. කාලයක් දේශපාලනය කරල තියෙන දේ නැති කර ගත්තා. ඔහොම තමයි. අපේ ජානකීටත් රංජන් කරන හැමදේම හරි. අපි මොනව කිව්වත් වැරදියි"

"එතකොට රත්නපුරේ කට්ටිය"

"ඔව්... ඔව්. ඒගොල්ලන්ට කරදරයක් නෑ. මංජුල හරි දක්ෂයා. මේ ළඟදිත් අක්කර විසිපහක් අරගෙන තේ වවන්න පටන් අරන්"

"තේ මිල දැන් හොඳටම හොඳයි"

"එහෙනම් අක්කෙ අපි යමුද?"

"පුෂ්පා.... මම ෆැක්ටරියට යනවා. මේ හාමු මහත්තය කෑමට ඉන්නෙ නැහැ. වෙනද වගේ උයපං. මම ඉක්මනට එනවා"

★ ★ ★

හිමිදිරිය උදාවීමටත් ප්‍රථම වලව්වේ විදුලි බුබුළු දැල්වෙන්නට වූයේ මනමාලිය බැලීමට කළුතර යාමට සූදානම් වීම සඳහාය.

ලොකු මැණිකේ තමන් සතු වටිනා සාරි කිහිපයෙනුත් හොඳම සාරිය ඇඳ ගත්තාය. සඳරුවන්ද ලා නිල් පාට ඉරි වැටුන කමිසයකින් සහ කළු කලිසමකින් සැරසුණේය.

"ඇයි පුතේ, ටයි එකක් දාගන්න"

"මොන ටයිද මම්මෙ. මේ ගිනි ගහන රටේ. සුද්දො ශීතල නැති කර ගන්න බෙල්ල තද කරගෙන ටයි පටිය බඳිනව. අපිත් මෝඩයො වාගෙ දාඩිය මුගුරු දාගෙන ටයි ගැටගහගෙන ඉන්නවා"

"හා.. හා... පුතා ඕවට නීති අරගෙන එන්නකො පාර්ලිමේන්තුවට ගියහම"

"ඕව කරන්න බැරි දේවල්. මොකද මේ රටේ ඉන්න සෝභන කාරයො කැමති ඕව එල්ලගෙන ඉන්න"

"හා ඔයත් ඉතින් සෝභන කාරයා වගෙ යමුකො අද"

"මට නම් බැහැ. මම්මෙ, අපි මනමාලිට තෑගිත් අරගෙන යන්න ඕනිද ?"

"ඔව් නැතුව මනමාලියෙක් බලන්න යනකොට මනමාලය තෑගි ගෙනියන්න ඕනි. ඒක සිරිතක් මේ රටේ තියෙන"

"ඉතින් දැන් මොනවද අපි ගෙනියන්නෙ"

"පුතා කලබල වෙන්න එපා. මම අරගත්තා. අර පුතාගෙ අතේ ලොකු අක්ක මට එවල තිබ්බ හෑන්ඩ් බෑග් එක. ඒක මට ශෝක් වැඩියි.  ඒක හොඳ තරුණ ගෑනු ළමයෙකුට. ලංකාවෙ නම් මගෙ හිතේ රුපියල් හාර පන්දාහක් වෙයි"

"ඔව් අපරාදෙනෙ මම්මෙ ඒක හොඳ බෑග් එකක්නෙ. අනිත් අතට ඒක ලොකු අක්කා මම්මටම කියල අරන් එවපු එකක්නෙ. අක්ක මාත් එක්කම ගිහින් ලන්ඩන්වල තියෙන ඔල්ගා කියන ලොකු සාප්පුවකින් ඒක ගත්තෙ. අම්මට හොඳ තෑග්ගක් යවන්න ඕනි කියල. අම්මට දුක නැද්ද ඒක දෙන්න"

"අනේ නැහැ. ඉතින් මම ඒක දෙන්න යන්නෙ මගෙ අනාගත ලේලිටනෙ. මගෙ එකම පුතාගෙ ලේලිටනේ. මොනවද පුතේ දෙන දේ හොඳම එකෙන් දෙන්න ඕනි. සමහර අය නම් තෑගි කියල ගිහින් දෙන්නෙ තමන්ට එපා වෙච්ච ගෙවල්වල අයින් කරන්න තියෙන දේවල්. මම එහෙම කරන්නෙ නැහැ. දෙන දේ හොඳම දේ දෙන්නෙ. ඒක අපේ මේ වලව්වෙ එදා ඉඳලම පැවත එන හොඳ සිරිතක්"

"හොඳයි"

"අනෙක් අතට මේ වෙලාවෙ තව මොනවට වියදම් කරනවද? මෙච්චර අගනා තෑග්ගක් අපිට මේ හදිස්සියෙ හොයා ගන්නත් බැහැ. මංගල්ලෙ තීන්දු වුණොත් බැරියැ අපිට තව මීටත් වඩා රනින්, රිදියෙන් තෑගි අරන් යන්න"

සඳරුවන් සහ මැණිකේ ගෙදරින් එළියට බසින වෙලාවේ පුෂ්පා පිච්ච මල් දැමූ වතුර වීදුරුවක් රැගෙන ඉදිරියට ආවාය.

"තෙරුවන් සරණයි නෝනලාට"

"හා.. හා ... පුෂ්පටත් තෙරුවන් සරණයි. අපි එන්න ටිකක් හවස් වෙයි. ටෙලිෆෝන් කෝල් හෙම ආවොත් මම මේ ළඟකට ගියා දැන් එයි කියල උත්තර දීපං පුෂ්පා. හරිද?"

"හොඳමයි මැණිකෙ"

සෙනරත්ලාගේ මැදුරට මවත් පුතාත් ගොඩ වදින විට උදේ නමයට ළං වී තිබුණි. ඇග්නස් මැණිකේත් සෙනරත් හාමුත් ගජරාමෙට සඳරුවන්ලාට තේ මේසයක් පිළියෙල කර තිබුණේ දුර බැහැර සිට පැමිණි ඔවුන්ගේ විඩාව සහ බඩගින්න දුරු කිරීමටය.

"අප්පේ අදනෙ කල්‍යානි අක්කගෙ ලස්සන දැක්කෙ. එදා අපේ මගුල් ගෙදරටවත් ඔච්චර ලස්සනට ඇවිත් තිබුණෙ නැහැනෙ. මනමාලි පරාද වෙයිද මන්ද නැන්දම්මට"

"ආ... අපි හොඳ ලස්සන

32 වන පිටුව බලන්න



# ප්‍රාර්ථනා මල්...

31 වන පිටුවෙන්

කුමාරිහාමිල තමයි. ඒ කාලෙ. දැන් ඉතින් අපේ කාලෙ ඉවරයි. අපි දැන් යල් පැනපු කට්ටිය"

"හැම වයසටම අයිති ලස්සනක් තියෙනවා අක්කෙ. වයසට ගැලපෙන විදිහට ඇඳ පැළඳ ගත්තම ඒ ලස්සන මතුවෙනවා. අද කල්‍යානි අක්ක වයසට ගැලපෙන විදිහට පිළිවෙළට ඇඳල. ඉතින් හැබෑවටම ලස්සනයි"

"දරුවො දෙන්න නැතුව ගේ පාළුයි නේද නංගියෙ"

"අනේ ඔව් අක්කෙ. අපිට හිටියෙ ඉතින් ඔය කෙල්ලොනෙ. කෙල්ලො ඉතින් ගෙදර රැඳෙන එකක්යැ. අපි මේ ගෙවල් දොරවල් විශාලෙට හැදුවෙ පොඩි දුව මෙහි නතර වෙයි කියල හිතාගෙනනෙ. ඔන්න ඉතින් එයත් ගියා"

"නංගියෙ කොහොමද මනමාලි"

"අපේ පොඩි දුවගෙ හොඳම යාළුවනෙ"

"දෙන්න පොඩි කාලෙ ඉඳලම හොඳම යාළුවො. ඒකනේ බ්‍රයිඩ්මේඩ්ස්ටත් ගත්තෙ. හැබැයි අක්කේ අගේ ඇති කෙල්ල. අක්ක ඕක කියන කොට මට නම් හිතුනෙම මෙලහකටත් කාටහරි තීන්දු වෙලා ඇති කියලමයි. හොඳ වෙලාවට එහෙම එකක් නැහැ. හොඳට ගෙදර දොරේ වැඩත් පුළුවන්. අපේ පොඩි දුවගෙ වෙඩිං කේක එක හැදුවෙත් එයානෙ. කීප දවසක්ම අපේ ගෙදර ආව ඒ දවස්වල. හරිම නිරහංකාර කෙල්ල. මම ඒත් විහිළුවට වගේ ඇහුව කවදද ඔයා වෙඩිං කේක් දෙන්නෙ කියලත්. මම නම් හිතුවෙම කාටහරි තීන්දු වෙලා ඇති කියල. මොකද ලස්සන කෙල්ලො ඉක්මණටම මොකක හරි පැටලෙනවනෙ"

"නංගිලා නම් හොඳටම දන්නවා ඒ ළමයා ගැන"

"සඳරුවන් ළමයාගේ දේශපාලනයට යන්නත් හිතේ තියනවලු නේද?"

"ඔව්"

"මේ ළමය ඒවටත් හොඳට ගැලපෙනව. කිසි පැකිලීමක් නැතිව හොඳට කථා කරනවා. අපි ගියහමත් අම්ම තාත්තට වඩා විස්තර ඇහුවෙ ඒ ළමයා"



"මම හිතන්නෙ අපට දවල් කෑම එහෙමත් සූදානම් කරල ඇති"

"ඔව්... ඔව් ඊයෙ රෑත් මේබලා මාත් එක්ක කතා කළා. ටෙලිෆෝන් එකෙන්. අම්ම ගජරාමෙට කෑම හදනවා කිව්වා. ඔච්චර දුර ඉඳල එන අයව බඩගින්නෙ යවන්න පුළුවන්ද කියල අම්ම කිව්ව කියල මේබලා කිව්වේ"

"මම්මෙ එහෙනම් අපි පරක්කු වෙන්නෙ නැතුව යමු නේද?"

සඳරුවන් ඔහුගේ හඬ අවදි කළේය.

"අප්පේ මෙන්න සඳරුවන් පුතාට තියෙන හදිස්සියක්"

"නැතුව ආවෙ ඒකටනෙ. මෙච්චර දුරක් ගෙවාගෙන"

"අන්න හරි පුතේ ආව අරමුණට තමයි ප්‍රධාන තැන දෙන්න ඕනි"

"එහෙනම් සුභ ගමන් කියල අපි පිටත් වෙමු නේද?"

"ඉන්නකො අක්කෙ පොඩ්ඩක් මගෙ රත්තරන් බඩු ටික දාගෙන එනකන්"

මනාලියගෙ නිවසට ගිය පිරිසට උසස්ම තත්ත්වයෙන් ආගන්තුක සත්කාර හිමිවිය. මනාලියද ඔසරියකින් සැරසී සිටීම ලොකු මැණිකෙගේ සතුටට හේතු විය. පහතරට තරුණියක් වුවද ඇගේ ඇඳුම් පැලඳුම් උඩරට ගතියකින් යුතුවිය. සඳරුවන් සමඟ චතුර ලෙස ඉංග්‍රීසි බසින් කතා කළ ඇය කඩිසරව අමුත්තන්ට සංග්‍රහ කිරීම්වලද නිරත විය. ගෙවතු අලංකරණය සහ නිවස අලංකරණයද සිදුවන්නේ ඇයගේ අතින් බව පවසමින් අගේ අම්මා ඇය ගැන මනා රෙකමදාරුවක් දෙනු ලැබුවාය.

"මේ දවස්වල පුතාල දෙන්නම ගෙදර නැහැ. මේබලා දුව තමයි මේ දවස්වල ඩ්‍රයිවර් වැඩෙත් කළේ"

"මේබලා එහෙනම් හොඳ ඩ්‍රයිවර් කෙනෙක්"

"අපෝ ඔව් පුතේ"

"සුහද කථාබහ අතරතුරේදීම දිවා ආහාර මේසයද සූදානම් විය. එය මඟුල් මේසයක් තරමටම සරුවිය. අපේ පුතාට නම් කරවල බැදුමයි, මැල්ලුමයි, පරිප්පුයි තමයි අල්ලලා යන්නෙ. මම හිතන්නෙ වෙන කිසි දෙයක් ඕන නැහැ. ඒ ටික තියෙනවා නම්"

"එහෙමද? එහෙනම් මමත් පුතත් එක වාගෙනෙ. මටත් ඊට ඉහළින් යන කෑමක් තවත් නෑ" මේබලාගේ තාත්තා ලයනල් වික්‍රමසිංහ හොඳ මහත දෙහෙත ශරීරයකින් යුතු බොහෝ නිහතමානී මහත්මයෙක් විය.

"ඔන්න අක්කෙ මාමයි බෑණයි ඒකෙන් නම් නියමෙට ගැලපෙනවා. කෑම රුචිය අතින් එක සමානයි" කියමින් ඔහු කොක් හඬලා සිනහ සෙන්නට විය.

සතුටු සාමීචියේ යෙදෙමින්ම දිවා ආහාරයද ගත් දෙපිරිස මේබලා සහ සඳරුවන්ට හුදකලා වී කතා බහේ යෙදීමටද අවස්ථාවක් ලබා දුන්හ. මේ අතරතුර ඔවුහු දේශපාලනය හා වතුපිටි පාලනය තම මාතෘකා කර ගත්හ.

සවස තුනට පමණ ආපසු යාමේ අවශ්‍යතාව දැන්වූයේ ලොකු මැණිකේය.

"අපි යමුද එහෙනම්. අපිට පැය තුන හතරක් මග ගෙවන්නත් තියෙනවනෙ"

"ඔව්... ඔව් කොළඹට ගිහිනුත් තවත් ඒවගේම දුරක් යන්න එපායැ. එහෙනම් අපි පිටත් වෙමු"

ගමනේ දුර බැහැරකම නිසාම තව දුරටත් රැඳිය නොහැකි හෙයින් ඔවුහු නිවැසියනට සමුදී වාහනයට ගොඩ වූහ.

**ලබන කලාපයෙන් හමුවෙමු**

BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers
Any Document Shipping worldwide
DHL EXPRESS
AIR-SEA-LAND
Household Goods & Commercial Cargo
Packing / Relocation / Transport / Express delivery
DELIVERY SERVICE ALL PART OF SRI LANKA (GIFT PACK)

Warehouse In Colombo
LAKSIRI SEVA (PVT) Ltd
66 New Nuge Road,Peliyagoda
Kelaniya
Tel: 11-257-4180

Kurunegala Warehouse
Laksiri Seva (PVT)Ltd
118/96 Negombo Road
Malkaduwawa
Kurunegala
Tel : 037-2052-810

Warehouse In Batticaloa
LAKSIRI SEVA (PVT)Ltd
26,Hmyl Lane
Main Street,Addapalam
Ninthavur
Tel : 0672051050

Toronto: - 416-321-0400
IAM
Proud member of
International Association Of Movers
Canadian International Movers Club
Ajax / Whitby - Mr.Prasad,1-289-200-4288
Ottawa : Kannan -1-613-828-2221
Montreal: Uthayan -1-514-736-2525
Web:www.briskcargo.com
Email: info@briskcargo.com
919 Ellesmere Road Suite # 306 M1P2W7



# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2018 මාර්තු 01 දින සිට මාර්තු 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)

### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ 8 වැන්නේ ස්වක්ෂේත්‍ර වී ගමන් කරයි. මේ මස 03 වන දින වන විට 11 වැන්නේ යෙදෙන බුධ-සිකුරු යෝගය ශුභ වේ. ගුරු කේන්ද්‍රගතව ඇත. රැකියා දියුණුව ඇති කෙරේ. උසස් වීම් ලැබීමට භාග්‍යය ඇත. රැකියා අපේක්ෂිත අයට තම බලාපොරොත්තු ඉටුවීමේ අවස්ථාව පවතී. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. ආදායම් මාර්ග ශුභ වේ. හදිසි ධන ලාභ ඇත.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු මේ මස 02 වෙනි දින 11 වැන්නට පැමිණීම ශුභයි. රැකිරක්ෂා කටයුතු දියුණු වන අතර කාර්යබහුල වේ. නව රැකියා බලාපොරොත්තු වන අයට එය ඉටුකර ගැනීමට අවස්ථාව ලැබේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. තරග විභාගවලින් ජය ලැබිය හැක. ස්ථාන මාරු ඇතිවිය හැක. ආදායම් මාර්ග ශුභ වේ.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ මේ මස 03 වන දින නීච වී 10 වැන්නට පැමිණේ. එහිදී උච්ච වී සිටින සිකුරු සමග යෝග වීම ශුභයි. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. විභාග ජය ලැබේ. රැකියා, ව්‍යාපාර කටයුතු දියුණු වේ. උසස්වීම් තනතුරු ලැබීමටත්, රැකියා අපේක්ෂිත අයට ලැබීමටත් වාසනාව ඇත. ආදායම් මාර්ග ශුභ වේ.

### කටක ලග්නය

ලග්නාධිපති සඳු 2 වැන්නේ ගමන් කරමින් මේ මාසය ඇරඹේ. ගමන් බිමන් අධික වේ. රැකියා වෙළඳ ව්‍යාපාර දියුණු වේ. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. යාන වාහන මිල දී ගැනීමේ භාග්‍යය ඇත. කලා කටයුතුවලට වඩාත් ප්‍රිය වේ. පිනට දහමට වඩා යොමු වේ.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 7 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපනය හදාරණ අයට ඉන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැක. හදිසි තීන්දු තීරණ ගැනීමට පුළුවන. ඉදිරිපත් වීමේ හැකියාව ඇත. වැඩ රාජකාරි අධික වේ. රැකියා ව්‍යාපාර කටයුතු ආදිය යහපත් වේ. දෙස් විදෙස් සංචාරක ගමන් යාමට අවස්ථාව එළඹේ. රැකියාව, පදිංචිය වෙනස් විය හැක. ආදායම් මාර්ග ශුභ වේ.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ මේ මස 03 වැනි දින 7 වැන්නට ගමන් කරයි. එහි යෙදෙන බුධ-සිකුරු යෝගය ශුභ වේ. අධ්‍යාපන කටයුතු ශුභ වේ. කලා කටයුතුවලටද යොමු වේ. රැකිරක්ෂා ව්‍යාපාර දියුණු වේ. තනතුරු වරප්‍රසාද ලැබීමට හැකි කාලයකි. විවාහ අපේක්ෂිත අයට මංගල යෝග උදා වේ. ආදායම සරු වේ. ධන ලාභ ඇත.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු 6 වැන්නේ ගමන් කරයි. රැකියා, ව්‍යාපාර අංශවල දියුණුව, වරප්‍රසාද ඇති කෙරේ. ගේ දොර ඉඩකඩම් ගැනීමේ අවස්ථාව එළඹේ. වචනය බලවත් වේ. අධ්‍යාපන කටයුතු තුළින් විශේෂ ජයග්‍රහණ ලැබිය හැක.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ ලග්නයේ ස්වක්ෂේත්‍ර වී ගමන් කරයි. ආවේග ශීලී බව ඇති වේ. හදිසි තීන්දු තීරණ ගන්නා අවස්ථාවකි. සමාජසේවා කටයුතුවල යෙදේ. රැකියා දියුණුව ඇති කෙරේ. වෙළඳ ව්‍යාපාරවලින් වාසි ලැබේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. අය-වැය සමව පවතී.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 11 වැන්නේ ගමන් කරයි. රැකියා, ව්‍යාපාර අංශ තුළ වැඩකටයුතු ශුභ වේ. තනතුරු උසස් වීම් ලැබීමේ හැකියාව ඇත. රැකියා අපේක්ෂාවෙන් සිටින අයගේ බලාපොරොත්තු ඉටුවන කාලයකි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. ගේ දොර ඉඩකඩම් ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ආදායම් මාර්ග යහපත් වේ. ශුභ ඵල ඇත.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. ඉඩකඩම් දේපළ ගේදොර මෙන්ම භූමි ලාභද ඇත. නව ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට ශුභ කාලයකි. රැකියා දියුණුව ඇති කෙරේ. අධ්‍යාපන කටයුතු ශුභ වේ. ආදායම සරු වේ. සඳු 12 වැන්නේ නම් අනතුරු පීඩා ඇතිවීමට ඉඩ ඇති හෙයින් ප්‍රවේසම් වීමට සිහි තබාගන්න.

### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. කුජ කර්මස්ථානයේ බලවත් වී සිටීමද ශුභයි. රැකියා අංශයේ අවහිරතා දුරු කර දියුණුව තනතුරු වරප්‍රසාද ලද හැක. තම මතයට වැඩ කරයි. ගේදොර මිල දී ගැනීමේ අවස්ථාව ලැබේ. අධ්‍යාපන කටයුතු ශුභ වේ. පිනට දහමට යොමු වේ. ආදායම් මාර්ග සරු වේ.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 8 වැන්නේ ගමන් කරයි. භාග්‍යස්ථානයේ යෝගකාරක කුජ බලවත්ව ගමන් කිරීමද ශුභයි. රැකියා දියුණුව ඇති කෙරේ. උසස් වීම් ලැබීමට, රැකියා අපේක්ෂිත අයට ලැබීමට අවස්ථා සහිතයි. අධ්‍යාපනයට ශුභ වේ. විභාග ජය ලැබේ. මංගල යෝග උදා වේ. ආදායම් මාර්ග සරු වේ. හදිසි ධන ලාභ ඇත.







එම්. වයි. ධර්මවිජය
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණි(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca

# 1948 ඡන්දය පුරා දින 19ක් !



■ අසේල කුරුලුවංශ

මෙරට පරමාධිපත්‍යය ජනතාව සතු බව ව්‍යවස්ථාවෙන්ම සහතික කොට තිබේ. 'රට කරවන ලියැවිල්ල' නොහොත් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව' මගින් ජනතාවට පාලන බලතල, මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය ඔස්සේ පරම-ආධිපත්‍යයක් ලෙසින් ලබා දී ඇත. පරමාධිපත්‍යයේ එක් කොටසක් වන ඡන්ද බලය මගින් පාලන බලතල යටතට ගැනේ. ජනතාව සතු ව්‍යවස්ථාදායක බලය, විධායක බලය හා අධිකරණ බලය නිරූපණය කෙරෙයි.

ජනතාව සතු විධායක බලය සමස්ත ජනතාව විසින් ජනපතිවරණයකදී තෝරා පත් කර ගන්නා ජනපතිවරයාගෙන්ද ව්‍යවස්ථාදායක බලය ජනතා ඡන්දයෙන් තෝරා පත් කරගන්නා මහජන නියෝජිතයන්ගෙන් සැදුම් ලත් පාර්ලිමේන්තුවෙන්ද අධිකරණ බලය පාර්ලිමේන්තුව සිදු කෙරෙන නීති සම්පාදනය තුළින් අධිකරණය හරහාද ක්‍රියාත්මක වෙයි.

### මැකලම් ප්‍රතිසංස්කරණ ඡන්ද බලය ලබා දෙයි

මෙහිදී නිදහස් හා සාධාරණ මැතිවරණ මගින් ජනතා කැමැත්ත ඉස්මතු වීමට ඉඩ ලබාදීම අත්‍යවශ්‍ය කාරණයක් වෙයි. අනෙක් පැත්තෙන් එය ජනතාවට ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති පරමාධිපත්‍ය බලය ආරක්ෂා කිරීමකි. මේ අනුව මැතිවරණයක මූලික අංශය සර්ව ජන ඡන්ද බලය යන්න අවිවාදිතව පිළිගත යුතු සත්‍යයකි.

මෙරටට සර්වජන ඡන්ද බලය හිමි වී මේ වන විට දශක අටකට වැඩිය. යටත්විජිත සමයේ නිදහස සඳහා අරගල කළ අතීත විරුවන් කළ සටන්වල ප්‍රතිඵලයක් ලෙස 1910 දී මෙරටට ඡන්ද බලය හිමි විය. මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මඟින් සර්වජන ඡන්ද බලය වෙනුවට ඡන්ද බලය පමණක් ශ්‍රී ලංකාවට මුලින් හිමි වූයේ අපගේ පාලකයින් වූ බ්‍රිතාන්‍යය තුළද ඒ වන විට සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක නොවූ බැවිනි.

ව්‍යවස්ථාදායක සභාවට තෝරා පත්කර ගත් සාමාජිකයින් 10 දෙනා අතරින් සිවුදෙනකු ඡන්ද බලයෙන් තෝරා ගැනීමේ අවකාශ බ්‍රිතාන්‍යය පාලකයින් අපට ඡන්ද බලය ලෙස ලබාදුන් අතර එහිදී ඡන්දය දීමට අවස්ථාව හිමි වූයේ ඉහළ අධ්‍යාපනයක් ලද හෝ ඉහළ වත්කම් ඇති පුරුෂ පක්ෂයට පමණි.

මේ ආකාරයෙන් සීමාසහිත පිරිසක් පමණක් කේන්ද්‍ර කැරගත් ඡන්ද ක්‍රමය මඟින් ප්‍රජාතන්ත්‍රවාදය නිසි ලෙස නිරූපණය නොවන බවට නිතර මෙරට නායකයින් ගෙන ගිය අරගලයනට සාක්ෂියක් වූයේ 1928 වසරේදී බ්‍රිතාන්‍ය රජය එරට තුළ සර්වජන ඡන්ද බලය ක්‍රියාවට නැංවීමය. එය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාවටද සර්වජන ඡන්ද බලය ලබාදිය යුතු බවට ගෙන ගිය අරගලය සාර්ථක වූයේ 1931 වසරේදීය. ඒ වන විට අපට ඡන්ද බලය හිමිව හරියටම වසර 21 ක් ගතව තිබිණි.

### ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙන් සර්වජන ඡන්ද බලය

ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මඟින් 1931 දී අපට සර්වජන ඡන්ද බලය හිමි වූ අතර එහිදී ස්ත්‍රී පුරුෂ බේදයෙන් තොරව වයස අවුරුදු 21 සපිරූ සැමට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය හිමි විය. මේ සමග ශ්‍රී ලංකාව ඉතිහාසයට එක්වූයේ ආසියානු මහද්වීපයේ ප්‍රථමයෙන් සර්වජන ඡන්ද බලය හිමි වූ රට ලෙසිනි.

### දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභාව

ඕස්ට්‍රේලියා ලෙසින් හඳුන්වන ආසියානු හා ඕස්ට්‍රේලියානු මහද්වීප දෙකටම අයත් රටවල් ගත්තද අපට පෙර සර්වජන ඡන්ද බලය හිමිව තිබුණේ නවසීලන්තයට පමණි. සර්වජන ඡන්ද බලය ලැබූ වර්ෂ 1947 සෝල්බරි ප්‍රතිසංස්කරණයෙන් ලද පුනර්ජීවනයත් සමඟ 1948 නිදහස ලත් අපට පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය හඳුන්වා දෙනු ලැබිණි. සෝල්බරි ප්‍රතිසංස්කරණයෙන් මන්ත්‍රීවරු 101 ක් නිර්දේශ කෙරුණු අතර ඉන් 95 දෙනකුම තෝරා ගනු ලැබුවේ ඡන්දයෙනි.

මේ අනුව මෙරට පළමු පාර්ලිමේන්තු මැතිවරණය 1948 අගෝස්තු 23 සිට සැප්තැම්බර් මස 23 දක්වා වූ දින 31 ක කාලය තුළ දින 19 ක් පුරා පැවැත්විණි. මේ කාලය තුළ දිස්ත්‍රික් මට්ටමින් ඡන්දය පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු තවත් දිස්ත්‍රික්කයක ඡන්දය පැවැත්වීම සුවිශේෂී කරුණකි.

ශ්‍රී ලංකාවේ දෙවැනි මහ මැතිවරණය පැවැත්වූයේ 1952 මැයි මස 24 සිට 30 දක්වා වූ දින හත ඇතුළත දින හතරකදීය. තෙවැනි පාර්ලිමේන්තු මැතිවරණය මෙරට පැවැත්වූ සුවිශේෂී මැතිවරණයක් බවට පත්වූයේ නිදහසින් පසු ප්‍රථම වරට පාලක පක්ෂයේ වෙනසක් මෙම මැතිවරණය මගින් සිදුවීමය. වර්ෂ 1956 අප්‍රේල් මස 06 සිට 10 දක්වා වූ දින පහෙන් දින 03 කදී මැතිවරණය පැවැත්විණි. පළමු දින ඡන්ද විමසීමේ ප්‍රතිඵල නිකුත් කරන විට එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා නායකත්වය දුන් මහජන එක්සත් පෙරමුණ නියෝජනය කළ මන්ත්‍රීවරු ආසන ජයගෙන තිබිණි. පසු දිනවල පැවැති ඡන්ද විමසීමේදීද බණ්ඩාරනායක පිලට ජය හිමි වීම තුළ සිංහල භාෂා ව්‍යවහාරයට 'රැල්ලට යනවා' යනුවෙන් අලුත් වදනක් එක්විණි. පෙර දිනවල මැතිවරණ ප්‍රතිඵල සැලකිල්ලට ගෙන පසු දිනවලදී ජනතාව රැල්ලට ඡන්දය පාවිච්චි කරන බව මතයක් මේ ඔස්සේ සමාජගත විය.

### 1960 මාර්තු මැතිවරණය එකම දිනයකදී පවත්වයි

එම රැල්ල පාලනය කිරීමට කළ හැකි සුදුසුම දෙය මැතිවරණය එක් දිනයක් තුළ පැවැත්වීම බවට මතු වූ යෝජනාවත් සමග 1960 මාර්තු මස පැවැත්වූ මෙරට සිවුවන පාර්ලිමේන්තු මැතිවරණය එකම දිනයක් තුළ පවත්වා අවසන් කෙරිණි. එම මැතිවරණයේදී සිදුවූ තවත් විශේෂ කාරණයක් වූයේ එතෙක් වයස 21 සපිරූවන්ට පමණක් හිමිව තිබූ ඡන්ද අයිතිය අවුරුදු 18 දක්වා අඩු කිරීමය. කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කළ පීටර් කෙනමන් මහතා 1952 දී වයස අවුරුදු 18 සපිරූවන්ට ඡන්ද අයිතිය ලබා දෙන ලෙස පාර්ලිමේන්තුවට කළ යෝජනාව පරාජයට පත්වීමෙන් පසු එය යළි සම්මත වූයේ ඉන් වසර හතකට පසු 1959 මාර්තු මස 07 දිනය.

වැඩි ජන සහභාගිත්වයක් ඔස්සේ සිදුකරන ඡන්ද විමසීමකින් වඩා උසස් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වන බවටත් තරුණ මතය පාර්ලිමේන්තුව තුළ නියෝජනයට වැඩි ඉඩ ප්‍රස්තාවක් ලබාදීම රටේ ඉදිරි ගමනට පිටිවහලක් වනු ඇති බවටත් අවධානය යොමු කරමින් මෙම ඡන්ද හිමි වයස් සීමාව වයස අවුරුදු 21 සිට 18 දක්වා අඩු කිරීමට ගත් තීරණය තුළින් තරුණ නියෝජිතයන්ට පාර්ලිමේන්තුවට පත්වීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම වඩා යහපත් වූ ප්‍රවණතාවක් විය.

### තරුණ මතය පළ කෙරෙන දහඅටේ ඡන්ද බලය

'ව්‍යවස්ථාවෙන් හිමි වූ පරමාධිපත්‍යය බලයක් වූ ඡන්ද අයිතිය තමාම බුක්ති විඳිය යුතුය. එය කිසි විටෙකත් තමා වෙනුවෙන් ඡන්දය දීම සඳහා වෙනත් අයෙකුට පැවරිය නොහැක්කේය.' ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ එලෙසය. වර්ෂ 1969 තෙක් මෙරට ඡන්ද හිමි නාමලේඛන ඉංග්‍රිසි භාෂාවෙන් පමණක් මුද්‍රණය කළ අතර 1970 සිට එය සිංහල හා දෙමළ භාෂාවන්ගේ මුද්‍රණය කෙරිණි. මෙරට පැවැත්වෙන මැතිවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට අවකාශ ඇත්තේ වයස අවුරුදු 18 සම්පූර්ණ කළ වුවන්ටය. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වීමද අනිවාර්යය සුදුසුකමකි. මෙහිදී ද්විත්ව පුරවැසි නාමය ඇති අයටද ඡන්ද බලය හිමි වන අතර 19 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් ඔවුනට ඡන්දය ඉල්ලීමේ අයිතිය අහුරා ඇත. සාමාන්‍ය පදිංචිකරුවකු (ස්ථිර හෝ තාවකාලික) වීම ඡන්දය අයිතිය ලැබීමට අවශ්‍ය තවත් සුදුසුකමකි.

උමතු රෝගීන්, වසර දෙකක් හෝ ඊට වැඩි සිර දඬුවමක් නියමව බන්ධනාගාර ගතව මාස හයක කාල සීමාවක් සම්පූර්ණ කළ අයවලුන් ඡන්ද නාම ලේඛනයට ඇතුළත් නොකරයි. අංගොඩ මානසික රෝහලේ ප්‍රතිකාර ලැබ සුව වී සිටින නමුත් ඥාතින් විසින් යළි නිවෙස් කරා කැඳවා නොගිය පුද්ගලයින් 275 දෙනකුගේ නම් ඡන්ද හිමියන් ලෙස ඡන්ද නාම ලේඛනයට ඇතුළත් කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව 2014 වසරේ පියවර ගෙන තිබිණි. මේ ආකාරයෙන් අභිගුණ්ඨික පිරිස්, විශ්වවිද්‍යාල සිසුන්, රෝගීන්, වැඩිහිටි නිවාසවල දිවි ගෙවන්නන්, බන්ධනාගාර ගතව සිටින්නන් විශාල පිරිසක් ඡන්ද අයිතිය නොමැතිව තවමත් සිටින බව මැතිවරණ දෙපාර්තමේන්තුව පවසයි.

### ඡන්දය ප්‍රකාශ කිරීම තවමත් සියයට 70යි

සර්වජන ඡන්ද බලය හිමිව වසර 84 ක් ගතව තිබුණද අප රටේ තවමත් මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කරන්නේ 70% ක පමණ පිරිසකි. ජනපතිවරණයට සාපේක්ෂව මහ මැතිවරණයේදීත් ඊට සාපේක්ෂව පළාත් සභා හා පළාත් පාලන ආයතන මැතිවරණවලදීත් ජනතාව ඡන්දය ප්‍රකාශ කිරීමට දක්වන උනන්දු ක්‍රමයෙන් අඩුවන බව මැතිවරණ දෙපාර්තමේන්තු දත්ත පෙන්වා දෙයි. මෙරට මැතිවරණ ඉතිහාසයේ වැඩිම පිරිසක් ඡන්දය ප්‍රකාශ කැර තිබුණේ පසුගිය ජනපතිවරණයේදීය. එය 81.5% කි. වසර 2010 ජනපතිවරණයේදී එම අගය 74% කි. 2005 දී 73% කි. වසර 2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කර තිබුණේ 61% කි.

ඉහත දත්ත අනුව සාමාන්‍යයෙන් මෙරට මැතිවරණයකදී ලක්ෂ 30 ත් 40 ත් අතර පිරිසක් සෑම මැතිවරණයකදීම ඡන්දය ප්‍රකාශ නොකර සිටිති. මෙය ජනපතිවරණයකදී පමණක් නොව ඕනෑම මැතිවරණයක ප්‍රතිඵලය වෙනස් කිරීමට තරම් වූ ඉහළ අගයකි.

වසර 2014 වන විට මෙරට ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 150444904 බවත් වසර 2015 ජනපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කැර ඇත්තේ 1226437 ක් බවත් මැතිවරණ දෙපාර්තමේන්තු ලේඛන පෙන්වා දෙයි. මේ අනුව මෙරට වැඩිම ප්‍රතිශතයක් ඡන්දය ප්‍රකාශ කළ පසුගිය ජනපතිවරණයේදී ලක්ෂ 28 ක පමණ ජන පිරිසක් ඡන්ද අයිතිය ඇතත් එය ප්‍රකාශ කර නොමැත. එම මැතිවරණයේ ප්‍රතික්ෂේප කර ඇති ඡන්ද සංඛ්‍යාව 140925 ක් වන අතර එය 1.5% ක අගයකි.

මැතිවරණ දෙපාර්තමේන්තු දත්තවලට අනුව වසර 2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී ලියාපදිංචිව සිටි 14088500 ක්වූ ඡන්ද දායකයින් අතරින් ඡන්දය ප්‍රකාශ කර ඇත්තේ 8630689 ක පිරිසකි. ලක්ෂ 54 ක පමණ ජන පිරිසක් එහිදී ඡන්ද

**48 වන පිටුව බලන්න**


Cakes To Dream On
මංගල කේක්
ලාංකේය මංගල කේක්
මංගල හා ප්‍රිය සම්භාෂණ සඳහා තනි තනි අතුරුපස (Individual Desserts)
ඉල්ලීම අනුව නිර්මිත කේක් වර්ග (Custom Cakes)
කප් කේක් / කේක් පොප් / මැකරොන්
ප්‍රනීත ආහාර මේස (Sweet Tables)
ඩබල් චොක්ලට් ෆොන්ටන්
චොක්ලට් වර්ග
සජීවී ද්‍රාව්‍ය නයිට්‍රජන් අයිස් ක්‍රීම් (Liquid nitrogen Icecream (Live)
සජීවී උදෑසන අහාර මේස
ලාංකේය ක්‍රමයට බත් සහ ව්‍යංජන
සැන්විච් වර්ග
ලාංකේය බේකරි කෑම වර්ග (Pastries)
පලතුරු, චොක්ලට්, සීනිමය හා මාසිපෑන් වලින් නිර්මිත ප්‍රධාන කෑම සැරසිල්ල
(Edible Carvings for centre pieces)
සඳහා විශිෂ්ඨයන්.
25ස් වසරක අත්දැකීම් හා සහජ කුසලතාවෙන් සපිරි, ඔලිම්පික් රන් පදක්කම් ලාබී, සූපන ආචාර්ය ශිල්පී
දිමුතු පෙරේරා
අතින් හැඩගැන්වෙන සම්මානනීය ආහාර සැරසිලි, අප කේක්ස් ටු ඩ්‍රීම් ඔන් ආයතනයෙන් එළි දැක්වේ.
අප හා සම්බන්ධ වීමෙන් ඔබගේ ඊළඟ විශේෂ උත්සවය සඳහා අපගේ විශ්වාසනීය
උපදෙස් නොමිලේ ලබා ගත හැක.
Cakes To Dream On
www.cakestodreamon.ca
https://www.facebook.com/cakestodreamon
TP: 416-857-4566
order@cakestodreamon.ca
ටොරොන්ටෝ හා තදාසන්න ප්‍රදේශ (GTA), ඇජැක්ස්,
බර්ලිංටන්, ඕක්විල් හා මුස්කොකා දක්වා සේවා සැපයේ.
අවම ඇනවුම දස දෙනෙකු සඳහා.
තම නිවසටම ප්‍රවාහනය කෙරේ.


FLAVO
Custom Web Solutions
WEBSITES | PHOTOGRAPHY | DRONE SERVICES | DIGITAL MARKETING | SEO
Jason&Clarke
We are a one-stop shop for all your web and media needs.
For a Free Consulation Please visit our website, call or email us!
https://www.flavomedia.com | 647 - 995 3391 | info@flavomedia.com

# පන්හිඳක කඳුළු

මිනිසුනේ නුඹ ගැන
අකුරු කළ පන්හිඳ
අසිපතක් පැරද වූ
සෙනෙහසේ ආයුධය

ඉරා තිමිරය විදා
ලොවට පෙන්වූ දිනක
වසවතුන් පැමිණියා
මාර වෙස් ගෙන ළඟට

තලා පන්හිඳ කඩා
ගලන රුධිරය බලා
ආලවක සැඟවේය
ගදාධය හිනැහේය

හෙට දිනෙත් හිරු ඒය
ලෝකයත් පෙරළේය
පන්හිඳක් එසවේය
සැමදිනේ කඳුළු බිඳු
පන්හිඳේ දිලිසේය

**සුරන් අබේවර්ධන**

# බිරිය නම්

හිනාවෙන කොට තියෙන ලස්සන
රවන කොට දැක ගන්න බැරි හැටි
ජීවිතේ ඇති තුරා ඒ ගැන
සොයන ළතැවිල්ලක්ද ප්‍රේමය

නීල වටකුරු ඇසෙහි ලස්සන
ඔරවද්දි දැක ගන්න බැරි හැටි
ජීවිතේ මතු පිටින් හමුවන
සරදමක් විය හැකිද ප්‍රේමය

දයාබර මුව මඬල ලස්සන
බනින කොට දැක ගන්න බැරි හැටි
ජීවිතේ ඉරණම කියා දෙන
සදාකාලික දුකද ප්‍රේමය

**මහින්ද කුමාර දළුපොත**

# කිම ඒ දෑ?

දුවේ මා හද පිපුණු පරම පිවිතුරු — කුසුම
දෙගුරුන්ට අවනතව දීග ගිය කොඳ — කැකුළ
වැරදුනා දිවි ගමන නොසිතූ නොපැතූ — විලස
දුවේ මට නොතේරේ කිමද අප කළ — කරුම

කැදැල්ලේ සිටින තුරු රැක්කාය මා — නුඹව
දීග ගිය පසුත් නුඹ සවිය වුණි හැකි — පමණ
සල්ලාල සැමියෙක්ය ලැබුයේ පෙර — පවට
ඉතිං අප කෙලෙසකද සදන්නේ ඒ — වරද

වියපත්ය අප දෙදෙන සැඳෑ සමයේ — සිටින
කෙසේනම් නුඹ දමා හැරයම්ද මතු — දිනෙක
සඟවමින් කඳුළු කැට නුඹ විඳින දුක් — ගැහැට
දැනෙන මුත් මා සිතට හිඳිම් නොදැනෙන — විලස

**චම්පා කුමාරසිංහ - මිසසාගා**



# ප්‍රේමය

කලකදි සිතට දෙව්ලොව සැප ලබා — දෙතී
කලකදි එයම මුළු ලෝකය දවයි — නිතී
ප්‍රේමය නම් අකුරු තුනෙහි අරුමෙ — හැටී
දැනගන්නට ආලය කළ මැනවි — සකී

එක්ව හිඳින්නන් ප්‍රේමය නොම — දනිතී
වෙන්ව ගිය දනන් තනියෙන් පෙම් — කරතී
මහමෙර තරම් උස් වේදනා දරා — ගතී
අහසේ තරුද උන්ගේ මහ දුක — අසතී

ප්‍රේමයෙ රසය මුළු ලොව සැප — පරදවතී
රජ සැප වුවද ප්‍රේමෙට යට වෙලා — යතී
කඳුලැල්ලෙන්ද මුදු රසයක් ලබා — දෙතී
ප්‍රේමෙහි අරුත කිසිවෙකු තව නොම — දනිතී

ආදරෙ කියා තුරුලට ගෙන — සනසවතී
එහෙත් සැණින් වෛරය මුළු ලොව — වෙලතී
කෙස් ගස දුරින් ප්‍රේමය වෛරය — හිඳිතී
බලන් අරුම පෙම් කල අය එය — දනිතී

පිවිතුරු හැඟීමන් අතරේ අග — තැනකී
රාගය නැති ප්‍රේමය මහ පින් — බිමකී
එහෙත් නිබඳ ප්‍රේමය රාගයෙ — ගැටෙතී
නිරාමිස සුවක් පිවිතුරු පෙමෙහි — ඇතී

**ධනු තේනුවර**

# මෙවරක් මැනයි සිතනු

දන්නා කියන අය මරණින් වෙන් — වෙන්නේ
නෑ හිතවතුන් එක් වී දන් පින් — දෙන්නේ
එතනදි පමණි සසරෙහි දුක — වැටහෙන්නේ
බණ භාවනා ගැන නැහැ සිහියට — එන්නේ

මිය යන වැඩි දෙනා දුගතියටයි — යන්නේ
පින් කළ අය පමණි සුගතිය ලැබ — ගන්නේ
පව් කම් දුකට මුල බව නැතිවද — දන්නේ
පින් කම්වලට ඇයි තව තව — ළතවෙන්නේ

මිනිසත් බවට වටිනාකම් ලැබ — දෙන්න
බණ භාවනා තෙරුවණ වෙත — ළංවෙන්න
ඉඳුරන් පිනවමින් කාලය — නොගෙවන්න
මරණය නියත බව සැක හැර — දැනගන්න

වයසට යන්න පෙර දහමට — යොමුවීම
කළ යුතු දෙයකි කොයි කවුරුත — ඉඳුරාම
දින දින කල් දමා පසුවට — දුක්වීම
නොකරමු භාවනාවයි අපෙ — ගැලවීම

හිමිවරු නිතර බණ දහමින් ඔවා — දෙතී
නුවණැති පින්වතුන් එමගට ඇදී — එතී
ගුණදම් සුවඳ හැම තැනකම රැඳී — ඇතී
පන්සල ඔබේ දොලොවම වැඩ සදා — දෙතී

**සිසිල් මාන්නප්පෙරුම - මිසිසාගා**

# ඔබ මා හමුවුණු මොහොත සොයාගෙන

කෙහෙරැළි අතරේ රැඳි නුඹෙ සුසුමේ
උණුසුම අමතා පාර අසාගෙන
පියමැන යන්නෙමි මෙතුවක් ආ මග
ඔබ මා හමුවුණ මොහොත සොයාගෙන

එක මත බැඳි සිතුවම් ගොනු කොට
නැගී බිඳී යන සිතුවිලි පසු කර
සිතට නිනව් නැති පෙර එක මොහොතක
දෙනෙතක් කී පෙම් කවියක් හමුවිණ

තුරුණු සිතක කෙළි ලෝල මුහුන් කොට
සමනල තටුවක නිදහස විඳගෙන
දේදුන්නක් සේ විසිතුරු කැටි කොට
දිවිතුරු පෙමකට අර ඇඳි අරුමය

එදා මෙදා තුර කාලය වියැකී
සමනල සිත් හෙමි හෙමින් සොරා ගෙන
දිවියට අලුතින් අරුත් කියා දී
ප්‍රේමය ගැඹුරින් පිරිසිඳ දැන ඇත

**ලිරාජි පතිනායක**

# තරුවක් - වුණත්

ඇයි හොඳයිකම් මොකටද
නන්නාඳුනන අහසක් එක්ක
තරුවක් වුණත් පාර කිව්වට
අතරමං කරනවාමයි දවසක

**මදු දිසානායක**

# මනාපයි

තැනින් තැන
ඇලවිලා
ඉඳල මට
ඇතිවෙලා
දෙන්න ඔබෙ
මනාපය
යන්න මට
ගැලවිලා

**ප්‍රභා මාධවී**

# ALPC
## AHANGAMA LAW
PROFESSIONAL CORPORATION

- Real Estate Law
- Immigration Law
- Corporate Law
- Wills and Estates
- Family Law
  Simple Divorce/ Separation and Marriage Agreements

4465 Sheppard Avenue East
Unit 21, Toronto, ON
M1S 5H9
Canada

Tel: 647-977-2263
Cell: 647-215-7642
Fax: 647-977-2264
E-mail: info@ahangamalaw.com



**Anoshan Ahangama**
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC

# SILVY FERNANDO LAW




- ✓ Personal Injury
- ✓ Real Estate Purchase/Sale/Refinance
- ✓ Family Law
- ✓ Wills
- ✓ Powers of Attorney
- ✓ Affidavits
- ✓ Immigration
- ✓ Commercial Property Sale/Purchase
- ✓ Landlord-Tenant
- ✓ Notarizing & Commissioning
- ✓ Incorporations

**Silvy Fernando LL.B.**
Barrister, Solicitor & Notary Public

350 Highway 7 East, Suite 213
Richmond Hill, ON L4B 3N2
Tel: 416-272-6587/ 905-597-1716
Email: Silvy@sfdolaw.com

# EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca



**Manzeel Patel**
Mortgage Broker - M11002628

**Direct: 647-272-8355**

Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7

T 416 - 840 - 6368
F 416 - 850 - 5153

info@everythingmortgages.ca
www.everythingmortgages.ca

### We'll Target The Best Rates!

Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.

### Mortgage Renewals and Refinancing

First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!

### Investment Properties

Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!

### Safe and Secure Application

Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.

RMG Mortgages · Meridian · MERIX · Lendwise · Scotiabank · Paradigm · Alterna · Equitable Bank · blueprint · Bridgewater Bank · MCAP · Industrial Alliance · radius financial · ICICI Bank · National Bank Financial Group · Canadiana · CMLS Financial · First National Financial LP · B2B Bank · Optimum Mortgage · TD · XCEED · MCAP · Street Capital · Fisgard · Home Trust · HOMEquity · Savings

# ඝාතන සංස්කෘතියේ
## ඵල භුක්ති විඳින අහිංසක ඇමරිකානුවෝ




■ ජයරත්න ගුණමුණි
ලේකම් - එතෙර අපි සංවිධානය
- කැනඩා ශාඛාව

ලෝකයේ විවිධ ස්ථානවල ඇති වන ප්‍රශ්න හා ගැටලු අවි ආයුධ මගින් විසඳීමට උත්සුක වන ලෝක බලවතා වන ඇමරිකාවේ දිනෙන් දින වර්ධනය වන මිනිස් ජීවිතවල ආනාරක්ෂිතභාවය සංකීර්ණ සමාජ අර්බුදයක් කරා ගමන් කරමින් තිබෙනු පෙනේ. පසුගියදා පාසලක සිදුවූ වෙඩි තැබීමේ සිදුවීමත් සමග නැවතත් සමූහ ඝාතන පිටුපස කතාබහ කරළියට පැමිණ ඇත. පාසල්, විශ්වවිද්‍යාල, උද්‍යාන, හෝටල් ආදි විවිධ ස්ථානවලදී මෙය සිදුවන බව පසුගිය සිදුවීම් දෙස බැලීමේදී පැහැදිලි වේ. එක්සත් ජනපදය තුළ දිනකදී වෙඩි තැබීම් හේතුවෙන් 93 දෙනෙකු ඝාතනය වන බවත් 122 දෙනෙකු තුවාල ලබන බවත් ගණන් බලා තිබේ. එනම් වසරකදී ඝාතන 33,880 ක් සිදුවේ. ලෝකයේ අවි දරන්නන් අතර ඉහළම අනුපාතය පවතින්නේද එක්සත් ජනපදය තුළය. එරට වැසියන් 10 දෙනෙකුගෙන් 9 දෙනෙකුට ගිනි අවි ඇත.

ආසන්නම සිද්ධිය වන පෙබරවාරි 14 වෙනිදා Florida ප්‍රාන්තයේ Parkland හි පාසලක සිදු වූ වෙඩි තැබීමෙන් සිසුන් හා ගුරුවරුන් 17 දෙනෙකු මිය ගියහ. 2018 පළමු සති 7 තුළ සිද්ධීන් 8 ක් වාර්තා වී ඇත. ජනවාරි මස මැද දී Kentucky ප්‍රාන්තයේ උසස් පාසලක ශිෂ්‍යයකු සිදුකළ වෙඩි තැබීමකින් දෙදෙනෙකු මිය ගොස් 18 දෙනෙකු තුවාල ලැබූහ. පෙබරවාරි මුලදී ලොස්ඇන්ජලීස්වල සිසුවෙකුගේ බෑගයේ තිබූ ගිනි අවියක් පුපුරා යාමෙන් එක් අයෙකු මිය ගොස් තවකෙකු තුවාල ලැබීය. අනෙක් සිදුවීම් බරපතල ගණයේ ඒවා නොවේ.

එක්සත් ජනපද ඉතිහාසයේ බරපතලම මිනිස් ඝාතනය පසුගිය ඔක්තෝබරයේ ලාස්වේගාස් හිදී සිදුවිය. එයින් 58 දෙනෙකු මිය ගොස් 800 කට අධික පිරිසක් තුවාල ලැබීය. 2017 නොවැම්බර් 05 වෙනි දා විශ්‍රාමික හමුදා සෙබළෙකු විසින් Texas හි බැප්ටිස්ට් පල්ලියක සිදුකළ වෙඩි තැබීමකින් 26 දෙනෙකු මිය ගොස් 20 කට අධික පිරිසක් තුවාල ලැබීය. මෙම සහස්‍රය උදාවීමෙන් පසුව සිදු වූ ප්‍රධාන මිනිස් ඝාතන ලෙස 2007 දී Virginia තාක්ෂණික විශ්වවිද්‍යාලයකදී සිදු වූ තිස් දෙදෙනෙකු ඝාතනය හා 2012 දී Connecticut හි Sandyhook ප්‍රාථමික පාසලේ සිදු වූ සිසුන් 20 දෙනෙකු හා ගුරුවරු ඝාතනය වීම දැක්විය හැක.

සමූහ මිනිස් ඝාතනය 'එක් පුද්ගලයෙකු විසින් නිශ්චිත වේලාවකදී 4 දෙනෙකු හෝ ඊට වැඩි ගණනක් ඝාතනය කිරීම' ලෙස අර්ථ දක්වා ඇත. ජාතිවාදී, ආගම්වාදී හෝ වෙනත් සංකල්පයක පසුබිමක් හෝ සැලකිය යුතු හේතුවක් නොමැතිව නිරායුධ අහිංසක මිනිසුන් සමූහ වශයෙන් ඝාතනය කිරීමේ සංස්කෘතිය මුළුමනින්ම පාහේ එක්සත් ජනපදයට ආවේණික වූවකි. එවැනි පළමු සමූහ ඝාතනය සිදුවූවා යැයි සැලකෙන්නේ 1931 දීය. එතැන් පටන් වැඩිවීමේ ප්‍රවණතාවක් පෙන්වන මෙම සංස්කෘතිය පිළිබඳ කරුණු දක්වන මහාචාර්ය ජේම්ස් පෙට්‍රාස් මෙම සමූහ ඝාතන 1961-1980 දක්වා කාලය, 1981-1998 හා 1999-2016 කාලය ලෙස යුග 3 කට බෙදා දක්වයි. පළමු කාල වකවානුවේදී සාපේක්ෂව අඩු ඝාතන ප්‍රමාණයක් සිදුවී ඇති අතර ඊට හේතුව ලෙස සමාජමය විරෝධතා ප්‍රකාශ කිරීමට හා බහුජන ක්‍රියාකාරීත්වයන්ට වැඩි ඉඩකඩක් තිබීම ඔහු දකී. එහෙත් රොනල්ඩ් රේගන් ගේ ආගමනයත් සමග මෙම ඉඩ ප්‍රස්ථා සීමා කිරීම දෙවන කාල වකවානුවේදී ඝාතන වැඩිවීමට හේතුව ලෙස ඔහු විග්‍රහ කරයි. තත්ත්වය වඩාත් නරක වන නව ප්‍රවණතා ලෙස, එක්සත් ජනපදය වෙනත් රටවල් ආක්‍රමණය කිරීම, පොලිසිය හා ආරක්ෂක අංශවල ප්‍රහාරයන්, කළු ජාතිකයන්ට එරෙහි ප්‍රහාරයන් ආදිය තුන්වන කාල වකවානුවේදී ඝාතන වැඩිවීමට බලපා ඇති බව ඔහුගේ අදහසයි. ට්‍රම්ප් පාලනය හා ආසන්න කාලය තුළ මෙම ඉහළ යාම මත්ද්‍රව්‍ය භාවිතය හා මානසික රෝග ඉහළ යාම සමග බැඳී ඇත.

එක්සත් ජනපද වැසියන්ට ආයුධ මිලට ගැනීමේ හා දරා සිටීමේ අයිතිය 1791 ව්‍යවස්ථාවෙන් තහවුරු කොට ඇත. මෙම අසාමාන්‍ය සමූහ ඝාතන පාලනය සඳහා විවිධ පුද්ගලයින් හා සංවිධාන රජයට යෝජනා හා බලපෑම් කළද ජනාධිපතිවරුන් හෝ කොංග්‍රස් සභිකයින් ඊට යහපත් ප්‍රතිචාරයක් නොදක්වන බව පැහැදිලිව පෙනෙන්නට තිබේ. පසුගිය 14 වෙනිදා Florida හි පාසලේ සිදු වූ වෙඩි තැබීමෙන් පසුව Florida කොංග්‍රස් සභික Bill Nelson ජනතාව ඉදිරියේ ප්‍රශ්න කොට ඇත්තේ මෙය දින චරියාවක් කරගන්නේද හා ඇති දේ ඇතිය කියමින් එය දිගටම සිදුවීම දෙස බලා සිටින්නේද යන්නත්ය. නමුත් සිසුන් 20 ක් හා ගුරුවරු 6 ක් මිය ගිය 2012 දී Connecticut හි Sandyhook පාසලේ සිදු වූ සිද්ධියෙන් පසුව පවා කොංග්‍රසය අවි පාලන නව නීති ගෙන ඒම ප්‍රතික්ෂේප කර තිබුණි. Ronald Regan ජනාධිපතිවරයා වරෙක ප්‍රකාශ කළ 'ගිනි අවි නොව මිනිසුන් පාලනය කළ යුතුය' යන්න අද දවසේද ප්‍රතිරාවය වෙමින් පවතී. පසුගිය 14 වෙනිදා සිදු වූ සිද්ධියත් සමග ජනතාව හා විශේෂයෙන් පාසල් සිසුන්ගේ විරෝධතා වැඩි වී ඇති අතර එහිදී ජනාධිපති ට්‍රම්ප් ගේ යෝජනාව වී ඇත්තේ තෝරාගත් ගුරුවරු පිරිසකට ගිනි අවි පුහුණුව ලබා දීම හා ආයුධ සන්නද්ධ කිරීමයි. මෙය විසඳුමක් ලෙස මොහොතකට සැලකුවහොත් හෝටල්, උද්‍යාන හා අනෙකුත් ජනයා ගැවසෙන ස්ථාන සඳහා විසඳුම කුමක්ද? මානසික රෝගීන් විසින් මෙවැනි දේ සිදුකරන බවත් කළ යුත්තේ ඔවුන්ට ප්‍රතිකාර ලබාදීම බවත් ට්‍රම්ප් පාර්ශ්වයේ අදහසය. මධ්‍යස්ථ මතධාරීන් ප්‍රශ්න කරන්නේ මානසික රෝගියාට ආයුධයක් අතට ලැබීම පාලනය නොකරන්නේ ඇයිද යන්නයි.

ගිනි අවි පාලනය සඳහා ජනාධිපති හෝ කොංග්‍රසය එකඟ නොවන්නේ එය පිටුපස ඇති දේශපාලනය නිසා බව ඉතා පැහැදිලිය. 1871 දී පිහිටවනු ලැබූ ජාතික රයිෆල් සංගමය (N.R.A) ආයුධ අලෙවියෙන් විශාල ලාභයක් වාර්ෂිකව ලබයි. සෑම මැතිවරණයකදීම කොංග්‍රස් සභිකයින්ට විශේෂයෙන්ම රිපබ්ලිකන් පාක්ෂිකයින්ට විශාල මූල්‍ය ආදායම් ලබා දේ. ඩොනල්ඩ් ට්‍රම්ප් ගේ ඡන්ද ව්‍යාපාරයට ඩොලර් මිලියන 30 කට වැඩි මුදලක් ලබා දී ඇත. ඊට කළගුණ සැලකීමට දෝ ජාතික රයිෆල් සංගමයේ සමුළුවකට රොනල්ඩ් රේගන්ගෙන් පසුව සහභාගි වූ ප්‍රථම ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශ කොට තිබුණේ "ඔබට ධවල මන්දිරය තුළ සැබෑ මිතුරෙකු සිටී" යනුවෙනි.



# බුදු බව පතනා සුමන සමන් දෙවියෝ

සිංහල බෞද්ධ ජනතාවගේ අප්‍රමාණ ගෞරවයට, වන්දනාවට පාත්‍ර වූ දෙවි කෙනෙක් විදිහට සුමන සමන් දෙවියන්ව හඳුන්වන්ට පුළුවන්. සමන් දෙවියන්ගේ පිහිටෙන් සිරිපාදෙ කරුණා කරන සිංහල බෞද්ධයා ඒ වන්දනා ගමනේ හුඟාක් තැන්වලදී සමන් දෙවියන්ගේ ගුණ වර්ණනා කරනවා, පිහිට අයදිනවා. බුද්ධං සරණේ සිරස දරා ගෙන සිරිපාද කඳු මුදුනට හෙමින් සැරේ ළං වෙන වන්දනාකාරයෝ ඒ ගමන් වෙහෙස නිමා ගන්නේ බුදු ගුණ කියලා. බුදු ගුණ කියන ගමන්ම ඒ සිරිපතුල කඳු මුදුනෙ තියන්ට කියලා ආරාධනා කරපු සමන් දෙවියනුත් මතක් කරනවා.

සාසන බාරවූ විෂ්ණු දෙවියනේ
මේ හිම බාරවූ සමන් දෙවියනේ
දොසක් තිබුණ මුත් දුරලා හරිනේ
වඳින්ට යන්නට අවසර ලැබෙනේ

මෙම කවිය එන්නේ පුරාණ හිමගත වරුණ කියන පොතේ. මෙයින් කියැවෙන විදිහට අපේ බුදු සසුණ භාර වෙලා තියෙන විෂ්ණු දෙවියන්ගෙයි මේ හිම භාර වෙලා තියෙන සමන් දෙවියන්ගෙයි අවසරය, උදව් උපකාර නැතුව මේ නර පණුවන්ට ඒ ගමන යන්ට පුළුවනෑ. දෙවියන්ගෙ අඩවියකට යන ගමන බොහොම ගරු සරු ඇතිව වරම් ලබාගෙන යන්ටත් එපායෑ.

බෞද්ධයන්ගේ විශ්වාසය නම් මේ සිරිපා අඩවිය සුමන සමන් දෙවියන්ගෙම තමයි කියලා. ඒ වුණාට ජිනකාලමාලිනී කියන පාලි පොතේ එන විදිහට රාමා, ලක්ෂමණ, කතරගම, සමන් කියන දෙවිවරු හතර දෙනාම මේ සිරිපාදෙට අධිපතිලු. ඒ මොනව උනත් සිංහල බෞද්ධයන් විශ්වාස කරන්නේ සමන් දෙවියන්ගේ අඩවිය වගේම වාස භවනෙත් මේ සමනල කඳු වැටියෙම තිබුණු බවයි. මේ කඳු වැටි පෙළ සපරගමු කඳුවැටි කියලත් ඉස්සර හඳුන්වල තියෙනවා.

පූජාවලියෙ එන විදිහට නම් සමනල කන්දට අධිපති මේ සුමන සමන් දෙවියොම තමයි. බුදුහාමුදුරුවන්ගේ පළමුවැනි ලංකා ගමන සිදුවුණේ මහියංගණයටනෙ. ඒ කාලෙ ඒ ප්‍රදේශවල යක්ෂ ගෝත්‍රිකයො එහෙම ඉඳලත් තියෙනවනෙ. මේ ගෝත්‍රිකයන් අතර සටන් එහෙම සිදු වෙනවා. අන්න එහෙම මහ සටනක් සිද්ධ වෙන අතර වාරෙ තමා බුදුහාමුදුරුවෝ අහසින් වැඩල අහසේම පලක් බැඳගෙන ඉඳලා තියෙන්නේ. බුදුහාමුදුරුවො සෘද්ධි බලයෙන් ගිනි, දුම් එහෙම මවද්දී කව්රුත් බය වුණාලු. මේ යක්ෂ දමනය කෙරෙන වෙලාව සමන් දෙවියනුත් බුදු බල මහිමෙන් දැකල බොහොම පැහැදිල තියෙනවා. එවේලේ බුදුහාමුදරුවන්ගෙන් බණ අහපු දෙවිවරුන් සසර දුකින් මිදුණ කියලා පූජාවලියෙම තියෙනවා.

අපේ සමන් දෙවියනුත් එදා බණ අහල සෝවාන් වෙලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි සමන් දෙවියො බුදුහාමුදුරුවන්ගෙන් පූජාව සඳහා යමක් ඉල්ලවලු. ඒ පාර බුදුහාමුදුරුවෝ සිරස පිරිමැදල කේශධාතු ස්වල්පයක් අරන් සමන් දෙවියන්ට දීලා තියෙනවා. මහියංගනය කියන චෛත්‍යයෙ තමා ඒ කේශධාතු නිදන් කළ බව කියන්නේ. ලංකාවෙ මුල් කාලවල හිටපු දෙවියන්ගෙන් සමහර දෙනෙකුට හින්දු උපතක් තිබුණෙ. ඒ උනාට මේ සමන් දෙවියන් නම් පැහැදිලිව සිංහල බෞද්ධ දෙවි කෙනෙක් බව මේ කරුණුවලින් පේනවනෙ. බුදුබණ අහල සෝවාන් වුණ එකම දෙවියනුත් මේ සමන් දෙවියන්නෙ.

සමන් දෙවියන් ගැනත් නොයෙක් ජනප්‍රවාද තියෙනවා. රාවණ රජතුමා සීතාව පැහැරගෙන ඇවිල්ල ලංකාවෙ හිරකරගෙන හිටියලුනෙ. සිතා සොයාගෙන රාම කුමාරයයි ලක්ෂමනයි ඇවිත් තියෙනවා. රාම සීතාව සොයාගෙන ආපහු ගියේ මේ ලක්ෂමන කුමාරය නවත්වලලු. මේ විදිහට නතර කරපු ලක්ෂමන පස්සෙ ලක්සුමන වෙලා සුමන වූ බවත් හින්දුන් විශ්වාස කරනවා. ඒ වුණාට බුදු බණ අහල සෝවාන් වීම නිසා සුමන සමන් දෙවියන් අපේ දේශීය සංස්කෘතියට අයිති බවයි වඩාත් පිළිගත්තු අදහස. සමන් දෙවියන් නිරූපණය වෙන්නෙත් හරිම ශාන්ත විලාසයකටනෙ. මේ දෙවියන්ගෙ වාහනය සුදු ඇතෙක්. සුදු ඇතාට කියන තවත් නමක් තමයි ඇලි ඇතා. වෙස්සන්තර රජතුමා කලිඟු රටෙන් ආපු බ්‍රාහ්මණයන්ට දන දීල තියෙන්නෙත් ඇලි ඇතෙක්නෙ. ඉතා දුර්ලභ ඒ වගේම හාස්කම් තියෙන හස්ති රාජයෙක් විදිහටනෙ මේ ඇලි ඇතා සළකන්නේ. ඒ නිසා සමන් දෙවියන්ගේ ඇලි ඇතා බොහොම තේජවන්ත ඇත් රජෙක් වෙන්ට ඕනෑ. සමන් දෙවියන් සුරතින් සුදු නෙළුම් මලකුත් දරාගෙන ඉන්නවා. ඒ ඇතාගේ හොඬවැලෙත්

44 වන පිටුව බලන්න


The Power Tools To Sell Your Property
Renovation Cost upto $4000.00
Free
Advertising Signage & Photos
Free
Lawyer's Fee
Free
Market Evaluation & Home Inspection
Free
Home Staging
Free
Open Houses Showing
Free
**Some conditions apply. This promotion can be discontinued without prior notice. Not intended to solicit buyers or sellers currently under contract.
Save money when selling your home!
Selling real estate is what I do. I can help you save thousands when listing your property. You will pay less and get a full service listing with no hidden fees. My home marketing strategy will attract the greatest number of potential buyers and help you sell quickly and hassle-free for the best value.
Nishantha Donsiyambalapitiyage
Real Estate Sales Representative
Mobile: 416 417 0763
Email: nishan.don@gmail.com
Mississauga Office: 350 Burnhamthrope Dr. W. Unit 127
Scarborough Office:2250 Markham Road Unit #3 Scarbotough ON M1B2W4
Century 21
INNOVATIVE REALTY INC


A NEW VANNI MARKET.
40 Bristol Rd E. Unit 7. Mississauga, ON. L4Z 3K8
(NEAR BMO BANK)
Phone : 905-566-5550 Cell Phones : 416-456-5886/ 647-627-9013
We've put the finishing touches on our new Vanni Market in your neighborhood. Come in and take a tour of the new Vanni Market and buy all the Grocery, Vegetables, Fruits, Fresh Fish & Meat has to offer
under new management
FRESH GROCERIES, VEGETABLES, FRUITS, FISH & MEAT AVAILABLE !!

# සමන් පිච්ච මල් අරණක කව්. ගී පබැඳූ ගාමිණී...



■ අසංක දේවමිත්‍ර

මාර්තු 21 වන දිනට යෙදෙන සිනමා සක්විති ගාමිණී ෆොන්සේකා මහතාගේ 82 වන ජන්ම දිනය නිමිත්තෙන් එතුමාට උපහාර පිණිස පළවන ලිපියකි.

ගාමිණී ෆොන්සේකා නමැති කවියා, ගී පද රචකයා, සිත්තරා පිළිබඳ මහාචාර්ය සුනිල් ආරියරත්න මතක වත.....

ගාමිණී ෆොන්සේකා, හෙළ සිනමාවේ 'සක්විති' වූයේ රංගනයෙන් හා අධ්‍යක්ෂණයෙන් ඔහු පෑ විශිෂ්ට ප්‍රතිභාව නිසාවෙනි. එහෙත් එතුමන්ගේ කලා හැකියාවන් තවත් ඉසව් කිහිපයකම විසිරී පැතිරී තිබූ බව අපට රහසක් නොවේ. චිත්‍ර කලාවට, මෙන්ම කවියට හා ගී පද රචනයට බෙහෙවින්ම ඇළුම් කළ ඔහු විටෙන් විට එකී මාධ්‍යයන් ඔස්සේ සිය නිසඟ ප්‍රතිභාව විදහාලූයේ ගාමිණී ෆොන්සේකා මුද්‍රාව එහි සළකුණු කරමිනි.

'ගාමිණී ගී මිණි' කවියෙන් ගීතයෙන් හා සිතුවමෙන් ඔහු පෑ සුරුවිරුකම් එක්තැන් කළ අපූර්ව ග්‍රන්ථයකි. ඔහුගේ දස වැනි ගුණ සමරුවට සමගාමීව එය එළි දැක්වූයේ මේ මහා කලාකරුවාණන්ට උපහාර පිණිසය.

මෙරට විශිෂ්ටතම ගේය පද රචකයා ලෙස මහාචාර්ය සුචරිත ගම්ලතුන් හඳුන්වා දුන් මහාචාර්ය සුනිල් ආරියරත්නයන් අප හා මෙසේ එක් වන්නේ ගාමිණී නමැති සොඳුරු කවියා, ගී පද රචකයා පිළිබඳ අපූර්ව තොරතුරු ඔහුගේ අත්දැකීම් ඔස්සේ අප වෙත ගෙන එන්නටය.

ගාමිණී ෆොන්සේකා මගේ ජීවිතයට වඩාත් සමීප වුණේ නළුවෙක් හැටියට නෙවෙයි, කවියකු හැටියට. ඔහුත්, මාත් අතර ප්‍රථම හමුව සිදු වුණේ 'සරුංගලේ' චිත්‍රපටය ඔස්සේයි. ඒ ඔහු කවි කුරුටු ගෑ යුගයක්. ඒ කාලේ රත්මලානේ ඔහුගේ නිවසේ ඔහුත් සමඟ රාත්‍රි විශාල ප්‍රමාණයක් ගත කරලා තියෙනවා නොයෙකුත් සාහිත්‍ය හා කලාව පිළිබඳ කතාබහත් එක්ක.

ඇත්තටම 'සරුංගලේ' චිත්‍රපටයේ ආකෘතිය ඔහුගේ යෝජනාවක්. මම යාපනය විශ්ව විද්‍යාලයේ ඉන්න බව දැනගෙන තමයි 'සරුංගලේ' චිත්‍රපටයේ සැකිල්ල ඔහු මට කියන්නේ. ඒ කතාව කෙටි චිත්‍රපටයකට නගන්න අතීතයේ දවසක ඔහු කේ. ගුණරත්නම් මහත්මයා එක්ක සැලසුම් කර තිබී තියෙනවා 'සිනමාස්' සමාගම වෙනුවෙන්. ඒක කෙරුණේ නෑ. ඊට අවුරුදු පහළොවකට විතර පස්සේ තමයි ඔහු මට මේ යෝජනාව ගෙනෙන්නේ. ඒ අනුව තමයි සරුංගලේ නිර්මාණය වුණේ.

ඒ කාලේ ගාමිණී නිරන්තරයෙන්ම මට උදේ පාන්දර දුරකතන ඇමතුම් ලබා දෙනවා. මම ජීවිතයේ දීර්ඝතම දුරකථන ඇමතුමකට සවන් දීලා තියෙනවා නම් ඒ ඔහුගේ දුරකථන ඇමතුමකට. ඒ හුඟක් වෙලාවට කලාව හා සම්බන්ධ දේවල්වලිනුත් ඔහු කතා කළේ කවිය ගැන. ඔහුට රාත්‍රි කාලයේ යම්කිසි කවියක් ලියැවුණොත් එක්කෝ මම ඒ ගැන කතා කරන්න ඔහුගේ නිවසට යා යුතුයි. එහෙම නැතිනම් මේ කවිය ලියැවුණ හැටි දුරකතනයෙන් පැය ගාණක් ඔහු මට කියනවා.

ඊටත් පෙර තමයි ගාමිණී 'මයුරිගේ කතාව' චිත්‍රපටයට අමරදේවයන් ගයන 'සුදෝ මම ආදරෙයි' ගීතය ලියා තිබුණේ. දෙදෙනකුගේ ආදරයට මැදි වූ තරුණියකගේ වේදනානත්මක දෝංකාරය ඒ ගීතයේ තිබුණා.

ඔහු කවියක් හෝ ගීතයක් ලිව්වට පස්සේ ඒ ගැන කතා කරලා, අදහස් විමසලා ඊට පස්සේ ඒක පොඩි කරලා කුණු කූඩයට දමනවා. එහෙම පුරුද්දක් ඔහුට තිබුණා. "මේක මහා අපරාධයක්, ඇයි මේ විදිහට කරන්නේ" කියා මා ඔහුගෙන් අහපුවාම ඔහු කියනවා "නෑ මේවා මම ලියන්නේ එකතු කරලා ළඟ තියා ගන්න නෙවේ. හිතට වද දෙන දේවල් තමයි එහෙම ලියන්නේ" කියලා. ඕනෑම කවියකු, නිර්මාණකරුවකු ඔහුගේ සිතට වද දෙන දේවල් තමයි ලියන්න පටන් ගන්නේ. දැන් ගාමිණී ෆොන්සේකාගේ කවිත් එහෙමයි. ඔහුගේ හිතට වද දුන් දේවල් ඔහු පත් ඉරුවක් මත නිරන්තරයෙන් කුරුටු ගෑවා.

තවත් විශේෂ කාරණාවක් තමයි ඔහු ලියන කවියක් හෝ ගීතයක් සංශෝධනය කරනවාට ඔහු කැමැති නෑ. මොකද පසු කලෙක ඔහු ඉතාම හිතවත් වුණාට පස්සේ දවසක් මම කිව්වා 'සුදෝ මම ආදරෙයි' කියන වචන පේළියට එච්චර කැමැති නෑ කියලා. එතකොට ඔහු ඇහුවා ඇයි අකැමැති කියලා. ඒ වදන්වල බොළඳ ගතියක් තිබෙන බව මා පැවසූ විට ඔහු මට දුන්නේ අපූරු පිළිතුරක්. "නෑ ඕකෙ වැරැද්දක් නෑ. මගේ ගුරුවරයා අරිසෙන් අහුබුදු. එතුමා ලියලා තියෙනවනේ 'මාගෙ සුදා මාගෙ සුදා තාම නෑ' කියලා. 'සංදේශය' චිත්‍රපටයේ ලතා වල්පොල ගැයූ 'රෑන ගිරා රෑන අඹේ මී බිබී' කියන ගීතයේ කොටසක් එය. 'සුදා' කියන වචනය එහෙම බොළඳ එකක් කියලා පිළිගන්නේ නෑ" කියලා ඔහු කිව්වා.

කලා නිර්මාණවලදී ඔහු ඒ වගේ හරිම මුරණ්ඩුයි. ඇත්තටම මම 'සරුංගලේ' චිත්‍රපටයේ 'බඹරිදු, බඹරිදු' ගීතයේ වචන මේ මේ විදිහට යොදමුද කියා ඔහුට යෝජනා කළා ගීත රචකයෙක් හැටියට. ඒත් ඔහු ඒ එක වචනයක්වත්, එක අකුරක්වත් එහා මෙහා කරන්න කැමැති වුණේ නැහැ. සරුංගලේ කරන කාලේ අපි යාපනයේ නැවතී හිටියේ. දවසක් ඔය ගී පද රචනය මට දීලා ඔහු ඇහුවා "මේක මොකක්ද කියලා හිතාගන්න පුළුවන්ද?" කියලා. මේ ගීතයෙන් කියැවෙන්නේ මල් සහ බඹරුන් ගැන. ඒ කියන්නේ දෙපාර්ශවයක් අතර තිබෙන මිත්‍රත්වය, සහයෝගීතාව. "මේ සරුංගලේ චිත්‍රපටයේ කතාවනේ" කියා මං ඔහුට පැවසුවා. ඔහු කියපු දේ තමයි "මම ඕක ලිව්වේ මේ චිත්‍රපටයට තමයි. කැමැති නම් ගන්න" කියලා.

'සක්විති සුවය' චිත්‍රපටයට ඔහු ටැක්සිකාරයෙක් ගැන ගීතයක් ලිව්වා. 'නොමියෙන මිනිසුන්' චිත්‍රපටයේ තේමා ගීතය ලිව්වා. එය ගායනය කළේ පණ්ඩිත් අමරදේවයන්. ඒ අතරේ ඔහු කවිත් ලියාගෙන ගියා. ඔහු ප්‍රිය කළ සංගීතඥයන් අතරෙන් කෙනෙක් වික්ටර් රත්නායක. ඒ අනුව වික්ටර්ට මම ගාමිණී ලියූ ගී පදමාලා කිහිපයක් ලබා දෙනවා. මම මුලින්ම ඇහුවේ 'සුදෝ මම ආදරෙයි' ගීතය වුණාට ඔහු මුලින්ම ලියා තිබුණේ 'සොඳුර නුඹ මට මව් වෙයන්' කියන ගීතය. ඒක හරි අපූරු අදහසක්. ඔහු මේ මගේ මව වෙන්න කියන්නේ තමන්ගේ බිරියට. ඉතාම අපූරු කාව්‍යමය සංකල්පයක්.

ඒ වගේම තමයි ඔහු වික්ටර් රත්නායකයන්ට ලියූ 'අහිමි වුණත් නුඹ ළඳේ' ගීතය. ඇත්තෙන්ම ඒ ගී තනු පවා නිර්මාණය කරන්නේ අපි එකට එකතු වෙලා. ගාමිණී ෆොන්සේකා, මම, වික්ටර් රත්නායක අපි එකට ඉඳගෙනයි මේ තනු නිර්මාණය කරන්නේ. ගාමිණී පුදුම සෞන්දර්යකාමියෙක්. ඔහුගේ රත්මලානේ නිවසේ ඔහු ඒ සඳහා සූදානම් වන්නේ ඔහුගේ කාමරය පුරා සමන් පිච්ච මල් අතුරලා, හඳුන්කූරු පත්තු කරලා. වෙනම පේ වෙලා. එහෙම තමයි ඔහු අපේ සංගීත සාකච්ඡා, ගී තනු නිර්මාණය කරපු අවස්ථා සූදානම් කළේ. සිය කාමරය 'ගඳ කිළියක්' බවට පත් කරලා තමයි ඔහු ඒ කාර්යයට අත ගැසුවේ.

ගාමිණීට සංගීතය පිළිබඳ හොඳ ඉවක් තිබුණා. ගුවන්විදුලියට ඔහු ගායනා කළ ගීතයක් හෝ දෙකක් තියෙනවා. නමුත් ඇත්තටම මම ඒ ගීත අහලා නෑ. ඔහු එහෙම ප්‍රසිද්ධියේ ගීත ගායනා කළේ නෑ. ඒ ඇයි කියලා ඔහු කිව්වෙත් නෑ. මම ඇහුවෙත් නෑ. ඔහුට පියානෝ වාදනය කිරීමේ හැකියාවකුත් තිබුණා. ඒ නිවසේ පියානෝවක් තිබුණා. ඒ නිසා ඇත්තටම ගාමිණීට ගී පද රචනා කලාව, කවි කලාව වගේම සංගීතය පිළිබඳවත් යම් ඉවක්, දැනුමක් තිබුණා.

පසු කලෙක මම ඔහුගේ නිවසට ආ ගිය වෙලාවලදී ඔහු විසි කරපු කවි, ගී, ලිපි ගොනුවක එකතු කළා. මම කිව්වා දවසක අපි මේ කවි ටික මුද්‍රණය කරමු කියලා. ඒ නිසා පසු කලෙක ඔහුට අදහසක් තිබුණා ඒ කාර්යය කරන්න. වරෙක ඔහු මට අත් පිටපතක් පවා පෙන්නුවා. ඔහුට සිංහල බස ඉගැන් වූ අරිසෙන් අහුබුදුවන්ටත් මේ කවි ගීත ඉරා විසි කරන එක මහා පවක් කියා පෙන්වා දුන් සුනිල් ආරියරත්නයන්ටත් කියා තමයි ඔහු මේ පොත පුදලා තිබුණේ.

ඔහු ලියූ කවි අතර සදැස් හා නිසදැස් කාව්‍ය දෙවර්ග යම තිබුණා. ඇත්තෙන්ම ඔහුගේ මේ කවි කලාව ඔහු නළුවෙක් වුණාට පස්සේ ආරම්භ කළ දෙයක් නෙවේ. මොකද දැන් මේ පොතේ සඳහන් වෙනවා අරිසෙන් අහුබුදු සූරීන් ළඟ තබා ගත්ත, පාසල් සමයේදී ගාමිණී ලියූ කවි පංතියක්. එය සමුද්‍රඝෝෂ විරිතෙන් ලියා තිබූ සිව්පද කවි රචනයක්. ඒක ඇත්තටම පාසල් සාහිත්‍ය තරගයකදී ජයග්‍රහණය කළ රචනාවක්. අරිසෙන් අහුබුදුවන්, ගාමිණී ෆොන්සේකා ශිල්පියාට, තමන්ගේ ගෝලයාට දැක් වූ ආදරය නිසා මේ කවි පෙළ ආරක්ෂා කරගෙන ඉඳලා මේ පොතට ඇතුළත් කරලා ඒ ග්‍රන්ථයට නමක් යෙදුවා 'ගාමිණී - ගී මිණි' කියලා. ඒ විතරක් නෙවේ මේ ලිපි ගොනුව ශුද්ධ පවිත්‍ර කරලා, අක්ෂර වින්‍යාස දෝෂ දුරු කරලා එය සංස්කරණය කරන්නට පෙළඹුණේ අරිසෙන් අහුබුදුවන්. ඇත්තටම ගාමිණී ෆොන්සේකා පදනමේ සභාපති දමිත් ෆොන්සේකාට අවශ්‍ය වුණා මේ කෘතිය අරිසෙන් අහුබුදුවන් ජීවත්ව සිටි කාලයේ එළි දක්වන්න. එය නොහැකි වුණා. ඊළඟට ඔහුට අවශ්‍ය වුණා සුමිත්‍රා ෆොන්සේකා මහත්මිය ජීවත්ව සිටියදී මෙය එළි දක්වන්න. එයත් බැරි වුණා.

ගාමිණී ෆොන්සේකා රචිත කවි, ගී මෙන්ම ඔහුගේ චිත්‍ර කිහිපයකුත් මේ කෘතියට ඇතුළත් වෙනවා. ඇත්තටම ගාමිණී ෆොන්සේකා අතීතයේදී චිත්‍ර කලාව ඉගෙන ගෙන තියෙනවා ප්‍රවීණ චිත්‍ර ශිල්පී සුසිල් ප්‍රේමරත්නයන්ගෙන්. ඒ නිසා ඔහු චිත්‍රත් ඇන්දා. සමහර වෙලාවට ඔහු ටෙලිෆෝනයෙන් කා සමග හෝ කතා කරමින් කුරුටු ගෑ චිත්‍රයකින්, කවියකින් ඔහු තමන්ගේ කාන්සිය, හුදෙකලාව මකා ගන්න උත්සාහ කරන්නට ඇති. එබඳු වෑයමක ප්‍රතිඵලය තමයි මේ නිර්මාණ එකතුව. නමුත් ඒවා ජනගත කිරීමට ඔහුට අවශ්‍ය වුණේ නෑ මුලදී. පසු කලෙක මගේ බලකිරීම උඩ තමයි ඒ ගැන යම් උනන්දුවක් ඇල්මක් ඔහුට ඇති වුණේ. ඔහු මැරෙන තුරාම කවි ලිව්වා. රුක්මණී දේවි මිය ගිය අවස්ථාවේදී, ඒ වගේම මහගමසේකර මියගිය අවස්ථාවේදී කවි සටහන් තබා තිබෙනවා. තමන්ගේ හිතට වේදනාවක් ඇති වූ වෙලාවලදී ඔහු ගීත ලිව්වා. ඒ හැර ඔහු ඉංග්‍රිසි බසින් තමන්ගේ දියණියට, තමන්ගේ පුතණුවන්ට, තමන්ගේ ගුරුවරයකු වූ ප්‍රේමනාත් මොරායස් මහතාට කවි රචනා කළා. ඒ වගේම ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා වෙනුවෙන්. ඒ ඉංග්‍රිසි කවිත් මේ පොතට ඇතුළත් වෙලා තියෙනවා.

ඔහු මහා කවීත්වයකින් හෙබි ශ්‍රේෂ්ඨ කවියකු ලෙස මා හඳුන්වා දෙන්නේ නැහැ. ඔහු මෙරට බිහි වෙච්ච අග්‍රගණ්‍ය  නළුවා. එතකොට මේ නළුවා තුළ ගීත රචකයකු හා චිත්‍ර ශිල්පියෙකු සිටීම ඔහුගේ රංගන කාර්යයට මොන තරම් පිටුබලයක් වුණාද කියා මට හිතෙනවා. ඇත්තටම කලාකරුවෙක් කියන්නේ අනිවාර්යයෙන්ම කවියෙක්. හොඳ සිනමාකරුවෙක් කියන්නේ කවියෙක්. හොඳ චිත්‍ර ශිල්පියෙක් කියන්නේ කවියෙක්. ඒ නිසා කවීත්වය කියන එක ඕනෑම විශිෂ්ට කලාකරුවකු තුළ පැවැතිය යුතු ගුණාංගයක්. අන්න ඒ විශිෂ්ටත්වය තමයි මම ඔහුගෙන් දකින්නේ. කවිකම කියන එක ඔහු තුළ තිබුණා. නමුත් ඔහුට එය වැඩි දියුණු කරගෙන කවියකු හැටියට ඉදිරියට යන්න වුවමනාවක් තිබුණේ නැහැ. එතනදි වැදගත් වෙන්නේ ගාමිණී ෆොන්සේකා කියන කවියා. ගාමිණී ෆොන්සේකා කියන ගීත රචකයා, චිත්‍ර ශිල්පියා. ඔහු වෙනත් කවීන් හා චිත්‍ර ශිල්පීන් සමඟ සසඳන්නට යාම නිශ්ඵල ක්‍රියාවක් විදිහටයි මම දකින්නේ.

# යළි බැබළෙන්නේ නැති හොලිවුඩයේ චාන්දනිය

# ශ්‍රීදේවි



අවශ්‍ය කැමරාව ක්‍රියාත්මක කිරීම පමණි. බොලිවුඩයේ චන්ද්‍රාලෝකය හෙවත් 'චාන්ද්නි' ය අසම සම සොඳුරු දෑසින් සඳ කිරණ විහිදවීමට ගනී. එය විටෙක පුර සඳක් හා සමානය. දර්ශනයෙන් දර්ශනයට දෑස හා දෙතොල් යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වීමට ගනී. ප්‍රේක්ෂකයන්ට ඇසිපිය හෙළීමට පවා අමතකය. නව නළු රසයම, අද්විතීය නර්තන, රංගන කුසලතාවෙන් රන් රස සේ පෑහෙයි. ශ්‍රීදේවි, පළමු සුපිරි තාරකාව 'චාන්ද්නි' ය පුරා පනස් වසරක්ම බොලිවුඩයට 'චාන්ද්නි' වූවාය. ශ්‍රී දේවියගේ තුන්සිය වැනි සිනමා පටය තිරගත වූයේ 2017 ජූලි 7 වැනි දිනය. ඒ ඇයගේ පනස් හතර වැනි උපන් දිනයට අධ්‍යක්ෂ සැමියා බොනි කපූර් විසින් ලබා දුන් තිළිණයයි.

ශ්‍රීදේවියගේ සෑම සිනමා පටයක්ම රංගන ප්‍රතිභාවේ කූටප්‍රාප්තීන්ය. එහෙත් සිනමාවේ දෙවැනි ගමනින් පසු (විවාහ වී දරුවන් ලැබීමෙන් පසු) ඇයගේ ප්‍රතිභා ප්‍රභාව වඩාත් හොඳින් විදහා දැක්වෙන භූමිකා තෝරා ගැනීම නිසා බොලිවුඩයේ පමණක් නොව අන්තර්ජාතිකවද රසික සමූහයා බලා සිටියේ නොඉවසිල්ලෙනි. එහෙත් සඳ කිරණ නිවී ගියේය. තිරය වැසිණි. යළි ඒ සඳකිරණ ප්‍රේක්ෂකාගාරයේ බැබළෙන්නේ නැත.

2018 පෙබරවාරියේදී ශ්‍රීදේවි, බොනි කපූර් හා බාල දියණිය කුසී සමඟ ඩුබායි ගියේ බෑනා කෙනකු වූ මෝහිත් මර්වාගේ මංගල්‍යයට සහභාගී වීමටයි. මංගල්‍යයෙන් පසුව ද ශ්‍රී දේවිය දින කිහිපයක් ජුමෙයිරා එමිරේට් ටවර්ස් හෝටලයේ රැඳී සිටි අතර බොනී හදිසි කටයුත්තකට මුම්බායි පැමිණියේය. ඔහු පෙබරවාරි 24 වැනිදා පස්වරු 5.30 ට පමණ ඩුබායිහි හෝටලයට පැමිණියේ බිරිය රාත්‍රී කෑමකින් පුදුමයට පත් කිරීමටය. සැමියාගේ ඇමතුමින් අවදිවුණු ඇය නාන කාමරයට ගියේ ලහි ලහියේ නා පිරිසුදු වී සැමියා සමඟ යාමට සූදානම් වීමටය. ඇය නාන කාමරයට ගොස් මිනිත්තු 15 ගත වුවද කිසිදු හැලහොල්මනක් ප්‍රතිචාරයක් නැති තැන ඔහු කළේ නාන කාමරයේ දොර විවර කරගෙන ඇතුළු වීමය. සිහිසුන් ශ්‍රීදේවිය නාන බේසමේ නිසොල්මන්ව සිටියාය. රෑ කෑමට සැමියා සමඟ යනු වෙනුවට ඇය ඔහුටත් හොරා මාරයා සමඟ ගොස් සිටියාය. පුවත සැලවූ සැණින් සිනමාවට හද බැඳි රසික ප්‍රජාවම සිතුවේ මෙය තවත් එක් අන්තර්ජාල ප්‍රෝඩාවක් බවය. අවාසනාවට එය සත්‍යයක්ම විය.

1963 අගෝස්තු 13 වැනිදා උපන් ශ්‍රීදේවියට නිළිකමින් තොර ජීවිතයක් තිබුණේ සිව් වසරකි. දමිළ, තෙළිඟු, හින්දි, මලයාලම් හා කන්නඩ යන සකල ඉන්දීය සිනමාවේම අධිරාජිනිය වීමට ශ්‍රීදේවියට හැකිවිය. භාරතයේ එවැනි හැකියාවක් ලද එකම පුද්ගලයා ඇයය. එහෙත් ඒ අධිරාජ්‍යයන් ගොඩ නැඟුවේ වයස අවුරුදු හතරේ සිට කැමරාව ඉදිරියේ හෙලූ දහදිය කඳුළුවල ප්‍රතිඵලය. යාන්තම් පියවර එසවීමට පටන් ගත්දා සිට ශ්‍රීදේවි පාද තාලයට තබන්නට ගත්තාය. පියා තමිල්නාඩුවේ සිවකාසිවල නිසාත් මව අන්ද්‍රා පෙදෙසේ ත්‍රිපතිවල නිසාත් පුංචි ශ්‍රීදේවිට දමිළ හා තෙළිඟු යන භාෂා දෙකම චතුර ලෙස කතා කළ හැකි විය. ශ්‍රී අම්මා යන්ගේර් අයිප්පන් සිව් හැවිරිදි වියේදීම රංගනයට එක්වූයේ දෛවෝපගතවය. ගේය පද රචකයකු වූ කන්නදාසන්, වෘත්තියෙන් නීතිඥයකු වූ ශ්‍රීදේවිගේ පියාගේ හොඳම යහළුවකු විය. මේ අඹ යාළුවා දිනක් 'කන්ධන් කරුණෛයි' නම් සිනමා පටයට කඩා දරුවකු අවශ්‍ය බව පැවසුවේය. ශ්‍රීදේවි 1967 වසරේ කන්ධන් කරුණෛයි සිනමා පටයට හා හා පුරා කියා එක්වූයේ එලෙසිනි. තිරයේදී ඇයගේ උප්පැන්න සහතිකයේ නම 'ශ්‍රීදේවි' ලෙසින් වෙනස් විය. 1969 දී ඇය රැඟූ 'තුනෙයිවන්' සිනමාපටය ළමා නිළියක ලෙස ඇයගේ නම දකුණු ඉන්දීය සිනමාවේ ස්ථාපිත කිරීමට හේතුවිය. මුරුගන් දෙවියන්ගේ බාල අවදිය ශ්‍රීදේවි නිරූපණය කළාය. සිනමා පටය කළු සුදු හා ඊස්ට්මන් වර්ණයෙන් නිර්මානය වූ අතර දින සියය ඉක්මවා ප්‍රදර්ශනය කෙරිණි. ශ්‍රීදේවි කොලිවුඩයට එසේ පා තැබූ අතර ටොලිවුඩය හෙවත් තෙළිඟු සිනමාවට ඇය අවතීර්ණ වූයේ 'මා නාන්නා නිර්දෝෂි' සිනමා පටයෙනි. ඇය රැඟූ ප්‍රථම කන්නඩ සිනමා පටය භක්ත කුම්බරා' (1974) ය. එය ළමා නිළියක සේ රැඟූ පස්වැනි සිනමාපටයය. ඇය රැඟුවේ මුක්තා බායි චරිතයයි. මොලිවුඩයට හෙවත් මලයාලම් සිනමා ලොවට ඇය පිවිසියේ 'කුමාර සම්භවම්' (1969) සිනමා පටයෙනි. එහි සුබ්‍රමනියම් ලෙස ඇය රැඟූ අතර බොලිවුඩයට 'රාණි මෙරා නම්' (1972) සිනමා පටයෙන් ප්‍රවිෂ්ට විය. මේ ළමා නිළියගේ සිනමා ගමන 2018 වසරේ පෙබරවාරි 24 දක්වාම අවසන් නොවිණි. ඇය අවසන් වරට කැමරාවට පෙනී සිටියේ ශාරුක්ඛාන්, කත්‍රිනා කායිෆ් රඟන දෙසැම්බර් මාසයේ තිරගත වීමට නියමිත 'සීරෝ' සිනමා පටයේ කෙටි දසුනකටය. එහි ඇය ශාරුක්, ආලියා බාත් හා කරිෂ්මා කපූර් සමඟ සාදයක සතුටින් සිටින ජවනිකාවක් නිරූපණය කෙරේ.

ශ්‍රීදේවි දමිළ සිනමාවට හැත්තෑ එකකද, මලයාලම් සිනමාපට විසිතුනකද, කන්නඩ සිනමාපට හයකද, තෙළිඟු සිනමාපට අසූ එකකද, හින්දි සිනමාපට හැත්තෑ එකකද (හීරෝ නොමැතිව) රඟපාමින් සිනමාපට තුන්සියයකට රංගන දායකත්වය ලබා දී ඇත.

ශ්‍රීදේවියගේ ප්‍රබල සිනමා රංගන අතරින් මම් (2017), ඉංග්ලිෂ් විංග්ලිෂ් (2012), ලාඩ්ලා (1994), ලම්හේ (1991), ක්ෂණා ක්ෂණම් (1991 / තෙළිඟු), චාන්ද්නී (1989), චාල්බාස් (1989), මිස්ටර් ඉන්ඩියා (1987), සද්මා (1983), මීන්ඩුම් කෝකිලා (1981 / දමිළ) යන සිනමාපට ප්‍රමුඛස්ථානයක් ගනී. ඇය හොඳම නිළිය ලෙස ෆිල්ම් ෆෙයාර් සම්මාන දාහතරකට නිර්දේශ වූ අතර පස්වරක් ජයග්‍රහණය කළාය. 1992 ලම්හේ, 1990 චාල්බාස්, 1991 ක්ෂණා ක්ෂණම් (තෙළිඟු), 1982 මීන්ඩුම් කෝකිලා (දමිළ) සිනමා රංගනයන්ට ඇය සම්මානයෙන් අභිසෙස් ලැබූ නිර්මාණයි.

ඊට අමතරව සවුත් ඔෆ් වයතිනයිල් (1977), නාගිනා (1986) මිස්ටර් ඉන්ඩියා (1987) රංගනයන්ට ෆිල්ම් ෆෙයාර් විශේෂ සම්මාන හිමිවිය. ඇය 2013 දී ඉන්දීය පුරවැසියකු ලබන ඉහළම සිව්වැනි සම්මානය වන පද්ම ශ්‍රී සම්මානයෙන්ද පිදුම් ලැබුවාය.

තමිල්නාඩුවේ ජාතික සම්මානයෙන් 1981 දී ශ්‍රීදේවි හොඳම නිළිය ලෙස සම්මානයට ලක්වූයේ 'මූන්ඩ්‍රම් පිරායි' හි රංගනයටය. 2013 දී ඉන්දීය සිනමාවට සියක් වසරක් සපිරුණු අතර ජාතික මනාපයෙන් විශිෂ්ටම ඉන්දීය රංගවේදිනිය ලෙසින් තේරුණේ ශ්‍රීදේවිය. 2012 වසරේ වයස හතළිස් අටක්ව තිබියදීත් ශ්‍රීදේවි එම වසරේ පැවැත්වූ ජනතා ඡන්දයෙන් සියයට හැත්තෑ හතරකට වඩා ඡන්ද ලබා බොලිවුඩයේ වඩාත් බලසම්පන්න කාන්තාව වූවාය.

ශ්‍රීදේවියගේ මව රාජේශ්වරී සිනමා පටවල නර්තනයේ යෙදුණු බව කියැවේ. මේ ජාන උරුමය ශ්‍රීදේවිට හොඳින්ම තිළිණ විය. ශ්‍රීදේවිය බොලිවුඩයේ සුපිරි නර්තන තාරකාවක වූයේ සරෝජ් ඛාන් නම් රංගන ගුරුවරියකගේ මඟ පෙන්වීම නිසාය. ශ්‍රීදේවිගේ නාගීනා නයි නැටුම, මිස්ටර් ඉන්ඩියාහි චාලි චැප්ලින් නර්තනය, කතේ නහී කතේ නර්තනය ( මෙය බොලිවුඩයේ සරාගීම ගීතමය නර්තනය ලෙස සලකයි), හවා හවායි නර්තනය සමඟ එහි පිටුපස සිටින සරෝජ්ද අමතක කළ නොහැකිය. ශ්‍රීදේවිට දියණියක ලෙස සලකන ඇය තවමත් ශ්‍රීදේවිය මිය නොගිය බව සිතන්නට උත්සාහ ගන්නීය. ශ්‍රීදේවිගේ සිනමාපට 22 කම ගුරුවරිය වු ඇය පවසන්නේ දකුණු ඉන්දීය සිනමාවෙන් පැමිණි ඇයගේ නර්තන විලාශය මුලින්ම බොලිවුඩයට නොගැළපුණු බවය. කතක් හා භරත නාට්‍යයම්හි අග්‍රප්‍රාප්ති කුසලතා ප්‍රකට කළ ශ්‍රීදේවි බොලිවුඩයේ රිද්මයට නර්තනයේ යෙදවීමට සරෝජ් සැර වැරවූ සහ දඬුවම් කළ වාර බොහෝය. ඇය කියන්නේ ශ්‍රීදේවි ඒ සියල්ල ඉතා ඉවසිලිවන්තව දරාගත් බවයි.

'චාල්බාස්' හි 'නා ජනේ කහා සේ ආයි' නර්තනයෙහි ඇය යෙදුණේ අංශක 103 ට උණ වැලඳී තිබියදීය. එමෙන්ම ඇය බොලිවුඩ රංගනයට පිවිසියේ හින්දි බස චතුර ලෙස කතා කළ නොහැකිවය. ඇයට මුලදී හඬ දුන්නේ 'නාස්' ය. ඇයට පෙර බොලිවුඩයට පිවිසි දකුණු ඉන්දීය තාරකාව රේඛා, ශ්‍රීදේවි රැඟූ ආඛිර් රාස්තා සිනමා පටයේ ඇයගේ චරිතයට හඬ දුන්නාය. ශ්‍රීදේවි මුලින්ම හඬත් රංගනයත් එකට බොලිවුඩයට දායාද කළේ 'චාන්ද්නි' සිනමා පටයෙනි.

විවිධ චරිත නිරූපණය කිරීමේ පිපාසාවෙන් ඇය පෙළුණේ මුහුකුරාගිය නුවණක් නැති ගැටවර වියේදීමය. ඇය වයස අවුරුදු 13 දී 25 හැවිරිදි රජිනිකාන්ත්ගේ සුළුමව ලෙස රංගනයේ යෙදුණාය. ඉන් වසර කිහිපයකට පසු 1989 දී ඇය චාල් බාස් බොලිවුඩ් සිනමා පටයේ ඔහුගේ පෙම්වතිය වූවාය. ශ්‍රීදේවිගේ රංගනයට ප්‍රතිචාර ලැබුණේ සිනමා පට තිරගතවීමට පෙරදීය. ඇයගේ අකල් මරණයත් සමඟ ශේකර් කපූර් මිස්ටර් ඉන්ඩියාහි ශ්‍රීදේවි චැප්ලින් ලෙස රඟන විට සියල්ලන්ම ජාත්‍යන්තර ක්‍රිකට් තරගයකදී ජයග්‍රාහි අවසන් ලකුණ ලබාගනිද්දි නැඟී සිටින ප්‍රේක්ෂකයන් මෙන් නැඟී සිටි බව සිහි කළේය.

බොලිවුඩයේ

48 වන පිටුව බලන්න





# ලෝක සිතියම් විකාශනයේ ඉතිහාසය

■ ධනුෂ්කා රණවීර

අප වෙසෙන භූමිය මත දැක්වෙන තොරතුරු ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරනු ලබන සන්නිවේදන මාධ්‍යය සිතියම වේ. එය හුදෙක්ම මිනිසාගේ මනස තුළ නිර්මාණය වෙන පරිකල්පනික රූපාකෘතියක් නොවේ. කිසියම් නිශ්චිත වූ ක්‍රමවේදයකට හා පරිමාණයකට යටත්ව අවකාශීය සංකල්පය විග්‍රහ කරන ලද සටහනක් සිතියමක් වශයෙන් ඉතා සරලව හඳුන්වා දිය හැකිය. භෞතික භූගෝල විද්‍යාව පිළිබඳ හසල දැනුමකින් හෙබි විද්වතුන් සිතියම හඳුනාගෙන ඇත්තේ භූ තලයේ ඇති ප්‍රස්ථාරික නිරූපණයක් ලෙසිනි. මෙම හඳුනාගැනීම තුළින් භූ දර්ශනය මත ඇති භෞතික හෝ සංස්කෘතික කඩඉමක පැවතිය යුතු පරිමාණානුකූල බව හා දෘෂ්‍යමය ස්වරූපය අවධාරණය කර දක්වයි. මේ ආකාරයට විවිධ විද්වතුන් සිතියම් විද්‍යා ඉතිහාසය තුළදී සිතියම විවිධාකාරයෙන් හඳුනාගෙන ඇත.

සිතියම් විද්‍යා ඉතිහාසය ලේඛන කලාවේ ආරම්භයටත් පෙර යුගයන් දක්වා විහිදේ. ලිවීමට, කියවීමට නොදත් ආදි මානවයා පවා තමා දත් ලෝකය අන්‍යයන්ට වටහා දීම පිණිස සිතියම් සටහන් ඇඳීමේ යම් කිසි ක්‍රමවේදයක් භාවිත කළ බව අර්වින් රේස් වැනි විද්වතුන් පවසයි. එවැනි ආදි කල්පික සටහන්වලින් ඉතාමත් වැදගත් සිතියම් සටහනක් ලෙස ගැනෙනුයේ ලොව පුරාණතම සටහන ලෙසින් සලකන ක්‍රි.පූ. 2800 දී පමණ මැටි පුවරුවක සටහන් තබන ලද ගාසූර් මැටි පුවරුවයි.

මෙම සිතියම බැබිලනයෙන් සැතපුම් 200 ක් පමණ උතුරෙහි පිහිටි ගාසූර් නගරය කැණීම් කිරීමේදී සොයා ගන්නා ලදී. මෙම සිතියමේ දක්වා ඇති ගංගාව යුප්‍රටීස් බව විද්වතුන් ගේ අදහසයි. සිතියමේ දෙපස මාලුන්ගේ කොරපොතු මෙන් නිරූපණය කර ඇත්තේ කඳු පන්තියි. ගංගාව අතු ගංගා ත්‍රිත්වයකට බෙදී ඩෙල්ටාවක් හරහා මුහුදට හෝ විලකට ගලා බසියි. දිශාවන් සලකුණු කර ඇත්තේ අක්ෂර ඇතුළත් වෘත්තවලිනි. ඉතා ප්‍රාථමික යුගයේදී වුවද සටහන් තබන මෙම සිතියම තුළද දිශාව මුල් කරගත් සිතියම් ක්‍රමවේද අනුගමනය කර තිබීම පුදුමය දනවනසුලුය.

එස්කිමෝවරුද සිතියම් නිර්මාණයේ පෙරටුගාමීන් වූහ. ඔවුන් සිතියම් නිර්මාණයේදී මිණුම් උපකරණ භාවිතයකින් තොරව එසේම විද්‍යාත්මක පදනමකින් තොරව පැන්සල් රේඛා මනාව හසුරුවමින් බෙල්චර් නමැති දූපත් සිතියමකට නඟා ඇත. මෙය ජල විද්‍යා සටහන් සමග පහසුවෙන් සංසන්දනය කළ හැකි නිසා සුප්‍රකට දේශගවේෂකයකු වන විල් හෙල්මර් ස්ටෙපන්සල් ප්‍රකාශ කර ඇත්තේ එස්කිමෝවරුන්ගේ සිතියම් නිර්මාණ උසස් බවයි.

ඓතිහාසික සාක්ෂි අනුව සිත් ගන්නා සුලු සිතියමක් ලෙස ඇස්ටෙක්වරුන්ගේ සිතියම වැදගත් වේ. මෙම සිතියමේදී මොවුන් ගෝත්‍රික සංචාරක ජීවිතයට අත්‍යවශ්‍ය අංග එනම් ගංගා, වනාන්තර, කුඹුරු යන ප්‍රදේශයන් ස්වාභාවික ලෙසම සලකුණු කිරීමට ඉතා දක්ෂ විය. මෙම සිතියමේ මාර්ග බොහෝ විට පාද සලකුණුවලින් අලංකාර කරනු ලැබේ. අලංකාර සැරසිලිවලින් යුක්ත වූ මෙම සිතියම් එම ජන කොට්ඨාස අතර විශ්ව භාෂාවක් බවට පත්වී තිබුණි.

නූතන විද්වතුන් මවිත කරවන සුලු තවත් ආදි කල්පිත සිතියමක් ලෙස මාෂල් දූපත් වාසීන්ගේ සිතියම් හඳුන්වා දිය හැකිය. මෙම සටහන් තල් කොළවල මැද නාරටියෙන් සාදන ලද රාමුවක සවිකරන ලද සිප්පි කටුවලින් යුක්ත වේ. මෙහි සෘජු රේඛා මගින් මහ මුහුද නිරූපණය කරන අතර වක්‍ර රේඛා මගින් දූපත් අවට රළ පෙරමුණ දක්වනු ලබයි. කෝටු කැබලි අතර තැනින් තැන එල්ලා ඇති සිප්පි කටුවලින් දූපත් පිළිබිඹු වේ. මොවුන් අත්දැකීමෙන් සාගරයේ පිහිටීම හා එහි ස්වභාවය මනා දැනුමකින් සිතියම්ගත කර ඇත.

අෑත පෙරදිග ශිෂ්ටාචාරයද සිතියම් සටහන් තැබීමෙන් ඉදිරියෙන් සිටින අතර එයද වැදගත් කේන්ද්‍රස්ථානයකි. යුරෝපා ජාතීන් චීනයට සංක්‍රමණය වීමටත් පෙර සිට චීනයේ සිතියම් පැවතුනි. කඩදාසි නිපදවීමෙන් පසු චීන අධිරාජ්‍යයෙහි සියලුම කොටස්වල සිතියම් නිර්මාණය විය. චීන සිතියම් විද්‍යාවේ නියම ආදි කර්තෘවරයා වනුයේ පෙයි ෂියු. මොහු ප්‍රාදේශීය සිතියම් නිර්මාණයේ යෙදී සිටි අතර සිතියම් විද්‍යාව පිළිබඳ මූලධර්ම කිහිපයක් දක්වා ඇත. එසේම පෙයි ෂියු ගෙන් පසු සිතියම් නිර්මාණය කරන්නන් පර්සියාවේ සිට ජපානය දක්වා මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි සිතියම් නිර්මාණය කරන ලදී. ක්‍රි.ව. 421 - 466 අවධියේ දී ෂයේචූවා විසින් ලීයෙන් සිතියමක් නිර්මාණය කර තිබුණි. මෑත කාලයේ එනම් ක්‍රි.ව. 730-805 කාලවකවානු තුළ වැදගත් සිතියම් නිර්මාණය කරන්නෙක් වූයේ චියාටෑන් ය. මොහු වර්ග අඩි 30 ක සිතියමක් නිර්මාණය කර තිබූ අතරම ගල් පුවරු මත නිර්මාණය කළ සිතියම්ද හමුවිය. එම ගල් පුවරු සිතියමේ සුවිශේෂත්වය වන්නේ හොවැංහෝ ගඟ සහ චීන මහා ප්‍රාකාරය නිවැරැදිව දක්වා තිබීමයි. මෙය දැනට දන්නා පැරැණිම චීන සිතියම වේ. කෙසේ නමුත් 16 වැනි සියවසෙන් පසු චීන සිතියම බටහිර බලපෑමට ලක්වුණි.

සිතියම් විද්‍යාවේ විකාශනය පිළිබඳ සැලකීමේදී පුරාණ ග්‍රීක ශිෂ්ටාචාරය අපට අමතක කළ නොහැකිය. මක්නිසාද යත් වර්තමාන සිතියම් විද්‍යාවේ පදනම සලසන ලද්දේ ග්‍රීකයන් විසින් වන හෙයිනි. ක්‍රි.පූ. 4 වැනි ශතවර්ෂයේදී මෙතෙක් පෘථිවිය පිළිබඳ පැවති මතවාදය බිඳ දමමින් ඉදිරිපත් කරන ලද නව අදහස වූ පෘථිවිය ගෝලාකර වස්තුවක්ය යන්න සිතියම් විද්‍යාවේ විකාශනයත් සමගම වෙනස් කරනු ලැබුවේය. ක්‍රි.පූ. 350 දී පමණ ඇරිස්ටෝටල් මෙම අදහස සනාථ කිරීමත් සමගම පෘථිවියේ හැඩය, ධ්‍රැවය, සමකය හා නිවර්තන රේඛා ආදිය වෙත ඔවුන්ගේ දෘෂ්ටිය යොමුවිය. එපමණක් නොව පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය මෙන්ම ප්‍රථම ප්‍රක්ෂේපණයද බිහිවීම සිතියම් විද්‍යාවේ නව හැඩතලයන් නව මාර්ගයන් සොයා ගිය අවස්ථාය. නූතන මිනුම්වලට සාපේක්ෂව තරමක් දුර්වලතා පැවතියද එරටෝස්තිනිස් විසින් සූර්ය විකිරණයේ ස්වභාවය අනුව පෘථිවිය මිනුම් කොට ජනාශ්‍රිත ලෝකය පිළිබඳව සිතියමක් නිර්මාණය කරනු ලැබුවේය. එහි අක්ෂාංශ 7 ක්ද, මධ්‍ය රේඛා 7 ක්ද විය. තාප්‍රොබේන් දූපත් නමින් ශ්‍රී ලංකාව නියමිත ස්ථානයෙන් තරමක් බැහැරව ලකුණු කර තිබුණි.

ග්‍රීක සිතියම් ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස ක්‍රි.පූ. 90 සිට 168 ත් අතර කාලය සලකනු ලැබේ. එම කාලය ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ ක්ලෝඩියස් ටොලමිගෙන් ආරම්භ විය. තාරකා ශාස්ත්‍රය හා ගණිතය පිළිබඳව ඉතා පුළුල් වූත්, විශිෂ්ට වූත් දැනුමකින් හෙබි වූ ඔහු විසින් ප්‍රකාශයට පත්කරන ලද Geogrphia කෘතිය සිතියම් විද්‍යාවේ දියුණුවට ඉවහල් විය. නව සිතියම් ශිල්ප ක්‍රමයන් පිළිබඳව දැනුම එහි අඩංගු විය. ටොලමි විසින් නිර්මාණය කරන ලද ලෝක සිතියමෙහි අක්ෂාංශ හා දේශාංශ එක් පැත්තකට කිසියම් පරිමාණයකට අනුව සලකුණු කොට ඇත. නිවර්තන රේඛා තීරණය කර ඇත්තේ අක්ෂාංශ 23 ත් 50 ලෙසිනි. අර්වින් රේස්ට අනුව ටොලමි පෘථිවියේ ප්‍රමාණය අවතක්සේරු කර ඇත. මොහු විසින් දක්නා ලද ඇතැම් රටවල් විශාලවද, තවත් රටවල් වෙනස් පුදුමාකාර හැඩවලින් යුතුවද සිතියම්ගත කර ඇති බවට විවේචනාත්මක අදහස් පවතී.

මීට පසුව ආරම්භ වූ රෝම යුගය තුළදී පැරැණි තැටි සිතියම් සංකල්පය පරිශීලනය කළ බවක් දක්නට ලැබේ. වඩාත් වටකුරු වූ රාමුවක Orbis terrarum නම්වූ පටිපාටියකට ලෝකය බහාලූහ. මහාද්වීප තුනක් සමමිතික පිළිවෙළකට තබා දැක්විය. නැගෙනහිර දෙසට වන්නට ආසියාව දක්වා ඇති අතර ඉතාලිය කුඩාවට හා පළලට නිරූපණය කොට රෝමය අවධාරණය කර ඇත. පැරැණි චීන සිතියම්හිදී මෙන් තම රාජ්‍යය ලෝකයේ කේන්ද්‍රය බව පෙන්වීමට උත්සාහ ගෙන ඇත. සිතියම් සම්පාදනයේ දී නක්ෂත්‍ර දර්ශක සිතියම් මූලධර්ම හෝ ගණිතමය සංකල්ප පිළිබඳ සැලකිලිමත් වූවෝ නොවෙති. ඔවුන්ට අවශ්‍ය වූයේ පාලන ක්‍රම හා සංග්‍රාමික කටයුතු සඳහා උපයෝගී කරගත හැකි ප්‍රායෝගික සිතියමක් පමණි.

මින්පසුව එළඹුන මධ්‍යකාලීන ලෝකය සිතියම් විද්‍යාවේ තරමක පසුබෑමකට ලක්වූ යුගයක් වශයෙන් හඳුනාගත හැකිය. මේ කාලය තුළදී ලෝකය තත්ත්වාකාරයෙන් සටහන් කිරීම නොව සිය ධාර්මික විශ්වාස ඒ ආකාරයෙන් නිරූපණය කිරීමට සිතියම් භාවිත කළේය. ඔවුන්ද රෝමවරුන්ගේ වටකුරු ලෝක පටිපාටිය සිය සිතියම් ආකෘතිය බවට පත්කර ගත්තෝය. කල්පිත කලාත්මක මෝස්තරයකට හා සංකේතාත්මක රූපණයකට මුල් තැන දෙමින් නිර්මාණය කරන ලද මෙම සිතියම්වල භූගෝලීය වශයෙන් සිතියමක පැවතිය යුතු නිරවද්‍ය භාවය මඟහැරී ඇත.

මින්පසු කාලයකදී නිර්මාණය වී ඇති පෝටොලන් සටහන මෙතෙක් සිතියම් පිළිබඳ පැවති අඳුරු මතවාදයන් බිඳ දමමින් භූගෝලීය සිතියම් කලාවට නව දැක්මක් එකතු කළ සිතියම් විශේෂයක් ලෙසින් හඳුනාගත හැකිය. 13 වැනි ශතවර්ෂයේ දෙවන භාගයේදී පමණ ජිනීවා නැව් හමුදාවේ කපිතාන්වරුන් හා අද්මිරාල්වරුන් විසින් නිරවද්‍ය භාවයෙන් පරිපූර්ණ සටහන් තබන ලද මෙම සිතියම් විශේෂයන් 15 හා 16 වැනි ශත වර්ෂවලින් පසුව පරිහානියට පත්විය.

පසු කාලය සිතියම් විද්‍යාවේ නව පුනරුද කාලසීමාව ලෙසින් හඳුනාගත හැකිය. මේ කාලපරිච්ඡේද තුළදී පැන නැගී ආ සිතියම්කරණය පිළිබඳව අදහස් හා සංකල්ප සිතියම් විද්‍යාවේ ශීඝ්‍ර දියුණුවට ඉවහල් විය. මෙය ප්‍රධාන සිද්ධීන් තුනක් හා බැඳී පවතින බව විශ්වාස කළ හැක. ටොලමිගේ Geogrphia කෘතිය යළි සොයා ගැනීම සහ භාෂා ගණනකට පරිවර්තනය කිරීම, මුද්‍රණය හා කැටයම් කැපීමේ දියුණුව සමග සිතියම් විශාල ප්‍රමාණයක් නිකුත් කරන සිතියම් කර්මාන්ත ශාලා බිහි වීම හා නව නිපැයුම් හරහා ශ්‍රේෂ්ඨ සොයා ගැනීම් කිරීමද සිතියම් විද්‍යාවේ පුනරුදයට හේතුවිය. මේ කාලයේදී පැවති දුර්වලතා මඟහරිමින් නවීන අයුරින් සකස් කළ සිතියම් බොහෝ ගණනක් දක්නට ලැබේ. මේ නිසාම 17 වැනි සියවසේදී පමණ සිතියම් විද්‍යා නව ප්‍රතිසංස්කරණ යුගයකට පා තබන ලදී. සිතියම් විද්‍යා ක්ෂේත්‍රයේදී සිදුවූ මෙම දියුණු වූ සිතියම් පුනරුදයේ තවත් දියුණු අවස්ථාවක් වශයෙන් හඳුනාගත හැකිය.

මින්පසුව එළඹුන යුගයන්හිදී සිතියම යුදමය අරමුණු ආර්ථික අරමුණු හා පෞද්ගලික වශයෙන් වෙනස් වන්නටත් ඒ වෙනස්කම් හරහා සිතියම් විද්‍යාව දියුණු වන්නටත් විය. නූතන යුගය සිතියම් විද්‍යාවේ දියුණුම වූ කාලසීමාවක් බව හඳුනාගත හැකිය. පෘථිවි ගෝලයට පමණක් සීමා වූ සිතියම් කලාව අද වෙනත් ග්‍රහ වස්තූන්ගේ සටහන් සිතියම්ගත කරයි. සිතියම් විද්‍යාවේ ශිල්පීය අංශය පරිගණක තාක්ෂණය සමග අත්වැල් බැඳ ගැනීම මෙයට හේතුවී ඇත. අධිවේගී පරිගණක චන්ද්‍රිකා, භූගෝලීය තොරතුරු තාක්ෂණය (GIS) ද භාවිත කරමින් නූතන සිතියම් සම්පාදනය කරනු ලබයි. එහිදී අවකාශීය දත්ත ලබාගැනීම, ගබඩා කිරීම, හැසිරවීම හා විශ්ලේෂණය කිරීම ඉතා ක්ෂණිකව හා දෘෂ්ඨාත්මකව කරුණු ඉදිරිපත් කරනු ලබයි. මේ නිසා ඉතාම ක්‍රමානුකූලව හා නිරවද්‍යතාවයෙන් යුතුව සිතියමක් ක්ෂණිකයෙන් ලබාගත හැකිය. මේ නිසා සිතියම් වර්ග රාශියක් වර්තමානය වන විට නිර්මාණය වී ඇත.

රූපාකෘතියක සිට පරිමාණානුකූලව දත්ත ගබඩා කරන දෘශ්‍යමය උපාංගයක් බවට අද වන විට සිතියම පරිවර්තනය වී ඇත. මිනිසා නූතන තාක්ෂණයේ දියුණුව සිතියම් ශිල්පයේ ප්‍රාගුණ්‍යය වැඩි කිරීමට භාවිත කිරීම මෙයට හේතුව වී ඇත. මේ අනුව පුරාණ පැතලි ලෝකයට සීමා වී තිබූ සිතියම් දැනුමෙහි සීමා මායිම් ක්‍රි.පූ. 4 වැනි සියවසෙහි භූගෝලීය සංකල්පයන් සමග නව මංමාවත් කරා ගමන් කරමින් පුනරුදයේ සීමාවට පැමිණ එය අද වන විට පෘථිවි ගෝලයේ සීමා මායිම් ද පසුකරමින් දියුණු තලයකට පැමිණ ඇති බව සිතියම් විද්‍යාවේ ඉතිහාසය පරීක්ෂා කර බලන කල හඳුනාගත හැකි ප්‍රබල කරුණකි.



කෙටි කතාව

# හෙයියන්මාරුව

**'2016 බසක වරුණ' සිංහල සාහිත්‍ය තරඟාවලියේදී ප්‍රථම ස්ථානය දිනාගත් කෙටිකතාව.**

■ **තිසරි ශිබා රණසිංහ - ටොරොන්ටෝ**

දහවල අතුරු සිදුරු නැතිව පිරී ඉතිරී ගිය උසාවි භූමියේ එකෙක් දෙන්නෙක් හැර කිසිවකු නොවීය. නිහැඬියාව හාත්පස ගිලගෙන ඇත. වටින් පිටින් ගලා එන වැහි අඳුර මූසලය. සිදු වූ සියල්ල බියකරු හීනයක් සේය.

"මල්ලියේ, දැන් උඹ මොකක්ද කරන්න හිතන් ඉන්නෙ?"

කුසුමක්කා විටින් විට ඒ මූසල නිහැඬියාව ඉරා දමන්නීය. පිළිතුරක් නැති ප්‍රශ්නයක් ගැන සිතන්නට හිතේ ඉඩක් නැත.

"ඕකි උඹේ විතරක් නෙමෙයි. අපේ පරම්පරාවෙම මූණෙ දැලි ගෑවා. දෙයියනේ දැන් කොහොමද අපි ගමට මූණ දෙන්නෙ"

කුසුමක්කා විටින් විට දෙස් දොවොල් තියමින් සුසුම් ලන්නීය. ඇගේ කන්දොස්කිරියාව තවත් කරදරයකි. මට තනි විය යුතුව ඇත.

"මෙතන ඉදල දැන් වැඩක් නෑ. වැස්සකුත් එනවා. ඉස්සරහට වෙන්න තියන දේ ගැන බලපන්. උදේ ඉදල තේ කහට උගුරක්වත් නෑනෙ. ඊළඟ බස් එක අල්ල ගත්තෙ නැත්නම් ආයෙ ගෙදර යන්න වෙන්නෙ ගොම්මනේ"

"අක්කා යන්න. මම තව ටිකක් ඉදල එන්නම්"

"උඹ වරෙන් අද අපේ දිහා. තැන තැන රස්තියාදු නොවී"

කුසුමක්කා පිට වී යනතුරු මම බලා සිටියේ බිඳුනු සිතිනි. ඇගේ කෙසඟ සිරුර වැහැරී ඇත. සාගරිකා හා විවාහ වන විට කුසුමක්කා එයට කැමති නොවීය. ඇයගේ විරුද්ධත්වය එදා මා මායම් නොකළේය.

"උඹට ඔයිට වඩා හොද පෙළවහක් කර ගන්න පුළුවන් මල්ලියේ"

"ඒත් මම එයාට කැමතියි"

"ඇයි බං කැමති ගෑනු ඉස්සරහට ඕන තරම් හම්බ වෙයි. කැමතියි කියල ඒ හැම ගෑනියෙක්ම බොට කසාද ගෑනි කර ගන්න පුළුවනැයි. අනික මේ වීල් එකක් එළවල පවුල් නඩත්තු කරන්නෙ කොහොමෙයි. කසාදෙට කලින් උඹ රස්සාවක් හොයා ගනින්"

කුසුමක්කාගේ විරෝධය නොතකා මා සාගරිකා හා විවාහ වුවත් ඒ නෝක්කාඩු බොහෝ දිගු වූයේ නැත. ඈ සාගරිකාට හොඳින් සැලකුවාය. අප මහගෙදර පදිංචියට පැමිණියේ අක්කාගේ ඉල්ලීම මතය. අම්මාත්, අප්පච්චීත් මිය ඇදුනයින් පසු කුසුමක්කා මාව බලා ගත්තේ මවක් ලෙසිනි. ඈ කසාදයක් ගැන නොසිතුවේ මා නිසාය.

සාගරිකා එකල වැඩ කළේ ගම්සභා හන්දියේ ඇඟලුම් කම්මලේය. රෑ වැඩ මුරය අවසන් වූ බොහෝ දිනවල ඈ මගේ ත්‍රීවිලයට නැග්ගේ බෝඩිමට යනු වස්ය. කටකම්ස්සිරියාවක් නැතිව කියවන ඕ හැඩකාර කෙල්ලකි. මගේ සිත හොරා ගැන්මට ඇයට වැඩි කාලයක් නොගියාය. මිද්දෙනියේ ඉපදී හැදී වැඩුනු ඇයට සිටියේ එකම එක සොහොයුරෙකි. වඩමරව්ච් මෙහෙයුමේදී ඔහු මිය ගොස් තිබුණි.

"විජේ, අදත් අක්කගෙ අදෝවැඩියාව"

"ඇයි?"

"කසාද බැදල අවුරුදු දෙකක් ගිහිනුත් තාමත් දරුවො නෑ කිය කිය කියවනවා"

"ඔයා ඕවා ගණන් ගන්නෙ නැතිව ඉන්න. එයා ඔය කියන්නන් වාලෙ කියවනවා. අක්කගෙ හිතේ කහටක් නෑ"

"කොච්චර කලක් ඕවා අහන් ඉන්නද අනේ. මට දැන් ඇති වෙලා"

"ඉතින් මොකක්ද දැන් කරන්න කියන්නෙ"

සාගරිකාත් , කුසුමක්කාත් ඇවිළුණු හැම දිනකම මම කර බා ගත්තේ අන් කිරීමට කිසිත් නැති හෙයිනි. මවක් මෙන් මා බලා ගත් කුසුමක්කාට බැණ වැදීමට මට නොහැක. ඇය ජීවිතය කැප කළේ මා වෙනුවෙනි. මගේ නිහැඬියාව සාගරිකා දඩමීමා කොට ගත්තීය.

"තමුසෙ නම් මහ නෝන්පල් මිනිහෙක්. එක්කො ඒ ගෑනි ගෙදරින් එළවල දානවා. නැත්නම් මම යනවා යන්න. ඇයි යකෝ මෙහෙම කොහෙවත් යන ගෑනුන්ගෙන් කතා අහගෙන ජීවත් වෙන්නෙ මම කළ කරුමෙ මොකක්ද?"

අප මහ ගෙදරින් යෑමට තීරණය කළේ සාගරිකාගේත් කුසුමක්කාගේත් රණ්ඩු දිනෙන් දින වැඩි වීමට පටන් ගත් විටය. සාගරිකාගේ මිද්දෙණියේ මහගෙදර ජීවත් වූයේ ඇගේ මව පමණි. ඇදුම රෝගයෙන් පීඩා විඳි ඇයට අත්වැලක් අවැසි මොහොතක අප එහි පදිංචියට යෑමට සිතා ගතිමු.

"මම හාංකවිසියක්වත් හිතුවෙ නෑ උඹ මාව දාල යාවි කියලා"

"මහ ලොකු දුරකට යනව නෙමෙයිනෙ අක්කෙ. අනික පාක් එකෙත් දැන් එන්න එන්නම වීල් වැඩියි. හයර් එකක් හොයා ගන්නත් හරිම අමාරුයි"

★ ★ ★ ★ ★

ගිනිගහන මධ්‍යහනේ ඉස්පිරිතාලයේ ගේට්ටුව ළඟ එකම හිස් පොදියකි. තවමත් ලෙඩුන් බලන වෙලාව පැමිණ නැත. මා නොසන්සුන්ය. අප ජීවිතවලට අවුරුදු හතරකට පසු ඉර පායා තිබුණි. චූටි දියණියගේ මූණ දැක ගැනීමේ අසීමිත ආසාවකින් සිත පිරී ඇත. ඉස්පිරිතාලයේ ගේට්ටුව ඇරී විගස මා සෙනඟ පීරාගෙන ඇතුළට දිව ගියෙමි.

සාගරිකා කිරිකැටි දියණිය තුරුළු කොට ගෙන ඇයට කිරි දෙන්නීය. මවගේ තනපුඩුව බදාගෙන කිරි උරන දියණියගේ රෝස පැහැ කකුල් මම පරිස්සමින් අත ගෑවෙමි. ඒ රෝස පැහැ සියුමැලි දෙපා මලක් සේ මෙලෙකය. දිගැටි දෙනෙත් පිය වී ඇත. සාගරිකාගේ තනපුඩුවට හිර වී කිරි උරා බොන දියණිය දෙවියන් විසින් දුන් තිළිණයක් වැන්න. මම සාගරිකා තුරුළු කර ගත්තෙමි.

"විජේ මම ගන්න කියපු බඩු ටික ගත්තද?"

"සේරම ගත්තා"

"දුවට නමකුත් දාන්න ඕන. හාමුදුරුවො හම්බවෙලා වෙලාව දෙන්න"

"අද හවසට මම යන්නම් පන්සල පැත්තෙ"

"අද නම් ටිකට් කපන එකක් නෑ විජේ. ඒත් හෙට කියන්න බෑ"

"ආ සිරිමල් මල්ලිත් ඇවිත්.කඩේ වහලද ආවෙ මල්ලියේ"

"ඔව් විජේ අයියා. මේ දවස්වල කොහොමත් බිස්නස් අඩුයි"

සිරිමල් සාගරිකාගේ දුර ඥාතියෙකි. සිල්ලර කඩයක් පවත්වාගෙන යන සිරිමල් ජීවත් වූයේ තනිවමය. අප පවුලේ හිතවතෙකු වූ ඔහු අප වෙනුවෙන් කළ උදව් උපකාර බොහෝය. ඇතැම් දිනවල හයර් එකක් සඳහා මාතරට යෑමට මට සිදු වූ දිනවල සාගරිකා ක්ලිනික් රැගෙන යෑමට සිරිමල් මල්ලී කැමැත්තෙන්ම ඉදිරිපත් විය. බොහෝ කලක් දරුවන් නොමැතිව සිටි සාගරිකා ගැබ් ගැනීමෙන් පසු වඩාත් පරිස්සම් කර ගන්නැයි පැවසුවේ ගමේ වින්නඹු අම්මාය. මා නොමැති දිනවල සිරිමල් මල්ලීගේ වෑන් රියෙන් සාගරිකා ක්ලිනික් රැගෙන යෑමට ඔහු කැමති වීම මට සහනයක් විය. එවැනි දිනක මුළු සවස්වරුවේම කඩය වසා දැමීමට සිදුවීම ගැන ඔහු තැකීමක් කළේ නැත.

"දුව අයියා වගේමයි"

සිරිමල් මල්ලී දියණියගේ කකුල් අත ගාමින් පැවසූ විට සාගරිකාගේ මුහුණ ලැජ්ජාවෙන් රත් පැහැ විණ. මා සිනාසුණේය. රටක් රාජ්‍යක් හිමි වූවාක් සේ මා සිත පිරී තිබුණි. අප දියණියට පාරමී යැයි නම් තැබුවෙමු. පාරමීගේ සුරතල් සිනාවෙන් නිවස ඉතිරුණි. පසන් ඉපදෙන විට පාරමීට හරියටම දෑ අවුරුද්දකි. "චූටි දෝණිට අපි මල්ලි කෙනෙක් ගේනවා" යැයි මා දියණිය තුරුළු කොටගෙන පවසන විට දියණිය හඬ නගා සිනාසෙන්නීය. ඇයට මා කිව්වේ කුමක්දැයි වැටහීමක් නැතත් සාගරිකාගේ ඉදිරියට නෙරා ආ බණ්ඩියට අතින් තට්ටුවක් දමමින් එසේ පවසන හැම මොහොතකම පාරමී කොක් හඬලා සිනාසෙන්නීය.

තුන්වෙනියෙකුත් පවුලට එකතු වූ කල අප අගහිඟකම් අහස උසට නැග්ගේය. ත්‍රීවීල් එකෙන් ලැබෙන ආදායම ලෙව කෑමට පමණක් සෑහුනි. සාමාන්‍ය පෙළ සමත් වී සිටි මා රැකියා කිහිපයකටම අයදුම් කළත් ඒ හැමගෙන්ම විසි වූයේ දේශපාලන හයියක් නොමැති වූ හෙයිනි.

"චූටි පුතාගෙ පිටි එක ඉවරයි" මා නෑසූ කන් ඇතිව සිටියේ අතේ සතයකුදු නැති නිසාය.

"මේ ඔහේට ඇහුණද චූටි පුතාගෙ පිටි එක ඉවරයි"

"ඇහුණ යෝදියේ, බෙරිහන් දෙන්න පටන් ගත්තා ගමටම ඇහෙන්න. සිරිමලාගෙ කඩෙන් ඉල්ල ගනින්. මම ණය බේරන්නම්"

"අනෙ මගෙ කට. උන්දැට පින්සිද්ද වෙන්න තමයි අපි හාමතේ ගිලිල මැරෙන්නෙ නැතිව ඉන්නෙ. පැටව් ගහනවා වගේ ළමයි හැදුවට ඒ මනුස්සයද පළි? මෙච්චරකල් ගත්ත ණය බේරුවැයි"

"හරි හරි සාගරිකා. හෙට නුවර යන හයර් එකක් ආවා. ගිහින් ආවම සේරම ණය බේරන්නම්. අදට විතරක් පිටි එකක් පොතට අරන් වරෙන් බන්"

★ ★ ★ ★ ★

මොර සූරන වැස්ස ඉවරයක් නැත. හතර අතින් එන වැහි බීරම නිසා පාර නොපෙනේ. ඊයේ උදෑසන නුවරට ගිය හයර් එක නිසා කාලෙකින් ලැබුනු අමතර මුදල සිතට සැනසීමකි. දරුවන් මා එනතුරු බලා සිටිනවා ඇත. උන්ට කෑමට යමක් ගත යුතුය. සාගරිකාට තෑග්ගක් දුන් කාලයක් මතකයේ නොවේ. ඇයට කුමක් හෝ රැගෙන යා යුතුය. චිරි චිරි වැස්සේ නැවතීමක් නැත. හාත්පස කිසිවක් නොපෙනේ. දොඹකැට මෙන් වැටෙන වැහි බිඳු සිතට කරදරයකි.

කොස්ගොඩ පහුකරනවාත් සමග මා දුටුවේ මහ වැස්සේම කිසිවකු පාර පනින බවකි. සැනෙකින් දුටු රුව නිසා මා වහා තිරිංගය තද කළෙමි.

"දඩාං"

ත්‍රිවීලය ලිස්සාගෙන ගොස් ඉදිරියට ඇදුනි. මොර සූරන වැස්ස නිසා පාර පාළුවට ගොසිනි. වහා ත්‍රීවීලය නවත්තා ගත් මා ඉන් පැන ගත්තේ හැප්පුනේ කවුරුන්දැයි බැලීමටය. බඩදරු ගැහැනියක් පාර මැද වැටී සිටියාය.

"'අනේ මහත්තයෝ මාව ඉස්පිරිතාලෙට එක්ක යන්න"

බඩදරු ගැහැනිය කෙදිරිගාමින් පැවසුවාය. බයිසිකල්කරුවන් එකා දෙන්නා වට වීමට පටන් ගත්හ.

මේ මොන හෙයියන්මාරුවක්ද. සිත සිතා සිටිය නොහැක. මා ඇය වත්තන් කරගෙන ත්‍රීවීලයට ගොඩ වී ඉස්පිරිතාලයක් සොයා ගියේ පවනට බදු වේගයෙනි. විටින් විට නැගෙන කෙඳිරිලි හඬ මා සිත සලිත කළේය.

"ඔහේද ලෙඩාගෙ භාරකාරය"

"ඔව් මිසී"

"මෙතන ලිපිනය ලියලා අත්සන් කරන්න"

දවස් දෙකකට පසු යන්තම් ඔළුව උස්සා ගැනීමට හැකිවූයේ දිනපතා සාගරිකා සාදා දුන් කොත්තමල්ලි වතුර නිසාය. උණ ගතිය තවමත් පහ වී නැත. ඇඟපත අමාරුවට වඩා දැනෙන සිතේ අමාරුව කීමට කිසිවකු නැත. එදා වීලයට හැප්පුනු ගැහැනිය සුව වීද? ඇගේ දරුවා සුවෙන්ද? සාගරිකාට මෙය කිව යුතුද? මා සිත එකම ගිනි ගොඩකි

"විජේ රාළහාමි කෙනෙක් ඇවිත් ඔයාව හොයනවා"

"මේ මාව?"

සාගරිකාගේ ඉකිබිඳුම නිසා පාරමී හඬන්නීය. කොල්ලන් දෙන්නාට නම් වගක් නැත.

"මම හිතුවා රෑට රෑට ගෙදර එන්න පටන් ගත්තම. මොකක් හරි පටලැවිල්ලක් ඇති කියලා. ඇයි දෙයියනේ මට මෙහෙම කළේ"

"උනේ මොකක්ද කියල මම කිව්වා. මාව විශ්වාස නැත්නම් මට කරන්න දෙයක් නෑ"

48 වන පිටුව බලන්න

# මාංශයේ ජීවය රුධිරයයි

■ වෛද්‍ය සමන් ගුණහේරත්

අප කාටත් ලේ ඥාතීන් සිටින බව මා ඔබට අමුතුවෙන් කියන්නට තරම් වූ කාරණාවක් නොවේ. එසේම ලේ පලිය ගැනීම පාතාල ලෝකයේ සාමාන්‍ය සිරිතක් බවත් අපි බොහෝ දෙනා දනිමු. ලේ පිළිබඳ පැරැණි ලිත සටහන් අතුරෙන් පන්සිය පනස් ජාතක පොත විශේෂය. ඒ අප මහා බෝසතාණන් වහන්සේ විවිධ ආත්ම භවයන්හි ඉපැදෙමින් දාන පාරමිතාව පිරීම සඳහා ඇස්, ඉස්, මස්, ලේ දන් දුන් බවට සඳහන් වන අවස්ථාවන්ය. එමගින් තහවුරු වන්නේ රුධිරය තවෙකෙකුට දන් දිය හැකි ද්‍රව්‍යයන්ගෙන් එකක් බව අෑත අතීත කාලයේ පටන්ම ඇතැම් ජන කොට්ඨාසයන් විශ්වාස කළ බවය. ලේ පිළිබඳ ඇති පිළිගත් පැරැණිතම ලිඛිත සටහන් අයත් වන්නේ ශුද්ධ වූ බයිබලයටය. එහි ලෙවිටිකස් 17:11 මෙසේ සඳහන් කරයි. 'ලේ යනු මාංශයේ ජීවයයි'. මානව රුධිරය අරභයා සෑම ජන වර්ගයකටම ඔවුනට ආවේණික වූ විශ්වාසයන් ඇත. ඇතැම් ආගමික සංකල්පවලට අනුව ලේ දන් දීම මෙන්ම අනෙකකුගේ ලේ තම සිරුරට ලබා ගැනීමද බරපතල පාපයක් වේ.

ඉන්දීය වෛද්‍ය චින්තනයට අනුව කෙරෙන මානව දේහ විග්‍රහයේදී රුධිරය අයත් වන්නේ 'වාත' ගණයටය. එවකට ඉන්දීය වෛද්‍ය ක්‍රමය මගින් මානව ශරීරය වාතය, පිත හා සෙම යන මූල ධාතු 3 ක් ඔස්සේ විග්‍රහ කර තිබිණි. එසේම ඔවුහු රුධිරය අක්මාවේ නිෂ්පාදනයක් ලෙසද සැලකූහ. මේ විග්‍රහය ඒ අයුරින්ම හිපොක්‍රටීස්ට පෙර යුගයේ ග්‍රීක වෛද්‍යවරුන්ද අනුදත් ක්‍රමවේදයක් විය.

බටහිර වෛද්‍ය විද්‍යාවේ පීතෘත්වය හිමි කර ගත්තා වූ ග්‍රීක බුද්ධිමතකු වන ක්‍රි.පූ. 460-370 විසූ හිපොක්‍රටීස් විද්වතා මේ සංකල්පය තව දුරටත් සංස්කරණය කරමින් ඉන්දීය වෛද්‍ය ක්‍රමයේ වූ 'ත්‍රිදෝෂ' සංකල්පය වෙනුවට 'චතුර්දෝෂ' සංකල්පය ඔවුන්ගේ වෛද්‍ය ක්‍රමයට හඳුන්වා දුන්නේය. ඒ අනුව වාතය, කහ පිත, කළු පිත හා සෙම එම චතුර්දෝෂ වූ අතර රුධිරය නැවතත් වාතය යටතේම වර්ගීකරණය කෙරිණි.

බැබිලෝනියාව මානව සංස්කෘතියේ මවුකුස බව අපි සියල්ලෝම දනිමු. එසේම අෑත අතීතයේ සෑම සංස්කෘතියකම වෛද්‍ය කර්මයේ යෙදුණු පුද්ගලයෝ පූජකයෝ වූහ. ඒ අනුව බැබිලෝනියානු වෛද්‍ය පූජකවරු හෙවත් රබ්බිවරු රුධිරය පිළිබඳව යම් අවබෝධයක් ඇත්තවුන් බව පැහැදිලි වන සාක්ෂි පුරා ජීව විද්‍යා සටහන් අතරින් විසි වැනි සියවසේ අග භාගයේදී සොයා ගෙන ඇත. ජුදා නම් රබ්බිවරයකු විසින් සුන්නත් කළ දරුවන් තිදෙනකුගේ මරණය අරභයා ලියන ලද සටහන් විශ්ලේෂණය කරන මෝසස් බෙන් මැල්මන් (ක්‍රි.ව. 1135-1234) මේ මරණවලට හේතුව රුධිරයේ පවතින 'යම් අඩුපාඩුවක්' බව සඳහන් කරයි. හිමෝෆිලියා පිළිබඳව මෙන්ඩල් තම නිගමන ප්‍රසිද්ධ කිරීමට ශතවර්ෂ ගණනාවකට පෙර මැල්මන් 'රුධිරයේ අඩුපාඩු' යන සංකල්පය ඉදිරිපත් කර ඇත.

පයිතගරස් විද්වතා පිළිබඳව අප බොහෝ දෙනා දන්නේ සුප්‍රකට ගණිතඥයකු වශයෙනි. එහෙත් මේ විද්වතා හිපොක්‍රටිස්ටත් පෙර ක්‍රි.පූ. 529 දී එතුමා පවත්වාගෙන එන ලද ශාස්ත්‍රාලයේදී රුධිරය පිළිබඳ දැනුම ඔහුගේ සිසුනට ලබා දී ඇත. එවකට ඉතාලි නගරයක දිගින් දිගටම සිදු වූ මරණවලට හේතුව රුධිරය අඩු වීම බව පැහැදිලි කරන පයිතගරස් විද්වතාණන් මෙය සුව කරගැනීම සඳහා රෝගියාට ආහාර සහ සංගීත ශ්‍රවණය ලබා දිය යුතු බව සඳහන් කර ඇත. එදා සිට අද වන විට අවුරුදු 2500 කට අධික කාලයක් ගත වී ඇති අතර අදද මේ නගරවල G6PD එන්සයිම ඌනතාව නිසා ඇති වන 'හිමෝලයිටික් ඇනීමියා' වෙන් පෙළෙන්නෝ බොහෝය.

පයිතගරස් විද්වතාගේ ශිෂ්‍ය එම්පඩොයිස් විද්වතා (ක්‍රි.පූ 490-430) සමකාලීන වෛද්‍ය ක්ෂේත්‍රයේ රුධිරය පිළිබඳ බොහෝ අදහස් පළ කළ අයෙකි. ධන්වන්තරී, නාරද වැනි ඉන්දියානු විද්වතුන් මෙන්ම ඔහුද වාතය කිපීම නිසා ඇති වන හිසරදය, ශරීරය ඉදිමුම් ආදිය සුව කිරීම සඳහා රුධිර නාළ විවෘත කර (ශිරාවන්) රුධිරය ඉවත් කිරීමේ ප්‍රතිකාරය අනුමත කර ඇත.

රුධිර සංසරණය පිළිබඳව විශාල සටහන් ප්‍රමාණයක් සකස් කළ විද්වතකු වන හිපොක්‍රටිස්ගේ ශිෂ්‍ය ගැලන් රුධිරය සහ පෝෂණය පිළිබඳ අදහස් පළ කර ඇත.

රුධිරය පිළිබඳව නව දැනුම ආරම්භ වන්නේ 17 වැනි සියවසේදී ඇන්ටන් වෑන් ලෙවන්හුක් විද්වතා විසින් අණ්වීක්ෂය සොයා ගනු ලැබීමෙන් පසුවය. රුධිරය අණුදක්නයෙන් විශ්ලේෂණය කරමින් විවිධ මත සහ වාද එවකට පහළ වන්නට විය. මේ මගින් රුධිරය පිළිබඳව බොහෝ අදහස් සමාජගත වූ අතර ඇතැම් වෛද්‍යවරුන් එවකට පවා රුධිරය පාරවිලයනය කිරීමට උත්සාහ දරා ඇත. 1901 දී කාර්ල් ලැන්ඩ්ස්ටෙයිනර් රුධිරය ගණ 4 කට වර්ග කළ හැකි බව පෙන්වා දුන්නේය. A, B, AB, O ලෙස ඔහු රුධිරය වර්ගීකරණය කළ අතර, රුධිරය, රුධිර විද්‍යාවක් ලෙස ස්ථාපිත වීම සඳහා එමගින් වූ සේවාව ඉමහත්ය. තවත් අවුරුදු 21 ක් ඇවෑමෙන් ස්වීඩන් විද්වතකු වන ෆරායෙස් මානව රුධිරය අංශුවලින් හා දියරවලින් තැනී ඇති කළිල ද්‍රාවණයක් බව හෙළිදරව් කළ අතර රුධිර සෛල පිළිබඳව නව අදහස් රැසක් ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. ඉන්පසු එළැඹෙන කාලය තුළ රුධිර විද්‍යාව අතිශය පුළුල් පරාසයක් ඔස්සේ පැතිරෙමින් විෂයයක් ලෙස සංවර්ධනය වන්නට විය.

ඉංග්‍රීසි භාෂාවේ රුධිරය යන වචනය හමු වන්නේ ක්‍රි.ව. 1000 දී තරම් වූ මෑත අතීතයකදීය. එය ජර්මන් භාෂාවෙන් බිඳී ආ වදනක් ලෙස සැලකේ. ග්‍රීක භාෂාවේ රුධිරය හඳුන්වන හෙයිමෝ යන පදයෙන් බිඳී ආ හෙමෝ (හිමෝ), හෙමටෝ (හිමටෝ) ලෙස වෛද්‍ය විද්‍යාවේදී වර නැඟෙන්නේ රුධිරය සම්බන්ධ වූ නාමපදයන්ය. ඒ අනුව 'හෙමටෝලොජි - Hematology' යනු රුධිර විද්‍යාවයි.

අද වන විට කෘත්‍රිම රුධිරය සොයා ගැනීම දක්වා රුධිර විද්‍යාව දිගු ගමනක් පැමිණ ඇත. මානව රෝග, ආබාධ, අනාගත ගැටලු පමණක් නොව ඉදිරි පරම්පරාවට සම්ප්‍රේෂණය විය හැකි ගැටලු පවා පෙර දැකීමේ ප්‍රඥාව අද රුධිර විද්‍යාව සතුය. ඒ අනුව තවත් වසර ගණනාවකින් පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වන ජානමය රෝගවලින් මානවයා විනිර්මුක්ත වීමේ ඉහළ බලාපොරොත්තු තැබිය හැකි වනු ඇත.

## බුදු බව පතනා ...

38 වන පිටුවෙන්

සුදු නෙළුමක් තියෙනවා. එහෙම නම් ස්ථිර වශයෙන්ම නෙළුම් මල් මුනි පුදට බව හිතන්ට පුළුවන්. සමන් දෙවියන්ගේ ආරාධනාවෙන් බුදුහාමුදුරුවෝ සමනල කන්දට වැඩිය බව කවිරුන් පිළිගන්න, ඒ වගෙම විශ්වාස කරන අදහසයි. ඒක සිද්ධ වෙන්නේ බුදුහාමුදුරුවන්ගේ තුන්වැනි ලංකා ගමනෙදියි. ඊට පෙර බුදුහාමුදුරුවො ලංකාවට වැඩපු අවස්ථා දෙකේදීම සුමන සමන් දෙවියන් ඒවට සහභාගි වුණ බවත් කියනවනෙ. දෙවෙනි වර ලංකාවට වැඩියෙ චුලෝදර මහෝදර නාරජවරුන්ගේ යුද්දෙ සමථයකට පත් කරන්ටනෙ.

සමනල කන්ද මුදුනට ගිහිල්ලා එහි තිබෙන සිරිපතුල වන්දනා කිරීම ලේසි කටයුත්තක් නොවන බව එදා බුදුහාමුදුරුවොත් දැකල තියෙනවා. ඒ පාර ඒ සියල්ලම බලාගෙන, සමනල කන්දට එන බැතිමතුන් රැක දෙන බවට සමන් දෙවියො පොරොන්දු වෙලත් තියෙනවා. සමනල අඩවිය වගේම කන්ද උඩරට හා බින්තැන්නට යනකං මහවැලි ගං තීරය දිගටත් සමන් දෙවියන්ගෙ තෙද බල පැතිර තිබෙන බව විශ්වාස කරනවා. උඩරට වගේම කොත්මලේ ඉන්න ගොවියන්ගෙත් විශාල ගෞරවයක් සමන් දෙවියන්ට තියෙනවා.

ශ්‍රීපාද මළුවේ තමා සුමන සමන් දේවාලය තියෙන්නේ. දෙවන පැරකුම්බා රජ්ජුරුවන්ගේ කාලෙ දේවපතිරාජ කියලා ඇමැතිවරුයෙක් හිටියලු. මොහු එදා සමන් දේව රූපයක් හදලා පූජා කළ බවයි කියන්නේ. ඒක හදල තිබුණෙ සඳුන් ලීයෙන්. සිරිපා වන්දනාව පටන් ගන්නේ උඳුවප් මාසෙන. අවාර කාලේ, ඒ කියන්නෙ සිරිපාදෙට වන්දනාවේ නොයන කාලෙදී මේ සමන් දෙවියන්ගේ ප්‍රතිමා ගල්පොත්තාවෙල කීර්ති ශ්‍රී රාජසිංහ රජමහා විහාරෙ තමා තැන්පත් කරල තියෙන්නේ. වන්දනා කාලෙට ඒ ප්‍රතිමා සිරිපාදෙට වඩම්මවනවා. ඒකට කියන්නේ දෙවිහාමුදුරුවන් වැඩම වීම කියලා අද පැල්මඩුල්ලේල ගල් පොත්තාවල විහාරෙ ඉඳලා පෙරහැරකුත් එනවා.

පෙරහැර මළුවට ආවට පස්සේ උඳුවප් පෝය දවසෙ පාන්දර පූජාවල් එහෙම සිද්ධ කරනවා. දේවාලය පවිත්‍ර කරලා එහි පූජා වස්තු තැන්පත් කරනවා. මේ සමගම දොළොස් මහේ පහණත් දල්වනවා. පෙරහැරෙන් වඩමවා ගෙන ගිය කොත සමන් දේවාලයෙ වහලෙ මුදුනෙ පළඳවල තියෙනවා. ඊට පස්සේ මාස හයක්ම පූජා පවත්වල සමන් දෙවියන්ව සිහි කරනවා.

සිරිපා මළුවෙ දේව පූජාවට අමතරව බුද්ධ පූජාවකුත් කෙරෙනවා. කෙම්මුර දවස්ලට (බදාදා, සෙනසුරාදා) මළුවේ ඉන්න සියලු දෙනාම ටික වෙලාවක් ඉවත් කරලා සිරිපාද පත්මය සුවඳ පැන්වලින් ධෝවනය කරනවා. ඒ සඳහා පැන් කළ හතක් ගන්නවා. ඊට පස්සේ සමන් දේවාලෙත් පිරිසිදු කරනවා. මුළු මළුවම සුවඳ ජලයෙන් සෝදා සඳුන් මුසු කිරි පැන් ඉහිනවා. ඊට පස්සේ තමයි බැතිමතුන්ට එන්ට අවසර ලැබෙන්නේ. සිරිපාදෙ තේවාව බාර වෙලා තියෙන්නේ හාමුදුරුවන්ට. උන්වහන්සෙල උදේ සවස දෙකටම පිරිත් දේශනා කරනවා. සමන් දෙවියන්ට පූජා පිණිස පැවැත්වෙන පෙරහැරවල් දෙකක් තියෙනවා. එකක් තමා සබරගමුවෙ මහ සමන් දේවාලෙ කෙරෙන පෙරහැර. අනිත් එක මහියංගණේ. සබරගමුවෙ ජනතාව සමන් දෙවියන්ට පූජා කරන්නේ මතු බුදුවන බෝසත් කෙනෙකු විදිහට සළකලයි. ඒ නිසාම සමන් දෙවියන් අනෙක් සියලුම දෙවියන්ට වඩා විශේෂත්වයක්ගන්නවා.

සිරිපාද කඳු මුදුනට ගිහිල්ලා අවට බලද්දී පේන දර්ශනය හරිම ලස්සනයි. ඒක දෙවියන් වැඩ වාසය කරන භූමියක තිබෙන විශේෂත්වය කියාපාන දසුනක්. බුදුහාමුදරුවෝ විවේක සුවයෙන් ගත කළ 'භගවා ලෙන' නැත්නම් දිවාගුහාව මුලදී සමන් දෙවියන්ට අයිති එකක් වෙන්ට ඇති. ඒත් දැන් එය බුදුහාමුදුරුවන්ගෙ පාරිභෝගික වස්තුවක්. සැළලිහිණි සංදේශය ලියපු ශ්‍රී රාහුල හිමියන්, සමන් දෙවියන් සුරංගනාවියන් පිරිවරා ගෙන මදාරා හා පරසතු මල් රැගෙන මේ සිරිපාදයට වන්දනා කරපු ආකාරයත් වර්ණනා කරනවා. මෙයින් පේන්නෙ සමන් දෙවියන්ගේ නොබිඳෙන චාරිත්‍රයක් වෙලා තියෙන සිරිපා වන්දනාවයි.

සිංහල බෞද්ධයන් තුන් සරණේ ගුණ ගයමින්, සමන් දෙවියන්ගේ පිහිටෙන් සිරිපාදෙ වැඳලා බහිනවා වගේම හින්දු බැතිමතුන් බ්‍රහ්ම, විෂ්ණු, ශිව කියන ත්‍රිමූර්තිය හිසේ දරාගෙන සමනල කන්දට නගිනවා. හින්දූන්ට අනුව එහි තියෙන්නේ ශිව දෙවියන්ගේ පා සටහනයි. කතරගම දේවාලය හා සම්බන්ධ රජවරුන් හිටිය වගේම සිරිපාදෙ වඳින්නට ගිය සිංහල රජවරුන් ගැනත් සඳහන් වෙනවා. අපේ රජවරුන් කීප දෙනෙක්ම සිරිපාදෙ වඳින්ට ආපු බව සඳහන් වෙනවා. පළමුවන විජයබාහු රජතුමා සිරිපාදෙට ගම්වරත් පූජා කරල තියෙනවා. සමහරු ජනතාවට යන්න පහසු විදිහට පාර එහෙම වැඩි දියුණු කරලත් තිබුණා. මහගිරිදඹේ ගල්පඩි හදලා, දම්වැල් එහෙමත් දාලා දීලා තියෙනවා. විජයබාහු රජතුමා පොලොන්නරුවේ හිටිය ශ්‍රේෂ්ඨ රජෙක්. මේ රජු රට එක්සේසත් කරලා ඉවර වෙලා සිරිපාදෙට ආපු බවයි සඳහන් වෙන්නේ. මේ කතාව දුටුගැමුණු කතරගමට කළ පූජා උපහාර සිහිපත් කරනවා. එහෙම නම් එදා අපේ රජවරුන් තම සුවිශේෂ විජයග්‍රහණය සිහිපත් කරන්ට මේ ස්ථාන තෝරා ගත්තේ ඒ දෙවියන්ගෙ ආනුභාවයත්, බුදු ගුණත් සිහි කරලා වෙන්ට ඕනෑ. මේ සිරිපාද සටහන මේ කපේදී පහළ වූ කකුසඳ, කෝණාගමන, කස්සප, ගෞතම යන සිව් බුදුවරුන්ගෙම් පා පියුම් ලාංඡනය බවත් විජයබා රජු අදහස් කළාලු. හැබැයි එතකොට සමන් දෙවියන් පිළිබඳ ප්‍රවාදයට පදනමක් නැති වෙන බවත් සමහරුන්ගේ අදහසයි.

ඒ මොනව වුණත් සිරිපාදෙත් එක්ක දැඩි සබඳතාවක් තියෙන්නේ සුමන සමන් දෙවියන්ට තමා. හැබැයි සමන් දෙවියන් පැහැදිලිවම බෞද්ධ දෙවි කෙනෙක් ලෙසයි කැපී පෙනේනේ. කලින් කලට එක එක ජනප්‍රවාද සිරිපාදෙටයි, සමන් දෙවියන්ටයි එකතු වුණත් ඒ කිසිම දේකින් නොවේ සමන් දෙවියන් සබරගමු පළාතට විතරක් සීමා වුණේ. ඒකට විශේෂ හේතුවක් වුණේ සිරිපාදෙම බවයි සමාජ විද්‍යාඥයන්ගේ අදහසත්. සිරිපාද වන්දනාව අදටත් සලකන්නේ ඉතා දුෂ්කර ගමනක් විදිහටයි. සමන් දෙවියන්ගේ ප්‍රධානම කටයුත්ත ඒ වන්දනා සමයට එතෙන්ට ඇදෙන ජනතාව රැක බලා ගැනීම. නැත්නම් ඔවුන්ට පිහිට වීම. ඒ හින්ද තමයි හාපුරා කියලා, එහෙම නැත්නම් කිරිකෝඩුවෙන් සිරිපාදෙ යන අයට හුඟාක්ම කට පරිස්සම් කර ගන්ට කියන්නෙත්. ඒ වගේම සිරිපාදෙ හින්දු ආධිපත්‍යයක් නැති බෞද්ධ ආධිපත්‍යයට නතු වූ පූජනීය ස්ථානයක් බවත් කියන්නට ඕනෑ.

සිරිපාදෙ වැඩ හිටියත් සුමන සමන් දෙවියන්ගේ ප්‍රධානම දේවාලය තියෙන්නේ රත්නපුරේ. මේ දේවාලය හදලා තියෙන්නෙත් පරාක්‍රමබාහු රජතුමාගෙ සෙනෙවියෙක් බවයි කියන්නේ. ඒ සමන් දෙවියන්ට කරපු භාරයක් ඉෂ්ට කරන්නට. පස්සේ කාලෙකදි මේවට සතුරු ආක්‍රමණත් එල්ල වුණා. කොහොමහරි අද රත්නපුරේ සමන් දේවාලෙට භාර වෙන්න භාර ඔප්පු සිද්ධ කරන්ට ජන ගඟක් එන බවත් කියන්ට ඕනෑ. රත්නපුරේ මැණික් ව්‍යාපාරිකයො වගේම දරුවන් ප්‍රාර්ථනා කරන අයට, ඒ මව් පදවිය ලබා ගන්නටත් සුමන සමන් දෙවියන් පිහිට වෙන බවට විශ්වාසයක්තියෙනවා. සමන් දේවාලෙට එන බැතිමතුන් සිරිපාදෙ කන්ද දිහාට නමස්කාර කරල තමයි දෙවියන්ට පූජා පවත්වන්නේ.



# ජනාගමයේ පිදුම් ලබන
# කිරි අම්මාවරු සත්දෙනා

■ මහාචාර්ය දයා අමරසේකර

'කිරි අම්මා' සිංහල බෞද්ධ සංස්කෘතියේ ගෞරවනීය චරිතයකි. 'අම්මා' හා බැඳුණු පූජනීය වූ මාතෘත්වය පෙරදිග සංස්කෘතීන්හි වඩාත් ගෞරවනීය සංකල්පයක් බවට පත්වීමට මෙබඳු චරිතවලින් අපමණ පිටුබලයක් ලැබෙන්නට ඇතැයි සිතිය හැක. සාම්ප්‍රදායික උඩරට සමාජයෙහි ව්‍යවහාරික ඥාතී පද මාලාවන්ට අනුව කිරිඅම්මා වන්නී මවගේ හෝ පියාගේ මෑණියන්ය. පහතරට ඥාති පද මාලාවේ එම තනතුර ආච්චි වුවත් සාම්ප්‍රදායික උඩරට පවුල තුළ පැරණි පරපුරේ ආදිතම ඥාතිවරිය ලෙස සලකන්නේ කිරි අම්මාය. මෙලෙස කිරි අම්මා හුදු ඥාති පදයක් වටා ගෙතුණු චරිතයක් පමණක් නොව සිංහල බෞද්ධයන්ගෙන් බුහුමන් ලබන සුවිශේෂී දේවතාවියක් ලෙස දුරාතීතයේ සිට අපේ සංස්කෘතික ඉතිහාසයකට එකතු වී ඇති චරිතයක් වීම සුවිශේෂීය.

ජනශ්‍රැති ශබ්දකෝෂය, කිරි අම්මා යනු වැදි ජනයා විසින් අදහන ලද මිය ගිය තම ඥාතීන්ගේ ප්‍රභවයක් ලෙස දක්වා ඇත. ලංකාවේ ප්‍රාථමික ආදිතම ජන කොටසක් සේ සැලකෙන වැද්දන්ගේ 'නෑයකුන්' ඇදහීමෙන් මෙම කිරිඅම්මාවරු පිදීම ඇරඹෙන්නට ඇතය යන මතයද ප්‍රචලිත එකකි. වැදි ජනතාව සිය දරුවන් කුඩා අවදියේ සිටියදී මිය ගිය වැදි කාන්තාවන් කිරිඅම්මාවරුන් ලෙස සලකති. ඉන්දියාවේ හිමාලය අවට වෙසෙන ආදි වාසිකයන් දඩයමට ගිය විට 'ගිරි අම්මන්' වෙත භාර වීමේ චාරිත්‍රයක් පවතී. එසේ ගිරි අම්මන් වෙත භාර වන්නේ වනයේදී කිසිවකුගෙන් අනතුරක් සිදු නොවී තමන් රැක දෙනු පිණිසය. 'ගිරි' යන සංස්කෘත පදයෙන් 'කිරි' යන පදය හැදෙන්නට ඇතැයි යන අදහස දැරූ විද්වතෙකි හෙන්රි පාකර්. ද්‍රවිඩ බසින් 'ග' අකුරු සහ 'ක' අකුර සමාන බැවින් 'ගිරි අම්මා' යන්නෙන් 'කිරි අම්මා' යන්න හැදෙන්නට ඇතැයි පාකර් විශ්වාස කරන්නට ඇත. ගිරි අම්මන් යනු පාර්වති මාතාව පර්වත වාසී දෙවඟන යන තේරුම් ඇති දෙමළ වචනයකි. හිමාලය අසබඩ ආදිවාසීන් ගිරි අම්මන් යැයි දේවත්වයෙන් පුදනු ලැබුවේ පාර්වතී බව මෙයින් පැහැදිලි වෙයි. එහෙත් සිංහල සහ වැදි ජනතාව අතර කිරිඅම්මා යන නාමය යෙදුවේ කඳු පර්වත සමඟ සම්බන්ධයක් නොමැති දේවතාවියකට බව පාකර් දක්වා ඇත.

සැබවින්ම කිරිඅම්මාවරුන් යනු කවරහුද? ඔවුන් මෙරටේ සමාජ සංස්කෘතික පසුබිම තුළින්ම උපන් පිරිසක්ද? කිරිඅම්මාවරුන් හත්දෙනා පත්තිනි දෙවියන්ගේ නියෝජිතයන් හත්දෙනෙක් යන මතයද ප්‍රචලිත වූවකි. කිරි අම්මා යනු විදේශයෙන් මෙරටට ගොඩ බට වෙනම දෙවිවරුන් හත් දෙනෙකු බවද ඇතැම් කෘතිවල සඳහන් වේ. මෙම ලිපිය මෙම මතවාද පිළිබඳව සාකච්ඡා කිරීමකි.

වැදි ජනතාවගෙන් ප්‍රභවය ලද කිරි අම්මාවරු කෙසේ වුවද කිරිඅම්මා පිළිබඳ අදහස වඩාත් හොඳින් තේරුම් ගත හැක්කේ වැදි ජන සමාජය ඒ පිළිබඳව කරනු ලබන යාතු කර්ම හා ඒ අරබයා ගොඩනැඟී ඇති විශ්වාස අතරින් බව යළිත් කිව යුතුය. තම පරපුරේ කවරකු හෝ මිය ගිය වහාම එම තැනැත්තා හෝ තැනැත්තිය යකෙකු හෝ යකින්නියක වී උපත ලබන බවට විශ්වාසයක් වැදි ජනතාව අතර ඇත. මෙසේ මරණින් මතු යකෙකු හෝ යකින්නියක බවට පත්වන ඥාතියා හෙවත් 'නෑ යකා' තමන් දෙස බැලුම් හෙළමින් තම දිවිය සැපවත් කිරීමට උදව් කරතිය වැදි ජනතාව විශ්වාස කරති. යම් හේතුවකින් ඔහු හෝ ඇය තමන් සමඟ අමනාප වුවහොත් තමනට විණ කරතියි යන විශ්වාසයද ඒ සමඟම පවතින නිසා ඒ සඳහා මළ ගිය එම 'නෑ යකා' වෙනුවෙන් පුද පූජා පැවැත්වීමද සිදු කරති. කිරිඅම්මාවරුන් ලෙස වැදි ජනතාව සලකනු ලබන්නේ සිය දරුවන් බිළිඳු වියේදීම මිය ගිය වැදි කාන්තාවන්ටය. වැදි ජනයා අතර බුහුමන් ලබන කිරි අම්මාවරුන් අතර මූලිකවන 'කුකුළාපොළ කිරිඅම්මා' යනු ජීවහත්ත සහ දිසාලාගේ මව වන 'කුවේණි' බවට මතයක් ඇත. මෙසේ කිරිඅම්මා නමින් හැඳින්වෙන මිය ගිය වැදි කාන්තාවන් අතර මීට පෙර මිය ගොස් යකුන් බවට පත් වූ වැද්දන්ගේ භාර්යාවෝද සිටිති. 'කොස්ගම කිරිඅම්මා' නමින් හැඳින්වෙන්නේ කොස්ගම දෙවියන් හෙවත් කොස්ගම බණ්ඩාර දෙවියන්ගේ බිරිඳ බව පිළිගැනේ. 'ඉදිගොල්ලේ කිරිඅම්මා' යනු ගලේ යකාගේ බිරිඳයි.

මෙලෙස වැද්දන් සහ ඔවුන් අදහන යකුන් ආශ්‍රයෙන් කිරිඅම්මාවරුන් පිළිබඳ විශ්වාසය ප්‍රභවය ලබන්නට ඇතය යන අදහස අපට තවත් පැත්තකින් සාකච්ඡා කළ හැකිය. වැදි ජනතාවගේ ප්‍රභවය බලන විට පැහැදිලි වන කරුණක් නම් ඔවුන්ගේ සංස්කෘතිය ඉන්දියාවෙන් පැමිණි ආර්ය ජනතාව හා කිසි ලෙසකින්වත් බද්ධ වූවක් නොවන බවය. එහෙත් වැදි සිරිත් සහ වැදි භාෂා විලාසයේත් ද්‍රවිඩ ගෝත්‍රික ලක්ෂණ ඇත. ආර්ය සංක්‍රමණයට පෙර ලංකාවට වරින් වර නිදැල්ලේ සංක්‍රමණය වූ ද්‍රවිඩ ගෝත්‍රික ජනයාද ලංකාවේ වැද්දන්ට මිශ්‍ර වීම එයට හේතුවයි. එහෙත් ආර්ය ශිෂ්ටාචාරයේ කිසිම අංගයක් වැද්ද නොගැනීමට ලාංකීය වැද්දෝ පරිස්සම් සහගත වූහ. වැද්දන් සිංහල කුල සිරිත් අනුකරණය නොකළ නමුදු ඔවුන්ගේ සිරිත් විරිත් සහ ඇදහීම් රාශියක් දැනුවත් හෝ නොදැනුවත්ව හෝ සිංහල ජනතාව අතරට පැමිණ ඇත. කිරිඅම්මාවරුන් ඇදහීම ප්‍රචලිතව පවතින ප්‍රදේශවලින් ඒ බව පැහැදිලි වන බවට සිංහල දේවපුරාණයේදී මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස පෙන්වා දී ඇති අදහස වැදගත්ය.

'වැදි ජනතාවගේ ආගමික අදහස් ඔවුන් වෙසෙන පළාත්වල සිංහල ජනයා අතරද තරමක් දුරට පැතිර ගොස් ඇති බවට ඌව බිම්තැන්න, නුවර කලාපය, තමන්කඩුව, ආදී ප්‍රදේශවල කලක පැවැති බවට සාධක ඇති 'කිරිඅම්මා' නම් දේව පිරිසක් පිළිබඳ විශ්වාසයෙන් පෙනේ. මේ කිරිඅම්මා දෙවිවරු වැදි ජනයා අදහන මිය ගිය ඥාති පිරිසට අයත් වෙති'

මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ සිංහල ජනයා අතර පවතින කිරිඅම්මාවරුන් ඇදහීම වැදි ජනයා අතරින් සිංහල ජනයා අතරට පැමිණි ජන ඇදහිල්ලක් බවයි. වර්තමානයේ වුවද මෙම ඇදහීම දක්නට ලැබෙන්නේ වැදි ගම්මාන ආශ්‍රිතව සහ අතීතයේ වැදි ජනතාව ජීවත් වූවා යැයි සැලකෙන ප්‍රදේශවලය. නිදසුනක් ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ඇදහීම වර්තමානයේ වුවද දැකිය හැකි ප්‍රසිද්ධ දේව ඇදහිල්ලකි. මෙම ප්‍රදේශයේ 'මිරියබැද්දේ කිරිඅම්මා' සහ 'පලාගොල්ලේ කිරිඅම්මා' වෙනුවෙන් ඉදි වූ ස්ථිර දේවාල දෙකක් තිබෙන අතර එහි දෛනිකව පූජා පවත්වනු ලබයි. පස්සර ප්‍රදේශයේ ඇකිරිය නම් වු ගම්මානයේ වැදි ජනයා විසූ බව සඳහන් වෙයි.

'ඉහාවේ කිරිඅම්මා' නමින් හඳුන්වනු ලබන කිරිඅම්මා කෙනෙකු පිළිබඳව සඳහන් වන අතර ඉහාව යනු මොණරාගල දිස්ත්‍රික්කයේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම සේවා වසමකි. මෙම ගම්මානයේ 'කපුරු වැද්දා' විසූ කපුරුගල පිහිටා තිබෙන බවත්, එහි කපුරු වැද්දා සහ ඔහුගේ බිරිඳගේ රූපය කොටා ඇති බවත් සඳහන් වේ. මෙම ප්‍රදේශවල වර්තමානයේ ආදිවාසීන් වාසය නොකළද සිංහල ජනතාව අතරට මෙම ඇඳහීම ව්‍යාප්තව ඇති බව පෙනේ. මෙම සියලු කරුණු අනුව වැදි ජනතාවගේ ඇඳහීමක් වූ කිරිඅම්මාවරු ඇදහීම සිංහල ජනතාව අතරට ව්‍යාප්ත වූ අයුරු පැහැදිලි වේ. සංකල්පය පමණක් නොව පූජා විධි රටා අතින්ද මෙය ව්‍යාප්ත විය. එපමණක් නොව කිරිඅම්මාවරුන් පිළිබඳව විවිධ ජනශ්‍රැතිකාංගද සිංහල ජනතාව තුළින් පසුකාලයේදී බිහි වූ බව පැහැදිලිය.

කිරිඅම්මාවරුන්ගේ සංඛ්‍යාව 07 ක්, 21 ක් ලෙස ජනප්‍රවාදයේ සඳහන් වී ඇත. එහෙත් එම සංඛ්‍යා පිළිබඳ නිශ්චිත අදහසක් ඉදිරිපත් කළ නොහැකිය. වැදි ජනතාවගේ ඇඳහීම් අතර කිරිඅම්මාවරුන් 07 දෙනෙකු සඳහන් වන බව හෙන්රි පාකර් මහතා සඳහන් කරයි. එම කිරිඅම්මාවරුන් සත්දෙනා පහත දැක්වේ.

1. මිරියබැද්දේ කිරිඅම්මා
2. පුෂ්පරාග කිරිඅම්මා
3. උනාපාන කිරිඅම්මා
4. කොස්ගම කිරිඅම්මා
5. බෝවලගෙදර කිරිඅම්මා
6. බාලගිරි අම්මා
7. ගිනිජල් දේවතා කිරිඅම්මා වශයෙනි

වැදි ජනතාව විසින් අදහනු ලබන කිරිඅම්මාවරුන් අතර 'කුකුළාපොළ කිරිඅම්මා' ට සහ 'ඉදිගොල්ලේ කිරිඅම්මා' ට වැදගත් ස්ථානයක් හිමි වේ. එහෙත් පාකර් එම කිරිඅම්මාවරු දෙදෙනා මෙහි දක්වා නොමැත.

හෙන්රි පාකර් මහතා සිංහලයන් අතර පවතින කිරිඅම්මාවරුන් සත්දෙනා හඳුන්වා ඇත්තේ මෙසේය.

1. පොළොවේ මහී කාන්තාව
2. මුහුදේ මහීකාන්තාව
3. උමයංගනාව
4. සරස්වතී
5. සීතා පරමේශ්වරී
6. වල්ලිඅම්මා
7. පත්තිනි අම්මා යනුවෙනි.

ලංකාවේ ගැමි ජනතාව අතරද වැද්දන් අතර පවතින කිරිඅම්මාවරුන්ට සමාන කිරිඅම්මාවරුන් පිරිසක් අදහනු ලබන බව කිරිඅම්මාවරුන්ගේ නම් ගැන පර්යේෂණය කළ සී. ද එස්. කුලතිලක මහතා දක්වයි. එසේ දක්වා ඇත්තේ මොණරාගල ප්‍රදේශයේ කිරිමඩු යාගයට ඇතුළත් වූ කිරිඅම්මාවරුන් 13 දෙනෙකි. එනම්,

1. ඉනවැල්ලේ අලුත් කිරිඅම්මා
2. දොඹගහවෙල අලුත් කිරිඅම්මා
3. ඉඳිගස්ඇල්ල කිරිඅම්මා
4. පොල්ගහගම කිරිඅම්මා
5. තල්තොට අලුත් කිරිඅම්මා
6. කුකුළාපොළ කිරිඅම්මා
7. කොළොන්වින්නේ කිරිඅම්මා
8. දඹගල්ලේ අලුත් කිරිඅම්මා
9. ගෝනතලාවේ කිරිඅම්මා
10. ඉහාවේ කිරිඅම්මා
11. කපුයායේ අලුත් කිරිඅම්මා
12. මැදගංගොඩ අලුත් කිරිඅම්මා
13. බිළිඳු කිරිඅම්මා වශයෙනි

විවිධ මූලාශ්‍රවලින් සොයා ගත් කිරිඅම්මාවරුන් පිරිසකගේ නම් 'සිංහල දේව පුරාණය' නම් ග්‍රන්ථයේ මෙසේ දක්වා ඇත.

1. ඉදිගොල්ලේ කිරිඅම්මා
2. කුකුළාපොළ කිරිඅම්මා
3. උනාපාන කිරිඅම්මා
4. වෙල්ලස්සේ කිරිඅම්මා
5. කොස්ගම කිරිඅම්මා
6. බිළිඳු කිරිඅම්මා
7. කොටවැව කිරිඅම්මා
8. මහ කිරිඅම්මා
9. මිරියබැද්දේ කිරිඅම්මා

47 වන පිටුව බලන්න

## Saliroo Creations

**All Your Publishing Needs under one roof**

### Graphics
Illustrations, Logos, Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

### Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

### Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

**ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා**

**Tel : 416 201 0628**

## French Tutoring

Individual and small group classes for French learners'French reading, writing, and conversing'Any grade from grade 1-12, university minors and French Immersion

**Kumudu Abeywardena,** B.A (Modern Languages), Dip (AFC)

**T.P - 647 824 1897**

## MARRIAGE PROPOSALS

Sinhala Catholic parents in Toronto seek an educated pretty daughter (22 years or below) for their son of 25 years. He is 5'6", handsome and will be graduating in April in Computer Engineering from a leading University in Toronto (well poised for landing in a high caliber job soon after graduation with his several internship experiences in USA). He is a Canadian citizen. A daughter is sought either from Canada or Sri Lanka (willing to migrate to Canada).

Please reply with details with a photo to **telesfern@gmail.com**

## MARRIAGE PROPOSALS

An affluent, respectable Sinhala Govi Buddhist family from Colombo, Sri Lanka, wishes to find a suitable daughter from a respectable Sinhalese family living in Sri Lanka or overseas, for marriage, to their tall (nearly 6 feet), good looking, 32yr old son with fine personality. He is a non-smoker, teetotaler, brought up with Buddhist values and educated at leading schools in Colombo. He is the youngest of the family and runs the family business. His elder brother, ICT Engineer is married. He will inherit considerable wealth.

Please email relevant details and a copy of the daughter's horoscope (which will be treated as confidential) to

**avindrad@gmail.com** or

contact **+9477 147 988**1(mother)

**පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි**

### මංගල සභාවේ බේබදු කථාව

එය තේ අක්කර 25-30 ක්, කුඹුරු අක්කර 10-15 ක්, යාන වාහන හා තවත් බොහෝ දේ හිමි ගාලු දිස්ත්‍රික්කයේ එක්තරා ගමක වෙසෙන ධනවත් තරුණයකුගේ විවාහ මංගලෝත්සවයයි. අතිඋත්කර්ෂවත් අයුරින් පැවැත් වූ මංගල්‍යයට වැදගත් ප්‍රභූන් ඇතුළු දහස් සංඛ්‍යාත ඥාති හිතවත්තු සහභාගි වී සිටියහ. සාමාන්‍යයෙන් සෑම මගුල් ගෙදරකම පාහේ දක්නට ලැබෙන අරක්කු පැත්ත පළාතකට වැද්ද නොගත් එහි දක්නට ලැබුණේ ඇතැම් මධුලෝලීහු ජීවිතයට දැක නැති නමින්වත් අසා නැති අග්‍රගණයේ මත්පැන් වර්ගයෝය. මිල අධික මත්පැන් වර්ග නිවසේ කාණු දිගේ පවා ගලා ගියා යැයි කීවොත් නිබොරුය.

සියල්ලෝ ජයටම කා බී අවසන උත්සව සභාවට සූදානම් වූහ. මුලින්ම උත්සව සභාව ඇමතුවේ මනාලියගේ පාර්ශ්වයෙනි. ඒ විශ්‍රාමික විදුහල්පතිවරයෙකි. නව යුවළට කදිම අවවාද අනුශාසනා රැසක් අඩංගු එම අනුශාසනාව සිදු කළ ආකාරය කාගෙත් සිත් ගත් සෙයක් පෙනිණි. ඔහු එය ඉදිරිපත් කළ ආකාරය සහ ඊට යොදාගත් හාස්‍යජනක වදන් සමුදාය නිසාම එම අනුශාසනාව කාගේත් සිත් ගත් අතර සැවොම සිනාමුසු මුහුණින් යුතුව අසා සිටියහ.

"අද දින නව දිවියකට මුල පුරන අභිනව යුවතිපතීන් හට පමණක් නොව මේ සභාවේ හැමටම කදිම පාඩමක් කියා දුන් අප හැම සිනා සාගරයක ගිල්වූ විශ්‍රාම ලත් විදුහල්පතිතුමාට මේ මංගල සභාවේ සිටින හැමගේ ගෞරවනීය ස්තුතිය පළ කරමින් මා මීළඟට ආරාධනා කරනවා මනාල මහතා වෙනුවෙන් අනුශාසනාවක් පවත්වන ලෙසට අපේ .......... වෙද මහතාට" උත්සවයේ සංවිධායකවරයා එසේ පවසත්ම සභාවෙන් වේගවත් අත්පොලසන් හඬක් නැඟිණි. ඒ මුල් කතාව කළ විදුහල්පතිවරයාටත් වඩා රසවත් කතාවක් ඔහුගෙන් අසන්නට ලැබෙන බව දන්නා අය බොහොමයක් එම මංගල සභාවේ සිටි බැවිනි.

"කෝ වෙද මහත්තයා කෝ....?" කිහිපදෙනෙක් විමසිල්ලෙන් වටපිට බලන්නට වූහ.

කිහිපදෙනෙක් ගෙතුළට දිව ගියහ. පදමට බීගත් හෙතෙම කුස්සි ආලින්දයේ සනීප පුටුවේ දිග ඇදී මහා නින්දකට පිවිස සිටින අයුරු ඔවුනට පෙනිණි.

"වෙද මහත්තයෝ........ වෙද මහත්තයෝ....... අන්න ඔහේගෙ වාරය. නැගිටින්න, නැගිටින්න. අනික් පැත්තෙන් දුන්නා ඇට්ටි හැලෙන්න කථාවක්. අපිට පරාද වෙන්න බෑ. ගමේ නම්බුව තියන්න. දෙන්න ග්‍රවුන්ඩ් එකේ හතර පැත්තටම හයේ හතරෙ පාරවල් දෙන්න. පෙන්නන්න ඔහේගෙ කලර්ස්" තරුණයෝ ඔහු අවදි කරවා ලිහී තිබුණු ඔහුගේ සරමද අන්දවා ඔහුව වත්තන් කරගෙන එළියට රැගෙන ගියහ. ඔහු බීමතින් වැනි වැනී මයික්‍රෆෝනය අසලට පැමිණි ආකාරයම හැමට කදිම විනෝදයක් ගෙනදීමට සමත් විය. උද්දාමයට පත් මුළු සභාව මහා අත්පොලසන් හඬකින් ගිගුම් දුන්නේය.

"සම්භාවනීය මංගල සභාවෙන් අවසරයි. අභිනව යුවතිපතීන්ගෙන් අවසරයි. දෙපාර්ශ්වයේම ඥාති හිතවතුන්ගෙන් අවසරයි. මේ මනමාල මහත්තයා මගේ එකකුස උපන් සහෝදරීගෙ එකම පුතා. මූ මගේ ඇවැස්ස බෑනා. මම මේ කියන්නෙ බොරුවක් නම් මම හැන්දෑවට බීගෙන ඔය දෙවැට දිගේ කරුවලේ ගෙදර එනකොට ගහන්න මට හොඳ කිතුල් පොලු පාරක්. අම්මපා, දෙයියම්පා මම මේ කියන්නෙ සහතික ඇත්ත. මූ මගේ කෙල්ල එක්ක ඇයි හොඳයියක් තිබුණා. ඇවැස්ස නෑනා මස්සිනා නිසා අපේ අක්කවත් මමවත් ඒකට විරුද්ධ වුණේ නෑ. මූ බඳිනවා බඳිනවා කිය කියා අපේ ගෙදරට රිංගුවා. ඒ විතරක් නොවෙයි අහිංසකී එහේ මෙහේ අරගෙනත් ගියා. අන්තිමට ඒකිට බූට් එකද මොකක්ද කෙහෙල්මලක් තිබ්බා. අනේ පව් අසරණී. අද පොළොවෙ හැපෙනවා" වෙද මහත්තයාගෙ කථාව නතර කරන්නට සංවිධායක ඇතුළු කිහිපදෙනෙක්ම උත්සාහ කළද තම කථාව නතර කළේ ඔහු නොවේ.

"කොහොම වුණත් මූ හොඳ එකා. දළු සල්ලි ගත්ත හැම දවසකම මට අරක්කු බෝතලයක් වැරැද්දුවෙ නෑ" කථාව තවත් දුර දිග යද්දී කෙනෙක් මයික්‍රෆෝනය ක්‍රියාවිරහිත කළේය.

"මට ඔය බම්බුව ඕන නෑ, මට මගේ කට හොඳටෝම ඇති. හැබැයි බෑනෝ උඹ හිතාගනින් උඹට වැඩියෙ සල්ලි භාගෙ දේපළ තියෙන උඹට වැඩිය හොඳ ඉලංදාරියෙක් අද හෙටම හොයල මම මගේ කෙල්ල බන්දලා දෙනවා. එදාට උඹට හිතෙයි උඹ අද මේ උස්සගෙන ආපු ලදරම මොකක්ද කියල" කථාව එන්න එන්නම නරක අතට හැරෙනු දුටු සංවිධායකවරයා හා තවත් කිහිපදෙනෙක් මැදිහත්ව වෙද මහතා එතැනින් ඉවත් කර ගත්තේ බලවත් ආයාසයක් දරමිනි.

### ඔහොම පේන්නෙ නැහැ

පොලිස් ස්ථානයකට පැමිණි මැදිවයසට ආසන්න අවිවාහක තරුණියන් දෙදෙනෙක් තමාගේ නිවස ඉදිරිපිට ඇති නිවසේ වෙසෙන තරුණ ඉංජිනේරුවා හවසට තමන් දෙදෙනාට පෙනෙන සේ විදුලි පහන් දල්වා නිරුවතින් සාලයේ එහා මෙහා ගමන් කරන බව පැමිණිලි කර සිටියහ.

ඉන්පසු ස්ථානාධිපතිවරයා එය පරීක්ෂා කිරීමට පොලිස් කොස්තාපල්වරුන් දෙදෙනකු යැවීය. ආපසු පැමිණි කොස්තාපල්වරුන් දෙදෙනා එය අසත්‍යයක් බවත් හවසට නිවසට පැමිණෙන තරුණ ඉංජිනේරුවා නිවසට වැදී දොර වසා ගන්නා බවත් පැවැසීය. පසු දින පැමිණි තරුණියන් දෙදෙනා පොලිස් කොස්තාපල්වරුන් දෙදෙනා එය හරියාකාරව පරීක්ෂා නොකළ බව එකහෙළාම පවසා සිටි අතර වෙනත් නිලධාරියකු එවන ලෙස ඉල්ලා සිටියහ. ඔවුන්ගේ ගැළවීමක් නොලත් ස්ථානාධිපතිවරයා තරුණ උප පොලිස් පරීක්ෂකයකු ස්ථානය පරීක්ෂාවක් සඳහා යොමු කළේය. උප පොලිස් පරීක්ෂවරයා ප.ව. 7.00 ට නිවසට ගියේය. ගොස් නිවස තුළට වී ඉදිරි නිවස දෙස බලා සිටි අතර තරුණ ඉංජිනේරුවා කාරයෙන් පැමිණ නිවස තුළට ගොස් දොර වසා ගත්තේය.

"කෝ පේන්නෙ නැහැනෙ" යි පැවැසීය.

එවිට තරුණියන් මෙසේ පැවසූහ.

"ඔහොම පේන්නෙ නැහැ සර් මේ මේසෙ උඩට පුටුව තියල පුටුව උඩින් මේ පොඩි ස්ටූල් එක තියල ඒක උඩට නැගලා මේ ග්‍රිල් එක අස්සෙන් බලන්න. එතකොට හොඳට පේනවා"

### තැඹිලි හොරු අල්ලාගත් වතු හිමියා

එක් දහස් නවසිය අනූනවය වර්ෂයේ වයඹ පළාතේ කුලියාපිටිය ප්‍රදේශයේ උසස් පාසලක දහවන ශ්‍රේණියේ සිසුන් පිරිසක් දිනක් පාසල් වත්තට යාබද ඉඩමට පැන්නේ හොරෙන් තැඹිලි කැඩීම සඳහාය. තැඹිලි ගස් පහකින් පමණ තැඹිලි ගෙඩි විස්සක් කැඩූ සිසුවෝ බිම හිඳගෙන ඒවා හිල් කරගෙන බොන අතරතුර වතු හිමියා පිරිසක් සමග වත්තට හදිසියේ කඩා වැදුණේ දින ගණනාවක් තිස්සේ තම ඉඩමේ තැඹිලි ගස්වලින් තැඹිලි ගෙඩි හොරෙන් කඩන හොරු අල්ලා ගැනීමේ අටියෙනි.

තැඹිලි හොරු අතටම අල්ලාගත් වතු හිමියා ඇතුළු පිරිස ඔවුනට පැන යෑමට ඉඩ නොදී රැකගෙන සිසුන්ගේ එක් අයකුට තැඹිලි

**48 වන පිටුව බලන්න**

**පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි**

# කාල මරණ සහ අකාල මරණ



■ ශාස්ත්‍රවේදී එස්. වීරරත්න

අපගේ ජීවිතයේදී ඉපදීම, මරණය, අසනීපවීම වැනි දේ සුලභය. දෛනිකව කෙනකුගේ අසනීපයක් අසන්නට ලැබේ. නැතහොත් තමාගේ අසනීපයක් හෝ පවුලේ ඥාතියකුගේ අසනීපයක් වෙනුවෙන් ප්‍රතිකාර ගන්නට සිදුවේ. එසේම දන්නා හඳුනන අයෙකුගේ හෝ අසල්වැසියකුගේ දරු උපතක් ගැන අසන්නට ලැබේ. එසේම මරණයක් ගැනද අසන්නට ලැබේ. අප හා ජීවත් වූ ඥාතීන් කීදෙනෙකු අද අපගෙන් වෙන්ව ගොස් ඇත්ද? අප හා එක පංතියේ එක පාසලේ ඉගෙනුම ලැබූ යහළු යෙහෙළියන්ගෙන් කී දෙනෙක් වියෝ වී ඇත්ද? එක ආයතනයක සේවය කළ අය, එක ගමේ ජීවත් වූ අය, එදිනෙදා වෙළෙඳපොළේදී, බස්රියේදී, දුම්රියේ හමුවූ අය වෙන්ව ගොස් ඇත්ද?

ජාතිපි දුක්ඛා
ජරාපි දුක්ඛා
ව්‍යාධිපි දුක්ඛා
මරණම්පි දුක්ඛා

ඉපදීම, ජරාව, ව්‍යාධිය, මරණය දුකක් බව බුදුහිමි දේශනා කොට ඇත. ඉපදීම හා අසනීපවීම ගැන නොව මරණය ගැන මඳක් සිතා බලමු.

වර්තමානයේ පමණක් නොව අප දන්නා අතීතයේත් ඒ ලෙසම අසා කියවා ඇති ඉතිහාසයෙත් විවිධ ආකාරයේ මියයෑම් අපට හුරුය. පුරුදුය. පොදුවේ ගත් කල 'මරණය' කොටස් කිහිපයකට බෙදා වෙන්කළ හැක.

1. ස්වාභාවික මරණ
2. දිවි නසා ගැනීම්
3. දිවි තොර කිරීම්
4. හදිසි ආපදා නිසා සිදුවන මරණ
5. උපතේදීම සිදුවන මරණ
6. රෝගාබාධයකින් සිදුවන මරණ

සහ තවත් ක්‍රමවේදයන් මරණය සම්බන්ධව කතා කළ හැක. මෙයින් ස්වභාවික මරණය ලෙස දීර්ඝ කාලයක් ජීවිතය ගත කොට එනම් 'පරම ආයුෂ ගත කොට' මිය යෑම පෙන්වා දිය හැක. ඒ අතර ඇතැමුන් මේ මරණ ප්‍රධාන කොටස් දෙකකට වර්ග කර දක්වනු ලැබේ. එනම්

1. කාල මරණ
2. අකාල මරණ

කාල මරණ ලෙස පරම ආයුෂ ගත කොට, මහලුව, වියපත්ව මිය යෑම පෙන්වන අතර මවුකුසයේදී මිය යෑමේ සිට විවිධ සාධක මත අඩු ආයුෂ ගත කොට මිය යෑම අකාල මරණය යැයි පෙන්වා දේ.

බුදු දහමේ මරණය සිදුවන ආකාරය මනාව පැහැදිලි කොට ඇත. දැල්වූ පහනක් තෙල් සහ තිරේ අවසන්ව නිවී යා හැක. ඇතැම් විට තෙල් ඉතිරිව තිබියදී තිරේ දැවී යෑම නිසා පහන නිවී යා හැක. නැතහොත් තිරේ ඉතිරිව තිබියදී තෙල් අවසන්ව පහන නිවී යා හැක. මේ සියල්ලටම වෙනස්ව තිරේත් තෙල්ද දෙකම තිබියදී සුළඟක් හෝ ජල පහරක් නිසා පහන නිවී යා හැක. අපගේ මරණයද මේ ලෙස උපමා කොට ඇත. මරණය සිදුවන ආකාරය මිස 'අකාල මරණයක්' ගැන එහි සඳහන් නොවේ. මා කියන්නේද කිසිවෙකුට 'අකාල මරණයක්' සිදු නොවන බව පෙන්වා දීමටය. අඩු වයසින් මිය යෑම අනතුරක් අසනීපයක් හදිසි ස්වභාවික විපතක් නිසා සිදුවිය හැක. එවිට අප පවසන්නේ ඒ පුද්ගලයා 'අකාලයේ මිය ගිය' බවයි. එය වැරදි අදහසකි. කිසිවකු අකාලයේ මිය යන්නේ නැත. ඔහු හෝ ඇය උපදින විට ගෙනා ආයුෂ ගෙවා අවසන් වූ විට මරණය සිදුවේ. එය කවදාද? කොතනද? කෙසේද? අපි නොදනිමු.

කොළඹ සිට මහනුවරට දිවෙන නගරාන්තර දුම්රිය පොදුවේ සිය ගමනාන්තය දක්වා දිවයයි. එහෙත් ඇතැම් විට දුම්රිය ඇන්ජිමේ සිදුවන යාන්ත්‍රි ක ආබාධයක් නිසා එය අතරමග නතර කරන්නට සිදුවිය හැක. අධික වර්ෂාව නිසා පස් කන්දක් කඩා වැටී දුම්රිය අතරමග නතර කළ හැක. ඉන්ධන නොමැතිව හෝ රියැදුරු අසනීප වීම, මාර්ග සංඥා ක්‍රියාත්මක නොවීම, වැඩ වර්ජන ආදිය නිසා දුම්රිය නිසි පරිදි ධාවනය නොවිය හැක. එය මරණයට සම්බන්ධ කරගතහොත් මුළු ජීවිත කාලය අවසන්ව මිය යෑම සහ අතරමගදී මිය යෑම හා සමානය. ඒත් දුම්රිය ගමනාගමනය අපට වෙනස් කළ හැක. ඉන්ධන නොමැති නම් ඉන්ධන ලබාදිය හැක. මාර්ග අවහිරතා සිදුවූයේ නම් ඒ අවහිරතා ඉවත් කර ධාවනය කළ හැක. රියැදුරා අසනීප වූයේ නම් වෙන අයෙකු යොදා හෝ එය ධාවනය කළ හැක. ඒත් මරණය මෙසේ කළ නොහැක. යමෙකු මිය යන මොහොතේ ඒ වෙනුවට වෙනත් 'ආදේශකයක්' යොදාගත නොහැක. සැමියා වෙනුවට බිරිඳට මිය යන්නට බැරිය. මව වෙනුවට දරුවකුට මිය යන්නට නොහැක. මිය යා යුත්තේ මිය යෑමට නියමිත පුද්ගලයාම පමණි. මරණය මරණයට පමණි.

ජ්‍යොතිෂය හොඳ හැටි හදාරන විට යම්කිසි පුද්ගලයකුගේ මරණය සිදුවන වකවානුව තීරණය කළ හැක. යම් යම් ග්‍රහ පිහිටීම සලකා බැලීමේදී ජන්මියකුගේ මරණය සතියෙන්, මාසයෙන්, මාස තුනෙන්, අවුරුදු හතෙන් හෝ යම්කිසි කාල සීමාවකදී සිදුවිය හැකි බව හඳුනාගත හැක. එහෙත් බුද්ධිමත් ජ්‍යොතිෂවේදීන් ඒ පිළිබඳව තමාගේ සේවාදායකයාට පවසන්නේ නැත. එය භයානකය. යමෙකු මිය යන දිනය දැනගතහොත් ඔහු හෝ ඇය ඊට පෙර මානසිකව මිය යා හැක. එසේම ඔහු හෝ ඇයට පෙර ඔහුගේ සමීප ඥාතීන් මානසික පීඩාවලට ලක්වීම නොවැළැක්විය හැක. රෝගියකු මියයන දිනය දැනගත්තද වෛද්‍යවරයෙකු ඒ බව රෝගියාට හෝ ඥාතීන්ට පවසන්නේ නැත. තවත් කුමන හෝ ප්‍රතිකාරයක් කරන්නට අවශ්‍ය බව පවසා ඔවුන්ගේ සිත් වෙනස් අතකට හරවාලීම සිදුවේ. ඒ නිසා පළපුරුදු ජ්‍යොතිෂවේදියාද තමා වෙත ආ පුද්ගලයාගේ ජීවිතය ගැන ගන්නා තීරණය ඉතාම විමසීමෙන් තීරණය කරනු ඇත.

කුඩා දරුවන්ගේ ජන්ම පත්‍රය මාස තුනක් (ඉපදී) යනතුරු නොසාදන්නේද මේ කාරණය පදනම් කොට ගෙනය. මේ ලිපිය කියවන ඔබ මරණය සිදුවන බව හඳුනා ගන්නා ග්‍රහ පිහිටීම් මොනවාදැයි සිතා සොයා බලනු ඇත. ඒත් එවැනි ග්‍රහ පිහිටීම් ඇති බව පිළිගන්න. ඒත් ඒවා විමසීමට නොයන්න. මන්ද ඔබගේ හෝ ළඟම ඥාතියෙකුගේ එවන් ග්‍රහ පිහිටීමක් තිබුණහොත් ඔබ කම්පනයට ලක්වනවා ඇත.

එසේම පැවසිය යුතු තවත් දෙයක් පවතී. යම් යම් ග්‍රහ පිහිටීම් මත මරණය ලබා ඇතත් ඒ පිහිටීම වෙනත් ග්‍රහ පිහිටීමක් මගින් භංග වීමක් සිදුවිය හැක. ශශ යෝග, ගුරුහංස යෝග, භද්‍ර යෝග ආදිය ඇත්නම් ඔබට ලැබී ඇති දීර්ඝ ආයුෂ අඩුකරන්නට නොහැක. එසේම ග්‍රහ පිහිටීම් නිසා මරණය ආසන්න වුවත් (මාරක අපල ඇතත්) ඒවා වෙනස් කිරීමේ හැකියාවද ඇත. ඇතැම් ග්‍රහ පිහිටීම්, ශනි ඒරාෂ්ඨක ආදි අවස්ථාවල ඒවාට අවශ්‍ය පිළියම් යොදා ගැනීමෙන් මරණය කල් දමන්නට හැක. බුදුන් වහන්සේගේ කාලයේ 'දීඝායු කුමාරයාට' සත් දිනක් පිරිත් දේශනා කොට මරණයෙන් බේරා ගැනීම උදාහරණයකි.

අකල් මරණය යැයි දෙයක් නැත. එය අප මවාගත් දෙයකි. ජ්‍යොතිෂයේ අඩු ආයුෂ සහිතව නැතහොත් ඉක්මනින් මියයන යෝග පෙන්වා දී ඇත. ඒවා ඉක්මනින් නැතහොත් අඩු ආයුෂ- සහිතව මිය යෑම මිස 'අකල් මරණ' නොවේ. යමෙකු උපදින විට ජීවත්වන වයස තීරණය කර ඇත. කුඩා කාලය, ළමා කාලය, තරුණ කාලය, මැදිවිය හෝ මහලු විය ලෙස එය සිතාගත හැක. ඒ අනුව යමෙක් උපදින විට ගෙනා ආයුෂ අවසන් වීමෙන් මිය යෑම සිදුවේ. එය ළමා කාලයේදී වුවත් එය ඔහු ගෙන ආ 'පරම ආයුෂ' ය. එය පිළිගත යුතු දෙයකි. යමෙකුට ජීවත් වන්නට වාසනාව ඇත්නම් කුමන ව්‍යසන ආවද ජීවත් වේ. සුනාමි උවදුර නිසා මුහුදුකරයේ ජීවත් වූ සියල්ලෝම මියගියේ නැත.

## ජනාගමයේ...

45 වන පිටුවෙන්

10. පුෂ්පරාග කිරිඅම්මා
11. බෝවලගෙදර කිරිඅම්මා
12. බාලගිරි කිරිඅම්මා
13 ඉඳිගස්වෙල කිරිඅම්මා
14. පොල්ගහගම කිරිඅම්මා
15. කොළොන්වින්නේ කිරිඅම්මා
16. නෝනතලාවේ කිරිඅම්මා
17 ඉහඹේ කිරිඅම්මා
18 ඉනාවැල්ලේ කිරිඅම්මා
19 දොඹගහවෙල කිරිඅම්මා
20 කපුයායේ කිරිඅම්මා
21 මැදගංගොඩ කිරිඅම්මා
22 ගතල්තොට කිරිඅම්මා
23 දඹගල්ලේ කිරිඅම්මා
24 හඳුන්කුමාරී කිරිඅම්මා

ඌව බින්තැන්න, නුවර කලාවිය, තමන්කඩුව ආදි ප්‍රදේශවල මෙම කිරිඅම්මාවරුන් ඇඳහීමට ලක්වන බව එම ග්‍රන්ථයේ තවදුරටත් සඳහන් වේ. මීට අමතරව ඌව වංශ කථාවේ 'වන්නියේ බණ්ඩාර කිරිඅම්මා', 'උනාපානේ කිරිඅම්මා', 'කුකුළාපොළ කිරිඅම්මා', 'දොලහබණ්ඩාර කිරිඅම්මා' ආදී කිරිඅම්මාවරුන් ඌවේ ජනතාවගේ ඇදහිලි සහ විශ්වාස අතර දක්නට ලැබෙන බව සඳහන් වේ.

පස්සර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිරියබැද්ද ග්‍රාම සේවා වසමේ පිහිටි මිරියබැද්ද දේවාලයේ කන්නලව්වේදී 'මිරියබැද්දේ කිරිඅම්මා, අඹරාපොතකිරිඅම්මා, මස්පන්නේ කිරිඅම්මා, ගැටවර කිරිඅම්මා, කොටබෝවේ කිරිඅම්මා ආදී වශයෙන් කිරිඅම්මාවරු 07 දෙනෙකු පිළිබඳව සඳහන් වේ. පස්සර පලාගොල්ලේ කිරිඅම්මා දේවාලයේ වාර්ෂිකව පවත්වනු ලබන 'මල් එළිය' ශාන්තිකර්මයේදී ගායනා කරනු ලබන 'වෙල්ලස්සේ කිරිඅම්මා, අඹරාපොති කිරිඅම්මා, පළාගොල්ලේ කිරිඅම්මා, පුෂ්පාරාග කිරිඅම්මා, සඳුන් කිරිඅම්මා, හලඩකුමාරි කිරිඅම්මා, උනාපානේ කිරිඅම්මා, කුකුළාපොළ කිරිඅම්මා ආදී කිරිඅම්මාවරු පිළිබඳව සඳහන් වේ.

වර්තමානයේදී මහඔය පොල්ලේ බැද්ද, දඹාන, වටවන, කන්දේගම්වෙල ආදී ගම්වල වැදි ජනතාව ඉඳිගොල්ලේ කිරිඅම්මා, කන්දේ කිරිඅම්මා, උනාපානේ කිරිඅම්මා, දිවැස් කිරිඅම්මා, කුකුළාපොළ කිරිඅම්මා, වෙල්ලස්සේ කිරිඅම්මා, බිළිඳු කිරිඅම්මා, මහ කිරිඅම්මා ආදී අම්මාවරු අදහනු ලබන බව වැද්දන් පිළිබඳ පර්යේෂණය කළ ඊ. එම්. රත්නපාල මහතා ප්‍රකාශ කරයි. මෙලෙස කිරිඅම්මාවරුන් රාශියක් පිළිබඳ විවිධ මූලාශ්‍රවල සඳහන් වෙයි.

ජනප්‍රවාදයේ කිරිඅම්මාවරුන් 07 ක්, 21 ක් ආදී වශයෙන් සඳහන් වුවද ඉහත දැක් වූ කිරිඅම්මාවරුන් පිළිබඳ තොරතුරු සලකා බැලීමේදී නිශ්චිත සංඛ්‍යාවක් සඳහන් නොකළ හැකි බව පෙනේ. එහෙත් කිරිඅම්මාවරුන් 07 දෙනකු පිළිබඳ සංකල්පය සමාජයේ මුල් බැසගත් සංකල්පයක් බව පෙනී යයි.

## 1948 ඡන්දය...

34 වන පිටුවෙන්

පොළට නොපැමිණ ඇත. ඡන්ද පොළට පැමිණ දැන හෝ නොදැන අවලංගු වන ආකාරයෙන් ඡන්දය පාවිච්චි කළ පිරිස 596972 කි. ඕස්ට්‍රේලියාව වැනි රටවල ඡන්දය භාවිත නොකරන පුද්ගලයින්ට රජය මඟින් දඩ පනවන නමුත් ශ්‍රී ලංකාවේ එවැනි තත්ත්වයක් නොමැත. ඡන්ද බලය පාවිච්චි කිරීමට හෝ නොකර සිටීමට පුරවැසියාට අයිතියක් ඇති බවත් ඡන්දය පාවිච්චි නොකිරීමෙන් යම් පණිවුඩයක් සමාජයට ලබාදීමට ඡන්ද දායකයාට අවකාශ ඇති බවත් අධිනීතිඥ ලාල් විජේනායක මහතා පවසයි. ඡන්දය යනු ව්‍යවස්ථාවෙන් පුද්ගලයකුට ලැබී ඇති අයිතියකි. කොන්දේසි සපිරූ විට එම අයිතිය පුරවැසියාට ලබාදීම රජයේ වගකීමකි. එසේ ලබාගත් අයිතිය පාවිච්චි කිරීමට හෝ නොකර සිටීමට පුරවැසියාට පෙරළා අයිතියක් තිබේ. ඡන්දය යනු ජනතාව සතු හිංසාකාරී නොවන අවියකි. එම අවිය පාවිච්චි කළ යුත්තේ වංචාව දූෂණය පිටුදකින අවංකත්වය අගයන ජනහිතකාමී බුද්ධිමත් නිවැරැදි දැක්මක් ඇති පුද්ගලයන් තමන් වෙනුවෙන් තීරණ ගැනීම සඳහා විධායකයට හා ව්‍යවස්ථාදායකයට පත්කරන්නටය. අප ඡන්ද පොළට නොයනා විට නොමනා පුද්ගලයින්ට අප වෙනුවෙන් තීන්දු තීරණ ගැනීමට වැඩි අවකාශ සැලසෙනු ඇත.

## යළි බැබළෙන්නෙ...

41 වන පිටුවෙන්

පළමු සුපිරි තරුව වූයේ රාජේෂ් ඛන්නාය. එතෙක් පටන් නළුවන් පමණක් සුපිරි විරුවන් වෙමින් තරු බලය සිනමා පටයේ ආදායම් වාර්තා ලබන්න හේතු කාරක කරගනිමින් විරාජමාන වෙද්දී තමන් සුපිරි තරුවක් නොව මෙගා තරුවක් බවත්, සිනමා පටයක සාර්ථකත්වයට ශ්‍රීදේවි නම පමණක්ම වගකීමේ සහතිකයක් බවත් ඇය පෙන්වා දුන්නාය. ශ්‍රීදේවි කමල් හසන් සමඟ සිනමාපට විසි එකකත්, රජිනි ඛාන්ත් සමඟ සිනමාපට විසි දෙකකත් රඟපෑවාය. ශ්‍රීදේවිය බොලිවුඩයේ ප්‍රධාන තාරකාවගේ චරිතය මුල් වරට රඟන්නට වරම් ලැබුණේ සොල්වා සාවන් (1979) සිනමා පටයේය. එවකට ඇය සොළොස්විය සපිරූ නව යෞවනියකි. කතාව ගෙතී තිබුණේද ගුරුවරියක වීමට සිහින මවන එම වයසේම යෞවනියක වටාය. සොල්වා සාවන් 1977 කොලිවුඩයේ තිරගතවූ 16 වයතිනලේ බොලිවුඩ් ප්‍රතිනිර්මාණයයි. එහිද කතා නායිකාව වූයේ ශ්‍රීදේවියයි.

සිනමා පට දෙකේම අධ්‍යක්ෂවරයා වූ භාරතිරාජා අධ්‍යක්ෂවරයා ඇගේ අකල් වියෝව කන වැකුණු පසු කියා සිටියේ මුලින් ශ්‍රී දේවි බොලිවුඩයට පා තැබීමට අකැමැති වූ බවයි. එහෙත් පසුව අධ්‍යක්ෂවරයා ඇය දිරිමත් කර තිබේ. හිම්මත්වාලා (1983) ශ්‍රීදේවි ජනප්‍රිය තරුවක් බවට පත් කළ පළමු බොලිවුඩ් සිනමා පටයයි. හිම්මවත්වාලා මිලියන 50ක ආදායමක් ලබමින් 1983 වසරේ වැඩිම ආදායමක් ලද සිනමා පටය බවට පත්විණි. අවාසනාවකට හිම්වත්වලා 35 වැනි සැමරුම යෙදී තිබුණු පෙබරවාරි 25 දිනට පෙර දින ශ්‍රී දේවි දිවි සිනමාවෙන් සමුගත්තාය. එහි ප්‍රධාන නළුවා ලෙසින් රඟ පෑ ජිතේන්ද්‍ර කියා සිටියේ මුලින්ම ඒ චරිතයට රේඛා තෝරාගෙන තිබුණද අවසානයේදී අවස්ථාව ශ්‍රීදේවිට ලැබුණු බවය. එමෙන්ම භාරතයේ අතිදක්ෂම නර්තන ශිල්පිනියක වූ ශ්‍රීදේවී එතරම් නැටුමට දක්ෂ නැති තම දුර්වලතා බොහෝ සංයමයෙන් යුතුව ඉවසා සිටි වග ජිතේන්ද්‍ර මාධ්‍යයට පැවසුවේ මීට සතියකට පමණ පෙරදීය. හිම්මවත්වාලා සාර්ථකත්වයට පසු ශ්‍රී දේවි - ජිතේන්ද්‍ර සිනමාපට පහළොවක එකට රඟපෑහ. රිෂී කපූර් - ශ්‍රී දේවි සුසංයෝගයද රන් රස සේ පෑහිණි. නාගීනා, චාන්ද්නී, ගුරුදේවී 1993 වැනි සිනමාපට ප්‍රේක්ෂක මතකයෙන් කිසිදා ගිලිහෙන්නේ නැත. 1986 දී නාගීනා සිනමා පටයේ දී මුලින්ම ශ්‍රීදේවිගේ පෙම්වතා බවට පත් වූ රිෂි කපූර් පවසන්නේ නාගීනා රගද්දි ශ්‍රීදේවි ඉතා නිහඬව පසුවූ බවයි. පසුකාලයේ ඇය රිෂිට තමන් හින්දි නොදන්නා නිසා එසේ නිහඬව සිටි බව පවසා තිබේ. නාගීනා නර්තනය නාග නර්තන අතර විශිෂ්ටම ඉහළම ප්‍රේක්ෂක මනාපයක් ලද නර්තනයකි.

ශ්‍රීදේවි අනිල් කපුර් රිදී තිරයට කෙතරම් තිරසාර යුවළක් වුවාද කිවහාත් දෙදෙනා එක්ව සිනමපට 16 ක රඟ පෑහ. මිස්ටර් ඉන්ඩියා (1987) ලම්හේ (1991) ල ජුඩායි (1997) ලාඩ්ලා (1994) හිර්- රන්ජා (1992) රූප් කී රාණි චෝරොන් කා රාජා (1993) ඉන් කිහිපයකි. ශ්‍රීදේවි දකුණු ආසියාවේ ප්‍රථම සුපිරි තරුව වූයේ මිස්ටර් ඉන්ඩියා හි රඟපෑමත් සමඟය. බොනි කපුර් සමඟ විවාහ වූ පසු අවසානයේදි ශ්‍රීදේවියගේ මස්සිනා බවට අනිල් පත් විය. මිය යාමට දින කිහිපයකට පෙර ශ්‍රීදේවි අනිල් කපුර් සමඟ චිත්තියාන් කලයියාන් ගීතයට නර්තනයේ යෙදුණාය.

ශ්‍රී දේවි මිථුන් චක්‍රබෝර්ති යුවළ පෙම්වතුන් වූයේ තිරයේදි පමණක් නොවෙයි. දෙදෙනා එක්ව රඟපෑවේ සිනමා පට හතරක වුවත් ජාග් උතා ඉන්සාන් (1984) සිනමා පටයේ දී ඇති වූ ප්‍රේමය තෙවසරක රහසිගත විවාහයකට පාර කැපීය. රාජේෂ් ඛන්නා, ශ්‍රී දේවි යන බොලිවුඩ් පළමු සුපිරි තරු යුවළ පෙම්වතුන් වූයේ නයා බාදම් (1984) මක්සාද්, නස්රානා, මාස්ටර් ජී සිනමා පටවල ය. ඇය මෙගා තරුව අමිතාබ් බච්චන් හා සිනමා පට පහක රඟ පා තිබේ. ඉන්ක්විලාබ්, ආක්රි රාස්තා, ජොම්මා චුම්මා ඉන් ලන්ඩන් ඒ අතර තිබේ. කුඩා ගුවාහ් (1992) දෙදෙනා රඟපෑ ප්‍රේක්ෂක සම්මානය නොඅඩුව දිනාගත් අන්තර්ජාතිකවද ජනාදරයට පත් සිනමා පටයකි. විශේෂයෙන්ම ඒ සිනමා පටය ඇෆ්ගනිස්තානයේ කෙතරම් ජනප්‍රිය වූවාද කිවහොත් එරට ඇගේ අකල් වියෝව අසා රසිකයන් මහත් සේ ශෝකයට පත් වී තිබේ.

ශ්‍රීදේවිට අමිතාබ් යළි තිරයේදි මුණ ගැසුණේ ඉංග්ලිෂ් විංග්ලිෂ් සිනමා පටයේ විශේෂ දර්ශනයකදීය. පෙබරවාරි 25 වන දින ඉන්දියාවේ වේලාවෙන් ප.ව. 1.00ට (ඩුබායි වේලාවෙන් 11.30ට) අමිතාබ් බච්චන් ට්විටර් වෙබ් අඩවියට මෙසේ සඳහන් කර තිබිණි. 'ඇයි දන්නේ නෑ මගේ හිතට අමුත්තක් දැනෙනවා.' ඉන් ස්වල්ප වේලාවකට පසුව ශ්‍රී දේවිය මරණයට පත් වූ පුවත මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කෙරිණි. බොලිවුඩ් පුරයේ සියල්ලන්ම වෙබ් අඩවි හරහා අකල් මරණය ගැන ශෝකය පළ කළද බච්චන් ඉන් පසු කිසිවක් සඳහන් කර තිබුණේ නැත. එහෙත් ඉරිදා දිනයට නියමිතව තිබූ අමිතාබ් සහ රිෂි රගන 102 Not Out සිනමා පටයේ ගීතමය ජවනිකාවක් රූගත කිරීම ශ්‍රීදේවියට උපහාර පිණිස අවලංගු කර තිබේ.

රාජේෂ් ඛන්නා, අමිතාබ් බච්චන් වැනි තමන්ට වඩා බෙහෙවින් ජ්‍යෙෂ්ඨ නළුවන් සමඟ සේම වයසින් බාල නළුවන් සමඟද පෙම්වතිය ලෙස රැඟීමේ වාසනාව ලද එකම නිළියද ශ්‍රී දේවිය. ශාරුක් ඛාන් සමඟ රැඟූ ආමි 1996, සල්මන් ඛාන් සමඟ රැඟූ චන්ද්‍ර මුඛී, චාන්ද් ඛාන් කා කුක්දා රසික ප්‍රසාදය නොඅඩුව දිනා ගත්තේය. බොලිවුඩයේ සම්ප්‍රදාය ළාබාල නිළියන් සමඟ වැඩිහිටි නළුවන් පෙම්වතුන් ලෙස රඟ පෑම වුවද ශ්‍රීදේවි සෑම පරපුරකම නළුවන්ට පෙම්වතිය වී ඒ සම්ප්‍රදායද උඩු යටිකුරු කළාය. බොලිවුඩයේ අඩ සියවසක් සම්පූර්ණ කර සිනමා පට 300කට දායක වීම ශාරුක්, සල්මන්, අමීර්ඛාන් ත්‍රිත්වයද එක් වුවද කළ නොහැකි බව සල්මන් කියා සිටියේ 2017 මම් සිනමා පටය ප්‍රවර්ධනයේදීය. 80-90 දශකයන්හීදි වඩාත්ම ජනප්‍රිය බොලිවුඩ් තාරකාව ශ්‍රී දේවි වූවාය. එලෙසම වැඩිම මුදලක් අය කළ තාරකාව වූයේද ඇයයි. ගුරු (1988) චාල්බාස් (1989) ලම්හේ (1991) කුඩා ගවාහ් (1992) සහ ගුරු දේවි (1994) සිනමා පටවල ඇය ද්විත්ව චරිත නිරූපණයෙහි යෙදුණාය.

වරෙක ස්ටීවන් ස්පිල්බර්ග්ගේ ජුරාසික් පාර්ක් සිනමා පටයේ ඇයට රඟන්න අවස්ථාව ලැබුණත් එය ප්‍රතික්ෂේප කළේ බොලිවුඩ් සිනමා පට සමඟ කාර්ය බහුල වීම නිසාය. ශ්‍රී දේවියට පසු බොලිවුඩයේ අංක එකේ නිළිය වූ මධුරි ඩික්සිත්ට එම වාසනාව පෑදුණේද ඇය නිසාමය. මුලින්ම බෙටා සිනමා පටයේ රඟපෑමේ අවස්ථාව ලැබුණේ ශ්‍රී දේවියට වුවත් ඇය එය ප්‍රතික්ෂේප කළේ අනිර් කපූර් සමඟ ඒ වන විට සිනමා පට රැසක රඟපා තිබුණු නිසයි. පසුව එම අවස්ථාව මධුරිට ලැබුණි.

ශ්‍රී දේවිය දක්ෂ චිත්‍ර ශිල්පිනියකද බව බොහෝ දෙනා නොදන්නා රහසකි. 2018 ආරම්භයේ දී ශ්‍රී දේවියගේ දළ ආදායම ඩොලර් මිලියන 35ක්ව තිබිණි. එහෙත් සිනමා දිවිය ඇරැඹුමේදි මවත් සුළු පියාත් සොයුරියත් අඩ සොයුරාත් යන සිය පවුලම නඩත්තු කිරීමට සිදු වූයේ ඇයටයි. අමෙරිකාවේ හා බ්‍රිතාන්‍යයේ ඉපදුණු ධනවත් ඉන්දියානු ජාතික තරුණයන්ගෙන් විවාහ යෝජනා රැසක් ලැබුණත් ඒ සියල්ල ප්‍රතික්ෂේප කළ ශ්‍රීදේවී දෙවැනි වරටද විවාහ වූයේ දෙදරු පියකු වූ අට වසරක් වැඩිමල් බොනි කපූර් සමගය. විවාහ වන විට ඇය සත් මසක ගැබිනියකව වී සිටියාය. විවාහයට පෙර ගැබ් ගෙන ඇති බව පිළිගත් එකම බොලිවුඩ් තාරකාව ශ්‍රීදේවිය.

මුලින් ශ්‍රීදේවිය හෘදයාබාධයකින් මිය ගිය බව පැවසුණත් පසුව ඇය නාන බේසමේ වැටී ගිලී මිය ගිය බව ප්‍රකාශ විය. ශ්‍රී දේවිය ද මැරිලින් මොන්රෝ, දිව්‍යභාරතී මෙන් ලෝකයට ප්‍රශ්නාර්ථයක් ඉතිරි කරමින් අවසන් ගමන් ගියාය. ලොවම එළිය කළද පහන් දැල්ලක මුල අඳුරුය. ඇය ලොවට පෙන්වූයේ සතුටින් දිවි ගෙවන බවය. එහෙත් සත්‍ය එයද?

**උපුටා ගැනීම 'සිළුමිණ' පුවත්පතිනි.**

## හෙයියන්මාරුව...

43 වන පිටුවෙන්

"කිව්වා කිව්වා. රාලහාමි ගෙදරටම හොයාගෙන ආවම. මැරුනු ගෑනි මළා. දැන් කවුද ඔය දරුවා හදා ගන්නෙ"

"අර මක්කටෙයි කොහෙවත් යන උන් මම හදා ගන්නෙ? ඒ මගෙ දරුවෙක් නෙමෙයි යෝදියේ"

"අනෙ මගෙ කට. තූ නොදකින්. දරු තුන්දෙනෙක්ගෙ තාත්ත කෙනෙක් කියලා අමතක වුණා එහෙනම් වල්කමේ යනකොට"

"මේ සාගරිකා උඹ මගෙන් මැරුම් කන්නෙ නැතිව ඉදපන්. ඇයි යකෝ වදින්න ගිය දේවාලෙ ඉහේ කඩන් වැටුන වැඩක්නෙ මට මේ වුණේ"

නන්නාඳුනන ගැහැනියගේ මරණය භාර ගත නොහැකි යැයි එදා මා පොලීසියට පැවසුවත් වැඩක් වූයේ නැත්තේ ඇගේ භාරකරු ලෙස මාගේ අත්සනින් ඇය රෝහලට බාර දී තිබුණ හෙයිනි. දරුවාගේ පියා මා නොවී යැයි ඔවුන් විශ්වාස කළේ නැත. උසාවිය තෙක් රැගෙන ගිය මියගිය ගැහැනියත්, දරුවාත් මගේ බව පැවසීමට ඔවුන් නොගත් උත්සාහයක් නැත. අවසානයේ මගේ ලේ පරීක්ෂාවක් කර දරුවාගේ පියා කවුරුන්දැයි හදුනා ගැනීමට උසාවිය නියෝග කළේය. අද එහි තීන්දුව එනතුරු මා සිටියේ නොඉවසිල්ලෙනි. මේ මර උගුලෙන් ගැලවිය යුතුව ඇත. සාගරිකා මා සමග කතා කිරීම අත්හැර තිබුණේ සිතේ කැකෑරෙන වේදනාව දෙගුණ කරමිනි. අවුරුදු ගණනක් එකට පවුල් කෑ ගැහැනියට මා කවුරුන්දැයි වටහා ගැනීමට නොහැකි වී ඇත. ගම්මුන් එකා දෙන්නා සමච්චලයට සීනාසීම ඉවසිය හැකි මුත් පාක් එකේ සගයන්ගේ කතා ඉවසිය නොහැක. මා දුටු විට සිරිමල්ගේ කට කොනකින් නැගෙන හිනාව මට අල්ලන්නේ නැත. අද හැමදේම වෙනස් විය යුතුව තිබේ.

මා උද්දෑසන අවදි වූයේ උසාවියේ දෙවන නඩු දිනය නිසාය. අද වෛද්‍ය වාර්තා උසාවියට ඉදිරිපත් කරන දිනයයි. සාගරිකා දරුවන් සමග ලකලෑස්ති වූයේ උසාවියට යෑමට වුවත් ඈ මා හා එක්ව නොයන බව මම දනිමි.

"මම එන්නම් සිරිමල් එක්ක" ඈ පැවසුවාය.

"ඇයි සිරිමල් උඹේ මිනිහදැ" යි ඇසීමට සිත් වුවත් මා කරබා ගතිමි. වරද ඇත්තේ මා අතය.

උසාවියේ මගේ නඩු වාරය කතා කරන විට දැනුණේ තිගැස්මකි.

"මුදියන්සේලාගේ විජය සාගර වන මොහුගේ ඩී.එන්.ඒ රුධිර සාම්පල ඉපදී ඇති දරුවාගේ රුධිර සාම්පල හා සන්සන්දනය නොවන බවත්, විජය සාගර වන මොහුට දරුවන් සෑදීමට ඇති හැකියාව අවම මට්ටමක පවතින වඳභාවයෙන් යුතු පුද්ගලයෙක් හෙයින් මොහු මේ නඩුවෙන් නිදොස් කොට නිදහස් කරන බවටත්, මියගිය කාන්තාවගේ දේහය රජයේ වියදමින් භූමදාන කිරීමට නියෝග කරන අතර, දරුවා ළමා නිවාසයකට බාර දීමට............"

මට කිසිවක් ඇසුණේ නැත. සිහි එළවා ගත නොහැකිව මා ඉඳගත්තා මතකය. සියල්ල බොඳ වී ඇත. සාගරිකා සිරිමල් එක්ක ඈතට යනවා මා දුටුවේ බොඳ වූ දෑසිනි.

## පුංචි කතා...

46 වන පිටුවෙන්

හොරුන්ගේ නම් ලියාදෙන ලෙස අණ කළේ පාසලේ විදුහල්පතිට මේ හොරුන්ගේ නම් ලැයිස්තුව දී ඔවුනට දැඩි දඬුවම් කරවීමේ අදහසිනි. එකිනෙකාගේ නම් වතු හිමියාට ලියා දුන් සිසුවෝ ඉන් ගැලවී නැවත පාසල් වත්තට පැන තම තමන්ගේ පන්තිවලට ගියහ.

සිසුන් ලියා දුන් නම් ලැයිස්තුව අතට ගත් වතු හිමියා එසැණින්ම පාසලේ විදුහල්පති හමු වී දිනපතා තම වත්තෙන් තැඹිලි කඩන තැඹිලි හොරුන්ගේ නම් ලැයිස්තුව විදුහල්පතිට ඉදිරිපත් කළේ "සර් අද නම් තැඹිලි හොරු සියල්ලෝම අතට අල්ලාගත්තා" යැයි කියමිනි.

වතු හිමියා දුන් තැඹිලි හොරුන්ගේ නම් ලැයිස්තුව කියවා බැලූ විදුහල්පතිට එකවරම සිනහ පහළ විය.

"ඈ අප්පච්චියේ මේ තැඹිලි කඩල තියෙන්නේ මමයි, මගේ ආචාර්ය මණ්ඩලයේ ගුරුවරුන් නව දෙනයි නේදැයි" ඇසුවේ වතු හිමියා විශ්මයට පත් කරවමිනි. හොරෙන් තැඹිලි කැඩූ සිසුන් දස දෙනා වතු හිමියාට ලියා දී ඇත්තේ පාසලේ විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයේ දස දෙනකුගේ නම් බැව් පසුව හෙළි විය.

මෙම සිද්ධිය මුළු පාසලේම ආචාර්ය මණ්ඩලයේ හා සිසුනගේ සිනහවට හා හාස්‍යයට කරුණක් බවට පත් විය. පසුකාලීනව මෙම සිද්ධිය ප්‍රදේශය පුරාම ප්‍රචලිත විය. මෙය සත්‍ය සිද්ධියකි. පසුව මෙම සිසුහු දස දෙනාට විදුහල්පති ඇතුළු අනෙකුත් ගුරු භවතුනගේ නම් කියා ඇමතීමටද අනෙක් සිසුහු පුරුදු විය.

**ඩී.එන්.දිසානායක**

# බොරු මතවලින් ගැලවෙමු !

## කුකුළු මස් ගැහැනු දරුවන්ට අගුණයි කීම පට්ටපල් බොරුවක්...
## හෘදයාබාධවලට හොඳම බීම 'තේ'

අපේ ආහාර සංස්කෘතිය තුළ ඇති වැරැදි පුරුදු හා වැරැදි මත මෙන්ම වැරැදි විශ්වාස ගැන අපි නිතරම කතා බහ කරන්නෙමු. එහිදී කාබෝහයිඩ්රේට, ප්‍රෝටීන, මේද අම්ල හා අනෙකුත් විටමින් ඛනිජ ද්‍රව්‍ය ගැන මෙතෙක් කලක් සමාජයේ මුල් බැහැගෙන තිබූ වැරැදි මත හා විශ්වාස මෙන්ම පුරුදු නිවැරැදි කර ගන්නට උත්සාහ කළ යුතු ආකාරය ගැන සාකච්ඡා වේ.

ඒ ඔස්සේ ඊළඟට මතුවන ප්‍රශ්නයකට උත්තර සොයන්නට අද අපි සූදානම් වෙමු..... අපි කොහොමද නිවැරැදි ආහාර වේලක් සකසා ගන්නේ? දවසේ අපි ගන්නා ආහාරය කෙසේ විය යුතුද......?

එම ප්‍රශ්නවලට උත්තර දෙමින් ආචාර්ය ආනන්ද චන්ද්‍රසේකර මෙසේ පිළිවදන් දෙයි.

### නිවැරදි ආහාර වට්ටෝරුව

මෙන්න මෙතැනදී අපට යම් සංකීර්ණ ප්‍රශ්නයකට මුහුණ දෙන්නට වෙනවා. මොකද අපි ගත යුතු ආහාර වට්ටෝරුව මෙන්න මේකයි කියල නිශ්චිතවම කියන්න අපි කිසිවෙකුට පුළුවන්කමක් නැහැ. ඒ මොකද පුද්ගලයාගෙන් පුද්ගලයාට ඒ වට්ටෝරුව වෙනස් වෙනවා. වෙනස් වෙන්නේ ඔහු තුළ තියෙන වයස, උස, බර, ක්‍රියාකාරිත්වය, රැකියාව, ආහාර පුරුදු, සංස්කෘතිය, දේශගුණය වගේ සාධක රැසක් මත.

හොඳම දේ තමයි තනි තනිව පෝෂණවේදියෙක් හමුවෙලා තමන්ට නිසි ආහාර වට්ටෝරුව සාදා ගැනීම. නමුත් ලංකාවේ තියෙන ප්‍රශ්නය පෝෂණවේදියෝ හිඟයි. හැමකෙනෙක්ටම පෝෂණවේදියෙක්ව හමුවන්න අවස්ථාවක් නැහැ.

මෙන්න මේ නිසා අපි හැමෝම කරන්න ඕන දේ තමයි ආහාර ගත යුතු රටාව ගැන අවබෝධයක් ඇති කර ගැනීම. මේ සඳහා අපි සාමාන්‍ය සරල දිවි පෙවෙතක් ගෙවන පුද්ගලයකුට අවශ්‍ය ආහාර රටාව ගැන සලකා බලමු.

කිසි බර වැඩක් නොකරන මධ්‍යම ප්‍රමාණයේ ශරීරයක් ඇති අයෙකුට දිනකට අවශ්‍ය වන ශක්තිය කැලරිවලින් 2000 ක් කියා හිතමුකෝ. ඒ කැලරි 2000 අපි, අපි ගන්නා ආහාර වර්ගවලින් ලැබෙන කැලරිවලට අනුව බෙදා ගත යුතුයි.

එම කැලරි 2000 න් සියයට 40 සිට සියයට 60 අතර ප්‍රමාණයක් කාබෝහයිඩ්රේට ආහාරවලින් සපයා ගන්න වග බලාගන්න ඕන. සියයට 15 ත් සියයට 25 ත් අතර ප්‍රමාණයක් තෙල් සහ මේදවලින් ලබාගන්න ඕන. සියයට 20 ත් සියයට 25 ත් අතර ප්‍රමාණයක් ප්‍රෝටීන්වලින් ලබා ගන්න ඕන.

ඒ වගේම ඊට අමතරව ශරීරයට අවශ්‍ය වෙනවානේ ඛනිජ ලවණ, විටමින්, ජලය, කෙඳි වගේ දේවල්. ඒවා අවශ්‍ය ප්‍රමාණයට එකතු කර ගත යුතු වෙනවා. මේ සරල රටාව හුඟ දෙනෙක් අද දන්නවා. හැබැයි භාවිතයට ගියාම තම ශරීරයට අවශ්‍ය පරිදි නිසි ප්‍රමාණ සකසා ගැනීමේදී තමයි අපේ ජනතාව වැරැදි පුරුදුවලටයි මිථ්‍යා මතවලටයි නොයෙක් විශ්වාසවලටයි වහල් වෙන්නේ.... අපි පුළුවන් තරම් දැනුවත් වෙලා එම තත්ත්වය වළක්වා ගන්නයි අවශ්‍ය වෙන්නේ.

මෙන්න මේ සියලු දේවල් ඇරුණාම ශරීරයට ඉතාම සුළු ප්‍රමාණවලින් අවශ්‍ය වන ශාක රසායනික ද්‍රව්‍ය කිහිපයකුත් අපි ආහාරවලට එකතු කරගත යුතු වෙනවා. අපි මේවාට පයිටෝ කෙමිකල්ස් (phytochemicals) කියලා කියනවා.

### ප්‍රති ඔක්සිකාරක

ඉස්සර නම් මේවා ගැන කවුරුවත් වැඩි තැකීමක් කළේ නැහැ. නමුත් මේවා ඉතාම වැදගත් වෙනවා. මේවායින් අපට ලැබෙන්නේ ශාක රසායන ද්‍රව්‍ය තුළ තියෙන ප්‍රති ඔක්සිකාරකයි. (Antioxidants)

ඇයි අපිට මේ ශාක රසායන ද්‍රව්‍ය ප්‍රතිඔක්සිකාරක අවශ්‍ය වෙන්නේ. ඒ තුළ තියෙනවා විශේෂ හැකියාවන් ගණනාවක්ම. හෘදයාබාධ වළක්වන ගුණයක්තියෙනවා. පිළිකා කාරකයන්ට ප්‍රතිරෝධීව ක්‍රියා කරනවා. ශරීරයේ ප්‍රතිශක්තීය ක්‍රියාකාරීත්වය නිසි පරිදි හැඩ ගස්වනවා. අමතක වීම වළක්වා ස්මරණ ශක්තිය ඇති කරවා දෙනවා.

මෙන්න මේ ප්‍රතිඔක්සිකාරක තියන ආහාරය තමයි පලතුරු. පලතුරුවල විශාල වශයෙන් ප්‍රතිඔක්සිකාරක තියෙනවා. පාට එළවළු ජාතිවලත් ප්‍රතිඔක්සිකාරක තියෙනවා. ඒ වගේම තක්කාලිවලත් තියෙනවා.

අපේ රටේ අපිට ප්‍රතිඔක්සිකාරක ලබා ගැනීම සඳහා තියෙන ලාභම හා පහසුම මාර්ගය තමයි තේ. ග්‍රීන් ටී ගැන සමහරු කියවනවනේ. ග්‍රීන් ටීවල විතරක් නොවෙයි. හොඳ පිරිසිදු තේවලත් තියෙනවා. ලෝකයේ හොඳම ගුණවත්ම තේ තියෙන්නේ අපිටයි. අපෙන් තේ අරගෙන ගිහින් පිටරැටියෝ නිවැරැදි යහගුණ ගන්නවා. නමුත් අපි අපේ හොඳම තේවලට පිටි දාල සීනි දාල තියෙන යහගුණය විනාශ කර ගන්නවා. අපි තේ බොන්නේ වැරැදි ක්‍රමයටයි.

ඇත්තම කියනවා නම් ප්‍රංශයේ රතු වයින්වල තියෙන ප්‍රතිඔක්සිකාරක ගුණයට සමාන ගුණයක් තේවලත් තියෙනවා. කතාවට කියනවානේ මධ්‍යධරණී මුහුද අවට කලාපයේ හා ප්‍රංශයේ අයට හෘදයාබාධ අඩු රතු වයින් බොන නිසා කියලා. ඔලිව්වලත් මේ ගුණය තිබෙනවා. ඒ ගුණය තේවලත් තියෙනවා. හෘදයාබාධ තියෙන අයට හොඳම බීම තමයි තේ....

ඊළඟට අපි සැලකිලිමත් විය යුතුයි කාබෝහයිඩ්රේට්, ප්‍රෝටීන්, තෙල් සහ මේද ගන්නා ආකාරය ගැන. දෛනික ආහාර වේලෙන් භාගයක් කාබෝහයිඩ්රේට් ගත්තාට කමක් නැහැ. හැබැයි ඒ ගන්නා කාබෝහයිඩ්රේට් සරල සීනි වශයෙන් නොගෙන සංකීර්ණ කාබෝහයිඩ්රේට් (complex-carbohydrate) ලෙස ගන්න වග බලා ගන්න ඕන. මම කලිනුත් කිව්වා. මේ සඳහා තම්බාපු රතු හාල් ඉතාම ගුණයි. තම්බාපු සුදු හාල් වුණත් ප්‍රශ්නයක් නැහැ. හැබැයි සුදු හාල්, කුරුට්ට ඉවත් කළ රතු හාල්, පාන්, ඉඳිආප්ප ගැනෙන්නේ අඩු වැඩි වශයෙන් සරල සීනි සපයා දෙන ආහාරවලටයි. මම මේ ගැන කලින් කියල තියෙනවා. පුළුවන් තරම් රතු තම්බාපු හාල් කන්න පුරුදු වෙන්න ඕන. හැබැයි ශරීරයට අවශ්‍ය ප්‍රමාණයට විතරක්.

### සත්ව ප්‍රෝටීන්

ඊළඟට අපි ප්‍රෝටීන් ගැන සැලකිලිමත් විය යුතු වෙනවා. ප්‍රෝටීන් තියෙනවා. සත්ව ප්‍රෝටීන් හා ශාක ප්‍රෝටීන් ලෙස වර්ග 2 ක්. ශාක ප්‍රෝටීන් වර්ග තියෙනවානේ පරිප්පුවල, මුං, කව්පි, කඩල ආදී ධාන්‍යවල හා සෝයා ආදි රනිල කුලයේ ශාක ආහාර හැම එකකම වගේ. නමුත් ප්‍රශ්නයක්තියෙනවා. සත්ව ප්‍රෝටීන්වල වගේ ශාක ප්‍රෝටීන්වල අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල හැම දෙයක්ම අන්තර්ගත වෙලා නැහැ. මස්, බිත්තර, මාලු, කිරිවල අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල සියල්ල තියෙනවා. නමුත් ශාක ප්‍රෝටීන්වල සමහර අත්‍යවශ්‍යම දේවල් නැහැ. ඉතින් ඒවා අපි වෙන වෙන දේවල්වලින් ලබා ගන්න ඕන. ඒ සඳහා හොඳ මිශ්‍රණයක් ලෙස ගැනීම අවශ්‍යයි.

ඒකයි අපි කියන්නේ ශාක ප්‍රෝටීන්වලට වඩා අත්‍යවශ්‍ය ප්‍රෝටීන් ලබන්න තියෙන හොඳම මග සත්ව ප්‍රෝටීන් කියලා. බිත්තර සුදුමදය තුළ තියෙන ප්‍රෝටීන් ඉතාම විශිෂ්ටයි. කිරිවලත් තියෙන්නේ හොඳම ප්‍රෝටීන්. හැබැයි කිරිවල විතරයි. කිරි පිටිවල ඇති මගුලක් නෑ... කිරිපිටි කියන්නේ වංචාවක්. සියලු යහගුණය උදුරා ගන්න රොඩ්ඩක් අපි ගෙනැල්ලා දිය කරලා බීල අපි අපිවම රවට්ටා ගන්නවා.

මම එක පාරක් ඔස්ට්‍රේලියාවේ ගිහින් බොන්න කිරිපිටි හෙව්වා සුපර්මාකට් එකක. මිනිස්සු කන බොන ආහාර සමග ඒවා තිබුණේ නැහැ. මම එයාලගෙන් ඇහුවා. කේක් හදන බඩු තියෙන තැන තියෙනවා කියල කිව්වා. ඒ රටවල කිරිපිටි ගන්නේ කේක් වගේ රස කැවිලි හදන්න මිස පානය කරන්න නෙවෙයි. මම මේ කියන්නේ ළදරු කිරිපිටි (ෆෝමියුලා) ගැන නොවෙයි. හැබැයි ඉතින් පව් පින් අවිහිංසාවාදය වගේ දේවල් ගැන හිතලා කිරි, බිත්තර, මස්, මාළු නොකනවා නම් එයාලා ශාක ප්‍රෝටීන් ලබා ගත්තාට වරදක් නැහැ. ඉතින් අපට හොඳම ආහාරය සත්ව ප්‍රෝටීන්....

කුකුළු මස් ඉතා හොඳයි. හම ඉවත් කරල ගත්තාම කුකුළු මස්වල තෙල් තට්ටුවත් ඉවත් වෙනවා. කුකුළු මස්වල තියෙන්නේ ඔමේගා 3, ඔමේගා 6 වගේ අත්‍යවශ්‍ය මේදයයි. කුකුළු මස් ගැන කතා කරන කොට මිනිස්සුන්ගේ වැරැදි මතයක් තියෙනවා ගැහැනු දරුවන්ට හොඳ නැහැ කියලා. කුකුළු මස්වල හෝර්මෝනයක් නිසා ප්‍රංව් දරුවෝ ඉක්මනට මල්වර වෙනවලු. මේක විද්‍යාත්මක පදනමක් නැති හිතලුවක් විතරයි. මල්වර වීමයි කුකුළු මසුයි අතර කිසිම සම්බන්ධයක් නෑ....

හැබැයි හොඳ කෑම බීම වැඩිපුර ලැබිලා සැපට හැදෙන ළමයින්ගේ පෝෂණය ඉහළයි. එහෙම ළමයි ඉක්මනට මල්වර විය හැකියි. පෝෂණය වැඩි වුණාම මල්වර වීම ඉක්මන්. මන්දපෝෂණය, මල්වර වීම පමා කරන බව මම විද්‍යාත්මකව දන්නවා.

### බැදීම, පිච්චීම සහ තැම්බීම

මස් වර්ග වැඩිපුර තැම්බීම තුළ යහගුණය නැති වෙනවා කියල සමහරු කියනවා. වැඩිපුර බැදීම හොඳ නැහැ කියලත් කියනවා. ඒවත් මිනිස්සුන්ගේ වැරැදි විශ්වාස විතරයි. එළවළු වර්ග නම් තැම්බීමෙන් විටමින් වර්ග, ඛනිජ වර්ග, ප්‍රතිඔක්සිකාරක විනාශ විය හැකියි. නමුත් මස්තැම්බීම තුළ වන්නේ අනවශ්‍ය මේද ඉවත් වීමයි. ඒක හොඳයි. මස් බාබකිව් කිරීම තුළත් ඒකම වෙනවා.

වැඩිපුර බැදීම තුළ මස්වල තියෙන යහගුණය නම් විනාශ වෙන්නේ නැහැ. නමුත් ගැඹුරු තෙලේ බැදීමේදී එම තෙල්වල තත්ත්වය මත ප්‍රශ්න ඇතිවිය හැකියි. එම තෙල් දෙතුන් වතාවක් පාවිච්චි කරලා ට්‍රාන්ස්ෆැට් හැදිච්ච තෙල් නම් බදින ආහාර (මස්)වලට ට්‍රාන්ස්ෆැට් ඇතුළු වෙනවාමයි. ඒක හෘදයාබාධවලට ඇති කරයි. ඒ වගේ දේවල් දැනගෙන ඉන්න ඕන.

මස් පිච්චීම හොඳයි. අනවශ්‍ය තෙල් ඉවත් වෙනවා තමයි. නමුත් වැඩිපුර පිච්චීම හා දුම් ගැසීම තුළ සමහර පිළිකා කාරක දේවල් මස්වලට එකතු විය හැකියි. ඒවා දැනගෙන කරන්න ඕන.

### මස් කෑම

මස් වර්ග වැඩිපුර කෑම අහිතකරද කියලා හිතන අයත් ඉන්නවා. නමුත් අපි දන්නවානේ මස් වර්ග ප්‍රධාන ආහාර කරගත් අය ඉන්න සංස්කෘති ලෝකයේ තියෙනවා. එයාලට කිසි ප්‍රශ්නයක් නැහැ. විවිධ සාධක ආහාරවලට බලපානවා කියල මම කිව්වේ ඒකයි.

සමහරවිට වකුගඩුවල, අක්මාවේ ආබාධ තියෙන අය මස් වර්ග වැඩිපුර කෑම අහිතකර විය හැකියි. එහෙම නැත්නම් කොච්චර මස් මාළු කෑවත් ඒ අමතර ශක්තිය ශරීරයට ලොකු ප්‍රශ්නයක් නොවෙයි. වැඩි කොටස මුත්‍රා සමග පිටවී යනවා.... ඒත් ඉතින් අත්‍යවශ්‍ය ප්‍රමාණය ඉහත කී ගණනය කිරීම් අනුව කෑමට ගැනීම තමයි ඉතාම සුදුසු දේ......

### මුදල් සහ පෝෂණය

සමහරු හිතනවා මේදය, ප්‍රෝටීන් ගන්න සල්ලි වැඩිපුර තියෙන්නම ඕන කියලා. ඒකත් මිථ්‍යාවක්. ඔය වෙල් මාළුවල, වැව් මාළුවල තියෙන යහ ගුණය මේකට හොඳ උදාහරණයක්.

වැව් මාළු, වෙල් මාළු, පලා, කරවල, පලතුරු කන කෙනා මේ ඔක්කෝටම වඩා පොහොසත්..... ගමේ වැවෙන අල, බතල වර්ග හරිම වටිනවා. ඉතාම හොඳ ආහාර වේලක්ගමේ ගෙවත්තෙන් සපයාගත හැකියි. ඒකට වැඩිපුර සල්ලි ඕන නැහැ.

හොඳම දේ තමයි සරල වීම. අපි දන්නවා විවිධ සාධක මත එක එක්කෙනාගේ ආහාර වට්ටෝරුව එක එක විදියයි. නමුත් තමන් සරල වුණොත් බුද්ධිමත්ව කල්පනා කළොත් තමන්ට අවශ්‍ය ආහාරවේල තමන්ටම සකසා ගත හැකියි. සමබර වන ලෙස හැකිතරම් කාබෝහයිඩ්රේට අවම කරලා. ගන්නා කාබෝහයිඩ්රේට පුළුවන් තරම් සංකීර්ණ සීනි සහිත කාබෝහයිඩ්රේට අරන් ප්‍රෝටීන හා මේද අවශ්‍ය ප්‍රමාණයට අරන් එළවළු පලා වර්ග සහිත සරල ආහාරයක් ගෙන ඉන්පසු සුදුසු පලතුරක් ගැනීමයි හොඳම ආහාරවේල. මස්, මාළු ගන්න එක හොඳයි. නමුත් වෙනත් විකල්පවලට ගියත් ප්‍රශ්නයක් නැහැ.

### ව්‍යායාම

ඒත් මේ ඔක්කොම කළත් තවත් අත්‍යවශ්‍ය දෙයක්තියෙනවා. ඒ තමයි ව්‍යායාමය. තමන් කරන රැකියාව ශරීරය වෙහෙස වන රැකියාවක් නොවෙයි නම් ඉතින් නිරෝගීව ඉන්නත් ශරීරයේ නිසි ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යන්නත් ව්‍යායාම නම් කළ යුතුම දෙයක්. මේ අතර තියෙන සරලම ව්‍යායාම තමයි ඇවිදීම...

මේ ගැන විවිධ අයගේ විවිධ මත තිබිය හැකියි. හැබැයි මම මගේ විද්‍යාත්මක මතය එයයි.

# Tilake

## An exhibition of paintings by Cavaliere Tilake Abeysinghe

In a career spanning over 50 years, Tilake Abeysinghe, internationally reputed painter and sculptor, has held over 70 exhibitions from Beijing to Sao Paulo to Copenhagen. In 1984, he was knighted by the Italian government for his services to art.



**MONTE CARLO INN**
**7255 WARDEN AVENUE, MARKHAM ON**
**Sunday March 25th 2018,11:00 am to 4:00 pm**

Dr. Chitralekha Abeysinghe cordially invites you to grace her father's Exhibition of Paintings.
Entrance Free.

Proceeds of sales of painting duplicates will be donated to charity.

# BEYOND YOUR EXPECTATIONS !

## Residential & Commercial Real Estate

**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



**5% DOWN ? No problem!**

**I will guide you through obtaining your DREAM HOME through my proven system!**

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

RE/MAX 100% Club Award

2016, 2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award

2015, 2012

The Diamond Realty Inc Brokerage

A member of CanLanka BUSINESS ASSOCIATION

RE/MAX HALL OF FAME

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

**Call me Today !**

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.
Join the many happy home owners I've helped and find the perfect home for you!

# Gamini Abeysinghe. ABR, CNE

## Real Estate Sales Representative

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828
1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

**www.gaminiabeysinghe.com**

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements




දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

## වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

**Gamini - 416 822 2789**

## ඔබේ නිවසටම දසත Dasatha

**සෑම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.**

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

Please make all Cheques payable to **Dasatha Publications**

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

**www.dasatha.com**